# ගුරු මාර්ගෝපදේශය

## (මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, සෞන්දර්ය, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, දෙවන ජාතික භාෂාව)

## (2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## 1 ශ්‍රේණිය




මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

www.nie.ac.lk

# ගුරු මාර්ගෝපදේශය

**(මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, සෞන්දර්ය අධ්‍යාපනය,**

**ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, දෙවන ජාතික භාෂාව)**

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

## 1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

ගුරු මාර්ගෝපදේශය
1 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2025

©ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි.

**ISBN**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : **www.nie.ac.lk**

# විෂයමාලා දායකත්වය

## උපදේශකත්වය

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**ආචාර්ය දර්ශන සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

## අධීක්ෂණය

**ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය**
අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂයමාලා සම්බන්ධීකරණය

එස්. එම්. සඳමාලි දේශප්‍රිය මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

## විෂයමාලා කමිටුව

එච්. ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. සජීවා රුවනි රඹුක්වැල්ල මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
එස්. එම්. සඳමාලි දේශප්‍රිය මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
හරිනි ගයානා වනසේකර මිය - කථිකාචාර්ය
එම්. සුචිනි ප්‍රනාන්දු මිය - කථිකාචාර්ය

## බාහිර සම්පත් දායකත්වය

| | |
|---|---|
| මහාචාර්ය ඩී.එම්.ඩබ්ලිව්. මුණසිංහ | - (විශ්‍රාමික) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය |
| ආචාර්ය සුරනිමල ලේකම්ගේ | - (විශ්‍රාමික) අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| ආචාර්ය ටී. චන්ද්‍රිකා පීරිස් | - (විශ්‍රාමික) කථිකාචාර්ය, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| ආචාර්ය චන්ද්‍රා අමරසේකර | - (විශ්‍රාමික) පීඨාධිපති, සබරගමු විශ්ව විද්‍යාලය |
| සරත්චන්ද්‍ර කුරුප්පු මයා | - (විශ්‍රාමික) අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| එස්. උදයසන්තිරන් මයා | - (විශ්‍රාමික) අධ්‍යක්ෂ, දෙමළ භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| ලක්ෂාන්ති ගුණරත්න මිය | - (විශ්‍රාමික) ගුරු උපදේශක - ඉංග්‍රීසි |
| එස්. එච්. මායාදුන්නේ මයා | - ගුරු උපදේශක, හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලය. |
| එම්. ප්‍රියානි මාතරගේ මිය | - ගුරු සේවය, බප/හෝ/ධර්මරාජ විද්‍යාලය, මීගොඩ |
| නයනා කුමුදුනී මිය | - (විශ්‍රාමික) ගුරු සේවය - ඉංග්‍රීසි |
| දිලිනි සුරවීර මිය | - (විශ්‍රාමික) ගුරු සේවය - ඉංග්‍රීසි |
| අනෝජා ජයවර්ධන මිය | - (විශ්‍රාමික) ගුරු සේවය - ඉංග්‍රීසි |
| එස්. බී. දොඩම්වල මිය | - ගුරු සේවය - මප/දෙනු/ වට්ටප්පල මධ්‍ය මහා විද්‍යාලය |
| එම්. එන්. එම්. රීදාන් මයා | - ගුරු සේවය - ඩී. එස්. සේනානායක විද්‍යාලය, කොළඹ |

**භාෂා සංස්කරණය**

ඩබ්ලිව්. කරුණාරත්න මයා - ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම

**පිටකවරය හා චිත්‍ර නිර්මාණය**

ආචාර්ය ටී. චන්ද්‍රිකා පීරිස් - මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

එම්. සුවිනි ප්‍රනාන්දු මිය - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

තුසිත රුවන් ධර්මප්‍රිය - නිව්ස්ටඩ් බාලිකා විද්‍යාලය, මීගමුව

චිත්මි හසරංගි සේනාරත්න මෙණවිය

ප්‍රේමරත්න බණ්ඩාර මයා

**පරිගණක අක්ෂර සංයෝජනය (පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණය)**

ඒ. ඩී. අනුෂා තරංගනී මිය - ජාතික අධ්‍යාපන ආයතනය

ආර්. එම්. රජිත සම්පත් මයා - ජාතික අධ්‍යාපන ආයතනය

කාංචනා ආර්. පද්මපෙරුම මිය - ජාතික අධ්‍යාපන ආයතනය

එන්. ජනනි මෙණවිය - ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහය**

ඩබ්ලිව්.එච්. ටියුඩර් සිල්වා මයා - කළමනාකරණ සහකාර ජාතික අධ්‍යාපන ආයතනය

# ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම් ලාභියෙකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, විසි එක් වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසි භාවය, වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂයමාලාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගි සංවාදයක් ඔස්සේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම මෙම කාර්යයේදී විශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන්ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයයන් නවීකරණය වන අතර ම නව විෂයයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය වෙයි. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම පාසල් විෂයයක් සඳහා ම ඉගෙනුම් ද්‍රව්‍ය හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේදී 1 ශ්‍රේණිය සඳහාත් 2027 වර්ෂයේදී 2 ශ්‍රේණිය සඳහාත් 2028 වර්ෂයේදී 3 ශ්‍රේණිය සඳහාත් 2029 වර්ෂයේදී 4 ශ්‍රේණිය සඳහාත් 2030 වර්ෂයේදී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් පොත් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් සිදු කෙරෙයි. ගුරුවරුන්ට ලබා දෙන උපදෙස් ගුරු මාර්ගෝපදේශවල ඇතුළත් කර ඇති අතර සිසුන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවලට යොමු කර සිසු හැකියා සංවර්ධනයට මෙම විෂයමාලාව බෙහෙවින් උපකාර වන බව අපගේ විශ්වාසයයි. විසි එක්වන සියවසේ කුසලතා සංවර්ධනයටත් එමගින් සිසු පෞරුෂය සංවර්ධනයටත් හඳුන්වා දෙනු ලබන විෂයමාලාවේ ඇතුළත් ක්‍රියාකාරකම් මනා පිටුබලයක් වනු ඇත.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීමේදී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මෙම ඉගෙනුම් ද්‍රව්‍ය ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# අධ්‍යක්ෂ පණිවුඩය

ප්‍රාථමික අධ්‍යාපන කාල පරිච්ඡේදය ළමා සංවර්ධනයේ ඉතා ම තීරණාත්මක අවධියකි. අනාගතයේ සාර්ථක පුරවැසියෙක් වශයෙන් ජීවත් වීමට අවශ්‍ය කුසලතා මෙන් ම ඉදිරි ඉගෙනුම සඳහා වන පදනම සංවර්ධනය වන්නේ ද මෙම කාල පරිච්ඡේදයේ දී ය. මෙම අවධිය තුළ කායික, බුද්ධිමය, සමාජයීය හා චිත්තවේගීය වශයෙන් සිදුවන්නා වූ සමස්ත සංවර්ධනය උපරිම අයුරින් ගොඩනැඟීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කරදීම ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යභාරය විය යුතු ය.

අභියෝගවලට සාර්ථක ව මුහුණදීමට හැකි වන පරිදි සිසුන්ගේ පෞරුෂ සංවර්ධනයට අවශ්‍ය පදනම සකස් කිරීම අත්‍යවශ්‍ය ය. ළමා සංවර්ධනයේදී දරුවාට නිවැරදි ව හා පීඩාවක් නොවන අයුරින් උත්තේජන සැපයීම සිදු කෙරෙන ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීම අනිවාර්යයෙන් ම සිදු විය යුතු ය. ඒ සඳහා සෙල්ලම්, විනෝදජනක ක්‍රියාකාරකම් හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ආශ්‍රිත ඉගෙනුම් අද්දැකීම් ලබා දීම අවශ්‍ය ය. මේ සඳහා සෑම සිසුවෙකුට ම ඉගෙනුමට ප්‍රවේශ විය හැකි අන්දමට මෙම ඉගෙනුම් අද්දැකීම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය ය. එමෙන් ම නිවසින් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙන් විධිමත් පාසලේ පළමුවන ශ්‍රේණියට ද, ප්‍රාථමික පාසලෙන් ද්විතීයික පාසලට ද සුමට ලෙස සංක්‍රාන්ති වීම සඳහා දරුවාට අවශ්‍ය සහාය ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි දී සිදු විය යුතු ය.

ඒ අනුව ප්‍රාථමික ශ්‍රේණි සඳහා නව විෂයමාලාව සකස් කිරීමේදී ලෝකයේ විවිධ රටවල පිළිගත් ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා අධ්‍යයනය කරන ලද අතර ළමා සංවර්ධනය හා ඉගෙනුම පිළිබඳ ව දාර්ශනිකයන් හා මනෝවිද්‍යාඥයින් විසින් පළ කරන ලද අදහස් පිළිබඳ අවධානය යොමු කරන ලදී. එමෙන් ම මෙයට පෙර වසරවල සිදු කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විෂයමාලා නවීකරණ මෙන් ම විෂයමාලා යාවත්කාලීන කිරීම් පිළිබඳ ව ද අධ්‍යයනයට භාජනය විය. ඊට අමතර ව විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් සමග සිදු කරන ලද සාකච්ඡා ඇසුරින් ලද තොරතුරු ද 2020න් ඔබ්බට පුරවැසියන්ට මුහුණදීමට සිදු වන අභියෝග පිළිබඳ ව ද අවධානයට ලක් විය. එහි දී දරුවන්ගේ කුසලතා සංවර්ධනය කිරීම මෙන් ම සමාජයීය හා චිත්තවේගීය නිපුණතා සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මග පෙන්වීම් පිළිබඳ ව ද සැලකිල්ලට භාජනය කරන ලදි. උක්ත කරුණු පදනම් කරගෙන සංවර්ධනය කරන ලද මෙම විෂයමාලාව සෑම සිසුවකුට ම තම අනන්‍යතාවට ගැළපෙන පරිදි උපරිම සංවර්ධනයක් ලබා ගැනීමට මඟ පෙන්වන්නකි.

2026 වසරේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමුවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශයට මූලික විද්‍යාව හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්, සෞන්දර්ය අධ්‍යාපනය, දෙවන ජාතික භාෂාව සහ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයන්වලට අදාළ ව පළමුවන ශ්‍රේණියේ පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් ඒ ඒ විෂය යටතේ ඇතුළත් කර ඇත. තවද, **සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය** සඳහා වෙන් කරන කාලය තුළදී 2016 වර්ෂයේ සිට හඳුන්වාදී ඇති ශාරීර සුවතා විෂයට අදාළ ක්‍රියාකාරකම් ද තවදුරටත් මේ සඳහා යොදා ගැනේ. එමෙන් ම **විෂය සමගාමී ක්‍රියාකාරකම්** සඳහා ද දී ඇති කාලය ඒ අකාරයෙන් ම යොදා ගැනේ. මව්බස, ගණිතය සහ ආගම සහ සාරධර්ම විෂය සඳහා වෙන වෙන ම ගුරුමාර්ගෝදේශ ඉදිරිපත් කෙරේ.

එම මග පෙන්වීම් අනුව ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීම ගුරුභවතුන්ගේ වගකීම වේ.

**අධ්‍යක්ෂ**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පටුන


| 1 වාරය | පිටු අංකය |
|---|---|
| 1. මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගුරු මාර්ගෝපදේශය | - 1-50 |
| 2. සෞන්දර්ය ගුරු මාර්ගෝපදේශය | - 51-59 |
| 3. ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගුරු මාර්ගෝපදේශය | - 60-103 |
| 4. දෙවන ජාතික භාෂාව (දෙමළ) ගුරු මාර්ගෝපදේශය | - 104-115 |
| **2 වාරය** | |
| 5. මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගුරු මාර්ගෝපදේශය | - 117-154 |
| 6. සෞන්දර්ය ගුරු මාර්ගෝපදේශය | - 155-163 |
| 7. ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගුරු මාර්ගෝපදේශය | - 164-208 |
| 8. දෙවන ජාතික භාෂාව (දෙමළ) ගුරු මාර්ගෝපදේශය | - 209-220 |
| **3 වාරය** | |
| 9. මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගුරු මාර්ගෝපදේශය | - 222-257 |
| 10. සෞන්දර්ය ගුරු මාර්ගෝපදේශය | - 258-268 |
| 11. ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගුරු මාර්ගෝපදේශය | - 269-281 |
| 12. දෙවන ජාතික භාෂාව (දෙමළ) ගුරු මාර්ගෝපදේශය | - 282-291 |

# මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගුරු මාර්ගෝපදේශය

# හැඳින්වීම

"මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" නමින් හැඳින්වෙන මෙම විෂය ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ ජෛව, භෞතික සහ සමාජීය පද්ධතීන් පිළිබඳ හා ඒවා පදනම් කර ගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ස්වභාවයෙන් ම පුද්ගලයා තම ළදරු වියේ සිට සිය වටපිටාව කෙරෙහි කුතුහලයකින් යුක්ත වන අතර අනුක්‍රමයෙන් එම වටපිටාව සමග අන්තර් ක්‍රියා කිරීමට උත්සාහ දරයි. එමගින් පරිසරයේ තිබෙන දෑ පිළිබඳ විමසිලිමත් ව ග්‍රහණය කිරීම සඳහා පංචේන්ද්‍රියන්ගේ තීව්‍රතාව ඇති කර ගැනීම, තොරතුරු රැස් කිරීමට සහ වාර්තා කිරීමට සමත් වෙයි. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ක්ෂේත්‍රයේ විවිධ ප්‍රවේශ තුළින් මෙම ක්‍රියාවලිය වඩාත් තීව්‍ර ලෙස පෝෂණය කිරීමට අවස්ථාව සැලසේ.

### පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට අදාළ සංකල්ප (Concepts of ERA Subject)

(1) පරිසරය කෙරෙහි සංවේදී වීම -Environmental Sensitivity (2) සෞන්දර්යාත්මක සංවේදීභාවය හා වින්දනාත්මක ප්‍රකාශනය - Aesthetic Sensitivity & Performing (3) පරිකල්පනය හා නිර්මාණශීලීත්වය - Imagination & Creativity (4) පරිසරය සඳහා විද්‍යාත්මක ප්‍රවේශය - Scientific approach to Environment (5) අතීත උරුමය සහ දේශීයත්වය - Historical, Cultural & Indigeniousness Heritage (6) පුද්ගල යහපැවැත්ම සහ ධනාත්මක සමාජ සබඳතා - Personal Wellbeing & Positive Social Interaction යන සංකල්ප පදනම් කොටගෙන සංවර්ධනය කර ඇත.

මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ක්‍රියාත්මක වන්නේ තේමා පාදකව ය. මෙම විෂය තුළ අන්තර්ගත විෂයයන්හි සමෝධානය මෙන් ම මව්බස හා ගණිතය විෂයයන් අතර සම්බන්ධීකරණය වී හර විෂයයක් ලෙස පෝෂණය වීම මෙහි ඇති සුවිශේෂත්වය යි. මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය තේමා දාහතරකින් (14) සමන්විත ය.

පළමුවන ප්‍රධාන අවධිය සඳහා තේමා දොළහක් (12) ද, දෙවන ප්‍රධාන අවධිය සඳහා තේමා දොළහක් (12) ද, තුන්වන ප්‍රධාන අවධිය සඳහා තේමා දොළහක් (12) ද වශයෙන් ක්‍රියාත්මක ය. පළමු ප්‍රධාන අවධියේ දී ආරම්භ වන තේමාවලින් දෙකක් (2) එම අවධියේ දී ම අවසන් වෙයි. දෙවන ප්‍රධාන අවධියේ දී ආරම්භ වන නව තේමා දෙකක් (2), තුන්වන ප්‍රධාන අවධියේ අවසානය තෙක් ක්‍රියාත්මක වෙයි. මෙම තේමා ක්‍රියාත්මක වන ආකාරය පහත දැක්වෙන වගුවෙන් ඉදිරිපත් කර ඇත.

| 1 - 5 ශ්‍රේණිය දක්වා තේමා බෙදී යාම | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1 අපේ පාසල - Our School | ✓ | ✓ | - | - | - |
| 2 අපේ ගෙදර - Our Home | ✓ | ✓ | - | - | - |
| 3 අපේ මව්බිම - Our Country | - | - | ✓ | ✓ | ✓ |
| 4 අපට ලැබෙන සේවා - Services We Receive | - | - | ✓ | ✓ | ✓ |
| 5 ශාක හා ආහාර භෝග - Plants & Food Crops | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 6 අපේ උරුමය - Our Heritage | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 7 අපේ සුව පැවැත්ම - Our Wellbeing | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 අප අවට සත්තු - The Animals Around us<br>අපේ සත්ත්ව ලෝකය - The World of Animals | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 9 ජල සම්පත - Water Resource | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 10 පොළව සහ අහස - The Earth & Sky | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 11 අපේ රටේ සම්පත් /Resources of our Country අපේ සම්පත් හා නිපැයුම්/ Our Resource & Products | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 12 ගමන් බිමන් / ගමනාගමනය - Travelling | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 13 තොරතුරු හුවමාරුව /සන්නිවේදනය - Communication | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 14 අපේ වැඩට ශක්තිය - Energy for our work | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

මෙම විෂය තුළින් නිරීක්ෂණ, සරල පරීක්ෂණ සහ ගවේෂණ වැනි විද්‍යාත්මක ප්‍රවේශ භාවිත කරමින් සංවේදී ඉන්ද්‍රියන්ගේ තීව්‍රතාව සංවර්ධනය වීමට සහ පුද්ගල හැසිරීම් නිරීක්ෂණ, විවිධ පුද්ගලයින් හමුවීම් හා කතාබහ වැනි සමාජ කුසලතා සංවර්ධන වීමට සහ තොරතුරු රැස් කිරීමට අවස්ථා සැලසේ. මෙසේ රැස් කර ගන්නා තොරතුරු වර්ගීකරණය, සංසන්දනය, විශ්ලේෂණය හා තර්කනය වැනි චින්තන කුසලතා සංවර්ධනය වීමට ද යොමු වේ.

එමෙන් ම තොරතුරු වාර්තා කිරීම සඳහා වාචික මෙන් ම ලිඛිත ඉදිරිපත් කිරීම්, රූපික හා ප්‍රස්තාරික ඉදිරිපත් කිරීම්, ඇඹීම් සහ ආකෘති නිර්මාණ, චිත්‍රමය හා දෘශ්‍යමය ඉදිරිපත් කිරීම්, භූමිකා රංගන වැනි ප්‍රාසාංගික ඉදිරිපත් කිරීම්, චලන, අනුකරණ වැනි චාලක ඉදිරිපත් කිරීම් සඳහා ද ඉඩ ප්‍රස්තා සැලසේ. තව ද සරල උපකරණ, මෙවලම් සහ ද්‍රව්‍ය හැසිරවීම වැනි තාක්ෂණික කුසලතා සංවර්ධනයට ද අවස්ථා හිමි වේ.

මෙම විෂය ක්ෂේත්‍රයේ ක්‍රියාවලිය තුළින් සංවේදීබව, සහකම්පනය, අන්‍යයන්ට උදවු කිරීම, කණ්ඩායම් හැඟීම, නිර්මාණශීලී විවේචන සහිත සාමූහික තීරණ ගැනීම, සහයෝගයෙන් වැඩ කිරීම, කැපවීම, අගය කිරීම, ආරම්භයේ සිට නිමාව තෙක් අවධානයෙන් යුතු ව කටයුතු කිරීම, උපේක්ෂා සහගත බව වැනි මෘදු කුසලතා සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

ගණිතමය කුසලතා, භාෂාමය කුසලතා සදාචාරත්මක වටිනාකම් සහ ආධ්‍යාත්මික වටිනාකම් පෝෂණය කිරීම ද මෙම මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ක්ෂේත්‍රය තුළින් අපේක්ෂා කෙරේ. මෙවැනි විවිධ පැතිකඩ ඔස්සේ කුසලතා සංවර්ධනය වීමේ සමස්ත ප්‍රතිඵලය වන්නේ පුද්ගලයෙකුගේ **මූලික ජීවන නිපුණතා** සංවර්ධනය වීම ය.

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය අරමුණ

ස්වාභාවික ජීවී, අජීවී පරිසරයේ ද, පරිසර හිතකාමී නිර්මිත පරිසරයේ ද විවිධත්වය අගය කරමින් ඒවායේ චමත්කාරය වින්දනය කළ හැකි, නිරෝගී දිවි පැවැත්මක් සඳහා වන හැසිරීම් හා සමාජ සංවේදී සබඳතා සහිත, අතීත උරුමයෙන්, දේශීය ඥානයෙන් පෝෂණය වූ, නවෝත්පාදන මානසිකත්වයෙන් හා ව්‍යවසායකත්ව කුසලතාවලින් හෙබි, විශ්ලේෂණාත්මක ප්‍රවේශයකින් අභියෝගවලට මුහුණ දීමට හැකි පුද්ගලයෙකු බිහි කිරීම.

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය අභිමතාර්ථ

- ජීවී හා අජීවී පරිසරයේ විවිධත්වය අගය කරමින් එය ආරක්ෂා කිරීම.
- ජීවී හා අජීවී පරිසරය කෙරෙහි සංවේදී ව කටයුතු කිරීම.
- උදවු උපකාර කළ යුතු පුද්ගලයින් පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම.
- පරිසරයේ අපූර්වත්වය සෞන්දර්යාත්මක ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීම.
- එකිනෙකාගේ අවශ්‍යතා පිළිබඳ සංවේදී ව අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ව ක්‍රියා කිරීම.
- පරිසරය පිළිබඳ විද්‍යාත්මක ප්‍රවේශයකින් යුතු ව විමසිලිමත් වීම.
- පරිසර ගවේෂණය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රියාවලියට අදාළ කුසලතා සංවර්ධනය වීම.
- පාරිසරික සංසිද්ධි හේතුවෙන් සිදුවන පරිසර වෙනස්කම්වලට අනුගත වීමේ වැදගත්කම පිළිබඳ ආකල්ප සංවර්ධනය වීම.
- සමාජ යහපැවැත්ම සඳහා වන ආචාරශීලී භාෂා හැසිරවීමට යොමු වීම.
- පුද්ගලයින්ගේ විවිධත්වය අනුව සංයමයෙන් යුතු හැසිරීම් පවත්වා ගැනීම.
- විවේකය විනෝදය සහ ශරීර සුවතාව ඵලදායි ලෙස යොදා ගැනීමෙන් සැහැල්ලු මානසිකත්වයක් ගොඩනැගීම.
- විවේකය, විනෝදය සහ ශරීර සුවතාව අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා ජීවිතයට මුසු කර ගැනීම.
- සතුන්, ශාක සහ ස්වභාවික සම්පත්වල විවිධත්වයෙන් මතුවන සුන්දරත්වය පිළිබඳ යහපත් ආකල්ප ගොඩනගා ගැනීම.
- සුවබර දිවි පැවැත්මක් සඳහා පාරිසරික සුන්දරත්වය රැක ගනිමින් සීමිත අවකාශයක ඵලදායි පරිසරයක් නිර්මාණය කිරීම.
- අතීත උරුම රැක බලාගෙන අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳ ආකල්ප ගොඩනගා ගැනීම.
- අභියෝගවලට මුහුණ දීමේ දී දේශීය ඥානයෙන් (Indigenous practices) යුතු භාවිත උපයෝගී කර ගැනීමේ මානසික සැඳුමක් (mindset) ගොඩනගා ගැනීම.
- නවෝත්පාදන සහිත සක්‍රීය දායකත්වයක් දක්වමින් අනාගත වැඩ ලෝකයට ව්‍යවසායකයෙකු ලෙස පිවිසීමට පදනමක් ගොඩනැගීම.

## තේමා

## 1 ශ්‍රේණිය සහ 2 ශ්‍රේණිය

| අනු අංකය | තේමාව | වාරය |
|---|---|---|
| 1 | අපේ පාසල<br>Our School | I වාරය |
| 2 | අපේ ගෙදර<br>Our Home | |
| 3 | ශාක හා ආහාර බෝග<br>Plants and Food Crops | |
| 4 | අපේ උරුමය<br>Our Heritage | |
| 5 | අපේ සුව පැවැත්ම<br>Our Wellbeing | II වාරය |
| 6 | අපේ සත්ත්ව ලෝකය<br>The World of Animals | |
| 7 | ජල සම්පත<br>Water Resource | |
| 8 | පොළව හා අහස<br>The Earth and Sky | |
| 9 | අපේ රටේ සම්පත්<br>Resource of Our country | III වාරය |
| 10 | ගමන් බිමන්<br>Traveling | |
| 11 | තොරතුරු හුවමාරුව<br>Communication | |
| 12 | අපේ වැඩට ශක්තිය<br>Energy | |

## මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනයට උපදෙස්

මෙය මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සඳහා වන ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කළ යුත්තේ කෙසේ ද යන්නට මග පෙන්වීමකි.

මූලික විද්‍යාව හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය ප්‍රාථමික විෂයමාලාවේ තවත් එක් ප්‍රධාන විෂයකි. සිසුනට සමීප භෞතික, ජෛව මෙන් ම සමාජ පරිසරය කෙරෙහි අවධානය යොමු කරමින් තේමා 12ක් හඳුනා ගෙන ඇති අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් සමූහයක් ඉදිරිපත් කර ඇත. මෙම විෂය සඳහා ගුරුවරයාට තිබෙන එක ම මූලාශ්‍රය වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශය පමණි. පරිසරය කෙරෙහි සංවේදී වීම, පරිසර ගවේෂණය, පරිසරය සඳහා විද්‍යාත්මක ප්‍රවේශය, සෞන්දර්යාත්මක සංවේදීභාවය හා වින්දනාත්මක ප්‍රකාශනය, පරිකල්පනය හා නිර්මාණශීලිත්වය, ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම්, සෞඛ්‍යය හා පෝෂණය, පුද්ගල යහපැවැත්ම සහ ධනාත්මක සමාජ සබඳතා වැනි විෂය ක්ෂේත්‍ර කිහිපයකින් සමන්විත වූ මෙම විෂය සමෝධානිත මෙන් ම සම්බන්ධීකරණ විෂයක් ලෙස පුළුල් විෂය පරාසයක් ආවරණය කරමින් නිර්මාණය වී ඇත. මෙම සියලු කොටස් පිළිබඳ ගුරුවරයා මනා අවබෝධයකින් යුතු ව කටයුතු කිරීම වැදගත් වේ.

නිර්මාණශීලී ගුරුවරයෙකුට මෙහි අන්තර්ගත ක්‍රියාකාරකම්වලට පමණක් සීමා නොවී නව ක්‍රියාකාරකම් සැලසුම් කර, සිසුනට වඩාත් ඵලදායී ඉගෙනුම් අවස්ථා උදා වන අයුරින් කටයුතු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශය තුළ අවශ්‍ය තරම් ඉඩ ප්‍රස්ථා ලබාදී ඇත.

මිල දී ගනු ලබන ඉගෙනුම් සම්පත් වෙනුවට හැකිතාක් තම අවට පරිසරයෙන් සපයා ගත හැකි ස්වභාවික සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. තවද අන්තර්ගත ක්‍රියාකාරකම්වලට ගැළපෙන විවිධ ඉගෙනුම් ක්‍රම භාවිත කරමින් සිසුන් ක්‍රියාකාරී ව සුතත්‍ය (Authentic Learning) ඉගෙනුමක් තුළින් වින්දනාත්මක ව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් සම්පාදනය කරගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

තවද, නව විෂයමාලාවේ වෙනස නිවැරදි ව හඳුනා ගනිමින් ඊට අනුරූපී ව පහළ චින්තන හැකියාවේ සිට ඉහළ චින්තන හැකියාව වෙත සිසුන්ගේ චින්තනයේ පරිවර්ථනීය වෙනසක් කරමින් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම ඉතා වැදගත් ය. ඒ සඳහා පහත දැක්වෙන බ්ලූම්ගේ ඉගෙනුම් පිරමීඩය උපයෝගී කරගත හැකි ය. ඒ සඳහා ගුරු මාර්ගෝපදේශයේ දැක්වෙන පවසන්න, කතාබහ කරන්න, සාකච්ඡා කරන්න, පෙන්වා දෙන්න, විමසිලිමත් වන්න, සහාය වන්න, අවස්ථාව දෙන්න වැනි ගුරු උපදෙස් කෙරෙහි ගුරුවරයාගේ චින්තනය මෙහෙයවීම අත්‍යවශ්‍යය.


උදා : තේමාව - ජල සම්පත

ගුරු මාර්ගෝපදේශයේ උපදෙස - **'ජලය කාන්දු වන කරාමයක් දකින ඕනෑම අවස්ථාවක එය වසා දැමීමට කටයුතු කිරීම තම ජීවන පුරුද්දක් බවට පත්කර ගැනීමට සිසුන්ට සහාය වන්න.'**
මෙම උපදෙස නිර්මාණශීලී ගුරුවරයෙකුගේ ඉහළ චින්තන හැකියා ගොඩනැන්වීමේ ප්‍රවේශයයි.
'ඔබ ජල කරාමයකින් කාන්දුවන ජල බින්දුවක් නම් -

- එම කරාමය දැක වසා දමන කෙනෙකුට ඔබ කියන්නේ මොනවා ද?
- ඕනෑ ම තැනක, ඕනෑ ම ජල කරාමයක ජල බින්දු කාන්දු වන විට පුරුද්දක් ලෙස එම කරාම වසා දමන කෙනෙකු අගය කරමින් කියන්නේ මොනවා ද?

ගුරු මාර්ගෝපදේශයට අනුව තේමා ක්‍රියාත්මක කිරිමට පෙර, ඉහත සඳහන් ආකාරයේ උපදෙස් ඇති

අවස්ථා ගුරු මාර්ගෝපදේශයෙන් තෝරා කියවන්න. ඒවා අතරින් ඉහළ චින්තන හැකියා වර්ධනය කිරීමට සුදුසු අවස්ථා තෝරා ගන්න. එම අවස්ථා ඇසුරෙන් ඉහළ චින්තන හැකියා සිසුන් තුළ වර්ධනය කිරීමට යෝග්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ භාවිත කිරීමට කටයුතු කරන්න.




උසස් චින්තන හැකියා
**Higher order Thinkinkg**

**තේමාව - ජල සම්පත**
ගුරු මාර්ගෝපදේශයේ උපදෙස - **'ජලය, කාන්දු වන කරාමයක් දකින ඕනෑ ම අවස්ථාවක එය වසා දැමීමට කටයුතු කිරීම තම ජීවන පුරුද්දක් (ජීවන නිපුණතා සංවර්ධනය සඳහා) බවට පත්කර ගැනීමට සිසුන්ට සහාය වන්න.**
සාමාන්‍ය ගුරුවරයෙකු ලෙස හුදෙක් සිසුන් ට උපදෙස් දීමකින් තොර ව නිර්මාණශීලී ගුරුවරයෙකු ලෙස සිසුන් ඉහළ මට්ටමේ චින්තනයට යොමු කිරීම තුළින් මෙය **ජීවන පුරුද්දක්** බවට පත් කළ හැකි ය.
උදා
**'ඔබ ජලකරාමයකින් කාන්දුවන ජල බින්දුවක් නම් -**
පියවර 1 -එම කරාමය දැක වසා දමන කෙනෙකුට ඔබ කියන්නේ මොනවා ද?
පියවර 2 -ඕනෑ ම තැනක ඕනෑ ම කරාමයක ජල බින්දු කාන්දු වන විට පුරුද්දක් ලෙස එම කරාම වසා දමන කෙනෙකු අගය කරමින් ඔබ කියන්නේ මොනවා ද?

ගුරු මාර්ගෝපදේශයට අනුව තේමා ක්‍රියාත්මක කිරීමට පෙර, ඉහත සඳහන් පියවර 1 ආකාරයේ උපදෙස් ඇති අවස්ථා ගුරු මාර්ගෝපදේශයෙන් තෝරා කියවන්න. ඒවා අතරින් ද ඉහළ චින්තන හැකියා වර්ධනය කිරීමට සුදුසු අවස්ථා තෝරා ගන්න. එම අවස්ථා ඇසුරෙන් ඉහළ චින්තන හැකියා සිසුන් තුළ වර්ධනය කිරීමට යෝග්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ සිතා බලමින් සිසුන්ට චින්තනයේ යෙදීමට අවස්ථාව ලබාදෙන්න. සිසුන් සිතූ දේ ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසන්න. ඉන් පසු ඒවා සිසුන්ගේ චරිතායනට යොමු කරන්න.

සෞන්දර්යාත්මක සංවේදීභාවය හා වින්දනාත්මක ප්‍රකාශනය කෙරෙහි ද වැඩි අවධානය යොමු කරමින් ඒ සඳහා සතියකට පැයක පමණ කාලයක් පළමු වන ප්‍රධාන අවධිය සඳහා ලබා දී ඇත. මේ ආකාරයට දෙවන හා තෙවන ප්‍රධාන අවධියට ද සතියකට පැයක් වන පරිදි අතිරේක කාලයක් ලබා දී ඇත්තේ ප්‍රාථමික අවධියට පසු ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශයක් ලෙස විධිමත් ව සෞන්දර්යාත්මක කුසලතා සංවර්ධනය කිරීමට ය.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, මූලික විද්‍යාව හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී මෙන් ම ගණිත විෂයයේ දී භාවිත කිරීමට ඔබට අවස්ථා සලසා ඇත. ඉංග්‍රීසි භාෂාව සිසුන්ට හුරු කිරීම සඳහා එදිනෙදා භාවිතයට ගැනෙන වචන සහ වගන්ති මූලික විද්‍යාව හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට

අදාළ තේමා යටතේ පෙර පරිදි ගොනුකර ඇත. දෙවන ජාතික භාෂාව (දෙමළ) භාවිතය පිළිබඳ ව ද විෂය නිර්දේශය සහ ක්‍රියාකාරකම් ගුරු මාර්ගෝපදේශයෙහි ඊට අදාළ මගපෙන්වීමක් කර ඇති අතර එය උචිත පරිදි ගළපා ගනිමින් හා සංවිධානය කර ගනිමින් සිසුන්ට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ක්‍රියාකරකම් පාදක වාචික ඉංග්‍රීසි සහ දෙවන ජාතික භාෂාව යන කොටස් ඉගැන්වීමේ දී උචිත ඉගෙනුම් සම්පත් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

අවිධිමත් මෙන් ම විධිමත් ව සිදු කරන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තුළින් හඳුනා ගැනෙන සිසු ප්‍රබලතා හා දුබලතාවලට දෛනික ව සිදු කරන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවශ්‍ය මග පෙන්වීම් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසු තක්සේරු කිරීමට අදාළ තක්සේරු නිර්ණායක ඇතුළත් පත්‍රිකා **(RUBRICS)** මෙම ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කර ඇත.

මෙම කාර්යයේ සාර්ථකත්වය සඳහා ඒ ඒ විෂයන්ට අදාළ ව කාලය වෙන් කර ඇති අතර එම කාලය උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා ගුරුවරයා කටයුතු කළ යුතු වේ.

**එස්. එම්. සඳමාලි දේශප්‍රිය**
විෂයමාලා සම්බන්ධීකරණ නිලධාරී,
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

# 1 තේමාව - අපේ පාසල

අපේ පාසල තේමාව තුළින් විධිමත් පාසලට ප්‍රවේශ වන දරුවාට, පන්ති කාමරය හා පාසල් භූමිය පිළිබඳ අද්දැකීම් ලබා ගැනීමට මෙන් ම පාසලේ සිසුන් වෙනුවෙන් සේවා සපයන හා වගකීම් ඉටු කරන පුද්ගලයන් හඳුනා ගැනීමටත්, පාසල් සංස්කෘතිය පිළිබඳ අවබෝධය ලබා දීමටත් අපේක්ෂා කෙරේ. තව ද සිසුන්ට හැකි අයුරින් පන්ති කාමර පරිසරය හා පාසල් භූමිය පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීමට අවශ්‍ය මූලික හුරුකම් ලබා දීමත් අරමුණු කරගෙන මෙම තේමාව සකස් කර ඇත.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. පන්ති කාමරයේ සිටින අන් අය සමග සුහද ලෙස අදහස් හුවමාරු කර ගනියි. | ◆ පන්ති භාර ගුරුවරයාගේ නම | 1.1 පන්තිභාර ගුරුවරයාගේ නම නිවැරදි ව ප්‍රකාශ කරයි. | 1.1.1 නම නිවැරදි ව ප්‍රකාශ කිරීම. |
| | ◆ යහළුවන් කිහිප දෙනෙකුගේ නම් | 1.2 යහළුවන් කිහිප දෙනෙකුගේ නම් නිවැරදි ව ප්‍රකාශ කරයි. | 1.2.1 නම් නිවැරදි ව ප්‍රකාශ කිරීම. |
| | ◆ තමාගේ නම, ගම සහ වයස | 1.3 තමාගේ නම, ගම සහ වයස නිවැරදි ව ප්‍රකාශ කරයි. | 1.3.1 නම, ගම සහ වයස නිවැරදි ව ප්‍රකාශ කිරීම. |
| | ◆ පන්තියේ සිසුන් හා ගුරුවරයා සමඟ යහපත් අන්තර්සම්බන්ධතා | 1.4 පන්තියේ සිසුන් හා ගුරුවරයා අතර යහපත් අන්තර්සම්බන්ධතා ප්‍රදර්ශනය කරයි. | 1.4.1 යහපත් අන්තර්සම්බන්ධතා ප්‍රදර්ශනය කිරීම. |

## ක්‍රියාකාරකම් 1

### පියවර 1

- ගුරුවරයා පිළිබඳ අදහසක් කියැවෙන සරල ගීතයක්/නිර්මාණය කරගත් කවියක් සිසුන් සමග ගායනා කරන්න.

  උදා : උදෙන් ම පාසලට ඇවිත්
  ආදරයෙන් සිත සනසන
  සිනා සෙමින් කථා කරන
  අපේ ගුරුතුමී ලස්සන අපේ ගුරුතුමී/අපේ ගුරුතුමා ලස්සන අපේ ගුරුතුමා ///

- ගීතය අවසානයේ කියවෙන්නේ කවුරුන් ගැන ද යන්න විමසන්න.
- ගුරුවරයා තමා පිළිබඳ කෙටි හැඳින්වීමක් ඉදිරිපත් කරන්න.
  - ° තමාගේ නම
  - ° තමා කැමති ම දේ මෙන් ම සිසුන්ට ආදර්ශයක්/ප්‍රබෝධයක් ඇති වන අදහසක් ප්‍රකාශ කරන්න.

  උදා: මම උදෙන් ම අවදි වෙනවා,
  කම්මැළි නැතුව දවසෙ වැඩ සතුටින් කරනවා,
  දිනපතා ම පාසල් එනවා

- මෙහිදී ගුරුවරයා තමා සතු හැකියාවක් ඉදිරිපත් කරන්න. (ගීතයක්, නැටුමක්, චිත්‍ර, කවියක්.......වැනි)
- එසේ ම පාසල තුළදී සිසුන් ආදරයෙන් බලා ගන්නේ තමා බවත්, හැම විට ම තමා සියලු ම සිසුන් ආරක්ෂා කරන බවත්, කිසියම් ප්‍රශ්නයක්, කරදරයක් තිබේ නම් නොබිය ව ගුරුවරයාට පැවසිය යුතු බවත් ආදරණීය ව සිසුන්ට පවසන්න.

- පන්ති කාමරය දෙපස/අසල්වැසි පන්තියේ ගුරුවරයා හඳුනා ගැනීම ද මේ අවස්ථාවේ දී ම සිදු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 1 සඳහා සිසුන් යොමු කරන්න.

### පියවර 2

- සිසුන් සියලු දෙනා සමග ඉඩකඩ ඇති ස්ථානයකට යන්න.
- "අපි දැන් සෙල්ලමක් කරමු" යැයි පවසමින් සංඥාවකට අනුව සිසුන්ට නිදහසේ දිවීමට උපදෙස් දෙන්න.
- ඊළඟ සංඥාව ලබා දීමත් සමග ම තමා ළඟ සිටින යහළුවාගේ අතින් අල්ලා ගැනීමට පවසන්න.
- අත් අල්ලාගත් දෙදෙනා එකිනෙකාගේ නම පවසමින් හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න. (මගේ නම, මගේ ගම, වයස ..........)
- මෙලෙස කිහිප වාරයක් සිසුන් මෙම ක්‍රීඩාවේ යොදවන්න.
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි හා දෙවන ජාතික භාෂාව විෂයයන්වලදී නම ප්‍රකාශ කරන ක්‍රියාකාරකම ද මෙහිදී භාවිතයට ගන්න.
- ඉන් පසු පහත සඳහන් කවිය අනුව තාල තබමින් ගායනා කරන්න.
- මෙම කවියෙන් කියවෙන අදහස සිසුන්ට හැඟීම් දනවන ආකාරයට පහදා දෙමින් **මිත්‍රත්වය හා සුහදශීලීබව සැමදා පවත්වා ගැනීමේ වැදගත්කම** පෙන්වා දෙන්න.

යාළුයි අපි යාළුයි
හැමදාමත් යාළුයි
හැම දෙනාට උදවු කරන
පුංචි යාළුවෝ

යාළුයි අපි යාළුයි
හැමදාමත් යාළුයි
එකමුතු වී වැඩ කරනා
පුංචි යාළුවෝ

### පියවර 3

- පාසල පිළිබඳ ධනාත්මක හැඟීමක් ඇති කරවීම සඳහා පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.

උදා :
  - හොඳින් ඉගෙන ගැනීමට
  - අලුත් දේ සොයා බැලීමට
  - සතුටින් කාලය ගත කිරීමට
  - යහළුවන් හඳුනා ගැනීමට
  - පාසල රැක ගැනීමට

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. පාසල් භූමියේ තිබෙන සුවිශේෂ ස්ථාන හඳුනා ගෙන යෝග්‍ය පරිදි හා ආරක්ෂාකාරී ව කටයුතු කරයි. | ◆ භාණ්ඩ හා උපකරණ පරිහරණය<br><br>◆ පන්ති කාමරය අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගැනීම | 2.1 පන්ති කාමරයේ දී එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි. | 2.1.1 භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව හා ආරක්ෂාකාරී ව භාවිත කිරීම |
| | | 2.2 පන්ති කාමරය අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගැනීමට දායක වෙයි | 2.2.1.අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගැනීමට දායක වීම |

## ක්‍රියාකාරකම් 2

### පියවර 1

- සිසුන්ට පන්ති කාමරයේ ඇති දේවල් හඳුන්වා දෙන්න.
  උදා: මේ ගුරුවරයාගේ පුටුව හා මේසය - මේක තියෙන්නේ ගුරුවරයාට
  මේ තියෙන්නේ ඔබේ (සිසුන්ගේ) ඩෙස් හා පුටු - මේවා තියෙන්නේ පුංචි ඔයාලට

- මෙලෙස භාණ්ඩ හා උපකරණ කිහිපයක් හඳුන්වා දෙන්න.

- එම භාණ්ඩවල හා උපකරණවල ඇති වැදගත්කම, අප ඒවා ඉතාමත් පිරිසිදු ව හා පරෙස්සමෙන් පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

### පියවර 2

- සැම දිනක ම පන්තිය තුළ සිදු වන ක්‍රියාකාරකම්වලදී ඉහත හඳුනා ගත් භාණ්ඩ හා උපකරණ ඇතුලු පන්ති කාමර පරිසරය පිරිසිදු ව පවත්වා ගැනීමට එකඟතාවන් කිහිපයක් සිසුන් සමග සාකච්ඡා කරමින් ගොඩනඟා ගන්න.
  උදා:
  - ඉවත දමන දෑ කසළ බඳුනට දැමීම

- ගොඩනඟා ගත් එකඟතා පිළිබඳ අතපසු වීම් සිදු වූ විට ඒවා නිවැරදි කර ගැනීමට සඳහා සිසුන්ට මග පෙන්වීම සිදු කරන්න.
  උදා: පැන්සලක් උල් කර එහි කුඩු බිමට දැමීම... වැනි අවස්ථාවකදී එය නිවැරදි කර ගැනීමට යොමු වීම


- මෙහිදී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයේ භාවිත වන Bits of paper ගීතය යොදා ගත හැකි ය.


## ක්‍රියාකාරකම් 3

### පියවර 1

- පන්ති කාමරය පිරිසිදු කිරීම සඳහා (සිසුන්ට හැකි අයුරින්) මුව ආවරණ, අත්වැසුම් හා ඉවත ලන රෙදි කැබලි (දූවිලි පිස්නාවක්) වැනි දේ ගෙන ඒමට පෙර දින සිසුනට උපදෙස් දෙන්න.

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- සෑම වැඩකදී ම පිරිසිදුකම හා පිළිවෙළ පවත්වා ගන්නා අයුරු **ජපන් 5 – s සංකල්පය** වැනි සංකල්පවල ප්‍රායෝගික ව සිසුන් සමග යෙදීමෙන් පෙන්වා දෙන්න.



  - සු - සුපසන්බව (අනවශ්‍ය දේවල් ඉවතට ගෙන පරිසරයට හානියක් නොවන පරිදි බැහැර කරන්න)
  - පි - පිළිවෙළට තැබීම (අවශ්‍ය දේ පරිහරණය ට ගත හැකි ලෙස පිළිවෙළට තබන්න.)
  - පි - පිරිසිදුකම (කුණු රොඩු කිසිවක් නොතිබෙන ලෙස සම්පූර්ණයෙන් පිරිසිදු ව තබන්න)
  - අ - අඛණ්ඩ ව පවත්වා ගෙන යාම (සෑම විට ම යහපත් පාලනයක් සහ මනා පිළිවෙළක් සහිත ව තබා ගැනීම)
  - පි - පිරිපුන්බව (මනා පාලනය පිළිබඳ විනය රීති අනුගමනය කිරීමට ජනතාව පුහුණු කිරීම)

- එදිනෙදා තමන්ගේ මේසය, පොත් රාක්ක දූවිලි පිස්නාවෙන් පිස දැමීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- වැඩ අවසන් කළ පසු එම උපකරණ ද නිසි ආකාරයට පිරිසිදු කර නැවත නියමිත ස්ථානවල තබන අයුරු ආදර්ශනය කරන්න.

- පන්තිය පිරිසිදු කිරීමෙන් පසු ව ඒ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න. නිවසේදී ද එලෙස සිදු කිරීමට දිරිමත් කරන්න.

- සිසුන්ගේ උත්සාහය අගය කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 2 සඳහා සිසුන් යොමු කරන්න.

### පියවර 2

- "අපේ පන්තිය  ලස්සන කරන්න මොනව ද අපට කරන්න පුළුවන්" සිසුන් සමග සාකච්ඡා කරමින් පන්තිය ලස්සන කිරීමට විවිධ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

- එම යෝජනා අගය කරමින් බිත්ති සැරසිල්ලක් නිර්මාණය කිරීමට සැලසුම් කර ගන්න.

- මේ සඳහා ඉවත ලන කඩදාසි කැබලි, බයින්ඩර් ගම්, කතුරු භාවිත කරමින් සිසුන්ට නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. (කේවල හෝ සමූහ හෝ නිර්මාණයකට යොමු විය හැකි ය.)

- සිසුන්ගේ උත්සාහය අගය කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 පාසල් භූමියේ තිබෙන සුවිශේෂ ස්ථාන හඳුනා ගෙන යෝග්‍ය පරිදි හා ආරක්ෂාකාරී ව කටයුතු කරයි. | ◆ පාසල් භූමියේ තිබෙන සුවිශේෂ ස්ථාන<br>° හඳුනා ගැනීම<br>° ආරක්ෂාව හා පරෙස්සම<br>◆ ස්ථානයක/ උපකරණයක ආකෘතියක් ගොඩනැගීම | 3.1 පාසල් භූමියේ සුවිශේෂී ස්ථාන හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 සුවිශේෂී ස්ථාන හඳුනා ගෙන නම් කිරීම |
| | | 3.2 පාසල් භූමියේදී ආරක්ෂිතව හා පරෙස්සමින් කටයුතු කරයි. | 3.2.1 ආරක්ෂිත ව හා පරෙස්සමින් කටයුතු කිරීම |
| | | 3.3 පාසල් භූමියේ සිත්ගත් ස්ථානයක/ උපකරණයක ආකෘතියක් ගොඩනගයි. | 3.3.1 ආකෘතියක් ගොඩනැගිම |

## ක්‍රියාකාරකම් 4

### පියවර 1

- සිසුවා පාසලට පැමිණෙන විට පාසලට ඇතුළු වන ගේට්ටුවේ සිට පන්ති කාමරය තෙක් ගමන් කරන අතර මගදී දකින්නට ලැබෙන ස්ථාන හඳුනා ගැනීමට නිරීක්ෂණ චාරිකාවක් සංවිධානය කරන්න.

පාසල් ගේට්ටුව → පන්ති කාමරය

- පාසල් ගේට්ටුවේ සිට පන්ති කාමරය දක්වා ගමන් මාර්ගයේදී දක්නට ලැබුණ සුවිශේෂී තැන් පිළිබඳ විමසන්න

### පියවර 2

- ඔබගේ පාසලේ ඇති පහත සඳහන් ස්ථාන නිරීක්ෂණය සඳහා සැලසුම් සකස් කර ගන්න. විදුහල්පති කාර්යාලය, පුස්තකාලය වැනි විශේෂ ස්ථාන නිරීක්ෂණයට පෙර ඒ හා අදාළ පුද්ගලයන් දැනුවත් කිරීම සිදු කරන්න.

  - විදුහල්පති කාර්යාලය
  - බුදු මැදුර /ආගමික ස්ථාන
  - පුස්තකාලය
  - ක්‍රියාකාරකම් කාමරය
  - සෙල්ලම් මිදුල / ක්‍රීඩා පිට්ටනිය
  - සංගීත / නැටුම් කාමරය
  - පාසල් කොඩිය හා කොඩි ඔසවන ස්ථානය ආදි

- එම ස්ථාන හා පුද්ගලයන් පිළිබඳ මූලික හැඳින්වීමක් සිසුන්ට වැටහෙන පරිදි සරල ව පැහැදිලි කරන්න.

- සෙල්ලම් මිදුල නිරීක්ෂණය කරන අවස්ථාවේදී ඔවුන්ට නිදහසේ සෙල්ලම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- එහි ඇති උපකරණ හඳුන්වා දෙමින් සිසුන් ලැබූ අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- චාරිකාව අතරතුර දී පාසලේ අනතුරු සිදු විය හැකි ස්ථාන තිබේ නම් ඒවා පෙන්වා දෙන්න.

  උදා :
  - මාර්ගයේ කැඩී බිඳී ගිය ස්ථානයක්
  - දිය සෙවල සහිත ලිස්සන සුලු ස්ථානයක්
  - අනාරක්ෂිත වන ලැහැබක් (සතුන් ගැවසෙන ස්ථානයක්)
  - පාසලේ ඉපැරණි ගොඩනැගිල්ලක්
  - පරිහරණය නොකරන (පාළු) ළිං
  - දිරාපත් වූ අතු සහිත විශාල ගස්
- පාසලේ අනතුරු සිදු විය හැකි ස්ථාන ආරක්ෂිත ස්ථාන බවට පත් කර ගැනීමට එම අවස්ථාවේදී ම තමන්ට කළහැකි දෙයක් ඇත්නම් එය සිදු කිරීමට සිසුන් යොමු කරන්න.

  උදා:
  - වතුර රැඳී ඇති මඩ හෝ දිය සෙවෙල් හෝ සහිත ස්ථාන බුරුසුවකින් මැදීම.
  - කාණු අසල/යන එන ගමන් මාර්ගයේ කකුලේ වදින ගල්/ කුණුරොඩු ඇත්තම් ඉවත් කිරීම

- පරෙස්සම් විය යුතු අවස්ථා පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. එම ස්ථානවල දී පරෙස්සම් විය යුතු අයුරු සාකච්ඡා කරන්න

  උදා :
  - සෙල්ලම් මිදුලේ දී (ඔංචිල්ලාව ඉදිරිපස හෝ පිටුපස හෝ සිට ගැනීම. යකඩ බට මළ බැඳී ඇති දැයි සොයා බැලීම. සමබරතාවය පවත්වා ගනිමින් සීසෝව පැදීම සඳහා ගැළපෙන සිසුන් යොමු කිරීම. .............වැනි)
  - ජල කරාම/ළිඳ අසල දී
  - පිවිසුම් දොරටුවේ දී

- මෙම නිරීක්ෂණ චාරිකාව අවසානයේදී සිසුන් ලබා ගත් අද්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා සුහද සාකච්ඡාවක් ගොඩනගන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 3හි ඇතුළත් රූප ඇසුරෙන් කථාබහක නිරත වෙන්න.

## ක්‍රියාකාරකම් 5

- නිරීක්ෂණ චාරිකාවෙන් පසු, සිසුන් සුදුසු පරිදි කුඩා කණ්ඩායම්වලට වෙන් කර තමා දුටු පාසලේ කැමති ම ස්ථානය හෝ එහි ඇති උපකරණයක්, ක්ලේ/ මැටි/ පිටි මෝලි (play dough) වැනි ඕනෑම දෙයක් යොදා ගනිමින් සකස් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන්ට තම ඇඟිලි හොඳින් හසුරවමින් නිදහසේ නිර්මාණකරණයේ යෙදීමට අවකාශය සපයන්න.

- තම නිර්මාණය පන්තියට හඳුන්වා දෙමින් ඒ පිළිබඳ තමාට හැඟෙන අයුරින් කෙටි විස්තරයක් පැවසීමට සිසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

- සිසු නිර්මාණ අගය කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 පාසලේදී සේවා සපයන පුද්ගලයන් හඳුනා ගනියි. | ◆ පාසලේ වගකීම් දරන පුද්ගලයින් | 4.1 පාසලේ විවිධ වගකීම් දරන පුද්ගලයින් හඳුනා ගනියි. | 4.1.1 පාසලේ වගකීම් දරන පුද්ගලයින් නම් කිරීම |

## ක්‍රියාකාරකම් 6

### පියවර 1

- ඔබගේ පාසල තුළ විශේෂ සේවාවන් කරන පුද්ගලයන් කිහිප දෙනෙක් හඳුනා ගන්න.

  උදා

  - විදුහල්පති
  - ප්‍රාථමික අංශ භාර විදුහල්පති / ගුරුවරයා
  - ආසන්න පන්ති කාමර දෙකක ගුරුවරු
  - සනීපාරක්ෂක කම්කරු
  - පාසල් මුරකරු/ආරක්ෂක නිළධාරී

- ඒ සඳහා පහත පරිදි පෙර සූදානම් සකසා ගන්න.

- කැමති ද්‍රව්‍ය යොදා ගනිමින් සිසු සහාය ඇති ව ආරාධනා පත්‍ර අවශ්‍ය ප්‍රමාණයට සකසා ගන්න.

- හමු වීමට බලාපොරොත්තු වන සැම දෙනාට ම පෙර දැනුම් දීමක් කරන්න. හමු වී සාකච්ඡා කරන දේ හා කරන ක්‍රියාකාරකම් කෙසේ කළ යුතු ද යන්න පිළිබඳ ව අදාළ පුද්ගලයන් දැනුවත් කරන්න. හැකි නම් ඔවුන් පන්ති කාමරය වෙතට කැඳවා ගෙන එන්න. නැතහොත් අදාළ ස්ථානයේ දී හමුව යොදා ගන්න.

- ඉන් අනතුරු ව සැකසූ ආරාධනා පත්‍ර සිසුන් සමග අදාළ අයට ලබා දෙන්න.

- ආරාධිතයන් ගෞරවයෙන් පිළිගනිමින් ඒ එක් එක් අය ආදරණීය ව සිසුන්ට හඳුන්වා දෙන්න. බුලත් හුරුලක්/ මල් කිනිත්තක් වැනි දෑ පිළිගැනීම සඳහා සූදානම් කර ගන්න.

- ඔවුන් සමග සුහද කතා බහක යෙදෙන්න. ඒ අයගෙන් පාසලට හා සිසුන්ට වන සේවය පිළිබඳ ඉතා කෙටියෙන් හැඳින්වීමක් කළ හැකි ය.

- මේ අතර සිසුන්ට ද යම් යම් ප්‍රශ්න ඇසීමට, සිසු ඉදිරිපත් කිරීමකට අවස්ථාව සලසා දෙන්න.

- මුරකරු/ ආරක්ෂක නිළධාරී හමුවේදී විශේෂයෙන් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

උදා :

  - සිසුන් පාසලට පැමිණිය යුතු හා පාසලෙන් පිට විය යුතු වන්නේ කුමන දොරටුවෙන් ද යන වග
  - පාසලට ඇතුළු වූ පසු අත් සේදීම කළ යුතු බව (පවතින තත්ත්වයන් මත)
  - කිසිදු අවස්ථාවක කිසිවෙකුට නොදන්වා පාසලෙන් පිටවීම නොකළ යුතු බව
  - ඔබගේ මව/පියා/භාරකරු යන දරුවන් ගෙන යාමට සැමදා ම පාසලට පැමිණෙන අය සමග පමණක් පාසලෙන් පිටවිය යුතු බව
  - නොහඳුනන අයෙක් අඬගැසුවහොත් පිටතට නොයා අදාළ අය දැනුවත් කළ යුතු බව

- එම සාකච්ඡාවෙන් පසු මුරකරුට ස්තුති කිරීම සඳහා සිසුවෙකුට අවස්ථාව ලබාදෙන්න.

පියවර 2

- සිසුන් සමග වැසිකිළි ඇති ස්ථානයට යන්න.

- එම අවස්ථාවේ සිසුන්ට දැනුන දේ විමසන්න.

- සිසු අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සනීපාරක්ෂක කම්කරු පිරිසිදුබව හොඳින් පවත්වා ගැනීම වැනි අදහස් ප්‍රකාශ කරන්නේ නම් ඒ පිළිබඳ සිසුන්ට පැහැදිලි කරන්න.
    - වැසිකිළි පවිත්‍ර ව තබා ගැනීමේ වැදගත්කම
    - අපවිත්‍ර වන ආකාරය
    - ඒ සඳහා සිසුන්ට කළ හැකි දේ
    - වැසිකිළි පවිත්‍රතාවයට හේතු වී ඇති අඩුපාඩු සාකච්ඡා කරන්න.
    - සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- ඉන්පසු වැසිකිළිය භාවිතයේදී සිදු කරන පහත සඳහන් සෑම දෙයක් පිළිබඳව ම ගුරුවරයා හා සනීපාරක්ෂක කම්කරු විසින් සිසුන්ට පැහැදිලි කිරීමක් කරන්න.

  උදා
    - වැසිකිළියේදී භාවිත කරන උපකරණ පරිහරණය කරන ආකාරය
    - වැසිකිළිය කාර්යයන් දෙකකට පාවිච්චි කරන බව
    - ඇඳුම අපවිත්‍ර නොවන පරිදි වැසිකිළි කැසිකිළි නිවැරදි ව භාවිත කරන ආකාරය
    - වැසිකිළි පෝච්චිය හා වැසිකිළි බිම පිරිසිදු කරන ආකාරය

- වැසිකිළිය භාවිත කිරීමෙන් පසු ;
    - තමා එහි දී පවිත්‍ර වන/පිරිසිදු වන ආකාරය
    - ජලය යොදන ආකාරය
    - අත් සබන් ගා සෝදා ගත යුතු ආකාරය

- මෙහිදී ගැහැනු, පිරිමි සිසුන් දෙපිරිස ම සිටිනවා නම් වෙන් වෙන් වශයෙන් ඔවුන්ට අදාළ වැසිකිළි අසලට ගෙන ගොස් පැහැදිලි කරන්න.

- මිශ්‍ර පාසලක් නම් ගැහැනු ළමුන්ගේ හා පිරිමි ළමුන්ගේ වැසිකිළි සඳහා සම්මත සංකේත දෙකක් ඇති බව රූප සටහන් මගින් හඳුන්වා දෙන්න. ( වැසිකිළි සඳහා සම්මත සංකේත දක්වා නොමැති පාසලක් නම් අදාළ සංකේත නියමිත ස්ථානයේ ඇලවීම මේ අවස්ථාවේ කිරීම යෝග්‍ය වේ.)

- තව ද පහත සඳහන් කරුණු පිළිබඳ ව ද සිසුන්ට හැඟෙන දැනෙන ආකාරයට පැහැදිලි කරන්න.
    - වැසිකිළි යන විට තම දෑතේ කිසිවක් රඳවා හෝ රැගෙන හෝ නොයා යුතු බව

  උදා පැන්සල්, යෝගට් කප්, ගල් කැට, ලී කැබලි, බෝතල්.........වැනි

    - වැසිකිළි පෝච්චියට ඉහත සඳහන් අනවශ්‍ය කිසිදු ද්‍රව්‍යයක් නොදැමිය යුතු බව
    - **සෑම දෙනාට ම එකසේ අවශ්‍ය වන වැසිකිළිය තවත් අයෙකුට යා හැකි වන සේ පිරිසිදු ව හා ප්‍රසන්න ව තබා ගැනීමේ වැදගත්කම පහදා දිය යුතු බව**
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 4හි ඇතුලත් රූප ඇසුරෙන් කථාබහක නිරත වෙන්න.

**වැදගත් - නිවසේ දී ද මෙම හොඳ පුරුදු නිවැරදි ව පවත්වා ගෙන යාමට සිසුන්ට උපදෙස් දෙන්න.**

- එම සාකච්ඡාවෙන් පසු සනීපාරක්ෂක කම්කරු මාමාට/නැන්දාට ට ස්තුති කිරීම සඳහා සිසුවෙකුට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට පාසල තුළදී තමන්ට සේවා සපයන, පාසලේ සේවය කරන පුද්ගලයින් හඳුනා ගත් පසු ගුරුවරයා විසින් පහත සඳහන් දේ පිළිබඳව ද ඉතා හොඳින් පැහැදිලි කරන්න.
    - ඔවුන් කරන විවිධ සේවාවන් තමන්ට හා පාසලට ඉතා වටිනා බව
    - ඔවුන්ගෙන් වන සේවය අගය කළ යුතු බව
    - ඔවුන්ට ගෞරව ලෙස කතා කළ යුතු බව

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5. පාසල තුළ ක්‍රියාත්මක වන ආචාර ධර්මවලට අනුගත වෙමින් කටයුතු කරයි. | ◆ පාසල තුළ ක්‍රියාත්මක වන<br>○ ආචාර ධර්ම | 5.1 පාසල තුළ ක්‍රියාත්මක වන ආචාර ධර්ම හඳුනා ගෙන අනුකූල චර්යා ප්‍රදර්ශනය කරයි. | 5.1.1 ආචාර ධර්මවලට අනුකූල චර්යා ප්‍රදර්ශනය කිරීම |

## ක්‍රියාකාරකම් 7

### පියවර 1

- පාසලේ උදෑසන රැස්වීම පවත්වන එළිමහනේ ඇති අදාළ ස්ථානය වෙත සිසුන් රැගෙන යන්න.

- එහිදී ආගම සිහි කිරීමේදී උපයෝගී කර ගන්නා ගාථා හෝ යාඥා පාඨ හෝ නිවැරදි ව උච්චාරණය කරමින් හා ගුරුවරයාගේ මූලිකත්වය ඇති ව ආගම සිහි කරන අයුරු ආදර්ශනය කරන්න. (තම ආගමකට ම අදාළ ව සිදු කරන ආගමික වතාවත් නිවැරදි ව කිරීම පිළිබඳ ආගම ගුරු මාර්ගෝපදේශ ඇසුරු කරගන්න.)

- ඉන් පසු ජාතික කොඩිය , පාසල් කොඩිය ඔසවන විට සිසුන් සිටිය යුතු ඉරියව්ව පිළිබඳ ගුරුවරයා විසින් ආදර්ශනය කර පෙන්වන්න.

- පාසල තුළ ක්‍රියාත්මක වන ආචාර ධර්ම පිළිබඳ සිසුන්ට හඳුන්වා දෙන්න.

  උදා
    - නිල ඇඳුම නිවැරදි ව ඇඳීම
    - පාසලට එන විට පාසල තුළ කටයුතු කිරීමේදී හා පිට වීමේදී ඇති ආචාර ධර්ම

- අදාළ පාසල් සංස්කෘතියට අනුව සිදු කෙරෙන කටයුතුවලදී ලබා ගත් ඡායාරූප/ වීඩියෝ පට පෙන්වමින් ඔවුන්ගේ අභිමානය නැංවීමට කටයුතු කරන්න.

### පියවර 2

- පන්ති කාමරය තුළදී මෙන්ම පිටතදී ද පිළිපැදිය යුතු ආචාර ධර්මවලට අදාළ ව භාවිත වචන පිළිබඳ සිසුන්ට පෙන්වා දෙන්න.

  උදා
    - ආයුබෝවන්
    - සුබ උදෑසනක් වේවා - good morning
    - කරුණාකර - please
    - බොහොම ස්තුති යි - Thank you very much
    - සමාවෙන්න - sorry/ excuse me

- ඉන් පසු  සිසුන් දෙදෙනා බැගින් ගෙන ඔවුන් කැමති ආකාරයට තම අවශ්‍යතා සඳහා වූ පහත සඳහන්  ආකාරයේ සංවාද කිරීමට උපදෙස් ලබා දෙන්න.

  *උදා: සෙතුම් - කරුණාකර මට පැන්සලක් දෙන්න පුළුවන් ද?*
  *නෙතු - ආ ..... මෙන්න*
  *සෙතුම් - බොහොම ස්තුතියි පැන්සල දුන්නාට*
  *සමාවෙන්න මගෙන් කරදරයක් වුණා නම්, ගිහින් එන්නම්*
- මෙම ක්‍රියාකාරකමේදී එම සංවාදවලට අදාළ ඉරියවු, කටහඬ හා ආංගික ප්‍රකාශන භාවිතයට සිසුන් හුරු කරවන්න.
- සිංහල මව්බස විෂයේ 6 වන ඉගෙනුම් පලයට අදාළ ක්‍රියාකරකම මෙහිදී තව දුරටත් සම්බන්ධ කර ගන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6 පාසල් යාම හා සබැඳි කවි/ගී ගායනයේ හා රංගනයේ යෙදෙයි. | ◆ පාසල් යාම හා සබැඳි<br>° කවි/ගී<br>° රංගන | 6.1 පාසල් හා සබැඳි කවි/ගී සාමූහික ගායනයට හා රංගනයට දායක වෙයි. | 6.1.1 ගායනයට හා රංගනයට දායක වීම |

## ක්‍රියාකාරකම් 8

- පාසල හා සබැඳි කවි ගී ගුරුවරයා සිසුන්ගේ  ද සහය  ඇති ව නිර්මාණය කර ගන්න.
- සිසුන් කණ්ඩායම් කර නිර්මාණය කරගත් කවි සුදුසු චලන උපයෝගී කර ගනිමින් ඉදිරිපත් කිරීමට අවස්ථා ව ලබා දෙන්න.
- එම ඉදිරිපත් කිරීම වඩාත් වින්දනාත්මක ව ප්‍රකාශ කිරීමට සංගීත භාණ්ඩ/විකල්ප භාණ්ඩ භාවිත කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 සෙල්ලම් මිදුල භාවිත වන චලන ගවේෂණ ක්‍රියාකාරකම්වලට සහභාගී වෙයි. | ◆ සෙල්ලම් මිදුල භාවිත කරමින් සිදු කරන චලන ගවේෂණ ක්‍රියාකාරකම් | 7.1 සෙල්ලම් මිදුල භාවිත කරමින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 7.1.1 චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල නිරත වීම |

## ක්‍රියාකාරකම් 19

- සිසුන් සෙල්ලම් මිදුල වෙත රැගෙන යන්න.
- මිදුල ආසන්නයේ සිසුන් පේළියට සිටීමට පවසන්න.
- සෙල්ලම් මිදුලේ ඇති උපකරණ ඇසුරෙන් අපි ගෙදර ඉඳලා  පාසලට එන ආකාරය නිරමාණශීලී ව ඉදිරිපත් කරන්නයි හදන්නේ යැයි සිසුන්ට පවසන්න.
- ඔබ කැමති ඕනෑ ම ආකාරය ආදර්ශමත් හා නිර්මාණශීලී ක්‍රමයක් මේ සඳහා භාවිත කරන්න.
- සිසුන් කණ්ඩායම බැගින් මේ සඳහා යොදවන්න.

*උදා;*

දැන් ඔන්න ගඟක් තියෙනවා. ගඟෙන් එගොඩ වෙන්න ඒදණ්ඩක් තිබෙනවා.  දැන් සමබර දණ්ඩට නැග සිසුන් එය දිගේ සමබරතාවය රැක ගනිමින් යාමට අවස්ථාව ලබා දෙන්න.ඊ ළඟට අපිට පොඩි වතුර වළක් තියෙනවා. ගහක අත්තක එල්ලිලා තමයි යන්න වෙන්නෙ. එල්ලෙන රාමුවට නැගී එය තරණය කිරීමට පවසන්න. එය පසු කර එන්න. මෙන්න ගහක වැල් දෙකක් ඔංචිල්ලාවක් වගේ අපි පදිමු යාළුවෝ තල්ලු කරන්න යැයි පවසමින් ඔංචිල්ලාව පදින්න අවස්ථාව ලබා දෙන්න. දැන් කන්දක් නගින්න ඕන, පල්ලම බහින්න ඕන, ලිස්සන බෝට්ටුවට නැගලා බහිමු යැයි පවසන්න.

- මේ අනුව තම පාසලේ සෙල්ලම් මිදුලට අදාළ ව ඇති උපකරණ භාවිත කරමින් පාඩමට සුදුසු ලෙස කතාව ගොඩනඟා ගන්න.
- උපකරණ භාවිතයට ගෙන එල්ලීම, පැද්දීම, රිංගීම නැගීම, බැසීම, බඩගෑම යන ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- සියලු ම සිසුන් ක්‍රියාකාරකම්වල සතුටින් සහභාගී වන්නේ දැයි නිරීක්ෂණය කරන්න. සිසුන් අගය කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 5 සඳහා සිසුන් යොමු කරන්න.

## තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි. අංක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 පන්තිභාර ගුරුවරයාගේ නම නිවැරදි ව ප්‍රකාශ කරයි | 1.1.1 | පන්තිභාර ගුරුවරයාගේ නම ප්‍රකාශ කරයි. | පන්තිභාර ගුරුවරයාගේ නම ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 1.2 යහළුවන් කිහිප දෙනෙකුගේ නම් නිවැරදි ව ප්‍රකාශ කරයි. | 1.2.1 | යහළුවන් කිහිප දෙනෙකුගේ නම් නිවැරදි ව ප්‍රකාශ කරයි. | යහළුවන් කිහිප දෙනෙකුගෙ නම් ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 1.3 තමාගේ නම, ගම සහ වයස නිවැරදි ව ප්‍රකාශ කරයි. | 1.3.1 | තමාගේ නම, ගම සහ වයස නිවැරදි ව ප්‍රකාශ කරයි. | තමාගේ නම/ ගම/ වයස යන තුනෙන් එකක් නිවැරදි ව ප්‍රකාශ කරයි. |
| 1.4 පන්තියේ සිසුන් හා ගුරුවරයා අතර යහපත් අන්තර් සම්බන්ධතා ප්‍රදර්ශනය කරයි. | 1.4.1 | පන්තියේ සිසුන් හා ගුරුවරයා අතර සුහදශීලී වචන හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | පන්තියේ සිසුන්/ ගුරුවරයා අතර සුහදශීලී හැසිරීම් ප්‍රදර්ශනය නො කරයි. |
| 2.1 පන්ති කාමරයේ දී එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි. | 2.1.1 | පන්ති කාමරයේ දී එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි. | පන්ති කාමරයේදි එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව/ ආරක්ෂාකාරී ව භාවිත කිරීමට දුෂ්කරතාවයක් පෙන්නුම් කරයි. |
| 2.2 පන්ති කාමරය අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගැනීමට දායක වෙයි. | 2.2.1 | පන්ති කාමරය අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගැනීමට දායක වෙයි. | පාසල /පන්ති කාමරය අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගැනීමට දායක වීමට උනන්දුවක් නො දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 3.1 පාසල් භූමියේ සුවිශේෂී ස්ථාන හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 | පාසල් භූමියේ සුවිශේෂී ස්ථාන 3-4ක් හඳුනා ගෙන නම් කරයි. | පාසල් භූමියේ සුවිශේෂී ස්ථානයක් හඳුනාගෙන නම් කිරීමට දුෂ්කරතාවයක් දක්වයි. |
| 3.2 පාසල් භූමියේ දී ආරක්ෂිතව හා පරෙස්සමින් කටයුතු කරයි. | 3.2.1 | පාසල් භූමියේ දී ආරක්ෂිතව හා පරෙස්සමින් කටයුතු කරයි. | පාසල් භූමියේ ආරක්ෂිතව හා පරෙස්සමින් කටයුතු කිරීමට දුෂ්කරතාවයක් දක්වයි. |
| 3.3 පාසල් භූමියේ සිත්ගත් ස්ථානයක/ උපකරණයක ආකෘතියක් ගොඩනගයි. | 3.3.1 | පාසල් භූමියේ සිත්ගත් ස්ථානයක/ උපකරණයක ආකෘතියක් අභිමත පරිදි ගොඩනගා ඒ පිළිබඳ විස්තර කරයි. | පාසල් භූමියේ සිත්ගත් ස්ථානයක/ උපකරණයක ආකෘතියක් ගොඩනැඟීමට මැළිකමක් දක්වයි. |
| 4.1 පාසලේ විවිධ වගකීම් දරන පුද්ගලයින් හඳුනා ගනියි. | 4.1.1 | පාසලේ විවිධ වගකීම් දරන පුද්ගලයින් තුන්දෙනෙකු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | පාසලේ වගකීම් දරන එක් පුද්ගලයෙකු හඳුනා ගෙන ප්‍රකාශ කරයි. |
| 5.1 පාසල තුළ ක්‍රියාත්මක වන ආචාර ධර්ම හඳුනා ගෙන අනුකූල චර්යා ප්‍රදර්ශනය කරයි. | 5.1.1 | පාසල තුළ ක්‍රියාත්මක වන ආචාර ධර්ම හඳුනා ගෙන අනුකූල චර්යා ප්‍රදර්ශනය කරයි. | පාසල තුළ ක්‍රියාත්මක වන ආචාර ධර්ම හඳුනා ගෙන අනුකූල චර්යා ප්‍රදර්ශනයට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 6.1 පාසල් හා සබැඳි කවි/ගී සාමූහික ගායනයට හා රංගනයට දායක වෙයි. | 6.1.1 | පාසල් හා සබැඳි කවි, ගී තාලානුකූල ව ගයමින් ප්‍රසංගික ව රංගන ඉදිරිපත් කරයි. | පාසල් හා සබැඳි කවි, ගී ගායනයට හා රංගනයට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 7.1 සෙල්ලම් මිදුල භාවිත කරමින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 7.1.1 | සෙල්ලම් මිදුල භාවිත කරමින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල සතුටින් නිරත වෙයි. | සෙල්ලම් මිදුල භාවිත කරමින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල නිරතවීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |

# 2 තේමාව - අපේ ගෙදර

එක නිවෙසක වාසය කිරීමේදී ඔවුනොවුන් සමග සමගිය, එකමුතුකම, බෙදාහදා ගැනීම, සහයෝගය වැනි සමාජ කුසලතා ප්‍රගුණ කළ යුතු ය. ඒවාගේ ම අන් අයට ගරු කිරීම, අන් අයට ඇහුම්කන් දීම, අන් මත ඉවසීම වැනි යහපත් චර්යාවන් පුරුදු පුහුණු විය යුතු ය. දුක, සතුට, ආදරය, කරුණාව, දයාව, සෙනෙහස වැනි චිත්තවේග සංවර්ධනය කර ගෙන ගෙදර දොරේ එදිනෙදා සිදු කරන කටයුතුවලට තමාට හැකි උපරිම අයුරින් සහයෝගය දක්වමින් ආරක්ෂාකාරී ව තම කටයුතු නිසි පරිදි ඉටු කිරීම අරමුණු කරගෙන " අපේ ගෙදර " තේමාව සකස් කර ඇත.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | **නිර්ණායක** |
|---|---|---|---|
| 1 පවුලේ සාමාජිකයන් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ පවුලේ සාමාජිකයන් | 1.1 පවුලේ සාමාජිකයන් හඳුනා ගෙන නම් කරයි. | 1.1.1 සාමාජිකයන් හඳුනා ගෙන නම් කිරීම |

## ක්‍රියාකාරකම් 1

### පියවර 1

මෙම ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර නිවෙස්වල පින්තූර, පවුලක සිටින සාමාජිකයන් නිරූපණය වන චිත්‍ර/පින්තූර කිහිපයක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. එම පින්තූරවලින් නිරූපණය වන ලක්ෂණ කිහිපයක් ආරම්භයේදී පෙන්වා දෙමින් පාඩමට ප්‍රවේශ වන්න.

- නිවසේ තමා සමග ජීවත්වන අය චිත්‍රයට නැඟීමට අවස්ථාව ලබා දී සිසුන් කැමති පරිදි පාට කිරීමට උපදෙස් දෙන්න.

- එක් එක් සිසුවා විසින් අඳින ලද තම පවුලේ සාමාජිකයන් පිළිබඳ විමසීමට ලක් කරන්න. (දෙමවුපියන් අහිමි වූ දරුවන් පිළිබඳ සැලකිලිමත් වෙමින් ක්‍රියාකාරකම සිදු කරන්න.)
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 1 අඳින ලද චිත්‍රය ගැන කතා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  උදා: චිත්‍රයේ සිටින්නේ කවුරුන් ද?

- වෙනත් කුමන හෝ කරුණු විමසිය හැකි වුවත් සිසුන්ගේ ප්‍රකාශයන්ට අනුව පමණක් එය සිදු කරන්න.

- ආගම විෂය හා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයන්ට අදාළ ව සිදු කරන ක්‍රියාකාරකම් මෙහිදී භාවිතයට ගන්න.

### පියවර 2

- පවුලේ චරිත සඳහා සිසුන් කණ්ඩායම් කරන්න.

- පවුලේ සාමාජිකයන් හඳුන්වන නම යොදමින් ගායනය හා රංගන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- ඒ සඳහා පොඩිකාලේ දඟ කෙරුවා ම ....... ගීතයේ නාදමාලාව යොදා ගන්න.

අම්මා, පෙම්බර අම්මා
තාත්තා, පෙම්බර තාත්තා
ලල්ලා ... ලලල ලා...//
අයියා, පෙම්බර අයියා
අක්කා, පෙම්බර අක්කා
ලල්ලා ... ලලල ලා...//
මල්ලී, පෙම්බර මල්ලී
නංගී, පෙම්බර නංගී
ලල්ලා ... ලලල ලා...//

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 පවුලේ සාමාජිකයන් සමග සුහද ව කටයුතු කරයි. | ◆ පවුලේ සාමාජිකයන් සමග කටයුතු කිරීමේදී සුහදබව | 2.1 පවුලේ සාමාජිකයන් සමඟ සුහද ව කටයුතු කරයි. | 2.1.1 සාමාජිකයන් සමග සුහද ව කටයුතු කිරීම |
| 3 තමාගේ සහ පවුලේ කාර්යයන්ට දායකත්වය දක්වයි. | ◆ තමන්ගේ වැඩ තමා විසින් ම කර ගැනීම<br>◆ පවුලේ වැඩට තම දායකත්වය | 3.1 තමන්ගේ වැඩ තමා විසින් ම කරගත් අවස්ථා විස්තර කරයි. | 3.1.1 තමා විසින් ම තමන්ගේ වැඩ කරගත් අවස්ථා විස්තර කිරීම |
| | | 3.2 පවුලේ වැඩකට තමන් උදවු කළ අවස්ථා විස්තර කරයි. | 3.2.1 පවුලේ වැඩකට උදවු කළ අවස්ථා විස්තර කිරීම |

## ක්‍රියාකාරකම් 2

### පියවර 1

- නිදහස් ක්‍රියාකාරකමකට යොමු කරමින් ස්ථාන කිහිපයක් සෙල්ලම් ගෙවල් ලෙස නම් කරන්න.
- සිසුන් කණ්ඩායම් කර සෙල්ලම් ගෙවල්වලට ඔවුන් යොමු කරන්න.
- සෙල්ලම් ගෙදර ඇසුරින් පවුලේ සාමාජිකයන් ලෙස චරිත නිරූපණය හා ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව සලසන්න.
- සිසුන් සෙල්ලම් කරන ආකාරය නිරන්තරයෙන් නිරීක්ෂණය කළ යුතු වේ. මෙහිදී ඔවුන් සුහද ව කටයුතු කරන ආකාරය, එකිනෙකා අමතන ආකාරය හා උදවු කරන ආකාරය පිළිබඳ විමසිලිමත් වන්න.
- සිසුන් පන්ති කාමරයට පැමිණීමෙන් අනතුරු ව තම අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- නිවසේ සාමාජිකයන් නිවස තුළ කරන කටයුතු පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අද්දැකීම් හා සාකච්ඡා ඇසුරෙන් ඉස්මතු වූ ගුණාංග එනම්; ආදරය, කරුණාව, සහයෝගය, එකමුතු කම, යුතුකම් ආදි ගුණාංගවල වැදගත්කම පිළිබඳ කතාබහ කරන්න.

## පියවර 2

- නිවසේදී තමා විසින් කරනු ලබන කාර්යයන් විමසන්න.

  උදා;
    - නිදාගත් ස්ථානය පිළිවෙළට සකස් කිරීම
    - දත් මැදීම (දරුවන් නිවැරදි ව දත් මදිනවා ද යන්න සොයා බලන්න)
    - මුහුණ සේදීම (දරුවන් නිවැරදි ව මුහුණ සෝදනවා ද යන්න සොයා බලන්න)
    - නිවැරදි ව වැසිකිළි පරිහරණය හා පිරිසිදු කර ගැනීම
    - තනිව ම තමා ආහාර ගැනීම හා තමා ආහාර ගත් ස්ථානය පිරිසිදු කිරීම
    - තමා විසින් පරිහරණය කරන කෝප්පය පිඟාන සෝදා පිළිවෙළට තැබීම
    - පාසල් යාමට අවශ්‍ය බෑගය, ඇඳුම් පැලඳුම් පෙර සූදානම් කර තැබීම
    - වැඩකරන මේසය පිළිවෙළට තබා ගැනීම
    - ඇඳුම හා සපත්තු, මේස් තනිව ම ඇඳ පැලඳ ගැනීම

- මෙහිදී තමා තනිව ම කරන කටයුතු ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදෙන්න. ඔවුන් කරන කටයුතු ඇගයීමක් කරන්න.

- තමාට තනිව සිදුකළ හැකි ඉහත සඳහන් වැඩ කටයුතු සෑම සිසුවෙකු විසින් ම පුරුදු පුහුණු වීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

- අන් අයට එය පහසුවක් වන බවත්, එය ඉතා හොඳ දෙයක් මෙන් ම සතුටු විය හැකි කරුණක් බවත් සිසුන්ට පැහැදිලි කර දෙන්න. සිසුන් කරන වැඩ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න. ඔවුන් කරන කාර්යයන් ඇගයීමට ලක් කරන්න.

## පියවර 3

- නිවසේ වැඩ කටයුතුවලට උදවු කළ ආකාරය පිළිබඳ එක් එක් සිසුවාගෙන් විමසන්න.

  උදා:
    - ගේ අතුගාන්න
    - රෙදි නවන්න
    - රෙදි වැලට දාන්න
    - පොල් ගාන්න
    - නිවසට ගෙනෙන දේවල් තෝරා පිළිවෙළට තබන්න

- ගෙදර වැඩට උදවු කරන සිසුන් අගය කරන්න.

- ඒවාගේ ම පොඩි අය වැඩිහිටියන්ට උදවු කරන අවස්ථා පිළිබඳව ද සාකච්ඡා කරන්න.

- පවුලේ අය **එකට එකතු වී වැඩ කිරීමෙන් ආදරය, කරුණාව, දයාව මෙන් ම පවුලේ සමගියත්, සතුටත් වැඩිවන** අයුරු පෙන්වා දෙන්න.

- පවුලේ වැඩ කටයුතු වෙනුවෙන් වෙහෙස මහන්සියෙන් කටයුතු කරන අය ගැන විමසා ඔවුන් පිළිබඳ කථාබහ කරන්න.
- ඒවාගේ ම ගෙදර සියලු දෙනාම වැඩවලට උදවු කිරීම මගින් වැඩ පහසු වන බවත්, ඉක්මනින් වැඩ කර ගත හැකි වන බවත් පෙන්වා දෙන්න.

- නිවසේ සිදු කරන කටයුතු කණ්ඩායම් වශයෙන් බෙදා දී සෙල්ලම් ගෙවල් ඇසුරෙන් සැබෑ අද්දැකීම් ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

- මේ සඳහා පහත සඳහන් ආකාරයේ කවි, ගී ද එකතු කර ගන්න.

උදා: අම්මා බත් උයනවා
තාත්තා තේ හදනවා
පුංචි මගේ අත් දෙකෙන්
කුඩෙට මල් නෙළනවා.

අයියා වතුර දානවා
අක්කා අතු ගානවා
හැමෝම වැඩ කරන අතරෙ
මමත්...................

- පවුලේ සාමාජිකයින් කරන උදවු අගය කිරීමේ වැදගත්කම ද සිසුන්ට පැහැදිලි කරන්න.

උදා: කෑම හරි ම රස යි
උයලා දුන්නට ස්තුති යි

- පවුලේ අය ඇගයීමට සුබ පැතුම් පත් වැනි දෑ සිසුන්ට හැකි පරිදි නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උදා : නිවසේ සිටිව අයගේ උපන් දින

- සිසුන් ලබාගත් අද්දැකීම් පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉන්පසු කැමති සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගා වර්ණවත් කිරීමට උපදෙස් දෙන්න.
- මෙහිදී ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 2 සඳහා අඳින ලද චිත්‍රය ගැන ද අදහස් විමසන්න.
- අඳින ලද චිත්‍ර ප්‍රදර්ශනය කරමින් ඇගයීමට ලක් කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට ගෞරවාන්විත ව සලකයි. | ◆ පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට ගෞරවාන්විත ව සැලකීම | 4.1 දෙමාපියන් පවුල වෙනුවෙන් වෙහෙසන අයුරු අගය කරමින් විස්තර කරයි. | 4.1.1 අගය කරමින් විස්තර කිරීම |
| | | 4.2 පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට ගෞරවාන්විත ව සලකන අවස්ථාවන් විස්තර කරයි. | 4.2.1 අවස්ථාවන් විස්තර කිරීම |

## ක්‍රියාකාරකම් 3

- පවුලේ සාමාජිකයින් පිළිබඳ පහත කවි තාලයකට ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඔවුන්ගේ ආදරය, කරුණාව හා වටිනාකම සිසුන්ට පෙන්වා දෙන්න. දෙමාපියන් අහිමි දරුවන් ඇත්නම් ඔවුන් පිළිබඳ සැලකිලිමත් වන්න.

පොඩි කාලේ මා සනසා
රසවත් ආහාර කවලා
දුකක් නොදී මා රකිනා
අම්මා මගේ රත්තරන්

උදේ හවා වෙහෙසීලා
පොත පත අරගෙන දීලා
දෑස වගේ මා රකිනා
තාත්තා මගේ රත්තරන්

- දෙමාපියන් අපි වෙනුවෙන් වෙහෙසෙන අයුරු පිළිබඳ නිවැරදි අවබෝධයක් සිසුන්ට ලබා දෙන්න.

- දෙමාපියන්ට අමතර ව නිවසේ සිටින වැඩිහිටියන්ට (ආච්චි, සීයා) ගරු කිරීම සහ සැලකීම සිදු කළ යුතු බව පෙන්වා දෙන්න.

- ඒ ඇසුරින් කතාවක් ගොඩනගා සිසුන්ට ඉදිරිපත් කරන්න. කතාව ඇසුරින් ප්‍රශ්න කිහිපයක් විමසන්න.

- ගෙදර වැඩවලට උදවු කිරීම, ඔවුන්ට ගෞරවයෙන් කතා කිරීම, වැඩිහිටියන්ට ඇහුම්කන් දීම, හැකි අයුරින් සැලකීම අපි ජීවිතයේ පුරුදු කර ගත යුතු හොඳ දේවල් බව පෙන්වා දෙන්න.

- මෙහිදී ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 3 සඳහන් පින්තූර බලා අදහස් ප්‍රකාශ කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.


- දෙමාපියන් සහ නිවසේ සිටින වැඩිහිටියන්ට ගරු කිරීම හා සැලකීමේ අගය සිසුන් තුළ තහවුරු කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 නිවසේ වැඩ කටයුතුවල දී තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් කටයුතු කරයි. | ◆ නිවසේ දී සිදු කරන කටයුතුවලදී තමාගේ ආරක්ෂාව අන් අයගේ ආරක්ෂාව | 5.1 නිවසේ වැඩ කටයුතුවල දී තමාගේ සහ අන් අයගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන අයුරු ප්‍රකාශ කරයි. | 5.1.1 වැඩ කිරීමේදී ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන අයුරු ප්‍රකාශ කිරීම |
| 6 නිවස හා අවට පිරිසිදු ව, ක්‍රමවත් ව හා අලංකාර ව පවත්වා ගන්නා අයුරු විස්තර කරයි. | ◆ නිවස හා අවට පරිසරය පිරිසිදුකම ක්‍රමවත්බව | 6.1 නිවස හා අවට පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වා ගන්නා අයුරු විස්තර කරයි. | 6.1.1 පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වා ගන්නා අයුරු විස්තර කිරීම |

## ක්‍රියාකාරකම් 4

**පියවර 1**

- නිවසේ වැඩ කටයුතුවලදී උදවු කළ ආකාරය හා එහිදී ආරක්ෂාකාරී නොවී හෝ සැලකිලිමත් නොවී හෝ ක්‍රියාකිරීමෙන් ලබාගත් අද්දැකීම් පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පහත ආකාරයේ පින්තූර පෙන්වා සිසුන්ට හැඟෙන දේ අසා දැන ගන්න.



- සමහර අවස්ථාවලදී **යමක් දෙස බලා සිදුවෙන දේ සොයා බැලීමට යාම නිසාත්**, අපගේ **නොසැලකිලිමත්කම නිසා ත්** අනතුරු සිදුවිය හැකි අවස්ථා ඉහත ආකාරයේ පින්තූරවලට අමතර ව තවදුරටත් සිසුන් සමග කතා බහ කරන්න.

- පවුලේ ආරක්ෂාව සඳහා නිවසේ වැඩිහියන් විසින් සිදු කළ වෙනස්කම් ද ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසු අදහස් අගය කරන්න.

- එම නිසා අනතුරක් /කරදරයක් වීමට පෙර ආරක්ෂාකාරී ව හා පරෙස්මෙන් කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න.

.

### පියවර 2

- අම්මා, තාත්තා හෝ වැඩිහිටියකු හෝ ගෙදර වැඩෙහි යෙදෙන විට භාවිත කරන උපකරණ ඔබ දැක තිබේ ද? ඒවා මොනවා ද? විමසමින් නිවසේ මුළුතැන්ගෙයි හා ගෙවත්තේ වැඩට යොදා ගන්නා උපකරණ හා ඒවායින් කෙරෙන කාර්ය පිළිබඳ තොරතුරු සිසුන්ගෙන් විමසන්න.

- එම උපකරණ භාවිතයෙන් පසු ව පිරිසිදු කර නිසි තැන නිසි පිළිවෙළට තැබීමේ වැදගත්කම පිළිබඳ සිසුන් සමග කතා කරන්න.

- "අපේ පාසල" තේමාවේදී හඳුන්වා දුන් ජපන් 5 – S සංකල්පය නැවත සිහිපත් කරමින් තමන්ගේ කාමරය /පොත් මේසය/නිවසේ තෝරාගත් කුඩා කොටසක් ඒ අනුව සකස් කිරීමට පවසන්න.
  - අවශ්‍ය නොවන දේ බැහැර කිරීම
  - පිළිවෙළට තැබීම
  - අතු ගා පිරිසිදු කර ගැනීම
  - කොළ කැබලි අපද්‍රව්‍ය තැන තැන නොදැමීම
  - එලෙස පවත්වා ගෙන යාම

- සතියකින් එහි ප්‍රගතිය විමසා බලා අවශ්‍ය පරිදි දිරිමත් කරන්න.
- මීට අමතර ව නිවස හා ගෙවත්ත පිරිසිදු ව තබා ගැනීම ගැන සිසුන් සතු අද්දැකීම් ද සමග කතාබහ කර තොරතුරු බෙදා ගන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 නිවස ආශ්‍රිත නිර්මාණ සහ සරල ආකෘති ගොඩනගයි. | ◆ නිවස ආශ්‍රිත<br>◆ හසුරු කුසලතා සහිත නිර්මාණ<br>◆ සරල ආකෘති | 7.1 නිවස ආශ්‍රිත නිර්මාණ සහ සරල ආකෘති ගොඩ නගයි. | 7.1.1 නිවස ආශ්‍රිත සරල ආකෘති ගොඩනැගීම |

## ක්‍රියාකාරකම් 5

### පියවර 1

- බිත්ති අලංකරණය සඳහා වන සැරසිල්ලක් නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අපතේ දමන රෙදි කැබලි , පරණ සඟරා, වර්ණ කඩදාසි හෝ වෙනත් අපතේ යන ඕනෑම දෙයක් ඇසුරින් තමන් කැමති නිර්මාණයක් කොලාජ් ක්‍රමයට සකස් කර ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිර්මාණය අගය කරන්න.

## පියවර 2

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- නිවසක්/ කුළුණක් හෝ සිසුන් කැමති ඕනෑ ම ආකාරයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පහත ආකාරයේ ද්‍රව්‍ය සපයා ගන්න.
  උදා: කෝටු, බීම බට, ඉරටු, අයිස්ක්‍රීම් කෝටු
  ඒවා එකිනෙක සම්බන්ධ කිරීම සඳහා ක්ලේ, පිටි මෝලි, මැටි වැනි ඕනෑ ම දෙයක්
- තමන් ගොඩනැගීමට යන දේ, ඒ සඳහා අවශ්‍ය වන දේ වැනි කරුණු සිසුන් කණ්ඩායම් වශයෙන් කතාබහ කර සැලසුම් කර ගැනීමට කාලය ලබා දෙන්න.
- ඉන්පසු, සපයා ගත් ද්‍රව්‍ය කැමති අයුරින් යොදා ගනිමින් ආකෘතියක්/නිර්මාණයක් ගොඩනැගීමට අවස්ථාව ලබා දෙන්න.
- එම නිර්මාණ ප්‍රදර්ශනය කරමින්, එය තමන්ට හැඟෙන අයුරින් විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත ආකාරයේ ප්‍රශ්න විමසන්න.
  උදා:
  - ගෙදර සාදා ගන්න යොදා ගත්තේ මොනවා ද?
  - ඒවා එකිනෙක සවි කළේ කොහොම ද?

- සිසු නිර්මාණ අගය කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8 පවුල යන සංකල්ප ඉස්මතු වන ක්‍රීඩාවල නිරත වෙයි. | ◆ පවුල යන සංකල්ප ඉස්මතු වන ක්‍රීඩා | 8.1 පවුල යන සංකල්ප ඉස්මතු වන ක්‍රීඩාවල නිරත වෙයි. | 8.1.1 පවුල හා සම්බන්ධ කටයුතු ආශ්‍රිත ක්‍රීඩාවල නිරත වීම |

## ක්‍රියාකාරකම් 6

### පියවර 1

- සිසුන් එළිමහනට රැගෙන යන්න. රවුමක් සාදන්න. සිසුන් 1 2 3 4 5 6 වශයෙන් (1-අම්මා 2-තාත්තා 3-අක්කා 4-අය්යා 5- නංගි 6- මල්ලී) ගණන් කරන්න පවසන්න.
- මීටර් 20ක පමණ දුරින් ස්ථානයක් සලකුණු කරන්න.
- අංක 1-6 දක්වා සිසුන් කණ්ඩායමක් ලෙස එකතු වී පවුල සාදා ගෙන ඉක්මනින් ම සලකුණු කරගත් ස්ථානයට කණ්ඩායමක් ලෙස දුවගෙන යන සිසුන්ට ජයග්‍රහණය හිමි වන බව පවසන්න.
- සියලු ම සිසුන් අත්පුඩි ගසමින් ඇගයීමට ලක් කරන්න.

### පියවර 2

- නිවස ආශ්‍රිත ව සිදු කළ හැකි ක්‍රීඩා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. පහත සඳහන් ක්‍රීඩාවල සිසුන් කණ්ඩායම් වශයෙන් නිරත කරවන්න.

උදා; අඹ ඇට පැනීම
ඔට්ටු ඇල්ලීම
බෝල ගැසීම

# තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත. නි. අංක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 පවුලේ සාමාජිකයන් හඳුනා ගෙන නම් කරයි. | 1.1.1 | පවුලේ සාමාජිකයන් හඳුනා ගෙන නිවැරදි ව නම් කරයි. | පවුලේ සාමාජිකයන් නම් කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 2.1 පවුලේ සාමාජිකයන් සමග සුහද ව කටයුතු කරයි. | 2.1.1 | පවුලේ සාමාජිකයන් සමග සුහද ව කටයුතු කළ අවස්ථාවක් විස්තර කරයි. | පවුලේ සාමාජිකයන් සමග සුහද ව කටයුතු කළ අවස්ථාවක් විස්තර කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 3.1 තමන්ගේ වැඩ තමා විසින් ම කරගත් අවස්ථා විස්තර කරයි. | 3.1.1 | තමන්ගේ වැඩ තමා විසින් ම කරගත් අවස්ථා 2ක් විස්තර කරයි. | තමන්ගේ වැඩ තමා විසින් ම කරගත් අවස්ථාවක් විස්තර කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 3.2 පවුලේ වැඩකට තමන් උදවු කළ අවස්ථා විස්තර කරයි. | 3.2.1 | පවුලේ වැඩකට තමන් උදවු කළ අවස්ථා 2ක් විස්තර කරයි. | පවුලේ වැඩකට තමන් උදවු කළ අවස්ථා විස්තර කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 4.1 දෙමාපියන් පවුල වෙනුවෙන් වෙහෙසන අයුරු අගය කරමින් විස්තර කරයි. | 4.1.1 | දෙමාපියන් පවුල වෙනුවෙන් වෙහෙසන අයුරු අගය කරමින් විස්තර කරයි. | දෙමාපියන් පවුල වෙනුවෙන් වෙහෙසන අයුරු විස්තර කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 4.2 පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට ගෞරවාන්විත ව සලකන අවස්ථාවන් විස්තර කරයි. | 4.2.1 | පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට ගෞරවාන්විත ව සලකන අවස්ථාවන් කිහිපයක් විස්තර කරයි. | පවුලේ වැඩිහිටි සාමාජිකයන්ට ගෞරවාන්විත ව සලකන අවස්ථාවක් විස්තර කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 5.1 නිවසේ වැඩ කටයුතුවල දී තමාගේ සහ අන් අයගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන අයුරු ප්‍රකාශ කරයි. | 5.1.1 | නිවසේ වැඩ කටයුතුවල දී තමාගේ සහ අන් අයගේ ආරක්ෂා ව පිළිබඳ සැලකිලිමත් වන අයුරු ප්‍රකාශ කරයි. | නිවසේ වැඩ කටයුතුවල දී තමාගේ සහ අන් අයගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන අයුරු ප්‍රකාශ කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |

| | | | |
|---|---|---|---|
| 6.1 නිවස හා අවට පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වා ගන්නා අයුරු විස්තර කරයි. | 6.1.1 | නිවස හා අවට පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගත් අවස්ථාවක් විස්තර කරයි. | නිවස හා අවට පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගත් අවස්ථාවක් විස්තර කිරීමට දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 7.1 නිවස ආශ්‍රිත නිර්මාණ සහ සරල ආකෘති ගොඩනගයි. | 7.1.1 | නිවස ආශ්‍රිත නිර්මාණයක් සහ සරල ආකෘතියක් අභිමත පරිදි ගොඩනගා හඳුන්වා දෙයි. | නිවස ආශ්‍රිත නිර්මාණයක් / සරල ආකෘතියක් ගොඩනැගීමට මැළිකමක් දක්වයි. |
| 8.1 පවුල යන සංකල්ප ඉස්මතු වන ක්‍රීඩා වල නිරත වෙයි. | 8.1.1 | පවුල යන සංකල්ප ඉස්මතු වන ක්‍රීඩාවල නිරත වීමට ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වෙයි. | පවුල යන සංකල්ප ඉස්මතු වන ක්‍රීඩාවල නිරත වීමට මැළිකමක් දක්වයි. |

# 3 තේමාව - ශාක හා ආහාර භෝග

ශාක හා ආහාර භෝග තේමාව මගින් සිසුන් තුළ යහපත් ආකල්ප වර්ධනයට අවස්ථාව සලසා දී ඇති අතර ශාකයක කොටස් පිළිබඳ මූලික අවබෝධය ලබා දීම හා පැළ සිටුවීම හා ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා සිසුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වී තිබේ. ඒ සමග ම සිසුන් තුළ සෞන්දර්යාත්මක මෙන් ම නිර්මාණාත්මක කුසලතා සහ විද්‍යාත්මක චින්තනය ඇති කිරීමට අවශ්‍ය ශක්තීන් ලබා දීමට මෙන් ම විද්‍යාත්මක ක්‍රියාවලියට අදාළ කුසලතා සංවර්ධනයට වැඩි අවධානයක් ලබා දී ඇත. ශාකය ද ජීවියෙකු බැවින් ඒ පිළිබඳ යහපත් ආකල්ප සිසුන් තුළ වර්ධනය කිරීම සඳහාත්, වර්තමාන හා අනාගත පරපුර වෙනුවෙන් ශාක ආරක්ෂා කර ගැනීම සඳහාත් සිසුන්ගේ සක්‍රිය දායකත්වය ලබා ගැනීම මෙම තේමාවේ ප්‍රධාන අරමුණ වී තිබේ.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 පාසල් වත්තේ ශාක නිරීක්ෂණය කර කොටස් හඳුනා ගනියි. | ◆ ශාකවල විවිධත්වය<br>◆ ශාකයක කොටස්<br>° පත්‍ර<br>° මල්<br>° ගෙඩි<br>° කඳ<br>° අතු<br>° මුල් | 1.1 පාසල් වත්තේ ශාකවල විවිධත්වය නිරීක්ෂණය කර අදහස් ප්‍රකාශ කරයි. | 1.1.1 ශාක විවිධත්වය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම |
| | | 1.2 ශාකයක ප්‍රධාන කොටස් හඳුනා ගෙන නම් කරයි. | 1.2.1 ශාකයක ප්‍රධාන කොටස් හඳුනා ගෙන නම් කිරීම |

## ක්‍රියාකාරකම් 1

### පියවර 1

- ගස් සෙවණකට සිසුන් රැගෙන යන්න.
- ගස් සෙවණේ සිසිලස විඳිමින් සිසුන්ට නිදහසේ ශාක නිරීක්ෂණය කිරීමට හා ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- හඳුනන ශාකවල නම් පැවසීමටත්, නොහඳුනන ශාක හඳුනා ගැනීමටත් අවස්ථාව දෙන්න
- සිසුන් නිරීක්ෂණය කළ ශාක අතරින් කැමති ශාකයක් නිදහසේ ඇඳීමට යොමු කරන්න. එම චිත්‍ර ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම 2 සිට 4 තෙක් ඇති ක්‍රියාකාරකම් මගින් පත්‍ර, අතු, මල්, ගෙඩි, කඳ හා මුල් යන ශාක කොටස්වලින් දිනකට කොටස් 1-2ක් බැගින් සිසුන්ට හඳුන්වා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 1 සඳහා සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම් 2

- සිසුන් පාසල් වත්තට කැඳවා ගෙන ගොස් ශාකවල හටගෙන ඇති මල් නිරීක්ෂණයටත්, ශාක යට වැටී ඇති මල් රැස් කර ගැනීමටත් සිසුන් යොමු කරන්න. එම මල්වල නම් ද හඳුන්වා දෙන්න.
- එම මල්වල වර්ණය, ප්‍රමාණය, හැඩය ආදිය නිරීක්ෂණයට හා අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන් කැමති අයුරින් මල් වර්ග කිරීමට යොමු කරන්න.
- ශාක බෝ වීමට, ඵල සෑදීමට (බොහෝ ශාකවල) මල් අවශ්‍ය බැවින් අනවශ්‍ය පරිදි මල් කඩා දැමීම සිදු නොකළ යුත්තක් බව පෙන්වා දෙන්න.
- මෙහිදී සිසුන් කුතුහලයෙන් විමසන ප්‍රශ්නවලට අදාළවන වීඩියෝ දර්ශන පෙන්විය හැකි ය.
- සිසුන් කැමති මල් ඇඳීමට අවස්ථාව දෙන්න.

පියවර 2

- අනතුරුව, ශාකවල හටගෙන ඇති ඵල (ගෙඩි/කරල්) පෙන්වන්න.
- ඒවායේ විවිධත්වය නිරීක්ෂණය කිරීමටත්, වර්ණය, හැඩය ආදිය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- ඵල හටගෙන ඇති ශාකවල නම් හඳුන්වා දෙන්න.
- සිසුන් කැමති ගෙඩි/කරල් ඇඳීමට අවස්ථාව දෙන්න.

## ක්‍රියාකාරකම් 3

- පාසල් වත්තේ ශාක අසලට ගොස් ශාක පත්‍ර නිරීක්ෂණයෙන් එම ශාක පත්‍රවල වර්ණය, ප්‍රමාණය, හැඩය ආදිය නිරීක්ෂණයට හා අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- පාසල් වත්තේ වැටී ඇති විවිධ ආකාරයේ ශාක පත්‍ර රැගෙන ඒමට සිසුන් යොමු කරන්න.
- ශාක වලට ජීවත් වීමට පත්‍ර අවශ්‍ය වන බැවින් ශාක පත්‍ර අනවශ්‍ය පරිදි කඩා නොදැමිය යුතු බව සිසුන්ට අවබෝධ වීමට සලසන්න.
- ශාක ද පණ ඇති ජීවීන් බැවින් ඒවා රැකගත යුතු බව පෙන්වා දෙන්න.
- සිසුන් කැමති අයුරින් ශාක පත්‍ර වර්ග කිරීමට යොමු කරන්න.
- සිසුන් කැමති ශාක පත්‍රයක්/පත්‍රවල සායම් තවරා අච්චු ගැසීමට හා එමගින් අලංකාර නිර්මාණ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**ගුරුවරයාගේ දැනුවත් භාවය සඳහා පමණි**
ශාක ද ජීවීන් ය. එසේ වන්නේ; වැඩී ම, බෝ වීම, ජලය - පෝෂක - වාතය ලබා ගැනීම වැනි ජීවින් සතු ලක්ෂණ ශාකවල ද තිබෙන බැවිනි.

## ක්‍රියාකාරකම් 4

- ශාකවල කඳ, අතු හා මුල් නිරීක්ෂණය සඳහා සිසුන් පාසල් වත්තට කැඳවා ගෙන යන්න.
- සිසුන්ට ශාක කිහිපයක කඳ හොඳින් ඇල්ලීමට, අත ගෑමට අවස්ථාව ලබා දෙන්න.
- විවිධ ශාකවල
    - කඳේ ප්‍රමාණය
    - පොත්තේ රළු/ සිනිඳු බව
    - ශක්තිමත් බව ආදිය සසඳමින් නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
- ගස්වල කඳට අතු සම්බන්ධ වී ඇති ආකාරය පෙන්වන්න.
- විශාල ගස්වල මුල් විහිදී ඇති ආකාරය හා ගලවන ලද පැළෑටියක මුල් නිරීක්ෂණයට ලක් කර ඒ පිළිබඳ අදහස් විමසන්න.
- පැළෑටියක මුල් නිරීක්ෂණයේ දී අත් කාචය භාවිත කිරීමටත්, පියෙවි ඇසින් බැලීමට වඩා අත් කාචයෙන් බැලීමේ දී පෙනෙන අයුරු වෙනස් වන ආකාරය සොයා ප්‍රකාශ කිරීමටත් ඉඩ දෙන්න.
- මෙම 2-4 ක්‍රියාකරකම් සිදුකරන අතර තුර ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකරකම 2 සහ 3 සම්පූර්ණ කිරීමට සිසුන්ට අවථාව ලබාදී ඒ ගැන සිසුන්ගෙන් විමසීමක් කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2. ශාකයක ආකෘතියක් ගොඩනගා ඒ පිළිබඳ අදහස් දක්වයි. | ◆ ශාකයක ආකෘතිය<br>◦ සැලසුම් කිරීම<br>◦ ගොඩනැගීම<br>◦ අදහස් දැක්වීම | 2.1 ශාකයක ආකෘතියක් ගොඩනගා ඒ පිළිබඳ අදහස් දක්වයි. | 2.1.1 ආකෘතිය පිළිබඳ අදහස් දැක්වීම |

## ක්‍රියාකාරකම් 5

- ශාක නිරීක්ෂණයෙන් පසු ක්ලේ/ මැටි/ පිටි මෝලි (play dough) සහ අවට පරිසරයේ ඇති ස්වාභාවික හෝ අපතේ හෝ යන ඕනෑම දෙයක් ඇසුරින් ගසක ආකෘතියක් නිර්මාණය කිරීමට සිසුන් යුගළ /කුඩා කණ්ඩායම් වශයෙන් අවස්ථාව සලසන්න.

- පහත ආකාරයේ ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න
  උදා
  - සෑදුවේ කුමන ගස ද (සිසුන්ට නිදහසේ අදහස් පැවසීමට දෙන්න)
  - එය ලොකු ගසක් ද? කුඩා පැළයක් ද?
  - ගස හදන්න තෝරා ගත්ත දේවල් මොනවා ද? ඒවා තෝරා ගත්තේ ඇයි?
  - සෑදූ ගසේ දැකිය හැකි කොටස් මොනවා ද?

- තේමාව ආරම්භයේදී අඳින ලද චිත්‍රය හා මෙහිදී සාදන ලද ගසක ආකෘතිය සසඳමින් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසු නිර්මාණ අගය කරන්න.


- ගස් පිළිබඳ කියවෙන සරල ගී ගායනා කරමින් , රබන් පද වාදනය කරමින් සිසුන්ට වින්දනයක් ලැබීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම් 6

- ඉහත ක්‍රියාකරකමේදී සිසුන් සාදන ලද ආකෘති ද සිසුන් ඉදිරියෙන් තබා ගැනීමට පවසමින් පහත සඳහන් කුඹි පොඩිත්තාගේ කතාව හෝ වෙනත් සුදුසු කතාවක් හෝ නිර්මාණශීලි ආකාරයකට යොදා ගනිමින් ගසක කොටස් නැවත සිහිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න. අවශ්‍ය පරිදි සුදුසු පින්තූර/ වීඩියෝ දර්ශන ආදිය යොදා ගන්න.
- පහත සඳහන් ගීතය සිසුන් සමග ගායනා කරමින් කතන්දරයට ප්‍රවේශ වන්න. ගීතයට අනුව හැඟීම් දැනවෙන ලෙස චලන ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශාක නිරීක්ෂණය තුළින් ලබාගත් අද්දැකීම් කතන්දරයෙන් නැවතත් මතුකරන්න.

**කුඹි පොඩිත්තාගේ විස්මිත චාරිකාව**

එක දවසක් දා කුඹි පොඩිත්තා
ගහක කොළේ උඩ නිදියා ගත්තා
අහස ගොරවලා වහින්න ගත්තා
කුඹි පොඩිත්තා තෙමෙන්න ගත්තා



- පුංචි යාළුවෝ දන්නවා ද මේ කුඹි යාළුවා නිදා ගත්තේ කොහේද කියලා ලෙස විමසන්න.

"වැස්ස වැටෙන නිසා කුඹි පොඩිත්තා ඇඳෙන් බැහැලා ඒ දණ්ඩක් වගේ පුංචි පාරක් දිගේ යන්න ගත්තා."

- "මොකක්ද මේ ඒ දණ්ඩක් වගේ පුංචි පාර?" නටුවෙන් පත්‍රයත් ගසත් සම්බන්ධ වන අයුරු සැබෑ පරිසරය ඇසුරෙන් නිරීක්ෂණයට යොමු කරන්න.

දැන් මේ නටුව දිගේ ගිහින් එයා වැටුණා ලොකු පාරකට. මොකක් ද මේ තැන කියලා පොඩිත්තා කල්පනා කළා. "මම කාගෙන් ද අහන්නේ? " මෙයා මෙහෙම කල්පනා කර කර ඉන්න කොට කොට්ටෝරු මාමා කුඹි පොඩිත්තාව දැක්කා.



"ආ කුඹි පොඩිත්තෝ මොනව ද කල්පනා කරන්නේ?" කොට්ටෝරු මාමා ඇහුවා.

"කොට්ටෝරු මාමේ මෙතන හරි ම ලස්සන යි. පාරක් වගේ. තව පාරවල් ගොඩක් පේනවා. මෙතනට මොකක්ද කියන්නේ ?" කියලා ඇහුවා.

"ඔයා ඔය ඉන්නේ ගහේ අත්තක් උඩ. ඕවා මේ ගහේ අතු....."
"හා හරි ම ලස්සනයි ගහේ අතු, දැන් මම දන්නවා ගහේ අතු ගැන, හරි ම සතුටු යි." කුඹි පොඩිත්තා කිව්වා.

"කොට්ටෝරු මාමේ ඔයා මොකද ඔතනට වෙලා කරන්නේ?" කුඹි පොඩිත්තා ඇහුවා.


"ටොක් ටොක් ටොක් ටොටොක්ක ටොක් //" හරි ම ලස්සනට ඇහෙන්න ගත්තා.

"මම මේ ගෙයක් හදා ගන්නවනෙ" කියලා කොට්ටෝරු මාමා කිව්වා.
"කොට්ටෝරු මාමා ගෙදර හදන්නේ කොතන ද?"කුඹි පොඩිත්තා ඇහුවා.
"ගහේ කඳේ තමයි ගෙදර හදන්නේ" කොට්ටෝරු මාමා කිව්වා.
"මම මේ ගහේ තවත් පහළට යනවා." කුඹි පොඩිත්තාට මේ ලස්සන ගස ගැන තවත් හොයන්න හිතුණා. පහළට යන කොට කුඹි පොඩිත්තාට කුඹි රැජිනියයි, එයාගේ පවුලේ අයයි හම්බ වුණා. දැන් එයාට හරි ම සතුටුයි.

"රැජිනියනි, රැජිනියනි, අන්න තියෙනවා ලස්සන මලක්".
"යමු මම පෙන්වන්නම් ඔයාට ගස්වල හැදෙන මල්." රැජින කිව්වා.

"මල නම් හරි ම සුවඳ යි.... මේක මම කඩා ගන්න ද ?" කුඹි පොඩිත්තා ඇහුවා.
"මල ගහේ ම තියෙන කොට බලන්න කොච්චර ලස්සන ද" රැජින ගොඩක් දේ කියා දුන්නා.

එතකොට ම කුඹි රංචුව ලොකු දෙයක් ඔසවා ගෙන එනවා දැක්කා. "මේක නම් හරි ම බරයි වගේ. අල්ලන්න. අල්ලන්න." කුඹි රැජින අණ කළා.
හැමෝම එකතු වෙලා එයාට උදවු කළා.



"මේ මොනවද අරන් යන්නේ." කුඹි පොඩිත්තා රැජිනගෙන් ඇහුවා.
"මේක මේ ගහේ හැදුණ ගෙඩියක්" කුඹි පොඩිත්තට පුදුමයි.
"ගෙඩි ඒ කියන්නේ මොනවා ද?" කුඹි පොඩිත්තා රැජිනගෙන් ඇහුවා.
"මම කියලා දෙන්නම්, එන්නකෝ. මේ ගස්වල ගෙඩි, කරල් හැදෙනවා.
ඒවා අපි එකතු කරනවා කෑමට ගන්න.
යමු මම ඔයාට පෙන්වන්නම් ගස්වල ගෙඩි, කරල්"

"හරි ම අපූරුයි මේ ගස්වල තියෙන කොටස්..." කුඹි පොඩිත්තා කිවුවා.
"දැන් හොඳට ම හවස් වෙලා අපි යමු ගෙදර." කුඹි ගුල තිබුණෙ ගහ ළඟින් ම පොළොව ඇතුළට ම වෙන්න.

පොළොව ඇතුළට යනකොට කුඹි පොඩිත්තා දැක්කා ගහේ අතු වගේ ම ඒ මේ අත දුවන පාරවල් වගේ තියෙනවා. "රැජිනියනි මේ ගහේ අතු නේ ද?" කුඹි පොඩිත්තා රැජිනගෙන් ඇහුවා.



රැජිනිය හිනා වෙලා කිවුවා "නෑ නෑ .... මේ තියෙන්නේ ගහේ මුල්" කියලා.
"යමු අපේ ගේ හදලා තියෙන්නේ පොළොව ඇතුළෙ නිසා අපිට හොඳට මුල් බලන්න පුළුවන්."
රැජිනිය කුඹි පොඩිත්තා පොළොව ඇතුළට ම එක්ක ගිහින් මුල් පෙන්නුවා.
කුඹි පොඩිත්තාට හරි ම පුදුම යි.
අද කුඹි පොඩිත්තා ගොඩක් දේවල් ඉගෙන ගත්තා. ඉන් පස්සෙ කුඹි පොඩිත්තාට මහන්සියට ම නින්ද ගියා.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 පාසල් වත්ත පිරිසිදු ව, අලංකාර ව පවත්වා ගැනීම සඳහා දායක වෙයි. | ◆ පාසල් වත්ත පිරිසිදු ව, අලංකාර ව පවත්වා ගැනීම | 3.1 පාසල් වත්ත මැනවින් පවත්වා ගැනීම සඳහා තමාට හැකි අයුරින් දායක වෙයි. | 3.1.1 තමාට හැකි අයුරින් දායක වීම |
| 4 ශාක වර්ධනයට හිරු එළිය අවශ්‍ය බව හඳුනා ගනියි. | ◆ ශාක වර්ධනයට හිරු එළියේ අවශ්‍යතාව | 4.1 ශාක වර්ධනයට හිරු එළිය අවශ්‍ය බව පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | 4.1.1 පරීක්ෂා කර ප්‍රකාශ කිරීම |

## ක්‍රියාකාරකම් 7

### පියවර 1

- සිසුන් පාසල් වත්තේ චාරිකාවක් සඳහා කැඳවා ගෙන යන්න.
- පාසල් වත්තේ ඇති සුවිශේෂ ශාක, ශාක සිටුවා ඇති අයුරු, වත්ත අලංකාර කරගෙන ඇති අයුරු, ක්‍රමවත් ව පවත්වා ගෙන යන අයුරු නිරීක්ෂණය කිරීමට ඉඩ දෙන්න.
- පාසල් වත්ත තව දුරටත් අලංකාර කර ගැනීම සඳහා අපට කළ හැකි දේ සිසුන් සමග සාකච්ඡා කරන්න. සිසුන්ට යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් වඩාත් උචිත යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට සිසුන් සමග පියවර ගන්න.
- පාසල් වත්තේ වැටී ඇති විවිධ ශාක කොටස් ආදියෙන් නිර්මාණයකට ගත හැකි යැයි සිතන දේ එක් රැස් කර ගැනීමටත් අනෙක් ඉවත ලන දේ අහුලා කොම්පෝස්ට් බඳුනට හෝ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයට හෝ දැමීමටත් මග පෙන්වන්න.

### පියවර 2

- අප අවට ඇති ශාකවලට අව්ව (ඉර එළිය) නොලැබුණොත් කුමක් වේවි දැයි චාරිකාව අතරතුර දී සිසුන්ගෙන් විමසන්න.
- තණකොළ සහිත බිමකට සිසුන් කැඳවාගෙන ගොස් එය පරීක්ෂා කර බලමු යැයි පවසන්න.

- තණකොළවල පෙනෙන්නට තිබෙන පාට විමසන්න.

- පොල් කටුවකින් තණකොළ ටිකක් වසා පසුදින ඇවිත් බලමු යැයි පවසා චාරිකාවේ දිගට ම යෙදෙන්න.

- පොල් කට්ටෙන් වැසූ තැනට දින පතා සිසුන් සමග පැමිණ තණකොළවලට සිදු වී ඇති වෙනස්කම් නිරීක්ෂණය කර ක්‍රියාකාරකම් පොතේ ඇඳීමට (ක්‍රියාකාරකම 4) යොමු කරන්න.

- ඒ පිළිබඳ සිසුන්ට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 පැළයක් සිටුවා එය ආරක්ෂා කිරීමට කටයුතු කරයි. | ◆ පැළයක්<br>° සිටුවීම<br>° රැක බලා ගැනීම | 5.1 පැළයක් නිසි ආකාරව සිටුවීමට දායක වෙයි. | 5.1.1 පැළයක් නිසි ලෙස සිටුවීමට දායක වීම |
| | | 5.2 පැළයක් රැක බලා ගෙන ඒ පිළිබඳ තම අද්දැකීම් විස්තර කරයි. | 5.2.2 පැළයක් රැක බලා ගැනීමේ අද්දැකීම් විස්තර කිරීම |
| 6. ශාක පිළිබඳ කියවෙන කවි, ගී තාලානුකූල ව ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | ◆ ශාක ඇසුරෙන්<br>° කවි, ගී, රංගන | 6.1 ශාක පිළිබඳ කියවෙන කවි, ගී ,ගායන කරමින් ඒ අනුව රංගන ඉදිරිපත් කරයි. | 6.1.1 ශාක ආශ්‍රිත කවි, ගී ,ගායන හා රංගන ඉදිරිපත් කිරීම |

## ක්‍රියාකාරකම් 8

- පාසල් වත්ත අලංකාර කර ගැනීමට අපිත් පැළයක් සිටුවමු යැයි පවසා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගන්න.

- පාසල් වත්තේ බිම හෝ මල් පෝච්චියක හෝ සිසුන්ට තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ සිසුන් කැමති පැළයක් සිටුවා අද්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

- දින පතා ජලය යොදමින් පැළෑටියකට වැඩීමට අවශ්‍යවන දේ සහ පැළෑටියක් රැකබලා ගන්නා අයුරු අත්විඳීමට සලස්වන්න.

- පැළෑටියකට දිනෙන් දින සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කිරීමටත්, ඒ පිළිබඳ සිසුන් අතර අදහස් හුවමාරු කර ගැනීමටත් අවස්ථාව ලබා දෙන්න.

- පහත ආකාරයේ නිර්මාණාත්මක කවි, ගී ගායනා කරමින් රංගනය දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

උදා:

පාට පාට මල් දෙන්නම්
රසට ගුණට ගෙඩි දෙන්නම්
සිතට ගතට සුව දෙන්නම්
සැමදා ඔබ රැක ගන්නම්

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 ශාක කොටස් ඇසුරෙන් විවිධ නිර්මාණ සකස් කරයි | ◆ ශාක කොටස් ඇසුරෙන්<br>° නිර්මාණ සකස් කිරීම<br><br>◆ තමන්ගේ සහ අන් අයගේ නිර්මාණ අගය කිරීම | 7.1 ශාක කොටස් ඇසුරෙන් විවිධ නිර්මාණ සකස් කරයි. | 7.1.1 ශාක ආශ්‍රිත නිර්මාණ සකස් කිරීම |
| | | 7.2 තමන්ගේ සහ අන් අයගේ නිර්මාණ පිළිබඳ සතුටු වෙමින් අගය කරයි. | 7.2.1 තමන්ගේ මෙන් ම අන් අයගෙ නිර්මාණ සතුටු වෙමින් අගය කිරීම. |

## ක්‍රියාකාරකම් 9

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පාසල් වත්තේ චාරිකාවේදී සිසුන් නිර්මාණයකට එකතු කර ගත් දේ සමග විවිධ නිර්මාණ සිදු කිරීම සඳහා මග පෙන්වන්න.

උදා



| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8 ශාක ඇසුරෙන් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වෙයි | ◆ ශාක ඇසුරෙන් සිදුකරන<br>° චලන ගවේෂණ ක්‍රියාකාරකම්<br>° ක්‍රීඩා | 8.1ශාක ඇසුරෙන් සිදු කරන චලන ගවේෂණ ක්‍රියාකාරකම් සිදු කරයි. | 8.1.1 ශාක ආශ්‍රිත චලන ගවේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම |
| | | 8.2 ශාක ඇසුරෙන් සිදු කරන නිර්මාණය කරගත් ක්‍රීඩාවක නිරත වෙයි. | 8.2.1 ශාක ආශ්‍රිත ක්‍රීඩාවක නිරත වීම |

## ක්‍රියාකාරකම් 10

**පියවර 1**

- සිසුන් එළිමහනට කැඳවාගෙන ගෙන යන්න.
- සුළඟට ගස් වැනෙන අයුරින් වැනෙමින් නම්‍යශීලිත්වය වර්ධනය කරගැනීමට ඉඩ දෙන්න.
- මඳ සුළඟට හා තද සුළඟට සිදුවන වෙනස්කම් නිරූපණය කිරීමට අවස්ථාව සලසන්න.

**පියවර 2**

- සිසුන්ට විනෝදාත්මක ව "ගස් මාරු" ක්‍රීඩාවේ යෙදීමට ඉඩ සලසන්න.
- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාවට අනුව සැම සිසුන් 3 - 4 දෙනෙකුට ම එක් අල්ලන්නෙකු බැගින් පත් කරන්න.
- ඉන් පසු සමාන දුරකින් ගස්/කණු හෝ පොළොවේ සලකුණු කරන ලද සීමා තුළ අනෙක් සිසුන් රඳවන්න.
- ගස් අතර මාරුවන විට එක් සිසුවෙකු අල්ලා ගතහොතත් එම සිසුවා අල්ලන්නෙකු බවට පත්වෙන බව පවසන්න.
- ඒ අයුරින් විනෝද වෙමින් "ගස් මාරු" ක්‍රීඩාවේ යෙදීමට ඉඩ දෙන්න.

### තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි. අං. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 පාසල් වත්තේ ශාකවල විවිධත්වය නිරීක්ෂණය කර අදහස් ප්‍රකාශ කරයි. | 1.1.1 | පාසල් වත්තේ ශාකවල විවිධත්වය නිරීක්ෂණය කර අදහස් ප්‍රකාශ කිරීම /චිත්‍රයට නැගීම සිදු කරයි. | පාසල් වත්තේ ශාකවල විවිධත්වය නිරීක්ෂණය කර අදහස් ප්‍රකාශ කිරීමට / චිත්‍රයට නැගීමට දුෂ්කරතා දක්වයි. |
| 1.2 ශාකයක ප්‍රධාන කොටස් හඳුනා ගෙන නම් කරයි. | 1.2.1 | ශාකයක ප්‍රධාන කොටස් 5-6ක් හඳුනා ගෙන නම් කරයි. | ශාකයක එක් ප්‍රධාන කොටසක්වත් හඳුනා ගෙන නම් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 2.1 ශාකයක ආකෘතියක් ගොඩනගා එය පිළිබඳ අදහස් දක්වයි. | 2.1.1 | ශාකයක ආකෘතියක් සැලසුම් කිරීමට, ගොඩනැඟීමට හා එය පිළිබඳ අදහස් දැක්වීමට හැකි ය. | ශාකයක ආකෘතියක් ගොඩනැඟීමට මැළිකමක් දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 3.1 පාසල් වත්ත මැනවින් පවත්වා ගැනීම සඳහා තමාට හැකි අයුරින් දායක වෙයි. | 3.1.1 | පාසල් වත්ත පිරිසිදු ව හා අලංකාර ව පවත්වා ගෙන යාමට තම දායකත්වය දක්වයි. | පාසල් වත්ත පිරිසිදු ව හා අලංකාර ව පවත්වා ගෙන යාමට තම දායකත්වය දැක්වීමට මැළිකමක් දක්වයි. |
| 4.1 ශාක වර්ධනයට හිරු එළිය අවශ්‍යබව පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | 4.1.1 | ශාක වර්ධනයට හිරු එළියේ අවශ්‍යතාව පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | ශාක වර්ධනයට හිරු එළිය අවශ්‍ය බව පරීක්ෂා කර ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 5.1 පැළයක් නිසි ආකාරව සිටුවීමට දායක වෙයි. | 5.1.1 | පැළයක් නිසි ආකාරව සිටුවීමට දායක වෙයි. | පැළයක් නිසි ආකාර ව සිටුවීමට මැළිකමක් දක්වයි. |
| 5.2 පැළයක් රැක බලා ගෙන ඒ පිළිබඳ තම අද්දැකීම් විස්තර කරයි. | 5.2.1 | පැළයක් රැක බලා ගෙන පිළිබඳ ඒ තම අද්දැකීම් විස්තර කරයි. | පැළයක් රැක බලා ගෙන ඒ පිළිබඳ තම අද්දැකීම් විස්තර කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 6.1 ශාක පිළිබඳ කියවෙන කවි, ගී ගායනා කරමින් ඒ අනුව රංගන ඉදිරිපත් කරයි. | 6.1.1 | ශාක පිළිබඳ කියවෙන කවි, ගී ගායනා කරමින් ඒ අනුව රංගන ඉදිරිපත් කරයි. | ශාක පිළිබඳ කියවෙන කවි, ගී ගායනා කිරීමට/රංගන ඉදිරිපත් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 7.1 ශාක කොටස් ඇසුරෙන් විවිධ නිර්මාණ සකස් කරයි. | 7.1.1 | ශාක කොටස් ඇසුරෙන් නිර්මාණයක් සැලසුම් කර සකස් කරයි. | ශාක කොටස් ඇසුරෙන් නිර්මාණයක් සකස් කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 7.2 තමන්ගේ සහ අන් අයගේ නිර්මාණ පිළිබඳ සතුටු වෙමින් අගය කරයි. | 7.2.1 | තමන්ගේ සහ අන් අයගේ නිර්මාණ පිළිබඳ සතුටු වෙමින් අගය කරයි. | තමන්ගේ හෝ අන් අයගේ නිර්මාණ පිළිබඳ සතුටු වීමේ හෝ අගය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 8.1 ශාක ඇසුරෙන් සිදු කරන චලන ගවේෂණ ක්‍රියාකාරකම් සිදු කරයි. | 8.1.1 | ශාක ඇසුරෙන් සිදු කරන චලන ගවේෂණ ක්‍රියාකාරකම් සිදු කරයි. | ශාක ඇසුරෙන් සිදු කරන චලන ගවේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 8.2 ශාක ඇසුරෙන් සිදු කරන නිර්මාණය කරගත් ක්‍රීඩාවක නිරත වෙයි. | 8.2.1 | ශාක ඇසුරෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවක සහයෝගයෙන් යුතු ව නිරත වෙයි. | ශාක ඇසුරෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවක සහයෝගයෙන් යුතු ව නිරත වීමේ දුෂ්කරතා දක්වයි. |

# 4 | තේමාව - අපේ උරුමය

සැම දරුවෙකුට ම තමා හැදෙන වැඩෙන පරිසරය අනුව ලබන අද්දැකීම් බොහොමයකි. එහි දී ජාතික වශයෙන් හෝ ආගමික වශයෙන් එක් එක් පරම්පරාවෙන් පැවතෙන අනන්‍යතා ඇසුරෙන් මානුෂීය ගුණාංග, සිතුම් පැතුම්, සිරිත් විරිත්, ආහාර පාන, ඇඳුම් පැළඳුම් ආදිය මෙන් ම සංස්කෘතික උත්සව, සැරසිලි ආදිය පිළිබඳ ව ද මෙහිදී අවධානය යොමු කළ යුතු ව ඇත. රටේ අනන්‍යතාව අපේ උරුමය ලෙස සිතා දේශීයත්වය ඉස්මතු කරමින් වැනි වටිනාකම අගය කරමින් කටයුතු කරන දරුවෙකුගේ පදනම සකස් කිරීම උදෙසා මෙම තේමාව නව විෂයමාලාවට අයත් ඉතා වටිනා තේමාවක් ලෙස ඉදිරිපත් කර ඇත.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 පන්ති කාමරය තුළ මානව හිතවාදී සම්බන්ධතා පවත්වා ගනියි. | ◆ මානව හිතවාදී සම්බන්ධතා ගුරු - සිසු<br>◆ සිසු - සිසු | 1.1 ගුරුවරයා සහ සිසුන් සමග සුහද ව හා ආචාරශීලී ව කටයුතු කරයි. | 1.1.1 ගුරුවරයා සහ සිසුන් සමග සුහද ව, ආචාරශීලී ව කටයුතු කිරීම |

## ක්‍රියාකාරකම් 1

### පියවර 1

- සියලු ම සිසුන් පන්තියට පැමිණීමට පෙර ගුරුවරයා පාසලට පැමිණෙන්න.
- සිසුන් පන්තියට පැමිණෙන විට "ආයුබෝවන දරුවනේ" කියා සිනහ මුසු මුහුණෙන්, සෙනෙහසින් මලක් (කඩදාසි/ සැබෑ මලක්) දී පිළිගන්න.
- සිසුන් සියලු දෙනා ම පන්තියට පැමිණි පසු ආගම සිහිකර දවස ආරම්භ කරන්න.
- ඉන් පසු අද දවස ආරම්භය ගැන සිසුන්ට දැනුණු දේ විමසන්න.
    - ගුරුවරයා ඔබ ව පිළිගත්තේ කෙසේද?
    - මලක් ඔබ අතට දුන් පසු ඔබ ගුරුවරයාට කීවේ කුමක් ද?
    - ගුරුවරයා සහ ඔබ "ආයුබෝවන්" යැයි කියා පිළිගැනීම ගැන සිතෙන්නේ කුමක් ද?
    - ආයුෂ බොහෝ වැඩි වේවා !
    - දිගුකල් දිනේවා ! දිගු කල් ජීවත් වේවා ! යන අදහස එහි ඇති බව පැහැදිලි කරන්න.
- අප බුලත් /මලක් වැනි දෙයක් දී පිළිගැනීමේදී එය දෙන කෙනා මෙන් ම එය ගන්නා කෙනා ද ඉමහත් ප්‍රීතියට පත්වන බවත් සිසුන්ට පෙන්වා දෙන්න.
- මේ ආකාරයට ගුරු සිත සතුටු වන ලෙස ඔබට කළ හැකි දේ සිසුන්ගෙන් විමසන්න.
- සිසු පිළිතුරු අගය කරන්න.
- පහත කවිය කිහිප වතාවක් සිසුන් සමග ගායනා කරන්න.

| | |
|---|---|
| ගුරු සිත | නොරිදවා |
| වේලාව | නොවරදවා |
| බැති පෙම් | උපදවා |
| අකුරු උගනී කුමරු | සොඳවා |

- කවියේ එක් එක් පේළියේ අර්ථය සරල ව අවබෝධ වන පරිදි සිසුන්ට පැහැදිලි කරන්න.

- සිසුන්, ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට
    - ගරු කරන
    - කීකරු වන
    - හොඳින් සවන් දෙන
    - ආචාරශීලී ව වචන භාවිත කරන... යනාදි **ගුණාංගවලින් පිරි පරපුරක්** ලෙස සිසුන් කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

## පියවර 2

- ගුරුවරයා සිසුන්ට ඇසෙන සේ පහත කවිය ද ගායනා කරන්න.

| | |
|---|---|
| සිසු සිත | නොරිදවා |
| වේලාව | නොවරදවා |
| බැති පෙම් | උපදවා |
| අකුරු කරවයි ඇදුරු | සොඳවා |

- සිසුන් ද කවිය ගායනට එක්කර ගනිමින් නැවත කිහිප වරක් ගායනා කරන්න.

- සිසුන්ගෙන් යහපත් ප්‍රතිචාර ලබා ගැනීමට නම්, ගුරුවරයා ද එම කවිය නිතර සිහියේ තබා ගනිමින් එහි අර්ථය ක්‍රියාත්මක වන පරිදි කටයුතු කිරීමට වග බලා ගන්න.

- සිසුන් සමග කටයුතු කරන සෑම අවස්ථාවකදී ම

    - සෙනෙහසින් ආමන්ත්‍රණය කරන
    - සිසුන්ට හොඳින් සවන් දෙන
    - සිසුන් කෙරෙහි සංවේදී වන.
    - සිසුන් අගය කිරීමට ලක් කරන.... ආදි අතීත උරුමයෙන් පැවත එන ගුණාංග අනුව කටයුතු කරන ගුරුවරයෙකු වීමට වගබලා ගන්න.

## ක්‍රියාකාරකම් 2

- පහත සඳහන් ගිරා පැටවුන්ගේ කතාව රසවත් ව ඉදිරිපත් කරන්න.

කන්දක් උඩ තිබුණු කුඩුවක ගිරා අම්මයි, තාත්තයි, පැටවු දෙදෙනෙකුයි ජීවත් වුණා. දවසක් ගිරා අම්මයි තාත්තයි කෑම සොයා ගෙන ගියා. එක වර ම මහ සුළඟක් හැමුවා. කුඩුවේ සිටි ගිරා පැටවුන් දෙදෙනා සුළඟට ගසා ගෙන ගිහින් කන්ද දෙපැත්තට වැටුණා. එක පැටවෙක් සොරු කණ්ඩායමක් ළඟට වැටුණා. අනෙක් පැටවා තාපසයන් සිටින අසපුවක් ළඟට වැටුණා. දවසක් දඩයමේ ආ රජ කෙනෙක් මේ කැලේ අතරමං වුණා. වෙහෙස නිසා රජතුමා ගහක් යට නිදා ගත්තා. මේ වෙලාවේ ගිරවෙක් ඉතා නරක වචනෙන් කතා කරනවා රජතුමාට ඇහුණා. බය වුණු රජතුමා කන්දෙන් එහා පැත්තට ගියා. එහි දී ගිරවෙක් ඉතා යහපත් වචන කතා කරනවා රජතුමාට ඇහුණා. රජතුමා මේ සිදුවීම ගැන පුදුම වුණා. මේ පිළිබඳ තාපසතුමාගෙන් විමසුවා. තාපස තුමා ගිරා පැටවුන් දෙදෙනාට

සිදු වූ දේ පැවසුවා. සොරු කණ්ඩායම ළඟට වැටුණු ගිරා පැටවාට ඉගෙන ගන්න ලැබුණේ නරක හැසිරීම් සහ නරක වචනයි. තාපසයා ළඟට වැටුණ ගිරා පැටවාට ඉගෙන ගන්න ලැබුණේ **යහපත් හැසිරීම් හා යහපත් වචනයි**. හොඳ මග පෙන්වීමක් ලැබුණු නිසා එක් අයෙක් හොඳ වුණා. නරක මග පෙන්වීමක් ලැබුණු නිසා අනෙක් කෙනා නරක කෙනෙක් වුණා.

- **ලැබෙන ගුරු හරුකම් අනුව සහ ඇසුරු කරන පුද්ගලයින් අනුව** කෙනෙක් යහපත් හා අයහපත් ගතිගුණ හුරු වන බව කතාව ඇසුරෙන් මතු කර දක්වන්න.

- සමාජ වගකීම් දරන පුද්ගලයෙකු ලෙස අතීතයේ සිට මේ දක්වා ම පැවත එන මනා ගුරු-සිසු සම්බන්ධතාව ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා ගුරුවරයා විසින් නිරන්තරයෙන් කටයුතු කරන්න.

- මෙය එක් දිනක පාඩමක් බවට පමණක් පත් නොකොට දිනපතා සිසුන් පිළිබඳ සොයා බලා කටයුතු කරන්න.

- සිසුන්ට සමීප ව, සවන් දෙමින් ඔවුන්ගේ අභිමානය සුරුකෙන ආකාරයට අවශ්‍ය උදවු ලබා දිමට කටයුතු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 3හි සඳහන් කථාව ඉදිරිපත් කිරිමට එක් එක් සිසුවාට අවස්ථාව ලබාදෙන්න.

### පියවර 2
- සිසු - සිසු හිතවාදී සම්බන්ධතා තහවුරු කිරීම සඳහා තමා මිතුරෙකුට උදවු කළ අවස්ථාවක් පිළිබඳ ගුරුවරයා විසින් අතීත අද්දැකීමක් පන්තියට ඉදිරිපත් කරන්න. සිසුන් තමන්ගේ යහළුවන්ට උදවු කළ අවස්ථා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සිසුන් ප්‍රකාශ කළ අද්දැකීම් අගය කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 අවස්ථානුකූල ව උචිත ඇඳුම් පැලඳුම් තෝරා ගනියි. | ◆ විවිධ අවස්ථා සඳහා<br>° උචිත ඇඳුම් පැලඳුම් තෝරා ගැනීම<br>° පිරිසිදු බව<br>° පිළිවෙළ | 2.1 විවිධ අවස්ථා සඳහා උචිත ඇඳුම් පැලඳුම් තෝරා ගන්නා අයුරු ප්‍රකාශ කරයි. | 2.1.1 අවස්ථාවෝ උචිත ඇඳුම් පැලඳුම් තෝරා ගන්නා අයුරු ප්‍රකාශ කිරීම |

## ක්‍රියාකාරකම් 3

### පියවර 1

- සැබෑ අද්දැකීම්/ පින්තූර/ වීඩියෝ දර්ශන/ ඉහළ ශ්‍රේණියක සිසුන් යොදා ගනිමින් සූදානම් කරගත් ඉදිරිපත් කිරීම් ඇසුරෙන් අවස්ථාවට උචිත ඇඳුම් පැලඳුම් ඇඳීම පිළිබඳ කතාබහ කරන්න.

- පහත ආකාරයට සිසුන් කිහිප දෙනෙකුගෙන් ප්‍රශ්න අසන්න.
  - අප ආගමික ස්ථානයකට යනවිට මොනවාගේ ඇඳුම් ද අඳින්නේ ?
  - අප මංගල අවස්ථාවකට සහභාගි වන විට මොනවාගේ ඇඳුම් ද අඳින්නේ ?
  - අපි අවමංගල අවස්ථාවකට සහභාගී වන විට මොන වාගේ ඇඳුම් ද අඳින්නේ ?
- සිසුන් දෙන පිළිතුරු ඔස්සේ විවිධ අවස්ථාවන්ට අඳින ඇඳුම් පැලඳුම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ඉහත අද්දැකීම් අනුව පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.

  ඇඳුම් පැලඳුම්
  හැසිරීම
  කතාබහ

- එම අවස්ථාවන්ට **ගැළපෙන නිවැරදි ඇඳුම් පැලඳුම් හා නිවැරදි හැසිරීම්** පවත්වා ගෙන යාමේ වැදගත්කම සිසු ඉදිරිපත් කිරීම් ඇසුරෙන් ම මතු කර දක්වන්න.
- අප සංස්කෘතිය තුළ පවතින මෙම ලක්ෂණ ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා ගුරුවරයා විසින් අවශ්‍ය මග පෙන්වීම කරන්න.
- "සිරිත් මල්දමේ" ඇති පහත කවිය ගායනා කරන්න.

  කිලිටු රෙදි බැනියම්
  ඇඳුම් නාඳිනු කිසියම්
  පිරිසිදු නිසි ඇඳුම්
  අඳිනු හැම කල නුඹට ඇත්නම්

- කවියෙහි අර්ථය සරල ව විස්තර කර, **පිරිසිදු ව, පිළිවෙළට** හා අවස්ථාවට අනුව ඇඳුම් ඇඳීමේ වැදගත්කම තව දුරටත් ඉස්මතු කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 දේශීය ආහාර පානවල වැදගත්කම පෙන්වා දෙයි. | ◆ දේශීය ආහාර පාන<br>° තෝරා ගැනීම<br>° සකස් කිරීම<br>° පිළිගැන්වීම<br>° භුක්ති විඳීම | 3.1 දේශීය ආහාර පාන වර්ග ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 3.1.1 දේශීය ආහාර පානවල වැදගත්කම ප්‍රකාශ කිරීම |
| | | 3.2 දේශීය ආහාර පාන වර්ගයක් තෝරා ගෙන සකස් කිරීම සඳහා දායක වෙයි. | 3.2.1 දේශීය ආහාරයක්/ පානයක් සකස් කිරීම සඳහා දායක වීම |
| | | 3.3 දේශිය සිරිත් විරිත් අනුව ආහාරපාන පිළිගැන්වීම හා භුක්ති විඳීම සිදු කරයි. | 3.3.1 දේශිය සිරිත් විරිත් අනුව පිළිගන්වීම හා භුක්ති විඳීම |

## ක්‍රියාකාරකම් 4

### පියවර 1

- අපේ ප්‍රධාන ආහාරය කුමක්ද යන්න පිළිබඳ සිසුන්ගෙන් විමසන්න. අපට ආහාර ලැබෙන්නේ කෙසේද යන්න පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගොවි මහතාගේ / මහත්මියගේ මූලිකත්වයෙන් ආරම්භ වී ආහාර අපට ලැබෙන තෙක් ගන්නා වෙහෙස නිර්මාණය කරගත් කතාවකින් / වීඩියෝ දර්ශනයකින් / සාකච්ඡාවකින් ඉස්මතු කරන්න.
- විශේෂයෙන් බොහෝ දෙනෙකු වෙහෙස මහන්සි වී අපට ලබා දෙන **ආහාර නාස්ති නොකර පරිභෝජනයට ගන්නා අයුරු** සාකච්ඡා කරන්න.

### පියවර 2
- කුඩා කණ්ඩායම් වශයෙන් කුඹුරක ආකෘතියක් සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා දෙන්න.

  උදා: මැටි

  ගොයම්/ සුදුසු ආදේශක පැළැටි

- සිසු නිර්මාණ පිළිබඳ ප්‍රශ්න විමසමින් අවශ්‍ය මග පෙන්වීම් කරන්න. අගය කරන්න.

## ක්‍රියාකාරකම් 5

### පියවර 1
- තම ප්‍රදේශයට ආවේණික දේශීය ආහාර පාන වර්ග පිළිබඳ කතාබහ කරන්න

  උදා: අග්ගලා, මුරුක්කු, කිරිබත්, හබල පෙති, බෙලි මල්, සව්

- හැකි සෑම විටම ආහාරය සඳහා **දේශීය ආහාර පාන** තෝරා ගත යුත්තේ ඇයි ද යන්න සිසුන් සමග සාකච්ඡා කරන්න.

  උදා:
  - වස විසෙන් තොර වීම
  - ගුණයෙන් ඉහළ වීම

- පහසුවෙන් සකස් කර ගත හැකි දේශීය ආහාරපානයක් සකස් කර ගැනීමට සැලසුම් කර ගන්න. අවශ්‍ය නම් සිසුන් කිහිප දෙනෙකුගේ දෙමාපියන්ගේ සහාය ලබා ගන්න.

- අදාළ දිනයේදී සැලසුම් කරගත් ආහාර වර්ගය සකස් කිරීමට අවශ්‍ය උපකරණ, අමුද්‍රව්‍ය රැගෙන ඒමට උපදෙස් ලබා දෙන්න.

- එහි දී සියලු ම සිසුන් ආහාර පිළියෙළ කරන ස්ථානය සඳහා යොමු කර, ඔවුන්ගේ සහාය දෙමාපියන් වෙත ලබා දීමට කටයුතු කරන්න.

  උදා:
  - පොල් ගෑම
  - ජලය ගෙන ඒම
  - ගුළි කිරීම

- ආහාර පිළියෙළ කිරීමේදී ආරක්ෂාව හා පරෙස්සම පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරන්න.
- ආහාර පිළියෙළ කළ ස්ථානය, භාණ්ඩ හා උපකරණ පිරිසිදු කර නියමිත ස්ථානවල තැබීමට සිසුන් යොමු කරන්න.
- ආහාර ගැනීමෙන් පසු තම තමන්ගේ ස්ථාන පිරිසිදු කර ගැනීමට සිසුන් සෑම විට ම යොමු කරන්න.
- දායකත්වය ලබා දුන් සිසුන් අගය කරමින් සිසුන් දිරිමත් කරන්න.

### පියවර 2
- පිරිසිදු මේස ඇතිරිල්ලක්, ජල බඳුන්, අත් පිස්නා, පිඟන් සහ කෝප්ප සූදානම් කරගන්න.
- පිළියෙළ කරන ලද ආහාරය මේසය මත තබා පිළිගැන්වීමට සිසුන් යොමු කරවන්න.
- එක් එක් ආගම් හා සංස්කෘතීන්, ආහාර සම්බන්ධ ව කරනු ලබන වත්පිළිවෙත් මෙහිදී සිදු කරන්න.

  උදා: - සිසුන්ට වතුර වීදුරුවක් පිළිගන්වා කෑමට ආරාධනා කිරීම.

- ඉන් පසු සියලු දෙනා එක් ව **තමාට ආහාරයට ගත හැකි ප්‍රමාණය පමණක්** බෙදා ගෙන සතුටින් ආහාර අනුභව කිරීම ඉතා හොඳ බව පහදා දෙන්න.
- ඉන්පසු සියලු දෙනාම ආහාරය භුක්ති විඳින්න.

- ආහාර ගැනීමෙන් පසු පන්ති කාමරය පිරිසිදු කිරීමට, භාජන සේදීමට දායක වීමට සිසුන් යොමු කරන්න.

- සිසුන් ලද අද්දැකීම් පිළිබඳ සාකච්ඡා කරන්න. අපට උරුම වූ තවත් දේශීය ආහාර වර්ග රාශියක් ඇති බව පවසන්න.

- අද දින අපගේ දේශීය ආහාර සකස් කර ආහාරයට ගැනීම නිසා තමන්ට සිතුණු දැනුණු දේ පන්තිය ඉදිරියට පැමිණ අදහස් ප්‍රකාශ කිරීමට ද සිසුන් යොමු කරන්න.

- සිසු අදහස් ඇගයීමට ලක් කරන්න.

- ආහාර පිළියෙළ කිරීමේදී හා ආහාර අනුභව කිරීමේදී අපට උරුම පහත සඳහන් දේශීය සංස්කෘතික ලක්ෂණ තවදුරටත් සිසුන්ට අවධාරණය කරන්න.

  උදා:
  - දේශීය ආහාර තෝරා ගැනීම
  - ආහාරයේ පළමු කොටස පූජා කිරීම
  - තව කොටසක් සතුන් සඳහා වෙන් කිරීම
  - ප්‍රමාණවත් ව ආහාර බෙදා ගැනීම
  - ගෞරවාන්විත ව ආහාර පිළිගැන්වීම

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 අපේ උරුමය හා සබැඳි විවිධ ප්‍රකාශන වින්දනාත්මක ව ඉදිරිපත් කරයි | ◆ ජන කතා | 4.1 ජන කථාවක් ප්‍රකාශනාත්මක චලන සහිතව ඉදිරිපත් කරයි. | 4.1.1 ජන කථා ආශ්‍රිත ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීම. |
| | ◆ ජන කවි/ගී | 4.2 ජන කවියක් තාලානුකූල ව ගායනා කරයි. | 4.2.1 ජන කවි තාලානුකූල ව ගායනා කිරීම. |
| | ◆ ජන නැටුම් | 4.3 ජන නැටුමක් සාමූහිකව ඉදිරිපත් කිරීමට දායක වෙයි. | 4.3.1 ජන නැටුමක් සාමූහික ව ඉදිරිපත් කිරීමට දායක වීම. |

## ක්‍රියාකාරකම් 6

### පියවර 1

- පෙර දිනයේදී සිසුන්ට තම පවුලේ වැඩිහිටියකුගෙන් ජන කතාවක් අසාගෙන පැමිණීමට උපදෙස් දෙන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට ගෙන ගොස් ජන කතාවක් සිසුන්ට රසවත් ව (අංග චලන යොදාග නිමින්, හඬ ගැළපෙන අයුරින් වෙනස් කරමින්) ඉදිරිපත් කරන්න.
- කතාව අවසානයේ සරල ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.
- එම කතාවෙන් ගත හැකි ආදර්ශ සිසුන් සමග සාකච්ඡා කරන්න.

- ඉදිරිපත් කළ කතාවේ තමන් සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැඟීමට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් විසින් අඳින ලද චිත්‍ර පිළිබඳ විමසීමක් කරන්න. සිසුන් අඳින ලද චිත්‍ර සහ ඔවුන්ගේ අදහස් අගය කරන්න.
- සිසුන් දන්නා/ අසා ගෙන පැමිණි එවැනි ජන කතා ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම් අගය කරමින් එම එක් එක් කතාවල ආදර්ශයන් මතු කර දක්වන්න.

### පියවර 2

- ජන කතා මෙන් ම අපට අනන්‍ය වූ ජන ගී හා ජන නැටුම් ද අතීතයේ තිබුණු බව සහ එහි වටිනාකම් ද සිසුන් සමග කතාබහ කරන්න.
- පළමු ව ගුරුවරයා තෝරා ගත් ජන කවි/ගීයක් ගායනා කරන්න.
- ඉන් පසු සිසුන් සමග තාල තබමින් (විකල්ප/සම්ප්‍රදායික භාණ්ඩ වාදනය කරමින්) කිහිප වරක් ගායනා කරන්න.

උදා:

අහසට පිඹිනා එරන් කළේයා<br>
පොළවට පිඹිනා භූමි කළේයා<br>
රන් මසු දහසක් වටින කළේයා<br>
නොබිඳින් නැනෝ මගේ කළේයා

- ගුරුවරයා ජන කවිය ගායනා කරමින් නර්තනයේ යෙදෙමින් සිසුන්ට ද තමන්ට සිතැඟි පරිදි නර්තනයේ යෙදීමට අවස්ථාව ලබාදෙන්න..
- සිසුන් දන්නා වෙනත් ජන කවි/ ජන ගී තිබේ නම් ඒවා ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම් (ගායනා හා රංගන) අගය කරන්න

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 උත්සව සඳහා යොදා ගන්නා දේශීය සැරසිලි නිර්මාණවලට දායක වෙයි | ◆ පෙර සූදානම<br>◆ දේශීය සැරසිල්ලක්<br>○ සකස් කිරීම<br>○ ප්‍රදර්ශනය | 5.1 තෝරාගත් අවුරුදු උත්සවයක් සඳහා පෙර සූදානම විස්තර කරයි. | 5.1.1 අවුරුදු උත්සවයක පෙර සූදානම විස්තර කිරීම |
| | | 5.2 උත්සව සැරසිල්ලක් සකස් කර පන්තිය/ ස්ථානය අලංකාර කර ගැනීමට දායක වෙයි. | 5.2.1 උත්සව සැරසිල්ලක් අලංකාර කර ගැනීමට දායක වීම |

## ක්‍රියාකාරකම් 7

### පියවර 1

- අපේ රටේ පැවැත්වෙන ප්‍රධානම ජාතික උත්සවයක් වන සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවයේ පෙර සූදානම පිළිබඳ සිසුන් සමග කතා බහ කරන්න.
  - උත්සවය පැවැත්වෙන මාසය
  - නිවෙස්වල සිදු වන වෙනස්කම්<br>නිවෙස් පිරිසිදු කිරීම, ගෙවත්ත පිරිසිදු කිරීම, කැවිලි පෙවිලි සකස් කිරීම, මුලුතැන්ගෙයි උපකරණ අලුත් කර ගැනීම, ඇඳුම් සකස්කර ගැනීම වැනි
  - පරිසරයේ සිදුවන වෙනස්කම්<br>උදා. ගස්වැල් මල් පලවලින් බර වීම, කොහාගේ නාදය, එරබදු වැනි විශේෂ වූ මල් පිපීම
  - උත්සවයේ ඇති වැදගත්කම

සැවොම එක ම වේලාවකට (නැකත් වේලාව) එක ම කටයුත්තක නිරත වීම, නෑදෑ හිත මිතුරු සබඳතා අලුත් වීම, සිරිත් විරිත්වලට අනුගත වීම වැනි

### පියවර 2

- සැරසිලි සඳහා සිසුන් සියලු ම දෙනා නිර්මාණ දායකත්වය ලබා දිය යුතු අතර අදාළ අමු ද්‍රව්‍ය ලබා දිය හැකි දෙමාපියන් හඳුනා ගන්න.

- පරිසර හානිය අවම වන අයුරින් පන්තියේ සියලු ම සිසුන්ට ප්‍රමාණවත් වන ලෙස අමු ද්‍රව්‍ය (ගොක්කොළ/පොල්කොළ/ අවශ්‍ය ප්‍රමාණයට කෙසෙල් කඳන්) සපයා දෙන ලෙස කල් තබා උපදෙස් ලබා දෙන්න.

- සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව අවස්ථාවල දී යොදා ගන්නා සැරසිලි සහිත වීඩියෝ දර්ශන, ඡායාරූප ආදිය දරුවන්ට ප්‍රදර්ශනය කර සිසු අද්දැකීම් පිළිබඳ කතා බහක නිරත වී සැරසිලි නිර්මාණයට යොමු වන්න.

- මෙහි දී සිසුන්ට කළ හැකි නිර්මාණ පමණක් තෝරා ගැනීමට සැලකිලිමත් වන්න.
  උදා ගොක්කොළ / පොල්කොළ දම්වැල්

- කෙසෙල් බඩ භාවිතයෙන් සරල මල් පෝච්චියක්




- අවශ්‍යතාව අනුව දෙමාපියන් කිහිප දෙනෙකුගේ සහාය ලබා ගෙන සංස්කෘතික ලක්ෂණ පිළිඹිබු වෙන අයුරින් පන්ති කාමරය /උචිත ස්ථානයක් සරසා ගන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6. අප රටේ විවිධ ජන වර්ගයන්ට අදාළ ව පැවැත්වෙන අවුරුදු උත්සව සමරයි. | ◆ විවිධ ජන වර්ගයන්ට අදාළ ව පැවැත්වෙන අවුරුදු උත්සව<br>° පෙර සූදානම<br>° සංවිධානය<br>° චාරිත්‍ර වාරිත්‍ර | 6.1 විවිධ ජන වර්ගයන්ට අදාළ ව පාසලේ පැවැත්වෙන අවුරුදු උත්සව සඳහා සක්‍රිය ව සහභාගී වෙයි. | 6.1.1 විවිධ ජන වර්ගයන්ට අදාළ ව පැවැත්වෙන අවුරුදු උත්සව සඳහා සහභාගී වීම |

## ක්‍රියාකාරකම් 8

### පියවර 1

- සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් මෙන් ම සංස්කෘතික අංග ද ඉස්මතු වන පරිදි ආදර්ශ සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කරන්න.
- මේ සඳහා ආදර්ශ හා නම්‍යශීලී දිනයක් සහ නැකත් වේලාවන් සකස් කරගන්න.
- පන්තියේ සිසුන්ට ප්‍රමුඛතාව ලැබෙන පරිදි හා ප්‍රබල ඉගෙනුම් අද්දැකීම් ගොඩනැංවෙන පරිදි සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීමට අවස්ථාව ලබා දෙන්න.

- නැකත් චාරිත්‍රවලට අනුව ළිප ගිනි මෙළවීම, වැඩ ඇල්ලීම, ආහාර අනුභවය, දෙමාපියන් ඇතුළු වැඩිහිටියන් නැමදීම ආදි චාරිත්‍රයන් නිවැරදි ව සිදුකරමින් සිසුන් වෙත අවුරුද්ද සම්බන්ධ අද්දැකීම් ලබා දෙන්න.

- ක්‍රියාකාරකම අවසානයේදී සිසුන්ගේ අද්දැකීම් හුවමාරු කරගැනීමට අවස්ථාව ලබා දෙන්න.

- උත්සව අවසානයේදී සියලු ම දේ පිරිසිදු කිරීම ගැන අද්දැකීම් ද සිසුන් වෙත ලබා දෙන්න.

- සමස්ත කාර්යයේදී අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය, යහ පුරුදු, ආරක්ෂාව හා පරෙස්සම පිළිබඳ අවධානය යොමු කරන්න.

- ඒවා ද සිසු අද්දැකීම් අතරට එක් කරන්න.

**පියවර 2**

- අප රටේ විවිධ ජාතීන්ට අයත් ප්‍රධාන උත්සව අවුරුද්දේ විවිධ මාසවලදී පැවැත්වේ. එම ජාතීන්ට අදාළ ව උත්සවයක් බැගින් තෝරා ගෙන එම උත්සව පැවැත්වෙන කාලසීමාවන්හිදී සරලව ඒවා හඳුන්වා දෙමින් උත්සවයට අදාළ සැරසිළි, වත්පිළිවෙත්වල නිරත වීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 ජන ක්‍රීඩාවලට සක්‍රීය ලෙස සහභාගී වෙයි. | ◆ ජන ක්‍රීඩා | 7.1 ජන ක්‍රීඩාවලට සක්‍රීය ලෙස සහභාගී වෙයි. | 7.1.1 ජන ක්‍රීඩාවලට සක්‍රීය ලෙස සහභාගී වීම |

**ක්‍රියාකාරකම් 9**

- අතීතයේ සිට පැවතෙන ජන ක්‍රීඩාවල සිසුන් නිරත කරවන්න,
  උදා; ලේන්සු හැංගීම /පනා හැංගීම

- එම ජන ක්‍රීඩාවලට අයත් කවි/ගීත ගායනා කරමින් වින්දනාත්මක ව ක්‍රීඩාවල නිරත වීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

## තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි. අං. | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 ගුරුවරයා සහ සිසුන් සමග සුහද ව හා ආචාරශීලී ව කටයුතු කරයි. | 1.1.1 | ගුරුවරයා සහ සිසුන් සමග සුහද ව හා ආචාරශීලී ව කටයුතු කරයි. | 2.1.1 ගුරුවරයා සහ සිසුන් සමග සුහද ව හා ආචාරශීලී ව කටයුතු කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 2.1 විවිධ අවස්ථා සඳහා උචිත ඇඳුම් පැලඳුම් තෝරා ගන්නා අයුරු ප්‍රකාශ කරයි. | 2.1.1 | විවිධ අවස්ථා සඳහා උචිත ඇඳුම් හා පැලඳුම් තෝරා ගන්නා ආකාරය ප්‍රකාශ කරයි. | 2.2.1 විවිධ අවස්ථා සඳහා උචිත ඇඳුම් හා පැලඳුම් තෝරා ගන්නා ආකාරය ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 3.2 දේශීය ආහාර පාන වර්ග හාරයට තෝරා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 3.1.1 | දේශීය ආහාර පාන වර්ග ආහාරයට තෝරා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | දේශීය ආහාර පාන වර්ග ආහාරයට තෝරා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 3.2 දේශීය ආහාර පාන වර්ගයක් තෝරා ගෙන සකස් කිරීමට දායක වෙයි. | 3.2.1 | දේශීය ආහාර පාන වර්ගයක් තෝරා ගෙන සකස් කිරීමට දායක වෙයි. | දේශීය ආහාර පාන වර්ගයක් තෝරා ගෙන සකස් කිරීමට දායකවීමේ දුෂ්කරතා දක්වයි. |
| 3.3 දේශිය සිරිත් විරිත් අනුව ආහාරපාන පිළිගන්වීම හා භුක්ති විඳීම සිදු කරයි. | 3.3.1 | දේශිය සිරිත් විරිත් අනුව ආහාරපාන පිළිගන්වීම හා භුක්ති විඳීම සිදු කරයි. | දේශිය සිරිත් විරිත් අනුව ආහාරපාන පිළිගන්වීම හා භුක්ති විඳීමට දුෂ්කරතා දක්වයි. |
| 4.1 ජන කථාවක් ප්‍රකාශනාත්මක චලන සහිතව ඉදිරිපත් කරයි. | 4.1.1 | ජන කථාවක් ප්‍රකාශනාත්මක චලන සහිත ව ඉදිරිපත් කරයි. | ජන කථාවක් ප්‍රකාශනාත්මක චලන සහිත ව ඉදිරිපත් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 4.2 ජන කවියක් තාලානුකූල ව ගායනා කරයි. | 4.2.1 | ජන කවියක් තාලානුකූල ව ගායනා කරයි. | ජන කවියක් තාලානුකූල ව ගායනා කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 4.3 ජන නැටුමක් සාමූහිකව ඉදිරිපත් කිරීමට දායක වෙයි. | 4.3.1 | ජන නැටුමක් සාමූහිකව ඉදිරිපත් කිරීමට දායක වෙයි. | ජන නැටුමක් සාමූහිකව ඉදිරිපත් කිරීමට මැළිකමක් දක්වයි. |
| 5.1 තෝරාගත් අවුරුදු උත්සවයක් සඳහා පෙර සූදානම විස්තර කරයි. | 5.1.1 | තෝරාගත් අවුරුදු උත්සවයක් සඳහා පෙර සූදානම (ස්වභාවිකව සිදුවෙන හා අප විසින් සිදුකරන) විස්තර කරයි. | තෝරාගත් අවුරුදු උත්සවයක් සඳහා පෙර සූදානම විස්තර කිරීමට දුෂ්කරතා දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 5.2 උත්සව සැරසිල්ලක් සකස් කර පන්තිය/ ස්ථානය අලංකාර කර ගැනීමට දායක වෙයි. | 5.2.1 | උත්සව සැරසිල්ලක් සකස් කර පන්තිය/ ස්ථානය අලංකාර කර ගැනීමට දායක වෙයි. | උත්සව සැරසිල්ලක් සකස් කර පන්තිය/ ස්ථානය අලංකාර කර ගැනීමට දුෂ්කරතා දක්වයි. |
| 6.1 අප රටේ විවිධ ජාතීන්ට අදාළ ව පැවැත්වෙන අවුරුදු උත්සව සමරයි. | 6.1.1 | විවිධ ජාතීන්ට අදාළ ව පාසලේ පැවැත්වෙන අවුරුදු උත්සව සඳහා සක්‍රිය ව සහභාගී වෙයි. | විවිධ ජාතීන්ට අදාළ ව පාසලේ පැවැත්වෙන අවුරුදු උත්සව සඳහා සක්‍රිය ව සහභාගී වීම සඳහා දුෂ්කරතා දක්වයි. |
| 7.1 ජන ක්‍රීඩාවලට සක්‍රීය ලෙස සහභාගී වෙයි. | 7.1.1 | ජන ක්‍රීඩාවලට සක්‍රීය ලෙස සහභාගී වෙයි. | ජන ක්‍රීඩාවලට සක්‍රීය ලෙස සහභාගී වීමට මැළිකමක් දක්වයි. |

# සෞන්දර්ය අධ්‍යාපනය
# ගුරු මාර්ගෝපදේශය

## හැඳින්වීම

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් ප්‍රාථමික අධ්‍යාපනයට හඳුන්වා දෙනු ලබන සෞන්දර්ය විෂය මෙතෙක් පැවැති පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ සමෝධානිත විෂය ක්ෂේත්‍රය ලෙස හඳුන්වන සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලින් ඔබ්බට විහිදී ගිය සුවිශේෂ මාර්ගෝපදේශයක් ලෙස හඳුන්වා දිය හැකි ය. 6වන ශ්‍රේණියේ සිට විධිමත් පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට යොමුවන සිසුන් තම දක්ෂතාවය චිත්‍ර, සංගීතය, නර්තනය, රංගන යන කුමන ක්ෂේත්‍රයට ද යන්න පිළිබඳ නිසි අවබෝධය ලබා ගැනීමට මෙමඟින් අවස්ථාව උදාවන්නේය. නව විෂයමාලා යටතේ මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ ද සමෝධානිත විෂය ක්ෂේත්‍රයක් ලෙස සෞන්දර්ය අන්තර්ගත වුව ද ඒ තුළින් ද සෞන්දර්ය විෂය පිළිබඳ විධිමත් නිපුණතා සංවර්ධනයක් සිදු නොවේ.

එය සැලකිල්ලට ගෙන එම පුළුල් පරමාර්ථය 1-5 ශ්‍රේණි දක්වා ක්‍රමයෙන් වාර තුනට ම යෝග්‍ය වන පරිදි සතියකට එක් කාලච්ඡේදයක් (මිනිත්තු - 50) ලෙස ගෙන, මුල සිට සරල ව ඉහත විෂය ක්ෂේත්‍ර හතර ම නියෝජනය වන පරිදි වාරයකට පැය 10 ක කාලයක් පන්තිභාර ගුරුවරයාගේ මැදිහත්වීම යටතේ මෙම ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. අප විසින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති ක්‍රියාකාරකම්වල පමණක් සිසුන් නිරත කරවමින්, ඔවුන්ගේ මානසික සුවය මෙන් ම ඉහත විෂය ක්ෂේත්‍රයන්හි (සරල ක්‍රියාකාරකමේ සිට සංකීර්ණත්වයට) නිසි අවබෝධයෙන් මෙම විෂය ස්පර්ශ කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමට කටයුතු කරන්න. මෙහිදී සිසුන් සතු කුසලතා ඔප්නැංවෙන ආකාරයට සැලසුම් කරමින්, අපේක්ෂිත මට්ටමට සිසුන් ගෙන ඒමට ගුරුවරයා උත්සුක විය යුතුය. හැකිනම් මේ සඳහා සෞන්දර්ය විෂය උගන්වන ගුරුවරයෙකුගේ සහය ලබා ගැනීමට කටයුතු කරන්න.සෞන්දර්ය විෂය උගන්වන කවර හෝ ගුරුවරයෙකුගේ සහය ලබා ගත්ත ද, **දෙන ලද උපදෙස් හා ක්‍රියාකාරකම් ඇසුරෙන් පමණක්** සිසුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමේ අවශ්‍යතාවය තව දුරටත් මෙමඟින් අවධාරණය කරන බව තරයේ මතක තබා ගන්න.

**එස්.එම්. සඳමාලි දේශප්‍රිය**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# චිත්‍ර

## ක්‍රියාකාරකම 01 — රේඛා ඇඳීමේ අභ්‍යාස කරමු


| | |
|---|---|
| **විෂය අන්තර්ගතය**<br>**රේඛා වර්ග - (Kinds of Line)** | මෙම ක්‍රියාකාරකමින් චිත්‍ර ඉගෙනුම සඳහා මූලිකවන රේඛා වර්ග අධ්‍යයනයට අවස්ථාව සම්පාදනය කරනු ලැබේ. රේඛා වර්ග ඇඳීම සඳහා රේඛා සිතුවම් පිටපත් කිරීම මින් සිදු කරනු ලැබේ. |

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පාට පැන්සල්, පැස්ටල්, පෑන් ආදි

**1 වන පියවර**

- දී ඇති විවිධ රේඛා වර්ග ඇඳ පෙන්වමින් ඒවා නම් කිරීමට යොමු කරන්න. එසේම ඒවා හොඳින් බලා ඇඳීමට මග පෙන්වන්න.



තිරස් රේඛා

සිරස් රේඛා

ඇල රේඛා

සිග් සැග් රේඛා

වක්‍ර රේඛා

**2 වන පියවර**

- පන්ති කාමරයේ වටපිටාව හොඳින් බැලීමට ළමුන් යොමු කරන්න. නිදසුන් ලෙස පොත් පත්, පොළොව, බිත්ති, දොර, ජනෙල් ආදි විවිධ භාණ්ඩ කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරමින් ඒවා ගොඩනැඟීමට පදනම්ව ඇති රේඛා මොනවාදැයි සාකච්ඡා කරන්න. ඒ ගැන ළමුන්ගෙන් විමසමින් ඔවුනොවුන් අතර අදහස් හුවමාරු කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**3 වන පියවර**

- මෙම රේඛා සිතුවම සිසුන්ට ලබා දෙන්න. එය හැකි පරිදි පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න.
- සිතුවම පිටපත් කර ගැනීමෙන් පසු ළමුන් පළමු පියවරේ දී ඉගෙන ගත් රේඛා සමග සිතුවමේ රේඛා සංසන්දනය කිරීමට ඔවුන්ට උදවු කරන්න.



Yellow And Blue, Art Painting by Henri Matisse, 1946

| ක්‍රියාකාරකම 02 | රේඛා ඇසුරෙන් චිත්‍ර නිර්මාණය කරමු |
|---|---|
| විෂය අන්තර්ගතය<br>සීරීම් සිතුවම් - (Etching painting) | මෙම ක්‍රියාකාරකමින් චිත්‍ර කලාවේ මූලිකවන රේඛා වර්ග ඇසුරු කරගෙන ප්‍රකාශන සිතුවම් නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ. |

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පැස්ටල්
- පැන්සලයක්, පෑන් හා අඩි රූලක් වැනි සියුම් තුඩක්

**1 වන පියවර**

- මෙහදී පළමු සුදු කඩදාසියක් මත පහත ආකාරයට පැස්ටල් භාවිත කර පිටුව පුරා වර්ණ තීරු ඇඳීමට යොමු කරන්න.



- දෙවනු ව එම වර්ණ තීරු වැසෙන ලෙස සමස්ත කඩදා සිය මත කළු වර්ණය තවරා අවරණය කර ගැනීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

**2 වන පියවර**

- කළු වර්ණය තැවරූ කඩදාසිය මත 1වන ක්‍රියාකාරකමින් අභ්‍යාස කළ රේඛා, කැමති හා නිදහස් ලෙස භාවිත කරමින් නිර්මාණයක් කිරීමට මග පෙන්වන්න.



- මෙම රේඛාකරණය කළු පාට මත සීරීමෙන් සිදු කර බැවින් ඊට ගැළපෙන පෑනක් හෝ පැන්සලක් වැනි තුඩක් සහිත උපකරණයක් භාවිත කිරීමට යොමු කරන්න.

**3 වන පියවර**

- තෝරාගත් තැනක ළමුන්ගේ සිතුවම් ප්‍රදර්ශනය කරන්න. ප්‍රදර්ශනය කරන සිතුවම් සම්බන්ධ ව සිසු අද්දැකීම් හා අදහස් ප්‍රකාශ කිරීමට, අනෙක් නිර්මාණ ගැන අදහස් ප්‍රකාශ කිරීමට, ගුරු ඇගයීම හා තක්සේරුවට අවස්ථාව සලසා ගන්න.

## ක්‍රියාකාරකම 3 — මූලික හැඩ අභ්‍යාස කරමු.

**විෂය අන්තර්ගතය**

ද්විමාන - (Tow- dimensional)
ජ්‍යාමිතික හැඩ - (Geometric Shapes)
ස්වභාවික හැඩ - (Organic shapes)

මෙම ක්‍රියාකාරකමින් චිත්‍ර කලාවේ ද්විමාන ස්වරූපය, ජ්‍යාමිතික හැඩ හා ස්වභාවික හැඩ අභ්‍යාස කිරීම සිදු කරනු ලැබේ.


**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පැන්සල්, පෑන්, පැස්ටල්
- රවුම්, කොටු හා ත්‍රිකෝණාකාර ජ්‍යාමිතික හැඩ සහිත ද්‍රව්‍ය
- ගස්වල කොළ, සිප්පිකටු, පැතලි ගල් කැබලි ස්වභාවික හැඩැති ද්‍රව්‍ය

1 වන පියවර - විනාඩි 15

- 1 වන පියවර


දී ඇති ජ්‍යාමිතික හා ස්වභාවික හැඩ පෙන්වමින් ඒවා නම් කිරීමට යොමු කරන්න.



වෘත්තය

චතුරස්‍රය


ත්‍රිකෝණය



ජ්‍යාමිතික හැඩ

ස්වභාවික හැඩ

පන්ති කාමරයේ වටපිටාවේ ඇති පොත්, බෑග්, බෝතල්, මල් හා කොළ ආදි විවිධ ද්‍රව්‍ය කෙරෙහි ළමුන්ගේ අවධානය යොමු කරමින් ඒවා ගොඩනැඟී ඇති හැඩ මොනවාදැයි පෙන්වා දෙන්න.



2 වන පියවර

- ජ්‍යාමිතික හා ස්වභාවික හැඩ භාවිත කර චිත්‍ර අඳින කඩදාසිය මත ඒවා විවිධාකාර ලෙස තබමින් ඇඳ ගැනීමට යොමු කරන්න.

3 වන පියවර

- මෙම විවිධ හැඩ නම් කිරීමට ඔවුන්ට උදව් කරන්න. සිසු අද්දැකීම් හා අදහස් ප්‍රකාශ කිරීමට, අනෙක් නිර්මාණ ගැන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා ගන්න. කඩදාසිය මත විවිධ හැඩ ඇඳීමෙන් සකස් වන නිර්මාණය ගැන අගය කරන්න.

## ක්‍රියාකාරකම 4 — මූලික හැඩ ඇසුරෙන් චිත්‍ර නිර්මාණ කරමු.

විෂය අන්තර්ගතය
කොලාජ් සිතුවම් - (Collag panting)
මිශ්‍ර මාධ්‍ය සිතුවම් - (mixed midum panting)

මෙම ක්‍රියාකාරකමින් චිත්‍ර කලාවේ ද්විමාන ස්වරූපය සහිත ජ්‍යාමිතික හා ස්වභාවික හැඩ ඇසුරෙන් චිත්‍ර නිර්මාණය කරනු ලැබේ.

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර ඇඳීන කඩදාසි
- පාට කඩදාසි
- ගම්
- වර්ණ (පැස්ටල් හෝ දියර සායම්)




1 වන පියවර

- වර්ණ කඩදාසි භාවිත කර ජ්‍යාමිතික හැඩ හා ස්වාභාවික හැඩ වෙන් වෙන් ව ඇඳ කපා ගැනීමට යොමු කරන්න. කපා ගත් හැඩ සුදු කඩදාසිය මත විවිධාකාරයෙන් ගොනු කිරීමට මඟ පෙන්වන්න. හැඩ එකිනෙකට වෙන් කරමින් හා එකිනෙක උඩ තබා බලමින් එය සිදු කිරීමට යොමු කරන්න.

2 වන පියවර

- අත්හදා බැලීම් කරන සුදුසු ගොනු කිරීම් වර්ණ කඩදාසියක් හෝ සුදු කඩදාසියක් මත අලවා ගැනීමට යොමු කරන්න. එහිදී සුදු කඩදාසියක් මත හැඩ ඇලවීමෙන් පසු සුදුසු පසුබිමක් හා රේඛාකරණයක් යොදා ගනිමින් සිතුවම නිමා කිරීමට මඟ පෙන්වන්න.







3 වන පියවර

- මෙම සිතුවම් තෝරාගත් තැනක ප්‍රදර්ශනය කරන්න. ප්‍රදර්ශනය කරන සිතුවම් සම්බන්ධ ව සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට හා අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට අවස්ථාව සලසා ගන්න.

# නර්තනය හා රංගනය

## අනුකරණය

පාසල් පරිසරයේ තිබෙන ගස් වැල් සුළඟට සෙලවෙන ආකාරය
පාසල් පරිසරයේ/නිවෙස් පරිසරයේ වෙසෙන සතුන් හා ඔවුන්ගේ චලන හා ඉරියව් අනුකරණය
පාසල් පරිසරයේ/නිවෙස් පරිසරයේ විවිධ අවස්ථා චලන මගින් නිරූපණය

- වැස්ස
- සුළඟ

## හඬ හැසිරවීම

පාසල් පරිසරයේ ඇසෙන විවිධ හඬවල්/ශබ්ද අනුකරණය
විවිධ හඬ අනුව අදහස් ප්‍රකාශනය. එකම වචනයක් හෝ වචන කිහිපයක් හෝ විවිධ අදහස් මතුවෙන ආකාරයට ඉදිරිපත් කිරීම.
උදාහරණ

- ඇයි ?
- මොකද කරන්නේ ?

**රිද්මය** - ස්වභාවික ව සිදුවන ක්‍රියාවලියකි
**තාලය** - තැලීමයි එය අත්පුඩි/තාලම්පට මගින් සිදුකළ හැකි ය.

# සංගීතය

## ක්‍රියාකාරකම 1

- මානසික සංවේදිතාවය ඇති කිරීමට අභ්‍යාසයක් කිරීම සඳහා 'ඕම්' කාරය පුහුණු කිරීම.
- පළමු ශ්‍රේණියේ සිට ම සිසුන්ගේ මානසික සමාධිය පුහුණු කිරීම තුළින් පාඩමට අවධානය රඳවා තබා ගැනීම පුහුණු කළ හැකි ය. එබැවින් සිසුන්ව නම්‍යශීලී කිරීමට 'ඕම්' කාරයට දැහැන් ගත කරවීම කළ යුතුය.

I 'ඕම්' කාරය වෙනුවට ඒ සඳහා සුදුසු ශබ්දයක් යොදා ගත හැක.

**ඉගෙනුම් සම්පත්:**
- ශ්‍රැති මංජුසාවක්/සර්පිනාවක් (විද්‍යුත් ශ්‍රැති මංජුසාවක්/ ස්මාර්ට් දුරකතනය)
- ලොකු බිත්ති ඔරලෝසුවක්

පියවර 1

- සර්පිනාවෙන් මධ්‍ය 'ස' ස්වරය වාදනය කරන්න.
- එය දෑස් පියාගෙන හොඳින් ශ්‍රවණය කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- මෙය විනාඩි පහක් පමණ කරන්න.
- දැන් සියලු සිසුන් 'ස' ස්වරයෙහි කටහඬ පිහිටුවන්නට උපදෙස් දෙන්න.

පියවර 2
- 'ස' ස්වරයට හුරු වූ දරුවන් ක්‍රමයෙන් 'රි' ස්වරය, 'ග' ස්වරය, 'ම' ස්වරයට හුරු කරවන්න.

පියවර 3

- 'ස' ස්වරයට අනුගත වී එය 'ඕම්' හඬ දක්වා හඬ විහිදුවන්න ('ඕම්' කාරය සඳහා විකල්ප ශබ්දයක් භාවිත කළ හැක) .
- 'ඕම්' හඬ විනාඩි 05 ක් පමණ අභ්‍යාස කරන්න.

පියවර 4

- ඔරලෝසු මුහුණත සිසුන්ට පෙනෙන්න තබන්න. දැන් එහි තත්පර කටුව 12න් පටන්ගෙන තත්පර 5ක පමණ වේලාවක් 'ඕම්' කාරයේ එකසේ හුස්ම රඳවා තබා ගැනීමට උපදෙස් දෙන්න.
- ශ්‍රැතියේ හඬ පවත්වා ගනිමින් 'ඕම්' කාරය දවසින් දවස ප්‍රගුණ කිරීමේදී මානසික සමාධිය සිසුන්ට ඉබේම ඇති වේ.
- ක්‍රමයෙන් තත්පර 5 ට වඩා 'ඕම්' කාරයේ සිටීමට සිසුන්ට ක්‍රම ක්‍රමයෙන් හැකියාව ලැබේ. අවසානයේ එය භාවනාවක තත්වයට වර්ධනය වේ.

## ක්‍රියාකාරකම 2

- ගීතයක් ගැයීමේ හැකියාව සංවර්ධනය කිරීම සඳහා ස්වර 02, 03ක් අතරේ විහිදී ගිය ගීතයක් ගායනා කිරීමට සූදානම් වීම.

ඉගෙනුම් සම්පත්

- සර්පිනාවක්
- තාලම්පොටක්
- රබානක්/ දර්බක් එකක්

පියවර 1

- ගීතය ගුරුවරයා විසින් ලයාන්විත හඬකින් සුදුසු සම්පත් යොදා ගනිමින් සිසුන්ගේ යහපත් ආකල්ප සංවර්ධන සඳහා ගීතය ගායනා කරන්න.

**හොඳ දේ හිතමී - හිතූ දේ කියමී**
**කියූ දේ කරමී - කරමින් හැදෙමී**

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තූ දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස - | ස - ස - |
| කි යූ දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

- සමාජ හා චිත්තවේග කුසලතා ඉස්මතුවන ආකාරයෙන් මෙම ගීතයේ කියවෙන අදහස පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සුදුසු අංග චලන යොදා ගනිමින් ගීතය ගායනා කර පෙන්වන්න.

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
# ගුරු මාර්ගෝපදේශය

# 1. Introduction

Education Reforms - 1998 has introduced English Language for all the students of Sri Lanka from grade 1 onwards to provide an equal opportunity of using English Language for communication and comprehension. This is known as 'Activity Based Oral English'. The name itself suggests that students are exposed to language through play activities and songs and they are unaware that they are learning a language.

Activity Based Oral English is introduced by the class teacher of Grade 1 to 5 while doing the Elementary Science and Environment Related Activities (ES and ERA) and Mathematics, as it is theme-based. Further 10 minutes is allocated for ABOE from the timetable 2023 onwards to convince the importance of Activity Based Oral English. Two weeks are allocated to introduce a theme in ES and ERA subject. During this period, the teacher is expected to make the students aware of and use the simple words and expressions of the English language that are needed to use in their day-to-day activities related to that particular theme, through play activities and songs.

Though the formal teaching of English takes place from grade 3 by a professionally qualified teacher of English, the primary class teacher is required and requested to continue doing ABOE to help the students in the primary grades to acquire and use the language they learn in their day-to-day life situations appropriately.

Through Activity Based Oral English, it is expected to provide an environment to acquire the language and use the language they acquired confidently.

To assist the teacher and the student during the learning teaching process of ABOE, 3 Activity books, 3 Teacher Handbooks, audio-video materials related to all the vocabulary, language expressions, songs, games, stories, and classroom language introduced are provided for each grade 1 to 5.

Teachers and principals of all the schools are expected to provide the opportunities for each and every child to use the language by organizing English Literary Associations, English Camps, Play houses, Play fairs, Concerts, etc.

## 2. Objectives of Introducing Activity Based Oral English

- To improve the students' Listening Skills
- To improve the students' Speaking Skills
- To improve the students' Vocabulary
- To improve the students' interest towards learning English
- To improve the students' Aesthetic Skills
- To improve the students' confidence in using English in and outside the classroom
- To provide a rich environment to acquire English Language
- To provide equal opportunity for all

## 3. Key concepts and definitions

| | |
|---|---|
| **Language use** | Engaging in active listening and speaking for effective communication in order to fulfill the needs of day to -day- life. |
| **Vocabulary development** | Making authentic connections of high frequency, low frequency and multiple meaning words meaningfully and automatically to access general communication. |
| **Learning of the language** | Acquiring grammatical arrangement of words and phrases in sentences with mechanics of language and using them practically in discourse. |
| **Enjoyment, imagination and creativity** | Using spoken, written, and visual language in a variety of literary texts to accomplish enjoyment, language development, morals, creativity, imagination and critical thinking skills. |
| **Subject integration** | Identifying and using domain specific language in order to engage in cross curricular learning contexts. |

# 4. Language areas in focus within the curriculum in Primary Education ABOE

1. **Listening and understanding** – The students are expected to listen attentively according to accepted norms in order to engage in live communication, respond appropriately and to record key information.

2. **Speaking for Interaction** – Developing a learner friendly platform to build up learner confidence within and outside the classroom that enriches the natural flow of communication. Students are expected to use appropriate social and academic conventions of spoken discourse for oral communication with individuals and in groups in both formal and informal familiar settings.

3. **Readiness for Reading** – Students are expected to identify the letters of the alphabet and, articulates and differentiates the sounds of the individual letters.

4. **Readiness for Writing** – Students are expected to trace the patterns of writing practice and trace the letters of the alphabet.

5. **Literature and Collaborative Activities for Enjoyment** – Students are expected to engage in a variety of simple literary texts with collaborative activities which ensures language acquisition and learning in an enthusiastic manner and develop a positive attitude towards language learning at an early stage of their learning. Providing ample opportunities for the learner to appreciate the aesthetic aspects of life at an early stage is also identified as a key focus in this language area.

## At the End of the Key Stage 3 (Primary Grade 5) Students can do:

## Listening and Understanding

- listen to short simple texts in order to understand and respond in a variety of situations for a variety of purposes.
- follow simple instructions related to real life and learning areas.
- Listen and responds to simple questions related to real life and learning areas.
- Identify familiar words from short simple texts related to real life and learning areas.
- Extract specific information from short simple texts related to real life and learning areas.

### Speaking for Interaction

- Initiate and maintain simple interactions with others in grade appropriate contexts related to real life and learning areas.
- Ask for and give information related to personal details and learning areas.
- Talk about familiar topics and learning areas using words, phrases and short simple sentences.

## 5. Level descriptors

1. **Can recognize** familiar words and phrases in simple spoken texts related to self, family, classroom and immediate environment, play, games, civics and basic life skills when spoken clearly at a slow pace.
2. **Can communicate** on topics related to self, family, classroom and immediate environment, play, games, civics and basic life skills using words and phrases practiced and memorized.
3. **Can attempt** to present and give limited information on familiar topics related to self, family, classroom and immediate environment, play, games, using words, phrases, simple sentences and expressions practiced and memorized.
4. **Can enjoy** and actively respond to simple rhymes, chants, action songs and stories.
5. **Can enjoy** and attempt to use practised and memorized words and phrases in games and collaborative learning activities

## හැඳින්වීම සහ උපදෙස්

සිසුවා තමාගේ මව්බස උගත් ආකාරයෙන් ම, දෙවන බස ද ඉගෙන ගැනීමට අවකාශය සැලසීම සඳහා දෙවන බස, පන්ති කාමරයේදී අසන්නට සැලැස්වීම ඔබගෙන් බලාපොරොත්තු වෙමු.

ඒ සඳහා පළමු ව සිසුන්ට ලබා දී ඇති ක්‍රියාකාරකම් පොත සහ ගුරු අත් පොතෙහි ඇති උපදෙස් හොඳින් අධ්‍යයනය කරන්න.

සිසුන්ට ඇසීමට සැලැස්විය යුතු වචන, වැකි සහ ගීත හොඳින් කියවා බලන්න.

ඒ සඳහා පිළියෙල කර ඇති හඬ පටවලට සවන් දී, වචන, වැකි සහ ගීත නිවැරදි ව උච්චාරණය කරන ආකාරය සහ ගීත ගායනා කරන ආකාරය හුරුපුරුදු වන්න.

කුඩා සිසුන්ට නිවැරදි ව සැම විට ම උච්චාරණය කිරීමට නොහැකි වනු ඇත. වැරදියට උච්චාරණය කරන අවස්ථාවල දී අප එය නිවැරදි කිරීම සඳහා උත්සාහ නොගත යුතු අතර, ගුරුවරයා සිසුන්ට ඇසෙන්නට නිවැරදි ව උච්චාරණය කිරීම කළ යුතුයි.

ක්‍රියාකාරකම් පොතෙහි, ක්‍රියාකාරකම් 46ක් ඇතත්, එම ක්‍රියාකාරකම් නිර්මාණය කර ඇත්තේ හුරුපුරුදු කිරීමට අවශ්‍යය වචන සහ වැකි, නැවත නැවතත් ඇසීමට සැලැස්වීමට ය.

සිසුවාට පළමු වාරයේ දී උකහා ගැනීමට (to aquire) සලස්වන්නේ වචන හැටක් (60) සහ වැකි පහළොවක් (15) සහ ගීත (20)ක් පමණි. ගීත තුළින් විනෝදාත්මක ව සහ නොදැනුවත්ව ම, මව්බස උගත් ආකාරයෙන් වචන සහ වැකි උකහා ගැනීමට අවස්ථාව සලසා දීම බලාපොරොත්තු වෙමු.

ඒ සඳහා හඳුන්වා දී ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් භාවිත කළ හැක. ඔබගේ නිර්මාණශීලීබව මෙහිදී ඉතා වැදගත් වේ. අදාළ ඉගෙනුම් පල සඳහා සිසුවා රැගෙන යාම ඔබගෙන් බලාපොරොත්තු වෙමු.

පින්තූර වර්ණ ගැන්වීම ද, ගුරුවරයාගේ දැනුම ඇතුව, ගුරුවරයා පවසන විට වර්ණ ගැන්වීම සිදු කළ යුතු ය. ඒ තුළින් සිසුවාගේ සවන් දීමේ හැකියාව සහ සවන් දී අදාළ වර්ණ ගැන්විය යුතු පින්තූරය හඳුනා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම ද අපේක්ෂා කෙරේ.

සිසුවා අපහසුතාවයට පත් නොවන අයුරින්, ඔහුගේ හෝ ඇයගේ ආත්ම ගෞරවයට හානි නොවන ආකාරයෙන්, ප්‍රිය ජනක ලෙස, මෙම ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සිසුවා හඳුනා ගත් වචන, වැකි සහ ගීත ඉදිරිපත් කිරීමට සහ රඟ දැක්වීමට අවස්ථාව ලබා දීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

සිසුන් ව ඇගයීමේ දී එය ඔවුන් නොදැනුවත්ව ම කණ්ඩායම් වශයෙන් සහ යුගල සහ, ඒකල වශයෙන් ක්‍රියාකාරකම් ඇසුරින් ම සිදු කළ යුතුය. එකිනෙක සිසුන් සැසඳීම කිසිසේත් ම සිදු නොකළ යුතුයි.

සිසුවාට ක්‍රියාකාරකමක දී වචන හෝ වැකි හෝ ගීත හෝ පැවසීම සිදු කළ නොහැකි වූ විටක, නැවත නැවතත් පන්ති කාමරයේ දී එම ක්‍රියාකාරකම් සිදු කිරීම තුළින් සිසුවා සවිමත් කළ යුතු ය.

ආචාර්ය ටී. චන්ද්‍රිකා පීරිස්

## Activity - 1 Song: Good morning to You…

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.1 Greets and responds to greetings | Good morning to you //<br>Good morning, dear children.<br>Good morning to you //<br>Good morning to you //<br>Good morning, dear teacher.<br>Good morning to you //<br>Good morning, children.<br>Good morning teacher. | Greets appropriately.<br>Greets politely.<br>Greets using a song appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- එකිනෙකාට ආචාර කිරීමේ දී දෑත් තබා ගත යුතු ආකාරය සිසුනට කියා දෙන්න.
- Good morning යැයි පැවසීමේ දී අත් දෙකෙහි අත්ල දෙක එකිනෙක මත ස්පර්ශ වන සේ සිරස් ව නිකටට පහතින් ළය මත තබා ගෙන "Good morning" කියා පැවසීමට කියා දෙන්න.
- ගීතයේ පළමු කොටස ඔබ ගැයූ පසු ගීතයේ දෙවන කොටස එනම් 4, 5, 6 පේළි සිසුන් ලවා ගැයීමට උපකාර වන්න.
- මෙලෙස දිනපතා ඉංග්‍රීසි පාඩම ආරම්භයේදී මේ ගීතය ගයා ආරම්භ කරන්න.

**Classroom Language**

| | |
|---|---|
| Teacher: | Children, stand up. |
| | Good morning, children. |
| Students: | Good morning, teacher. |
| Teacher: | Now we are going to sing a song. |
| | First, let's listen. Are you ready? |
| Students: | Yes, teacher. |

**තක්සේරු කිරීම:**

| Criteria | Yes |
|---|---|
| Greets ආචාර කරයි./ සුබ පතයි. | |
| Greets using a song ගීතයක් ඇසුරින් සුබ පතයි. | |

## Activity -2 Self - Introduction - Name

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.2 Asks for and gives information related to personal details and learning areas | Self - introduction<br>I'm …<br>Personal information - Name | Gives personal information -name politely on self. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ඔබගේ නම පවසා හඳුන්වා දෙන්න උදා: I'm……………
- මෙහි සමනලී වෙනුවට ඔබේ නම භාවිත කරන්න
- ඒ පරිද්දෙන් එකිනෙක සිසුවාට තමා හඳුන්වා දීමට උපකාර කරන්න

| | | |
|---|---|---|
| **Teacher** | : | I'm Samanali. |
| **Student 1** | : | I'm Shyama. |
| **Student 2** | : | I'm Raju. |
| **Teacher** | : | Now children, stand up one by one. Tell your name. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Introduces self - Says the name.<br>තමාගේ නම ප්‍රකාශ කර තමා හඳුන්වා දෙයි | |

## Activity - 3 Game: Pass the Ball

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.2 Asks for and gives information related to personal details | Game - Pass the Ball – What's your name? I'm.. | Asks for and gives information politely- name |

**ඉගෙනුම් සම්පත්** : ABOE - ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත, බෝලයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ඔවුන් ක්‍රීඩාවක් කිරීමට සූදානම් වන බව පවසන්න.

  'Today we are going to do a game. Are you ready?'

- සිසුන් මුහුණට මුහුණලා පේළි දෙකක් සෑදීමට පවසන්න.
- බෝලය අතට ගෙන පේළියේ එක් කොනක සිට උදාහරණයේ දැක්වෙන පරිදි ඔබගේ නම පවසන්න.

  උදාහරණ: I'm ………………
- පේළියේ ඉදිරිපසින් සිටින සිසුවාට බෝලය යොමුකොට ඔහුගේ/ ඇයගේ නම 'What's your name?' ලෙස විමසන්න.
- බෝලය අල්ලා ගත් සිසුවාට ඔහුගේ / ඇයගේ නම 'I'm..........'ලෙස පවසා ඉදිරිපසින් සිටින සිසුවාට බෝලය විසිකර යවා 'What's your name?' ලෙස විමසන ලෙස පවසන්න.
- සෑම සිසුවෙකුටම තව කෙනෙකුගේ නම විමසීමට සහ තම නම පැවසීමට අවස්ථාව ලැබෙන පරිදි මෙම ක්‍රීඩාව සිදු කරන්න.

| | | |
|---|---|---|
| **Teacher** | : | Today we are going to do a game, 'Pass the Ball'. |
| | | Are you ready? |
| **Students** | : | Yes, teacher. |
| | | (Teacher has a ball in her hands). |
| **Teacher** | : | Children, Let's form two lines. |
| | | I'm Samanali. (Teacher passes the ball to the first student and asks,) |
| | | What's your name…? |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Says the name නම පවසයි | |
| Asks the name නම විමසයි | |
| Plays the game actively ක්‍රීඩාව ක්‍රියාශීලී ව සිදු කරයි | |

## Activity - 4 Song: What's Your Name?

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.2 Asks for and gives information related to personal details | Song – What's your name?<br>I'm Shyama //<br>What's your name?<br>I'm ….. | Asks for and gives information politely- name |

**ඉගෙනුම් සම්පත්** : ABOE - ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත, බෝලයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- ඔබ සමග ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.
- ශ්‍යාමා යන නම වෙනුවට ඔබගේ නම යොදා ගීතය ගායනා කරන්න.
- සියලු ම සිසුන්ට මේ ආකාරයෙන් ගීතය ගයමින් තමාගේ නම පැවසීමටත් යහළුවකුගේ නම විමසීමටත් උදවු කරන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, now Shyama, Arshak, Meena, Bindu, Zeenath and Raju are going to tell their names using a song. Let's listen |
| **Teacher:** | Now, let's sing.Use your name and sing. |
| | Are you ready! |
| **Students:** | Yes, teacher. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Says the name using a song.<br>ගීතය භාවිත කරමින් තමාගේ නම පවසයි | |
| Asks the name using a song.<br>ගීතය භාවිත කරමින් නම විමසයි | |

## Activity - 5 Song: Self - Introduction - Name and Grade

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.2 Asks for and gives information related to personal details | Self- introduction<br>I'm …<br>I'm in grade...<br>Personal information - name, grade<br>I'm Shyama // I'm in grade 1<br>I'm Arshak // I'm in grade 1<br>I'm Meena // I'm in grade 1<br>La la la la la la la la la la la la<br>I'm Raju // I'm in grade 1<br>I'm Zeenath // I'm in grade 1<br>I'm Bindu // I'm in grade 1 | Gives personal information - name and grade politely on self |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයේ ක්‍රියාකාරකම් පොතෙහි චරිත හඳුන්වා දෙන්න
- මේ සඳහා ඔවුන්ගේ පින්තූර භාවිත කර එකිනෙක චරිත සඳහා කාඩ්පත් සකසා ගන්න.
- උදාහරණ වශයෙන් ශ්‍යාමාගේ පින්තූරය ඇතුළත් කාඩ්පත ගෙන පෙන්වා ශ්‍යාමා කතා කරන ආකාරයට "I'm Shyama. I'm in grade 1" කියා හඳුන්වා දෙන්න.
- මේ ආකාරයට අනෙක් චරිත 5 ද හඳුන්වා දෙන්න.
- ඉන් පසු සිසුන්ට තමාගේ නම සහ පන්තිය ඉහත ආකාරයට පැවසීමට උපකාර කරන්න.

**Teacher:** Children, today we are going to sing a song with actions. are you reday? First let's listen to the song.

I'm Shyama. I'm in Grade 1.
I'm Arshak. I'm in Grade 1.
I'm Meena. I'm in Grade 1.
la la la la la la la la la la la la
I'm Raju. I'm in Grade 1.
I'm Zeenath. I'm in Grade 1.
I'm Bindu. I'm in Grade 1.

**Teacher :** Now let's sing the song with actions.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Says the name තමාගේ නම පවසයි. | |
| Says the grade තමාගේ පන්තිය පවසයි. | |

## Activity - 6 Song: Let's Introduce Our Friends

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | Let's Introduce our friends<br>I'm...<br>This is... | Introduces self appropriately.<br><br>Introduces persons appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- දෙදෙනා බැගින් සිසුන් ව කණ්ඩායම් කරන්න.
- දෙදෙනා බැගින් වූ කණ්ඩායමකට පන්තිය ඉදිරියට පැමිණීමට පවසන්න.
- ක්‍රියාකාරකම් පොතේ පෙන්වා දී ඇති ආකාරයට පළමු ව තමාගේ නම පවසා (I'm……) තමාගේ යහළුවාගේ නම (This is……) යැයි අනෙක් දෙදෙනාට හඳුන්වා දීමට සහ ඒ ආකාරයෙන් ම අනෙක් කණ්ඩායම හඳුන්වා දීමටත් උපකාර වන්න.

  උදා: Shyama: I'm Shyama. This is Arshak.

  Meena: I'm Meena. This is Raju.

| | | |
|---|---|---|
| **Teacher** | : | Now children, Shyama is introducing herself and Arshak.<br>Meena is introducing herself and Raja.<br>Let's listen to them. Help them to sing the song using rheir names. |
| **Students** | : | I'm Shyama. This is Arshak. |
| **Teacher** | : | I'm Meena. This is Raja |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Introduces self තමා හඳුන්වා දෙයි. | |
| Introduces persons තමා දන්නා පුද්ගලයෙකු හඳුන්වා දෙයි. | |

## Activity - 7 Song: Books and Pencils

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively. | Song: Books and pencils//<br>Erasers, bags//<br>Bottles of water//<br>In the class//<br>Books and rulers//<br>Erasers, bags//<br>Bottles of water//<br>In the class// | Sings an action rhyme on classroom objects with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ගීතයට අදාළ අංග චලන ඉදිරිපත් කරමින් ගීතය ගයන්න/ හඬ පටය වාදනය කරන්න. උදා - ඔබ books යන වචනය ගායනා කරන විට පොත් පෙන්වන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to sing a song with actions. Are you ready?<br>First, let's listen to the song. |
| **Teacher:** | Now, let's sing the song with actions |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 8 Game: Show and Say (Objects in the Classroom)

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life. | Show and Say – Objects in the classroom | Introduces objects in the classroom appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ක්‍රීඩාවක් කිරීමට යන බව සිසුන්ට පවසන්න.
- පැන්සල පෙන්වා "This is my pencil" කියා පවසන්න.

  පසුව සිසුන් ළඟ තිබෙන පැන්සල පෙන්වා 'This is my pencil' කියා පැවසීමට අවස්ථාව දෙන්න.
- මේ අයුරින් අනෙක් වචන ද එකින් එක හඳුන්වා දෙන්න. ක්‍රමක්‍රමයෙන් වේගය වැඩි කරමින් මෙය ක්‍රීඩාවක් ආකාරයට සිදු කරන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to do a game. Let's start.<br>Look, this is my pencil.<br>Now show me your pencil and say, "This is my pencil"<br>Are you ready? |
| **Teacher:** | This is my eraser. (Teacher shows an eraser.) |
| **Students:** | This is my eraser. (They show their erasers and say. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Identifies the objects - book, pencil, eraser, bag, ruler, bottle of water<br>භාණ්ඩ/ උපකරණ හඳුනා ගනියි - book, pencil, eraser, bag, ruler, bottle of water | |

## Activity - 9 Objects in the Classroom - Listen and Colour

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1 Follows simple instructions (2-3 word) related to real life and learning areas | Listen and colour- objects pencil, bottle, bag, eraser, book | Listens and colour the objects correctly. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

මෙහි සඳහන් කර ඇති පරිදි මව්බස සහ ඉංග්‍රීසි බස යන භාෂා දෙකෙන් ම ඔවුනට උපදෙස් දෙන්න අද අපි පින්තූර පාට කරන්නයි යන්නේ.

Children, today we are going to colour the objects in the classroom.

- සිසුන්ට පාට පැන්සල් සහ ක්‍රියාකාරකම් පොත ගෙන සූදානම් වෙන ලෙස පවසන්න.'Now, get ready with your colour pencils and the ABOE Activity Book.'
- පාට කිරීමට පැවසීමට පෙර ඔවුනට වචන මතක දැයි බැලීමට "What can you see in this picture?" යැයි විමසන්න. ඔබට හොඳින් ඇහුම්කන් දී ඔබ පවසන වචනයට අදාළ පින්තූරය පමණක් ම පාට කිරීමට උපදෙස් දෙන්න.
- ඔවුන් පාට කරන අතරතුරේ දී පන්තිකාමරය තුළ ඇවිදිමින් ඔවුන් ව නිරීක්ෂණය කරන්න.
- පාට කිරීම සඳහා කාලය ගතවන බැවින් දිනකට **පින්තූර දෙකක් හෝ තුනක් නිදහසේ පාට කිරීමට අවස්ථාව ලබා දෙන්න. (ඔබ පැවසූ පින්තූර පමණි.)** මෙම ක්‍රියාකාරකම තුළින් දරුවන්ගේ සවන් දීමේ කුසලතාවය දියුණු කිරීමත් වචන නැවත නැවතත් අසන්නට ලැබීමෙන් මතකයේ රැඳීමට උපකාර වීමත් බලාපොරොත්තු වේ.
- වැරදියට පාට කර ඇත්නම් වැරදි ලකුණ නොදමන්න. නිවැරදි රූපය පාට කිරීමට උදවු වෙන්න. හැකි සෑම විට ම ඉංග්‍රීසි භාෂාවෙන් උපදෙස් දෙන්න.
- **"Colour the pencil" යනුවෙන් පවසා, එය මව්බසින් නොපවසන්න ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ම උපදෙස් දෙන්න**

  (හරි සලකුණ යොදන අතර ගුරුවරයා විසින් 'What is this object?'/'Show me the pencil' යන්න සිසුන්ගෙන් විමසන්න.)

- සිසුන් සියලු දෙනා ම රූප නිවැරදි ව හඳුනා ගත් පසුව පහත ගීතය ඔවුන් සමග ගායනා කරන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to colour the objects in the classroom. |
| | Now, get ready with your colour pencils.Students, are you ready? |
| **Students:** | Yes, teacher. |
| **Teacher:** | Colour the pencil. |

(Teacher goes around the classroom observing, whether they are colouring the correct picture.)

| | |
|---|---|
| **Teacher:** | Colour the bottle. |
| | Colour the ruler. |
| **Teacher:** | Ok children. Now bring your books. Stand in a line, one behind the other. |

(While marking the book, teacher asks, 'What is this object?' / 'Show me the pencil')

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Listens and colours the objects සවන් දී වර්ණ ගන්වයි. | |

## Activity - 10 Song: Places in the School

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | Places in the School<br>School, classroom, toilet, canteen, office, playground, library<br>**Song:**<br>Office //// where principal is //<br>Classroom //// where we learn //<br>Library //// where we read //<br>Playground //// where we play //<br>Canteen //// where we eat //<br>Washroom //// where we clean //<br>These are places // in my school // | Introduces places in the school appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**:

- ගීතය ගායනා කර / හඬ පටය වාදනය කර සිසුන්ට ඇසීමට සලස්වන්න.
- අදාළ පින්තූර කාඩ් පත් පෙන්වමින් මෙම ගීතය සිසුන් සමග ගයන්න.
- සිසුනට මෙම පින්තූර කාඩ් පත් බෙදා දී ගීතය ගයන අතරතුරදී, අදාළ පින්තූර කාඩ් පත පෙන්වමින් ගීතය ගැයීමට සලස්වන්න.

| | | |
|---|---|---|
| **Teacher** | **:** | Children, today we are going to sing a song with actions.<br>Are you ready?<br>First, let's listen to the song. |
| **Teacher** | **:** | Now, let's sing the song with actions. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 11 People in the School

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | People in the School Principal, teacher, security guard, friends.<br>This is our..<br>This is my… | Introduces persons in the school appropriately |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, සකස්කර ගත් විදුහල්පති, ගුරුවරයා, ආරක්ෂක නිලධාරියා සහ මිතුරන්ගේ රූප ඇතුළත් පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**:

- පින්තූර කාඩ් පත් පෙන්වමින් පුද්ගලයා/ පුද්ගලයින් හඳුන්වා දෙන්න.

  principal, teacher, security guard, friends
- ක්‍රියාකාරකම් පොතේ පින්තූරයේ රාජුව පෙන්වා, ඔහු තම පාසලේ පුද්ගලයන් ව හඳුන්වා දෙන බව පවසන්න. ඔබ රාජා ලෙස රඟපාන බව පවසා එකිනෙක පුද්ගලයන් ව හඳුන්වා දෙන්න.

Raju: This is our principal sir.
This is our teacher.
This is our security uncle.
These are my Friends.

| | | |
|---|---|---|
| **Teacher** | **:** | This is Raju. He is introducing the principal, teacher, security guard and friends in his school. |
| **Raju** | **:** | This is our principal sir.<br>This is our teacher.<br>This is our security uncle.<br>These are my friends. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Introduces people in the school. පාසලේ සිටින පුද්ගලයින් හඳුන්වා දෙයි. | |

## Activity - 12 Song: Bits of Paper

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively. | Song - Bits of Paper<br><br>Bits of Paper //<br>Lying on the ground//<br>Make the place untidy//<br>Pick them up// | Sings an action rhyme on 'Bits of paper' with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- දී ඇති ගීතය ඔබ හෝ අදාළ හඬ පටය වාදනය කරන්න එම ගීතයට අදාළ රංගනයේ යෙදෙමින් ඔබ ද ගීතය ගයන්න.

| | | |
|---|---|---|
| **Teacher** | **:** | Children, today we are going to sing a song with actions.<br>Are you ready? Let's listen to the song.(Teacher sings/ plays the audio and does the actions.) |
| **Teacher** | **:** | Now, let's sing the song with actions. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 13 Song: Red and Yellow

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively. | Song:<br>Red and yellow//<br>Green, blue and white//<br>Colours of the flowers//<br>We like them// | Sings an action rhyme on colours with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, සකස්කර ගත් රතු, කහ, කොළ, නිල් සහ සුදු වර්ණ කාඩ්පත්. සිසුන් හතළිස් දෙනකු සිටි නම් පාට පහ සදහා පාට පහෙන් කාඩ් පත් 9 බැගින් වන සේ කාඩ් පත් 45 සකස් කළ යුතුය. (ගුරුවරයාටත් පාට පහෙන්, එක බැගින් පහක් අවශ්‍ය නිසා)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- පළමු ව අදාළ වර්ණ සහිත කාඩ් පත් එකින් එක පෙන්වමින් එම වර්ණ සිසුන්ට හඳුන්වා දෙන්න.
- සෑම සිසුවකුට ම සකස් කරගත් කාඩ් පත බැගින් බෙදා දෙන්න.
- සුදුසු අංග චලන සහිත ව සිසුන් සමග ගීතය ගායනා කරන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to sing a song with actions.<br>Are you ready?<br>First, let's listen to the song. |
| **Teacher:** | Now, let's sing with actions. |
| **Teacher:** | Now, let's sing the song. You must show your colour card. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity- 14 Listen and Colour

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1 Follows simple instructions (2-3 word) related to real life and learning areas | Listen and colour- objects dog, bird, cat, car, flowers. white, blue, yellow, green, red. | Listens and colour the objects correctly. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- මෙහි සඳහන් කර ඇති පරිදි මව්බස සහ ඉංග්‍රීසි බස යන භාෂා දෙකෙන් ම ඔවුනට උපදෙස් දෙන්න. අද අපි පින්තූර පාට කරන්නයි යන්නේ.
- සිසුන්ට පාට පැන්සල් සහ ක්‍රියාකාරකම් පොත ගෙන සූදානම් වෙන ලෙස පවසන්න.

  'Now, get ready with your colour pencils and the ABOE Activity Book.'
- ඔබට හොඳින් ඇහුම්කන් දී, ඔබ පවසන වචනයට අදාළ පින්තූරය පාට කිරීමට උපදෙස් දෙන්න.
- ඔවුන් පාට කරන අතරතුරේ දී පන්තිකාමරය තුළ ඇවිදිමින් ඔවුන්ව නිරීක්ෂණය කරන්න.
- පාට කිරීම සඳහා කාලය ගතවන බැවින් දිනකට **පින්තූර දෙකක් හෝ තුනක් නිදහසේ පාට කිරීමට අවස්ථාව ලබා දෙන්න. (ඔබ පැවසූ පින්තූර පමණි.)** මෙම ක්‍රියාකාරකම තුළින් දරුවන්ගේ සවන් දීමේ කුසලතාවය දියුණු කිරීමත් වචන නැවත නැවතත් අසන්නට ලැබීමෙන් මතකයේ රැඳීමට උපකාර වීමත් බලාපොරොත්තු වේ.
- වැරදියට පාට කර ඇත්නම් වැරදි ලකුණ නොදමන්න. නිවැරදි රූපය පාට කිරීමට උදවු වෙන්න.
- හැකි සෑම විට ම ඉංග්‍රීසි භාෂාවෙන් උපදෙස් දෙන්න.

| | | |
|---|---|---|
| **Teacher** | **:** | Students, today we are going to colour some pictures.<br>Do you like it?<br>Then, get ready with your colour pencils.<br>**Listen and colour.**<br>1. Colour the dog **white.**<br>2. Colour the bird **blue.**<br>3. Colour the cat **yellow.**<br>4. Colour the car **green.**<br>5. Colour the flowers **red.** |
| **Teacher** | **:** | Okay children. Now bring your books. Stand in a line, one behind the other. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Listens and colour the objects සවන් දී වර්ණ ගන්වයි. | |

## Activity- 15 Song: Family Members

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life. | **Song:**<br>Father mother sister brother<br>I love you<br>Grandfather grandmother<br>I love you | Introduces members of the family appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- මෙහි දී ඇති ගීතය ඔබ හෝ අදාළ හඬ පටය වාදනය කරන්න.
- අදාළ පින්තූර කාඩ්පත පෙන්වමින් සිසුන් සමග ගීතය ගායනා කරන්න.

**Assessment:**


| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 16 A. B, C - Family Members

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life. | Family Members- father, mother, grandfather, grandmother, sister, brother, me<br>This is our family photograph.<br>This is my father.Etc., | Introduces members of the family appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, ඇමුණුම් 01 දක්වා ඇති පවුලේ සාමාජිකයින්ගේ සකස් කළ පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**




- පවුලේ සාමාජිකයන්ගේ රූප පෙන්වමින් ඔවුන් හඳුන්වා දෙන්න.

උදා: 'This is my father'

**සැලකිය යුතු**

16 (C) - ක්‍රියාකාරකමෙහි දක්වා ඇති ඉස්ලාම් පවුලට අදාළ grandfather සහ grandmother යන නාමයන් නිවැරදි කර සිසුන් වෙත ඉදිරිපත් කිරීමට කාරුණික වන්න.

**Teacher** : This is Shyama / Zeenath /Meena.

Shyama / Zeenath /Meena is describing her family photograph.

**Shyama / Zeenath /Meena:** This is our family photograph.

This is my father. This is my mother.

This is my grandfather. This is my grandmother.

This is my brother, and this is me. (Teacher points and says).

**Assessment:**

| Criteria members of | Yes |
|---|---|
| Introduces the members of the family. පවුලේ සාමාජිකයන් හඳුන්වා දෙයි. | |

## Activity - 17 Family Members – Draw and Describe

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life situations | Draw & describe family photograph | 1.1 Draws, colours and introduces the members of the family appropriately |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි තමන්ගේ පවුලේ සාමාජිකයින් අඳින ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන් තමන්ගේ පවුලේ සාමාජිකයින් ඇඳ වර්ණ ගැන්වීමෙන් පසුව ඒ එක් එක් අයව පහත ආකාරයට හඳුන්වා දීමට අවස්ථාව දෙන්න.

  උදා: This is my father/ mother

**Teacher:** Children, now draw your family photograph.

- Colour it.
- Describe your family photograph.

Help the students to describe their family photograph using the structure

'This is my ….

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Draw the family photograph. පවුලේ පින්තූරයක් අඳියි. | |
| Colour the family photograph. පවුලේ පින්තූරය වර්ණ ගන්වයි. | |
| Introduces members of the family. පවුලේ සාමාජිකයන් හඳුන්වා දෙයි. | |

## Activity 18 - Song: This is My House

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively. | **Song:**<br>This is my house//<br>That is the roof//<br>These are windows//<br>That is a door//<br>This is my house… | Sings an action rhyme on 'This is my house'…with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සුදුසු අංග චලන සහිතව සිසුන් සමග ගීතය ගායනා කරන්න.
- කිහිප වරක් ගායනා කිරීමෙන් පසුව සිසුන්ට කණ්ඩායම් වශයෙන් ගීතය ගායනා කිරීමට අවස්ථාව දෙන්න.

| | | |
|---|---|---|
| **Teacher** | : | Children, today we are going to sing a song with actions.<br>Are you ready?<br>First, let's listen to the song. |
| **Teacher** | : | Now, let's sing with actions. |
| **Teacher** | : | Now, let's sing the song. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 19 - My Home / My House – Describing parts of a house

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.4 Talks about familiar topics and learning areas (using 5-10 words) | My Home<br>Arshak Describes...<br>This is …<br>My home has … green and orange walls, one door, four windows, a brown roof | Talks about my home meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- අර්ශක් තමන්ගේ නිවසේ කොටස් විස්තර කරන බව පවසමින් ඔබ අර්ශක් ලෙස එම රූපය පෙන්වමින් අදාළ වචන අවධාරණය කරමින් පහත ආකාරයට විස්තර කරන්න.

> This is my home.
> My home has green and orange walls.
> My home has one door.
> My home has four windows.
> My home has a brown roof.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Talks about my home/ my House. 'මගේ ගෙදර / නිවස' ගැන කතා කරයි. | |

## Activity - 20  Parts of a house - Listen and Colour

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.1 Follows simple instructions (2-3 word) related to real life and learning areas. | Parts of a house<br>Listen and Colour | Listens and colour the parts of the house correctly. |

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- හොඳින් සවන් දෙමින් ප්‍රකාශ කරන වර්ණ අනුව නිවසෙහි රූපය පාට කිරීමට සිසුන්ට පවසන්න.
- ක්‍රියාකාරකම 15හි ලෙස සිසුන් වර්ණ ගන්වන ලද රූපය විස්තර කිරීමට ඔවුන්ට උදවු කරන්න.

**Teacher** : Students, today we are going to colour some pictures. Do you like? Then get ready with your colour pencils.
Listen to the teacher and colour the parts of the house.
1. Colour the roof in red.
2. Colour the wall in yellow.
3. Colour the door in blue.
4. Colour the windows in green.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Listens and colours the parts of the house. සවන් දී නිවසේ කොටස් වර්ණ ගන්වයි. | |

## Activity: -21 Song: Shyama's Good Habits

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life. | Shyama's Good Habbits<br>I help my mother<br>I make the bed /// after getting up//<br>I wash my cup /// after drinking tea //<br>I wash my plate /// after eating rice //<br>I flush the toilet /// after using it // | Introduces actions related to good habits appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- "I drink milk in the morning…" ගීතයේ තාලයට ගීතය ගායනා කරන්න. පින්තූර කාඩ්පත් හෝ අභිනයෙන් හෝ රඟ දක්වමින් ගීතය ගායනය කරන්න.

**Teacher** : Shyama is a good girl.
Let's listen to her good habits.

I make the bed /// after getting up //
I wash my cup /// after drinking tea //
I wash my plate /// after eating rice //
I flush the toilet /// after using it //

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 22 Song: I' m a plant.

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.4 Talks about familiar topics and learning areas (using 5-10 words) | I am a plant<br>I have leaves, flowers, buds, roots, fruits<br>I have roots // I have roots<br>I have leaves // I have leaves<br>I have buds // I have buds<br>I have flowers // I have flowers<br>I have fruits // I have fruits<br>I am a plant // la la la la la | Talks about 'I'm a Plant' meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි අදාළ රූපය පෙන්වමින් හෝ කාඩ්පතක විශාල ව සකස් කර ගත් පැළෑටියක රූපයක් පෙන්වමින් කොටස් වෙන වෙන ම සිසුන්ට හඳුන්වා දෙන්න. එම වචන සිසුන්ට නැවත කීමට පවසන්න.
- පසුව පැළෑටියක් හඳුන් වන ආකාරයට I have යන වචන ද භාවිත කරමින් සිසුන් ලවා එම කොටස් හඳුන්වා දෙන්න.
- හඬ පටය වාදනය කර ගීතය තාලයට ගායනා කරන්න.

| | | |
|---|---|---|
| **Teacher** | : | Children, look at the picture.What can you see? |
| **Students** | : | A plant. |
| **Teacher** | : | Yes, very good; it's a plant. |
| **Teacher** | : | What else? |
| **Students** | : | Flowers, leaves, … |
| **Teacher** | : | Yes, very good. We can see the parts of the plant.<br>This plant is talking. Let's listen to the plant. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Talks about 'I'm a Plant'. ' මම පැළෑටියක්' යන්න පිළිබඳ කතා කරයි. | |

## Activity: 23 (A,B) – Flowers in My Garden

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.2 Expresses personal ideas, thoughts and feelings related to short simple literary texts on topics of interest creatively using different modes<br><br>5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | **My Garden –flowers**<br>**Teacher can ask the following questions**<br><br>Where's Bindu?<br>In the garden/garden<br>What can you see in the picture?<br>Flowers / I can see…<br>Who is in the garden?<br>Bindu and mother are in the garden/ Bindu, Mother<br>What are they talking about?<br>They are talking about flowers<br><br>In my garden //<br>I see flowers //<br><br>Jasmine // Roses // Shoe flowers //<br>In my garden //<br>I see flowers<br>Lotus /////<br>Sunflowers // // | Uses vocabulary and language structures appropriately.<br><br>Sings an action rhyme on In my garden // …with appropriate rhythm and actions meaningfully. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity- 23 (B) Flowers in My Garden

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations. | My Garden – flowers<br>Jasmine, lotus, sunflower, shoe flower, roses<br><br>In my garden // I see flowers //<br>Jasmine // Roses // Shoe flowers //<br>In my garden // I see flowers //<br>Lotus ///// Sunflowers // | Uses vocabulary and language structures appropriately to ask for and give information related to colours and flowers. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම් 23 සහ 23ට අදාළ රූප ඇසුරෙන් කතන්දරයක් ආකාරයට එහි ඇති මල් හඳුන්වා දෙන්න. මේ සඳහා ගුරුවරයා මව ලෙස ද සිසුන් බින්දු ලෙස ද යොදා ගෙන ප්‍රශ්න අසමින් මල් හඳුන්වා දීමට සැලසුම් කරගන්න.
- පසුව පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකක් ලෙස මෙම ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- සෑම සිසුවකුට ම අදාළ මල් එකක් වන සේ පින්තූර කාඩ්පතක් ලබා දෙන්න. ගීතය ගයන අවස්ථාවේදී කියවෙන මලට අදාළ පින්තූර කාඩ්පත ඇති සිසුන්ට, එම කාඩ්පත ඉහළට ඔසවා පෙන්වීමට පවසන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity -24, 25 Story Telling: Jasmine & Lotus

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | **Jasmine**<br><br>Bindu : Mother, what is this flower called?<br>Mother: Son, which one?<br>Bindu: This white flower?<br>Mother: Oh, it is called jasmine.<br>Bindu: jasmine? It's beautiful.<br><br>**Lotus**<br>Bindu: Mother, what is this flower called?<br>Mother: Son, which one?<br>Bindu: This pink flower in this pond?<br>Mother: Oh, it is called lotus.<br>Bindu: Lotus? It's beautiful. | Uses vocabulary and language structures appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම් 24 සහ 25 ට අදාළ රූප ඇසුරෙන් දෙබසක් ආකාරයට රඟ දක්වන්න. මේ සඳහා ගුරුවරයා මව ලෙස ද සිසුන් බින්දු ලෙස ද යොදා ගෙන ප්‍රශ්න ඇසීමට සහ පිළිතුරු දීම සිදු කිරීමට සැලසුම් කරගන්න.
- පසුව පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකක් ලෙස සහ ඉන්පසු ව දෙදෙනා බැගින් ද මෙම ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity - 26, 27, 28 Story Telling Sunflower, Rose and Shoe flower

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | **Sunflower**<br>Bindu: Mother, what is this flower called?<br>Mother: Son, which one?<br>Bindu: This yellow flower?<br>Mother: Oh, it is called sunflower.<br>Bindu: Sunflower? It's beautiful<br><br>**Rose**<br>Bindu: Mother, what is this flower called?<br>Mother: Son, which one?<br>Bindu: This red flower, with thorns on the stem?<br>Mother: Oh, it is called rose.<br>Bindu: Rose? It's beautiful.<br><br>**Shoe flower**<br>Bindu: Mother, what is this flower called?<br>Mother: Son, which one?<br>Bindu: This orange flower?<br>Mother: Oh, it is called shoe-flower.<br>Bindu: Shoe-flower? It's beautiful. | Uses vocabulary and language structures appropriately |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසු ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම් 26, 27 සහ 28 ට අදාළ රූප ඇසුරෙන් දෙබසක් ආකාරයට රඟ දක්වන්න. මේ සඳහා ගුරුවරයා මව ලෙස ද සිසුන් බින්දු ලෙස ද යොදා ගෙන ප්‍රශ්න ඇසීමට සහ පිළිතුරු දීම සිදු කිරීමට සැලසුම් කරගන්න.
- පසුව පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකක් ලෙස සහ ඉන්පසුව දෙදෙනා බැගින් ද මෙම ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity - 29 Listen and Colour

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1 Follows simple (2-3 words) instructions related to real life situations and learning areas | Listen and Colour the flowers (Rose, Sunflower, Jasmine, Shoeflower, Lotus) | Listens and colour the flowers correctly. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- පහත අයුරින් ප්‍රකාශ කරමින් සිසුන්ට නිවැරදි ව මල් තෝරා ගෙන වර්ණ ගැන්වීමට යොමු කරන්න.

  උදා: Colour the rose.
- පළමු වගන්තිය ප්‍රකාශ කිරීමෙන් පසු සිසුන් නිවැරදි ව මල තෝරා ගෙන වර්ණ ගන්වයි ද යන්න පන්ති කාමරය වටා ගොස් නිරීක්ෂණය කරන්න.
- ඉන්පසු ඒ ආකාරයට ම ප්‍රකාශ කරමින් අනෙක් මල් ද වර්ණ කිරීමට අවස්ථාව දෙන්න.

| | |
|---|---|
| **Teacher** : | Students, today we are going to colour some pictures.<br>Do you like?<br>Then, get ready with your colour pencils.<br>Listen and colour.<br>1. Colour the rose.<br>2. Colour the sunflower<br>3. Colour the jasmine.<br>4. Colour the lotus.<br>5. Colour the shoe flower. |

(Teacher goes around the classroom observing, whether they are colouring the correct pictures.)
**Teacher:** Okay children. Now bring your books. Stand in a line, one behind the other.
(While marking the book, teacher asks, 'What is this flower?' / 'Show me the lotus' etc.)
**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Listens and colours. සවන් දී වර්ණ ගන්වයි. | |

## Lesson - 30 Fruit Friends - 01

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | I am a banana, pineapple, rose apple, papaw, mango | Uses vocabulary and language structures appropriately to give information related to fruits |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- සිසුන් අද කතාවකට සවන් දෙන බව ඉංග්‍රීසියෙන් පවසා, රසවත් ආකාරයෙන් (අප කලින් පාඩම්වලදී කළ අයුරින්) කතන්දරයක් ලෙස පලතුරු හඳුන්වා දෙන්න. මේ සඳහා දී ඇති පලතුරුවල පින්තූර කාඩ් පත් භාවිත කළ හැකි ය.
- හැකිතාක් මව්බස භාවිතය අඩුකර, ඉංග්‍රීසි බසින් ම පින්තූර පෙන්වමින් කතන්දරය කියා දෙන්න.
- ඊට පසු දිනයේ පින්තූර කාඩ්පත් භාවිත කරමින් එක් එක් පලතුරු චරිත නිරූපනය ඉදිරිපත් කළ හැක.
- පලතුරු 5 අනුව සිසුන් කණ්ඩායම් පහකට බෙදා කණ්ඩායමක් පලතුරක් ලෙස නිරූපණයට උදවු කරන්න.
- වරින් වර කණ්ඩායම්වල පලතුර වෙනස් කර නිරූපණයට අවස්ථාව දෙන්න.
- මෙසේ සැම පලතුරක් ලෙස ම රඟපෑමෙන් පසු, එක පලතුරක නම සහ වර්ණය පවසමින් නිරූපණයේ යෙදීමට උදවු කරන්න.

| | |
|---|---|
| **Teacher** : | Today we are going to listen to a beautiful story. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Lesson - 31–Fruit Friends -02

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information | I am red. I am yellow.<br>I am green and yellow. | Uses vocabulary and structures related to fruits and colours togive information appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- 31 වන ක්‍රියාකාරකමේ මෙන්, සැම සිසුවෙකුට ම එක් එක් පලතුරේ භූමිකාව නම සහ වර්ණය පවසමින් රඟ දැක්වීමට උදව් කරන්න.

උදා: Banana: I am a banana. I am yellow.

Help each student to play the role of each fruit, as in lesson 35.

Eg. Banana: I am a banana. I am yellow.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity - 32, 33 Fruit Friends - 03, 04

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | I am a banana<br>I am a pineapple<br>I am a rose apple<br>I am a papaw<br>I am a mango<br>I am red.<br>I am yellow.<br>I am green and yellow<br>We are fruits.<br>We are in your garden. | Uses vocabulary and language structures appropriately to give information related to fruits |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පලතුරු රූප

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- 31 වන ක්‍රියාකාරකමේ මෙන්, සෑම සිසුවෙකුට ම එක් එක් පලතුරේ භූමිකාව නම සහ වර්ණය පවසමින් නිරූපණය කිරීමට උදවු කරන්න.

  උදා: Banana: I am a banana. I am yellow.

- අවසානයේ සියලු දෙනාට ම එකතු වී ‘We are fruits. We are in your garden.’ ප්‍රකාශ කිරීමට යොමු කරන්න.

- ඊළඟ දිනයේදී පලතුරු රූප කාඩ්පත් යොදාගෙන එක් එක් පලතුරේ භූමිකාව නම සහ වර්ණය පවසමින් නිරූපණය කිරීමට උදවු කරන්න.

  උදා: I am a pineapple. I am yellow.

- ඉන්පසු රූපයේ ආකාරයට සිසුන් කණ්ඩායම් ලෙස පලතුරුවල නම සහ වර්ණය පවසමින් නිරූපණය කිරීමට යොමු කරන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity - 34  Fruit Friends - 04

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1 Follows simple (2-3 words) instructions related to real life situations and learning areas | Listen and colour - objects<br><br>**Vocabulary:**<br>Mango, rose apple, banana, pineapple, papaw | Listens and colour the correct object. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- පහත අයුරින් ප්‍රකාශ කරමින් සිසුන්ට නිවැරදි පලතුර වර්ණ ගැන්වීමට පවසන්න.

  Listen and colour.

  1. Colour the mango.
  2. Colour the rose apple.
  3. Colour the banana.
  4. Colour the pineapple.
  5. Colour the papaw.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Listens and colours. සවන් දී වර්ණ ගන්වයි. | |

## Activity - 35  Veggie Friends - 01

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | I am a carrot,<br>I am a beetroot,<br>I am a cabbage,<br>I am a tomato,<br>I am a pumpkin | Uses vocabulary and language structures appropriately to give information related to vegetables |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- 32 වන ක්‍රියාකාරකමෙහිදී පලතුරු හඳුන්වා දුන් ලෙස එළවළු හඳුන්වා දෙන්න.

  උදා : Carrot: I am a carrot.
- සිසුන් පස්දෙනා පමණ බැගින් වන කණ්ඩායම් සකස් කර සැම සිසුවෙකුට ම එක් එක් එළවළුවල භූමිකාව නම පවසමින් රඟ දැක්වීමට උදවු කරන්න.

| | |
|---|---|
| **Teacher:** | Today we are going to listen to a beautiful story. Raju is going to her garden. Vegetables are having a meeting. What are they talking? |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity - 36 Veggie Friends - 02

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | I am orange.<br>I am brown.<br>I am green.<br>I am red. | Uses vocabulary and structures related to vegetables and colours to give information appropriately. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

- 30 වන ක්‍රියාකාරකමේ මෙන්, සැම සිසුවෙකුට ම එක් එක් එළවළුවල භූමිකාව නම සහ වර්ණය පවසමින් රඟ දැක්වීමට උදවු කරන්න.

  උදා: Carrot: I am a carrot. I am orange.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Actvity - 37 Veggie Friends - 03

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | I am a carrot. I am a beetroot, I am a cabbage, I am a tomato, I am a pumpkin, I am a bean. I am orange. I am brown. I am red. I am green. I am orange and green. We are vegetables. We are in your garden. Do you like vegetables? We are good for you. | Uses vocabulary and language structures appropriately to give information related to vegetables |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- 32 සහ 33 ක්‍රියාකාරකම්වලදී මෙන්, සැම සිසුවෙකුට ම එක් එක් එළවළුවල භූමිකාව නම සහ වර්ණය පවසමින් ප්‍රකාශ කිරීමට උදවු කරන්න.

  උදා: Potato: I am a potato. I am brown.
- අවසානයේ සිසුන්ට ‘We are vegetables. We are in your garden.’ ලෙස ප්‍රකාශ කිරීමට ද උදව් කරන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity- 38 Let's Listen and Colour

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1 Follows simple (2-3 words) instructions related to real life situations and learning areas | Listen and colour the vegetables (carrot, beetroot, cabbage, potato, bean, pumpkin) | Listens and colour the vegetables correctly. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- පහත අයුරින් ප්‍රකාශ කරමින් සිසුන්ට එළවළු නිවැරදි ව වර්ණ ගැන්වීමට පවසන්න.

**Teacher:** Teacher: Students, today we are going to colour some pictures. Do you like?

Then, get ready with your colour pencils.

Listen and colour.

1. Colour the pumpkin.
2. Colour the carrot.
3. Colour the beetroot.
4. Colour potato.
5. Colour the cabbage.

(Teacher goes around the classroom observing, whether they are colouring the correct picture.)

**Teacher:** Okey children. Now bring your books. Stand in a line, one behind the other.

(While marking the book, teacher asks, 'What is this vegetable?' / 'Show me the potato. etc.).

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Listens and colours. සවන් දී වර්ණ ගන්වයි. | |

## Activity - 39 Song: Sinhala and Tamil New Year - 01

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | Sinhala & Tamil New Year Festival<br>What do we do for Sinhala and Tamil New Year Festival?<br><br>What do you do for – New Year ///<br>What do you do for New Year<br>La la la la<br>We clean the house for - New Year ///<br>We clean the house for New Year<br>La la la la<br>What do you do for – New Year ///<br>What do you do for New Year<br>La la la la<br>We buy clothes for - New Year ///<br>We buy clothes for New Year<br>La la la la | Uses vocabulary and structures related to Sinhala and Tamil New Year festival appropriately to give information<br><br>Sings the song with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ගීතයේ තාලයට ගීතය ගායනා කරන්න. පින්තූර කාඩ්පත් හෝ අභිනයෙන් හෝ රඟ දක්වමින් ගීතය ගායනය කරන්න.
- ගීතය ගායනා කරමින් සිසුන්ට එය රඟ දැක්වීමට උපකාර කරන්න.
- සිංහල හා හින්දු අලුත් අවුරුදු දිනවල සිදු කරන විවිධ කාර්යයන් / අවස්ථා පන්ති කාමරය තුළ දී භූමිකා රංගන අවස්ථා හරහා සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 40 Song: Sinhala and Tamil New Year - 02

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Sinhala and Tamil New Year Festival – What do we make?<br><br>How do we celebrate Sinhala / Tamil New Year festival?<br>we make sweets, oil cake, laddu, boondi, murukku, kokis, asmi, milk rice<br><br>Song 1<br>What do you make for - New Year ///<br>What do you make for new year?<br>La la la la<br>We make sweets for - new year ///<br>We make sweets for new year<br>La la la la<br><br>What do you make for - New Year ///<br>What do you make for new year?<br>La la la la<br>We make sweets for - new year ///<br>We make sweets for new year<br>La la la la<br><br>Song 2<br>Milk rice, oil cake…<br>On the plate<br>Banana, kokis //I like to eat//<br>Lighting crackers// play raban//<br>I like swinging// swing/// | Sings the song with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

ගීතයේ තාලයට ගීතය ගායනා කරන්න. පින්තූර කාඩ්පත් හෝ අභිනයෙන් හෝ රඟ දක්වමින් ගීතය ගායනය කරන්න.

- ගීතය ගායනා කරමින් සිසුන්ට එය රඟ දැක්වීමට උපකාර කරන්න.
- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද දිනවල සිදු කරන විවිධ කාර්යයන් / අවස්ථා පන්ති කාමරය තුළ දී භූමිකා රංගන අවස්ථා හරහා සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 41 Song: Sinhala and Tamil New Year - 03

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Sinhala and Tamil New Year Festival – Where do you go for New Year?<br><br>Where do you go - for New Year//<br>Where do you go for New Year<br>La la la la la la<br>We go to temple - for New Year //<br>We go to temple for New Year<br>La la la la la la<br><br>Where do you go - for New Year//<br>Where do you go for New Year<br>La la la la la la<br>We go to Kovil - for New Year //<br>We go to Kovil for New Year<br>La la la la la la | Sings the song with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට :

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

ගීතයේ තාලයට ගීතය ගායනා කරන්න. පින්තූර කාඩ්පත් හෝ අභිනයෙන් හෝ රඟ දක්වමින් ගීතය ගායනය කරන්න.

- ගීතය ගායනා කරමින් සිසුන්ට එය රඟ දැක්වීමට උපකාර කරන්න.
- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද දිනවල සිදු කරන විවිධ කාර්යයන්/අවස්ථා පන්ති කාමරය තුළ දී භූමිකා රංගන අවස්ථා හරහා සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 42 Song: Happy New Year ... Sinhala and Tamil New Year - 04

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Sinhala and Tamil New Year Festival<br>Happy New Year to you//<br>Happy New Year dear children<br>Happy New Year to you<br><br>Happy New Year to you//<br>Happy New Year dear teacher<br>Happy New Year to you | Sings the song with appropriate rhythm and actions meaningfully. |

ඉගෙනුම් සම්පත් : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**
ගීතයේ තාලයට ගීතය ගායනා කරන්න.
සිංහල හා හින්දු අලුත් අවුරුද්ද දිනවල සිදු කරන විවිධ කාර්යයන් / අවස්ථා පන්ති කාමරය තුළ දී භූමිකා රංගන අවස්ථා හරහා සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 43 (A,B) Religious Places

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | Son: Father, where are we?<br>Father: Son, we are in **Kandy.**<br>Son: Father, what is that building called?<br>Father: Son, it is called the **Temple of the Tooth**.<br><br>Son: Father, where are we?<br>Father: Son, we are in **Mannar.**<br>Son: Father, what is that building called?<br>Father: Son, it is called the **Madu Church.**<br><br>Son: Father, where are we?<br>Father: Son, we are in **Jaffna.**<br><br>Son: Father, what is that building called?<br>Father: Son, it is a **kovil.** It is called the **Nallur Kandaswami Kovil.**<br><br>Son: Father, where are we?<br>Father: Son, we are in **Colombo.**<br>Son: Father, what is that building called?<br>Father: Son, it is a **mosque.**<br>It is called **Dawatagaha Jumma Mosque.** | Uses vocabulary and language structures appropriately to ask and give information.<br><br> |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- මෙම අවස්ථාව සිසුන් සමග භූමිකා රංගනයේ යෙදෙමින් සිදු කරන්න. අවශ්‍ය පින්තූර කාඩ්පත් හෝ රූප රාමු සූදනම් කර ගන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity - 44 National Flag of Sri Lanka.

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations | **Teacher:** Children what is this flag?<br>**Student:** Teacher it is called the national flag.<br>**Teacher:** Yes, very good children, it is the national flag of Sri Lanka.<br><br>We are Sri Lankans//<br>We are sons and daughters of you<br><br>We are Sri Lankans//<br>We are sons and daughters of you | Uses vocabulary and language structures appropriately to ask and give information. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට, ජාතික කොඩියේ පින්තූරයක් (කොඩිය)

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ගීතය ගායනා කරමින් සිසුන්ට එය රඟ දැක්වීමට උපකාර කරන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the song with actions. අංග චලන සමග ගීතය ගායනා කරයි. | |

## Activity - 45 Fancy Dress Parade

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | Uses structures and vocabulary related to fruits, flowers and vegetables<br><br>I am …<br>E.g. I am a banana.<br>I am a fruit.<br>I am yellow. | Uses the vocabulary and structures acquired related to fruits, vegetables and flowers in the previous lessons meaningfully while playing the roles of each. |

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

- පෙර පාඩම්වල දී ඉගෙන ගත් මල්, පලතුරු, එළවළු වල නම් සහ වර්ණය ඉංග්‍රීසි බසින් පවසමින් රඟපෑම/ රංගනයේ යේදීමට සිසුන්ට උදවු කරන්න.
- සිසුන්ට ඔවුන් ඉගෙන ගත් වචන මාලාව සහ භාෂා ව්‍යුහයන් භාවිත කිරීමට උපකාර කරන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Plays the roles. භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Activity- 46 Song: Come and Buy...

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations<br>5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Names of fruits and vegetables.<br>What do you want?<br>I like…<br>Here you are.<br>How much is it?<br>Ten rupees/ its only ten rupees<br>Thank you very much.<br>You are welcome.<br><br>**Song**<br>Come and buy // cheap///<br>Pineapples // pawpaw and banana.<br>Pawpaw //// banana<br>Mango // rose apple<br>Fruits // Good for you ////<br>Good for you /// Come and buy.<br>Come and buy // cheap///<br><br>Vegetables // veggie ///<br>Pumpkin, potato //<br>Beetroot // carrot and beans<br>Cabbage // come and buy.<br>Cheap /// veggie /// vegetables<br>Good for you // Good for you.<br>Come and buy // cheap ///<br>Come and buy // cheap /// | Uses vocabulary and language structures appropriately to ask and give information.<br><br>Sings the action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්** : ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට, පින්තූර කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**:

පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක කණ්ඩායමක් වෙළෙන්දන් ලෙසත්, අනෙක් කණ්ඩායම මිලදී ගන්නන් ලෙසත්, ගීතය ගායනා කරමින් රංගනයේ යෙදීමට උදවු කරන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings the songs and plays the roles. ගීතය ගයමින් භූමිකා රංගනයේ යෙදෙයි. | |

## Song: Goodbye Everyone

Goodbye Everyone ///

It's time to say goodbye ///

Goodbye Everyone ///

It's time to say goodbye ///

# දෙවන ජාතික භාෂාව
# (දෙමළ)
# ගුරු මාර්ගෝපදේශය

# හැඳින්වීම

1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් දෙවන ජාතික භාෂාවක් ලෙස සිංහල මාධ්‍ය සිසුන්ට දෙමළ භාෂාව ද, දෙමළ මාධ්‍ය සිසුන්ට සිංහල භාෂාව ද හඳුන්වා දෙන ලදී. සිංහල මාධ්‍යයෙන් හා දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම ලබන සිසුන් අතර අන්‍යෝන්‍ය අවබෝධය මෙන් ම සහයෝගීතා ව ගොඩනැංවීමේ අරමුණින් ද ශ්‍රී ලාංකිකයකු වශයෙන් තමන් සමග ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව පිළිබඳ දැනුවත් බවක් ඇති කිරීමේ හා එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් යුතු ව යහපත් සබඳතා ගොඩනැගීමේ අරමුණින් ද මෙම විෂය හඳුන්වා දී ඇත. කාලීන සමාජ අවශ්‍යතා සඳහා මෙන් ම ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනය උදෙසා සමගි සම්පන්න ව, එක් ව කටයුතු කිරීම සඳහා ද දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දෙවන භාෂා විෂය ඉගැන්වීම මගින් ප්‍රාථමික පාසල් අවධියේ අවසාන වන විට සන්නිවේදනය සඳහා ප්‍රමාණවත් වාචික හැකියාවක් මෙන් ම අවස්ථානුකූල ව යෝග්‍ය ඉරියවු හැසිරවීමක් ද ක්‍රියාශීලී සවන් දීමක් හා ප්‍රකාශන හැකියාවක් ද සහිත ව එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

ද්විතීයික ශ්‍රේණිවල දී දෙවන ජාතික භාෂාව ඉගෙනීම සඳහා ශක්තිමත් පදනමක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් යුතු ව අවශ්‍යයෙන් ම ඉගෙන ගත යුතු විෂය අන්තර්ගත මෙහි දී තෝරා ගෙන ඇති අතර සිසුන්ගේ පරිණතිය හා එකිනෙකාගේ විවිධත්වය අනුව මතුවිය හැකි ගැටලු අවම වන ආකාරයට සුදුසු ප්‍රියමනාප ඉගෙනුම් වාතාවරණයක් ඇති කිරීම කෙරෙහි සැලකිලිමත් වෙමින් මෙම විශේෂ ක්ෂේත්‍රය සැලසුම් කර ඇත.

## දෙවන ජාතික භාෂාව විෂය අරමුණ

දෙවන ජාතික භාෂාවක් ලෙස දෙමළ භාෂාව හා සිංහල භාෂාව සන්නිවේදනය සඳහා භාවිත කිරීමටත්, සාහිත්‍ය නිර්මාණ රස විඳීමටත්, භාෂා හා බැඳුණු සංස්කෘතිය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ජාතික සමගිය තහවුරු කිරීමටත් අවශ්‍ය යාවජීව භාෂා කුසලතා සංවර්ධනය කිරීම

## 1 - 5 ශ්‍රේණි සඳහා දෙවන ජාතික භාෂාව විෂය අභිමතාර්ථ

- සවන් දීමේදී හා අදහස් ප්‍රකාශ කිරීමේදී වාචික ව අර්ථවත් ව සන්නිවේදනයක් සඳහා ප්‍රමාණවත් වාංමාලාවක් හා ඒ හා ගැළපෙන ඉරියවුවලින් ද යුතු ව දෙවැනි බස හැසිරවීමට අදාළ කුසලතා සංවර්ධනය කිරීම
- අන්තර් භාෂා රසවින්දන හැකියා පුළුල් කිරීම
- එකිනෙකා කෙරෙහි සංවේදී ව ඔවුනොවුන්ගේ සංස්කෘතික විවිධතා පිළිබද දැනුවත් බවින් යුතු ව, සමගියෙන්, එක් ව කටයුතු කිරීමට පෙලඹවීමක් ඇති කිරීම
- ශ්‍රී ලාංකිකයකු වශයෙන් සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීමට රුචියක් ඇති කිරීම මගින් දෙවන භාෂාවක් භාවිත කිරීම සඳහා වන ආකල්පමය වෙනසක් ඇති කිරීම
- ද්විතීය අධ්‍යාපනයට හා ඉන් ඔබ්බට දෙවන ජාතික භාෂාවක් හැදෑරීම දිරිමත් කිරීම මෙන් ම ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවේ අනෙකුත් විෂයන්ට අදාළ ව අවස්ථෝචිත ව සරල ලෙස දෙවන බස හැසිරවීමේ කුසලතා සංවර්ධනය කිරීම

## මූලික සංකල්ප සහ ක්‍රියාකාරී නිර්වචන

| මූලික සංකල්පය | ක්‍රියාකාරී නිර්වචනය |
|---|---|
| භාෂා භාවිතය | තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සන්නිවේදනයේ දී කථනයට වැඩි අවධානයක් යොමු කරමින් දෙවන බසක් ලෙස දෙමළ හා සිංහල භාෂා අර්ථාන්විත හා අවස්ථෝචිත භාවිතය |
| භාෂා දැනුම | දෙවන බසක් ලෙස සිංහල හා දෙමළ භාෂා ප්‍රායෝගික ව භාවිත කිරීමේ දී අත්‍යවශ්‍ය වන වචන, වාක්‍ය හා අර්ථ පිළිබඳ අවබෝධය |
| ශබ්දාර්ථ භාවිතය | දෙවන බසක් ලෙස සිංහල හා දෙමළ භාෂා භාවිත කොට සන්නිවේදනය කිරීමේ දී අවශ්‍ය වචනවල ශබ්ද, අර්ථ ගළපා නිවැරැදි ව හා අවස්ථෝචිත භාවිතය |
| රසවින්දනය | දෙමළ හා සිංහල භාෂාවෙන් රචිත සරල කවි, ගීවලට සවන් දීම, ගායන, රංගන වැනි වින්දනීය අද්දැකීම් |
| විෂයාන්තර සමෝධානය | ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ අනෙකුත් විෂයන්වල වචන, යෙදුම්, වැකි හා සංකල්ප ප්‍රායෝගික ව අර්ථවත් ව භාවිතය |

## ඉගෙනුම් ඉගැන්වීම් අනුක්‍රමය

**පළමුවන වාරයට නිදේශිත ඉගෙනුම් පල**

- මුණගැසීමක දී ආචාරශීලී යෙදුම් භාවිත කරමින් උචිත ප්‍රතිචාර දැක්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- ප්‍රශ්න කරමින් හා පිළිතුරු ලබා දෙමින් තොරතුරු හුවමාරු කර ගැනීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**දෙවන වාරයට නිර්දේශිත ඉගෙනුම් පල**

- උපන් දිනවල දී සුබ පැතීමේ හා ප්‍රතිචාර දැක්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- 1-5 තෙක් සංඛ්‍යා ගණන් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- අවස්ථෝචිත ඉල්ලීම් සහ ඉල්ලීම් සඳහා සවන් දී ප්‍රතිචාර දැක්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**තෙවන වාරයට නිර්දේශිත ඉගෙනුම් පල**

- වර්ණ සඳහා යෙදෙන වචන හඳුනා ගෙන ඒවා නිවැරදි ව භාවිත කරයි.
- පවුලේ සාමාජිකයින්ගේ ඥාතීත්ව හඳුනා ගෙන එදිනෙදා කතාබහේ දී භාවිත කරයි.
- සරල ළමා ගී ගායනා කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඉහත සියලු ඉගෙනුම් පලවලට ආදාළ අන්තර්ගතයන්ට නිර්දේශිත වචන, වැකි, ඒවා උච්චාරණය කරන ආකාරය සහ ඒවා ප්‍රායෝගික ව භාවිතය පිළිබඳ මග පෙන්වීමක් පහත දැක්වෙන සබැඳිය ඔස්සේ ඔබට ලබාගත හැකි ය.**

Channel NIE

# 01 ඉගෙනුම් පලය

# මුණගැසීමකදී ආචාරශීලී යෙදුම් භාවිත කරමින් උචිත ප්‍රතිචාර දැක්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| **வணக்கம்** (වණක්කම්) ආයුබෝවන් | ■ 1.1 ආචාර කිරීම සඳහා යොදන **வணக்கம்** යන යෙදුම නිවැරදි ව උච්චාරණය කරයි. | ■ 1.1.1 නිවැරදි උච්චාරණය |
| | ■ 1.2 ආචාරශීලී ස්වරයෙන් උචිත ඉරියව් ප්‍රදර්ශනය කරමින් **வணக்கம்** යන යෙදුම සුදුසු අවස්ථාවල දී භාවිත කරයි. | ■ 1.2.1 ආචාරශීලීබව |
| | | ■ 1.2.2 උචිත ඉරියවු |

**යෝජිත කාලය - පැය 01**

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**
**ක්‍රියාකාරකම 1**

**පියවර 1**

- ගුරුවරයා සිසුන් ඉදිරියේ "ආයුබෝවන්" යනුවෙන් පවසා ඉන් පසු "**வணக்கம்**" (වණක්කම්) ලෙසින් ද පවසමින් ආචාර කරන්න.
- නැවත "**வணக்கம்**" (වණක්කම්) යන්න සිසුන් ලවා ද කියවා ගුරුවරයාට ආචාර කිරීමට යොමු කරන්න.
- මේ ආකාරයට "**வணக்கம்**" යන්න නිවැරදි ව උච්චාරණය කරන තෙක් කිහිප වතාවක් සිසුන් ලවා උච්චාරණය කරවන්න.

**පියවර 2**

- ප්‍රථමයෙන් සිසුන් දෙදෙනකු ඉදිරියට කැඳවා එකිනෙකාට "**வணக்கம்**" (වණක්කම්) යැයි කියා සුබ පැතීමට සලස්වන්න.
- මේ ආකාරයට යුගල බැගින් සිසුන් ඉදිරියට කැඳවා එකිනෙකාට "**வணக்கம்**" (වණක්කම්) යැයි කියා සුබ පැතීමට යොමු කරන්න.
- පසුව සිසුන් කුඩා කණ්ඩායම් කර එක් සිසු කණ්ඩායමක් සිට ගැනීමට සලස්වා අනෙක් කණ්ඩායම වෙත "**வணக்கம்**" (වණක්කම්) යැයි පවසා සුබ පැතීමට යොමු කරන්න.
- මේ ආකාරයට සුබ පැතීමට සෑම සිසු කණ්ඩායමකට ම අවස්ථාව ලබා දෙන්න.

**පියවර 3**

- වෙනත් පන්තියක ගුරුවරයෙකු පන්තියට කැඳවා සිසුන් ලවා "**வணக்கம்**" (වණක්කම්) කියවා ආචාර කරවන්න.
- මේ ආකාරයට ආචාර කිරීමේ දී ආචාරශීලී ස්වරයෙන් එසේ කිරීමේ වැදගත්කම ද සිසුන්ට පහදා දෙන්න.

- ගුරුවරයා විසින් උදෑසන පන්ති ආරම්භයේ දී සිංහල බසින් මෙන් ම දෙමළ බසින් ද සිසුන්ට ආචාර කිරීම පුරුද්දක් වශයෙන් පවත්වා ගෙන යන්න.
- පන්තියට වෙනත් ගුරුවරයකු පැමිණෙන සෑම අවස්ථාවක දී ම මේ ආකාරයට උචිත ඉරියව්වු ප්‍රදර්ශනය කරමින් ආචාරශීලී ව භාෂා දෙකෙන් ම සුබ පැතීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 1.1 ආචාර කිරීම සඳහා යොදන **வணக்கம்** යන යෙදුම නිවැරදි ව උච්චාරණය කරයි. | 1.1.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය සිදු නොකරයි. |
| 1.2 ආචාරශීලී ස්වරයෙන් උචිත ඉරියවු ප්‍රදර්ශනය කරමින් **வணக்கம்** යන යෙදුම සුදුසු අවස්ථාවල දී භාවිත කරයි | 1.2.1 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන් **வணக்கம்** යන යෙදුම භාවිත කරයි. | **வணக்கம்** යන යෙදුම භාවිත කිරීමේ දී ආචාරශීලී නොවෙයි. |
| | 1.2.2 උචිත ඉරියවු | උචිත ඉරියවු ප්‍රදර්ශනය කරමින් **வணக்கம்** යන යෙදුම භාවිත කරයි. | **வணக்கம்** යන යෙදුම භාවිතයේ දී උචිත ඉරියවු ප්‍රදර්ශනය නොකරයි. |

## 02 ඉගෙනුම් පලය

## ප්‍රශ්න කරමින් හා පිළිතුරු ලබා දෙමින් තොරතුරු හුවමාරු කර ගැනීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| **உங்கள் பெயர் என்ன?**<br>උංගළ් පෙයර් එන්න?  ඔබේ නම මොකක් ද?)<br><br>**நான்** ... (නාන් ... - මම...)<br><br>**எனது பெயர்** ...<br>(එනදු පෙයර්... - මගේ නම....)<br><br>**உங்கள் ஊர் எது?**<br>(උංගළ් ඌර් එදු? - ඔබේ ගම කොහේ ද?)<br><br>**எனது ஊர்**.....<br>(එනදු ඌර් .... - මගේ ගම .... )<br><br>**எப்படி சுகம்?**<br>(එප්පඩි සුහම්? - සුවදුක් කොහොම ද?)<br><br>**நல்ல சுகம்.** (නල්ල සුහම් - හොඳින් ඉන්නවා) | ■ 2.1 කෙනෙකුගේ නම නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් විමසයි. | 2.1.1 නිවැරදි උච්චාරණය<br>2.1.2 ආචාරශීලීබව |
| | ■ 2.2 තවත් කෙනෙකු නම විමසන විට නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් පිළිතුරු ලබා දෙයි. | 2.2.1 නිවැරදි උච්චාරණය<br>2.2.2 ආචාරශීලීබව |
| | ■ 2.3 තවත් කෙනෙකුගේ ගම නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් විමසයි. | 2.3.1 නිවැරදි උච්චාරණය<br>2.3.2 ආචාරශීලීබව |
| | ■ 2.4 තවත් කෙනෙකු ගම විමසන විට නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් පිළිතුරු ලබා දෙයි. | 2.4.1 නිවැරදි උච්චාරණය<br>2.4.2 ආචාරශීලීබව |
| | ■ 2.5 තවත් අයකුගේ සුවදුක් පිළිබඳ ව නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් යුතු ව විමසයි. | 2.5.1 නිවැරදි උච්චාරණය<br>2.5.2 ආචාරශීලීබව |
| | ■ 2.6 සුවදුක් පිළිබඳ ව විමසන විට නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන්, පිළිතුරු ලබා දෙයි. | 2.6.1 නිවැරදි උච්චාරණය<br>2.6.2 ආචාරශීලීබව |

**යෝජිත කාලය - පැය 05**

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

**ඉගෙනුම් සම්පත්**


**සවරමක්**

### පියවර 1

- ගුරුතුමිය තමා පෙන්වා "நான் குமாரி" (නාන් කුමාරි - මම කුමාරි) ලෙස කිහිප වතාවක් පවසන්න.
- ඉන් පසු සිසුවකු ඉදිරියට කැඳවා ඔහුගේ නම ද ඒ ආකාරයෙන් ම පැවසීමට යොමු කරන්න.
  උදා: "நான் சமன்" (නාන් සමන් - මම සමන්)

### පියවර 2

- රූපයේ දැක්වෙන ආකාරයට සවරමක් සකසා ගන්න.



- සිසුන් රවුමක් ආකාරයට ස්ථානගත කරන්න.
- පළමුවෙන් ම ගුරුතුමිය රවුමේ මැදට ගොස් සවරම අතට ගෙන තමා හඳුන්වා දෙන්න.
  උදා: "நான் குமாரி" (නාන් කුමාරි)

- අනතුරුව රවුමේ සිටින සිසුවකු වෙත සවරම වීසි කරන්න. සවරම ලැබුණු සිසුවා රවුම මැදට පැමිණ එම ආකාරයට ම තමා හඳුන්වා දිය යුතු බව පවසන්න.
  උදා: "நான் சமன்" (නාන් සමන්)
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න.
- සවරම අතැති සිසුවා වෙනත් සිසුවකු වෙත සවරම යොමු කළ යුතු ය. සවරම ලබා ගත් සිසුවා ද ඉහත ආකාරයට තමා හඳුන්වා දිය යුතු ය.
- මේ ලෙස රවුමේ සිටින සෑම සිසුවෙකුට ම තමා හඳුන්වා දීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් නිවැරදි ව උච්චාරණය සිදු කරන්නේ ද යන්න පිළිබඳ ව මෙහි දී විශේෂයෙන් සැලකිලිමත් වන්න.

### පියවර 3

- නැවතත් ගුරුතුමිය තමා පහත ආකාරයට හඳුන්වා දෙන්න. "எனது பெயர் குமாரி" (එනදු පෙයර් කුමාරි)
- මෙසේ කියමින් පියවර 02හි මෙන් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පියවර 02හි හඳුන්වා දුන් ආකාරයෙන් ම පියවර 3හිදී හඳුන්වා දුන් ආකාරයට ද තමාව තවත් අයකුට හඳුන්වා දිය හැකි බව සිසුන්ට පහදා දෙන්න.

## ක්‍රියාකාරකම 2

### ඉගෙනුම් සම්පත්
**ටෙඩී බෙයා/ බෝනික්කා වැනි යමක්**

- පන්තියේ සියලු ම සිසුන් රවුමක් ආකාරයට සිට ගැනීමට සලස්වන්න. ගුරුවරයා ද රවුමේ ඇතුළත සිට ගන්න. ගුරුවරයා විසින් තමන් ඉදිරියේ සිටින සිසුවකුට

  நான் குமாரி. எனது பெயர் குமாரி. (නාන් කුමාරි, එනදු පෙයර් කුමාරි) ලෙස පවසන්න.
- රවුමේ සිටින එක් සිසුවකුහට ටෙඩිබෙයා කෙනෙකු/බෝනික්කෙකු ලබා දෙන්න.
- සිසුන් විසින් ටෙඩිබෙයා/බෝනික්කා රවුම වටේට අතින් අත මාරු කරමින් යැවිය යුතු අතර ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව එම ක්‍රියාව නතර කළ යුතු වේ.
- ගුරුවරයාගේ සංඥාව නිකුත් වන අවස්ථාවේ දී ටෙඩිබෙයා/බෝනික්කා අත රැඳි සිසුවා විසින් ඉහත ආකාරයට තම නම නිවැරදි උච්චාරණය සහිත ව ප්‍රකාශ කළ යුතු ය.
- සෑම සිසුවකුට ම තම නම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබෙන තෙක් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.

## ක්‍රියාකාරකම 3

- ගුරුවරයා ප්‍රථමයෙන් ම "**வணக்கம்**" (වණක්කම්) යනුවෙන් ආචාර කර, මම ........... (කුමාරි) යනුවෙන් පවසන්න.
- මෙසේ ගුරුවරයා තමාගේ නම පවසා වෙනත් සිසුවකුගෙන් "ඔබේ නම කුමක් ද"යි අසන්න. සිසුවා - මගේ නම .............(සමන්) ලෙස ප්‍රතිචාර දැක්විය යුතු ය.
- මේ ආකාරයෙන් සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න.
- නැවත "நான் குமாரி." (නාන් කුමාරි) "**உங்கள் பெயர் என்ன?**" (උංගල් පෙයර් එන්න?) යනුවෙන් විමසන්න.
- ඒ අයුරින් ම සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසා පිළිතුර ලබා ගන්න.
- ඔයාගේ නම කුමක් දැයි යන්න දෙමළ බසෙහි දී "**உங்கள் பெயர் என்ன?**" (උංගල් පෙයර් එන්න?) යනුවෙන් යෙදෙන බව මෙම ක්‍රියාකාරකම ආශ්‍රයෙන් සිසුන්ට අවබෝධ වීමට සලස්වන්න.
- මෙසේ යම් අයකුගේ නම විමසීමේ දී අප ආචාරශීලී ව එය විමසිය යුතු බව ද පෙන්වා දෙන්න.
- සිසුන් දෙදෙනා බැගින් ඉහත සඳහන් දෙබස පුහුණු වීමට යොමු කරන්න.
- පසු ව කණ්ඩායමේ සිටින අනෙක් සෑම සිසුවකු සමග ද එම ක්‍රියාකාරකමෙහි ම නිරත වෙමින් කෙනෙකුගේ නම කුමක් ද යන්න දෙමළ බසින් ඇසීමටත්, තම නම ප්‍රකාශ කිරීමටත් තව දුරටත් අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි නියැලෙන අතර අන්‍යයන්ගේ නම විමසීමේ දී නිවැරදි උච්චාරණ සහිත ව එය සිදු කරන්නේ ද යන්න පිළිබඳවත් ආචාරශීලී වන්නේ ද යන්න පිළිබඳවත් සැලකිලිමත් වන්න.

## ක්‍රියාකාරකම 4

### ඉගෙනුම් සම්පත්
**බෝලයක්**

- සිසුන් රවුමක් ආකාරයට ස්ථානගත කරන්න.
- ගුරුවරයා බෝලයක් රැගෙන එම රවුමේ මැදට එකතු වන්න.
- ගුරුවරයා තමාගේ නම "நான் குமாரி." (නාන් කුමාරි) "**உங்கள் பெயர் என்ன?**" (උංගල් පෙයර් එන්න?) ලෙස විමසමින් බෝලය එක් සිසුවකුට පිරිනැමිය යුතු ය.
- බෝලය අල්ලා ගත් සිසුවා තමාගේ නම "**நான் சமன்**" (නාන් සමන් ), "**உங்கள் பெயர் என்ன?**" (උංගල් පෙයර් එන්න? ) යැයි විමසමින් බෝලය තවත් සිසුවියක වෙත යොමු කළ යුතු ය.

- බෝලය ලබා ගත් සිසුවිය ද තම නම "நான் மாலா" (නාන් මාලා), යැයි ප්‍රකාශ කොට රවුමේ සිටින වෙනත් යහළුවකුට බෝලය යොමු කරමින් "உங்கள் பெயர் என்ன?" (උංගළ් පෙයර් එන්න?) යැයි විමසිය යුතු ය.
- මෙලෙස සියලු ම සිසුන් වෙත බෝලය යොමු කරමින් සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**ක්‍රියාකාරකම 5**

- ගුරුවරයා තමාගේ ගම සිංහල බසින් පවසන්න.
  උදා: මගේ ගම බලංගොඩ
- මෙලෙස සිසුන් කිහිප දෙනෙකුගෙන් ද ඔවුන්ගේ ගම විමසා පිළිතුරු ලබා ගන්න.
- අනතුරු ව ගුරුවරයා "எனது ஊர் பலங்கொட" (එනදු ඌර් බලංගොඩ) ලෙස පවසන්න.
- මේ අයුරින් සෑම සිසුවකුට ම තමාගේ ගමේ නම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් නිවැරදි ව උච්චාරණ සිදු කරන්නේ ද යන්න පිළිබඳ ව ද සැලකිලිමත් වන්න.
- නැවත ගුරුවරයා "எனது ஊர் பலங்கொட "(එනදු ඌර් බලංගොඩ) "உங்கள் ஊர் எது?" (උංගළ් ඌර් එදු?) යනුවෙන් ආචාරශීලී ව සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න.
- පසු ව "உங்கள் ஊர் எது?" (උංගළ් ඌර් එදු? ) යන්න යොදා ගනිමින් එකිනෙකාගේ ගම කුමක් ද යන්න විමසීමට සිසුන් යොමු කරන්න.
- අන්‍යයන්ගේ ගම් විමසීමේ දී ආචාරශීලී ව එය සිදු කළ යුතු බව ද සිසුන්ට පැහැදිලි කරන්න.
- සිසුන් එකිනෙකාගේ ගම විමසීමේ දී හා ඊට පිළිතුරු සැපයීමේ දී නිවැරදි ව උච්චාරණය සිදු කරන්නේ ද යන්න පිළිබඳ ව මෙහි දී විශේෂයෙන් සැලකිලිමත් වන්න.

**ක්‍රියාකාරකම 6**

**ඉගෙනුම් සම්පත්**
**මයික්‍රෝෆෝනයක් / මයික්‍රෝෆෝනයක ආකෘතියක්**

- වරකට එක් සිසුවකු බැගින් පන්තියේ ඉදිරියට කැඳවන්න.
- සිසුවා අතට මයික්‍රොෆෝනයක්/මයික්‍රොෆෝනයක ආකෘතියක් ලබා දී පහත දැක්වෙන ආකාරයට තම නම හා ගම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  උදා: "நான் சமன். "எனது ஊர் மல்வான" (නාන් සමන්. එනදු ඌර් මල්වාන) ලෙස පවසා වෙනත් සිසුවකු වෙත මයික්‍රොෆෝනය එම සිසුවා විසින් ලබා දිය යුතු වේ.
- මයික්‍රොෆෝනය ලබා ගත් සිසුවා ද එම ආකාරයට ම තමා පිළිබඳ ව හඳුන්වා දිය යුතු ය.
- මේ ලෙස සෑම සිසුවකුට ම අවස්ථාව ලැබෙන තෙක් ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 7**
**ඉගෙනුම් සම්පත්**
**සත්ත්ව රූකඩ**

- දැත්වල පැළඳ ගත හැකි ආකාරයට සත්ත්ව රූකඩ කිහිපයක් සකස් කර ගන්න.
- ගුරුවරයා තමන්ගේ දැත්වල සත්ත්ව රූකඩ දෙකක් පැළඳ ගන්න.

  උදා: කුරුල්ලෙක් සහ පූසෙක්
  හාවෙක් හා බල්ලෙක්
- එක් අතක තිබෙන සත්ත්ව රූකඩය චලනය කරමින් ගුරුවරයා අනෙක් සත්ත්ව රූපයෙන් "எப்படி சுகம்?" (එප්පඩි සුහම්?) යනුවෙන් විමසන්න.
- නැවත කටහඬ වෙනස් කර අනෙක් සත්ත්ව රූකඩය චලනය කරමින් "நல்ல சுகம்" (නල්ල සුහම්.) ලෙස පිළිතුර ලබා දෙන්න.

- අප යම් අයකුගෙන් "සුවදුක් කෙසේ ද?" යන්න විමසීමේ දී දෙමළ බසින් **எப்படி சுகம்**? (එප්පඩි සුහම්) ලෙස විමසන බවත්, ඊට පිළිතුර වශයෙන් 'සුවෙන් සිටිනවා' යන්න "**நல்ல சுகம்**" (නල්ල සුහම්) ලෙස පවසන බවත් පැහැදිලි කරන්න.
- නැවතත් රූකඩ යොදා ගනිමින් කිහිප වතාවක් දෙබස ඉදිරිපත් කරන්න.
- මේ ආකාරයට රූකඩවල සිටින සතුන් සිසුන්ගෙන් ද සිසුන් සතුන්ගෙන් ද වශයෙන් සුවදුක් විමසීම සිදු කරන්න.
- මේ ආකාරයට ගුරුවරයා විසින් සිසුන්ගෙන් ද "**எப்படி சுகம்?**" (එප්පඩි සුහම්?) ලෙස විමසා ඔවුන් වෙතින් පිළිතුර ලබා ගන්න.
- සිසුන්ට ද ගුරුවරයාගෙන් ඒ ආකාරයට විමසීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම වැකි හොඳින් තහවුරු වන තෙක් සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ යුගල වශයෙන් හෝ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- සමාන්තර පන්තියක ගුරුවරයකු/වෙනත් ගුරුවරයකු ගෙන්වා පන්තියේ සිසුන්ගෙන් මේ ආකාරයට සුවදුක් විමසීමට අවස්ථාව ලබා දී ඒ සඳහා පිළිතුරු ලබා දීමට සිසුන් යොමු කරන්න.

### ක්‍රියාකාරකම 8

- සුවදුක් විමසන ආකාරය හා ඊට පිළිතුරු ලබා දෙන ආකාරය ගීතයක් ආකාරයට සිසුන් සමග ගායනා කරන්න.

උදා: ගුරුවරයා - **எப்படி சுகம்** // (එප්පඩි සුහම් //)
සිසුන් - **நல்ல சுகம்** // (නල්ල සුහම් //)
ගුරුවරයා - **எப்படி சுகம்** // (එප්පඩි සුහම් //)
සිසුන් - **நல்ல சுகம்** // (නල්ල සුහම් //)

- මෙහිදී ගුරුවරයා විසින් ගීතය හොඳින් සිසුන්ට හුරුවන තෙක් ගායනා කරන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- පසු ව ප්‍රශ්නය එක් සිසු කාණ්ඩායමක් විසිනුත් පිළිතුර අනෙක් සිසු කාණ්ඩායම විසිනුත් ලබා දෙන ආකාරයෙන් ද ගීතය ගායනා කරන්න.

### ක්‍රියාකාරකම 9

- පන්තියේ සියලු සිසුන්ට තම හිස මේසය මත තබා ගන්නා ලෙස පවසන්න.
- ගුරුවරයා එක් සිසුවකුගේ නම පවසා **எப்படி சுகம்?** (එප්පඩි සුහම්? ලෙස විමසිය යුතු වන අතර සිසුවා හිස ඔසවා "**நல்ல சுகம்**" (නල්ල සුහම්.) ලෙස පිළිතුරු ලබා දිය යුතු වේ.
- මේ ආකාරයට සියලු සිසුන්ගේ නම් පවසමින් ගුරුවරයා දෙමළ බසින් සුවදුක් විමසිය යුතු වන අතර සිසුන් හිස ඔසවා ඊට පිළිතුරු ලබා දිය යුතු ය.
- පන්තියේ සිසුහු වැඩි දෙනෙක් සිටිත් නම් ගුරුවරයාට එකවර සිසුන් කිහිප දෙනෙකු වුව ද නම් කළ හැකි ය.

### ක්‍රියාකාරකම 10

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සෑම කණ්ඩායමක් ම පේළි ආකාරයෙන් ස්ථානගත කරන්න.
- එම පේළි අතරින් පළමු පේළියේ සිසුන් පමණක් සිටගෙන සිටීමට සලස්වන්න.
- සිටගෙන සිටින සිසු පෙළ හොඳින් පෙනෙන ආකාරයෙන් අනෙක් පේළිවල සිසුන් ඔවුන් සිටින ස්ථානයේ ම වාඩි කරවන්න.
- සිට ගෙන සිටින පේළියේ පළමු සිසුවා දෙවන සිසුවා වෙත හැරී දෙවන සිසුවාගෙන් "**எப்படி சுகம்?**" (එප්පඩි සුහම්?) යනුවෙන් විමසිය යුතු ය.
- එවිට දෙවන සිසුවා "**நல்ல சுகம்**" (නල්ල සුහම්) ලෙස පිළිතුර ලබා දිය යුතු ය.

- නැවත දෙවන සිසුවා තෙවන සිසුවා වෙත හැරී පෙර පරිදි ම විමසීම කළ යුතු අතර තෙවන සිසුවා ඊට පිළිතුරු ලබා දිය යුතු වේ.
- ප්‍රශ්නය ඉදිරිපත් කරන සිසුවා වෙත පිළිතුර ලැබුණු පසු ඔහු/ඇය පේළියේ තමා සිටි තැන ම වාඩි විය යුතු ය.
- මේ ආකාරයට පේළියේ අවසන් සිසුවා තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- පේළියේ අවසන් සිසුවා ගුරුවරයා වෙත ගොස්, "எப்படி சுகம்?" (එප්පඩි සුහම්?) ලෙස විමසිය යුතු අතර, ගුරුවරයා ඊට ප්‍රතිචාර දැක්විය යුතු ය.
- මෙසේ අනෙක් කණ්ඩායම් ද ක්‍රමයෙන් සිට ගැනීමට සලස්වා ක්‍රියාකාරකම සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායකය | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.1 කෙනෙකුගේ නම නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් විමසයි. | 2.1.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| | 2.1.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, නම විමසයි. | නම විමසීමේ දී ආචාරශීලි බවක් පෙන්නුම් නොකරයි. |
| 2.2 තවත් කෙනෙකු නම විමසන විට නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් පිළිතුරු ලබා දෙයි. | 2.2.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| | 2.2.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, තම නම පවසයි. | නම පැවසීමේ දී ආචාරශීලි බවක් පෙන්නුම් නොකරයි. |
| 2.3 තවත් කෙනෙකුගේ ගම නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් විමසයි. | 2.3.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| | 2.3.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, ගම විමසයි. | ගම විමසීමේ දී ආචාරශීලි බවක් පෙන්නුම් නොකරයි. |

| | | | |
|---|---|---|---|
| 2.4 තවත් කෙනෙකු ගම විමසන විට නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් පිළිතුරු ලබා දෙයි. | 2.4.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණ සහිත ව පිළිතුරු ලබා දෙයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| | 2.4.2 ආචාරශීලීබව | තම ගම විමසන ආචාරශීලී ස්වරයෙන්, පිළිතුරු ලබා දෙයි. | තම ගම විමසන විට ආචාරශීලී ව පිළිතුරු ලබා දීමක් සිදු නොකරයි. |
| 2.5 තවත් අයකුගේ සුවදුක් පිළිබඳ ව නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන්, යුතු ව විමසයි. | 2.5.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| | 2.5.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, යුතු ව **තවත්** කෙනෙකුගෙන් සුවදුක් පිළිබඳ ව විමසයි. | සුවදුක් පිළිබඳ ව විමසීමේ දී ආචාරශීලි බවක් පෙන්නුම් නොකරයි. |
| 2.6 සුවදුක් පිළිබඳ ව විමසන විට නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන්, පිළිතුරු ලබා දෙයි. | 2.6.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| | 2.6.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, පිළිතුරු ලබා දෙයි. | සුවදුක් පිළිබඳ ව විමසන විට ආචාරශීලී ව පිළිතුරු ලබා දීමක් සිදු නොකරයි. |

# ගුරු මාර්ගෝපදේශය

**(මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, සෞන්දර්ය අධ්‍යාපනය, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, දෙවන ජාතික භාෂාව)**

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

# 1 ශ්‍රේණිය

# දෙවන වාරය

# 05 තේමාව - සුව පැවැත්ම

රටක දියුණුව රඳා පවතින්නේ නිරෝගී, ශක්තිමත් මෙන්ම ජාතික මෙහෙවරට ඵලදායී අයුරින් දායක වන පුරවැසියන් මත ය. ඒ සඳහා ආහාර නිපදවීමට දායක වීම, පෝෂ්‍යදායී ආහාර පිළිබඳ යහපත් ආකල්ප ඇතිවීම, පෝෂණ ගුණයෙන් යුතු සමබල ආහාර නාස්තියකින් තොර ව පරිභෝජනය කිරීම ආදී ගුණාංගවලින් යුතු වීම අත්‍යවශ්‍ය ය. එසේ ම, තම පෞද්ගලික පිරිසිදු බව මෙන් ම තමා අවට පරිසරයේ පිරිසිදු බව ද සුව පැවැත්ම සඳහා හේතුවන ආකාරය පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරන දරුවෙකු රටට දායාද කිරීම සඳහා පදනම් වන නිපුණතා සංවර්ධනය කරනු පිණිස මෙම තේමාව ඉදිරිපත් කෙරේ.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 සුව පැවැත්ම සඳහා ශරීරය පිරිසිදුව පවත්වා ගනියි. | ♦ තම ශරීරයේ<br>° දැත් හා දෙපා<br>° හිසකෙස්<br>° මුඛය හා දත්<br>° සම<br>♦ පිරිසිදු ව හා මනාව පවත්වා ගැනීම | 1.1 දැත් නිවැරදි ව පිරිසිදු කර ගනියි. | 1.1.1 නිවැරදි පියවර අනුගමනය කිරීම. |
| | | 1.2 දැත් හා දෙපාවල ඇඟිලි සහ නියපොතු පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගනියි. | 1.2.1 පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීම. |
| | | 1.3 හිසකෙස් පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගනියි. | 1.3.1 පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීම. |
| | | 1.4 මුඛය හා දත් පිරිසිදු ව පවත්වා ගනියි. | 1.4.1 පිරිසිදු ව පවත්වා ගැනීම. |
| | | 1.5 සමෙහි පිරිසිදු බව පවත්වා ගනියි. | 1.5.1 පිරිසිදු බව පවත්වා ගැනීම. |
| | | 1.6 ශරීරය පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 1.6.1 වැදගත්කම ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 1

- දැත් හොඳින් පිරිසිදු කිරීමට නම් නිවැරදි පිළිවෙළට දැත් පිරිසිදු කළ යුතු බව පෙන්වා දෙන්න.
- දෑඅත් පිරිසිදු ව තබා ගැනීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන් සමග කතා බහ කරන්න.
- සිසු ක්‍රියාකාරකම් පොතෙහි දක්වා ඇති රූප සටහන් ආශ්‍රයෙන් ද ඔබ විසින් සිදු කරනු ලබන ආදර්ශනයෙන් ද නිවැරදි ව දැත් පිරිසිදු කරන ආකාරය පැහැදිලි කරන්න.



- එහි දී අත් සේදීමේ නිවැරදි පියවර සිසුන් විසින් අනුගමනය කරන්නේ ද යන්න ගුරුවරයා විසින් නිරීක්ෂණය කරන්න.

- සබන් යොදා නිවැරදි පියවර අනුගමනය කරමින් අත් සේදීමේදී අතේ තිබී ජලයේ දිය වූ කුණු, දූවිලි ආදිය ඉවත් වන අයුරු හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
- සබන් නොයොදා අක්‍රමවත් ව අත් සේදීමේදී හා සබන්/සබන් දියර යොදා ක්‍රමානුකූල ව අත් සේදීමේදී දක්නට ලැබෙන වෙනස සිසුන්ට පහදා දෙන්න.
- දෑත් සේදීමේදී ගලායන ජලයෙන් සේදීමේ වැදගත්කම ද මෙහිදී අවධාරණය කරන්න.
- නිවැරදි ව අත් නොසේදීම අපේ ශරීරයේ නිරෝගී බවට කෙතරම් හානිකර විය හැකි ද යන්න වීඩියෝ දර්ශන, කතන්දර, සිද්ධි, ඡායාරූප, ආශ්‍රයෙන් පහත කරුණු ද මතු කර දක්වමින් පැහැදිලි කරන්න.

  උදා; ශෙහාන්, ඔයාල වගේ ම පුංචි පුතෙක්. එයා ඔයාල වගේ ම පෝෂ්‍යදායී ආහාර තමයි කෑමට ගන්නේ. එයා එදා කෑමට ගෙනවිත් තිබුණේ මුං ඇට. දිවා විවේකයේදී අත සෝදන්න කවුරුත් පන්තියෙන් එළියට ගියා. ශෙහාන් තමයි ඉක්මනට ම අත හෝදගෙන පන්තියට ආවේ. කවුරුත් කෑම කෑවා. ටික වේලාවකට පස්සේ ශෙහාන් බඩ අල්ලා ගෙන අඬන්න පටන් ගත්තා.

  "ඇයි පුතේ මොකද්ද අමාරුව" ගුරුවරයා ඇහුවා
  "මගේ බඩ හොඳට ම රිදෙනවා" ශෙහාන් අමාරුවෙන් කිව්වා
  "ඇයි පුතාගෙ බඩ රිදෙන්නෙ, පුතා නරක දෙයක් එහෙම කෑවද?" ගුරුවරයා ඇහුවා
  "එයා බාගෙට අත හෝද ගෙන පන්තියට දුවගෙන ඉක්මනින් ම ආවනේ" ළමයි හැමෝම කිව්වා.
- අත් නිවැරදි ව සේදීම පිළිබඳ ව කියැවෙන පහත කවිය සිසුන් සමග ගායනා කරන්න.

| | | | |
|---|---|---|---|
| දෑත් අපේ | සෝදමු | අත්ල හොඳින් | සෝදමු |
| ඇඟිලි කරුත් | සෝදමු | ඇඟිලි තුඩු ද | සෝදමු |
| අත උඩ ඇති කුණු | දූවිලි | පිරිසිදු වන තුරු | අත් පොඩි |
| හොඳින් යන්න | සෝදමු | සබන් යොදා | සෝදමු |

## ක්‍රියාකාරකම් 2

පියවර 1
- සෑම සිසුවෙකුට ම ඔවුන් විසින් නිවසේදී භාවිත කරන දත් බුරුසුව ද රැගෙන එන ලෙස පවසන්න.
- ආදර්ශනය සඳහා දත් බුරුසුවක්, කෘත්‍රිම දත් ඇන්දක ආකෘතියක්, කුඩා කණ්ණාඩි කිහිපයක් හා සුදුසු දන්තාලේපයක් සූදානම් කර ගන්න.
- දත් බුරුසුවක් යොදා ගෙන නිවැරදි පියවරවලට අනුව දත් මැදීම සිදු කරන ආකාරය කෘත්‍රිම දත් ඇන්දක ආකෘතියක් භාවිත කර ආදර්ශනය කරන්න.
- මේ සඳහා හැකි නම් දන්ත වෛද්‍යවරයකුගේ/හෙදියකගේ සහය ලබා ගන්න.
- රූපයේ පරිදි නිවැරදි ව දත් මැදීමේ පියවර අනුගමනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පාසලේ උදෑසන කාලයේ විවේක කාලයට පෙර දත් හා දිව හොඳින් මැදීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කර මුහුණ බලන කණ්ණාඩි ලබා දී තම තමන්ගේ දත් හා දිව හොඳින් බැලීමට පවසන්න.
- පසුව සපයා ගත් කණ්ණාඩි ආධාරයෙන් තම දත් හා දිවෙහි පිරිසිදු බව පිළිබඳ ව හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- තම දත්වල දක්නට ලැබෙන තත්ත්වය (පිරිසිදු බව) පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- විවේක කාලයේ ආහාර ගැනීමෙන් පසු කණ්ණාඩි යොදා ගෙන පෙර පරිදි ම දත් හා දිව නිරීක්ෂණය කරන ලෙස උපදෙස් ලබා දෙන්න.
- උදෑසන බැලූ විට දුටු ආකාරයට වඩා දත් හා දිව යන ස්ථානවල යම් වෙනසක් සිදු වී තිබේ ද යන්නත්, බොහෝ විට දත් අතර කුඩා ආහාර කැබලි රැඳී තිබෙනු දක්නට හැකි බවත් පෙන්වා දෙන්න.
- මෙම ආහාර කැබලි දවසේ වැඩි වේලාවක් මුඛයේ දත් අතර හා දිවෙහි රැඳී පැවතීම නිසා ඇති

විය හැකි අයහපත් තත්ත්වයන් පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කරන්න.

උදා:

- ♦ දත් දිරා යාම
- ♦ මුඛයේ දුර්ගන්ධය හට ගැනීම

- එම අහිතකර තත්ත්ව මඟ හරවා ගැනීමත්, දත් ආරක්ෂා කර ගැනීමත් අප විසින් කළ යුතු බව සිසුන්ට පෙන්වා දෙන්න.
- දත් අප සිරුරේ ඉතා වැදගත් කාර්යයක් ඉටු කරන බව පිළිබඳ පහත කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.
    - ♦ ආහාර දිරවීමේ පහසුව සඳහා කුඩා කැබලි බවට පත් කර ගැනීමට
    - ♦ නිවැරදි ව වචන උච්චාරණය කිරීමට
    - ♦ සුන්දර සිනහවකට
- දත් ආරක්ෂා කරගැනීමට නිවැරදි ලෙස මුඛ සෞඛ්‍ය පුරුදු පවත්වා ගත යුතු බව ද මෙහිදී අවධාරණය කරන්න.

පියවර 2

- දත් මැදීමට භාවිත කළ දත් බුරුසු කිහිපයක් සපයා ගන්න.
- එගෙන ආ දත් බුරුසුවල පහත සඳහන් තත්ත්වයන් නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- දත් බුරුසුව, දත් මැදීම සඳහා හොඳ තත්ත්වයේ පවතිනවා ද? සිසු නිරීක්ෂණ ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- භාවිතයට සුදුසු දත් බුරුසුවක් පැවතිය යුතු තත්ත්වය පිළිබඳ ව සපයා ගත් දත් බුරුසු ආශ්‍රයෙන් සාකච්ඡාවක් ගොඩනගන්න.
- දත් මැදීම සඳහා භාවිත කළ යුතු දත් බෙහෙත් ප්‍රමාණය කොතරම් ද යන්න පිළිබඳ ව ද සිසුන් සමග සාකච්ඡා කරන්න.
- දත් මැදීම සඳහා කිසිදු විටකදී අන් අයගේ බුරුසු භාවිත නොකළ යුතු බවත්, එසේ කිරීමෙන් මුඛ රෝග බෝවන බවත් පෙන්වා දෙන්න.
- එසේ ම තමා භාවිත කරන දත් බුරුසුව පාවිච්චි කිරීමෙන් පසු ව නිවැරදි ව සෝදා පිරිසිදු කර, කෙඳි ආවරණය කර ආරක්ෂිත ව තැබිය යුතු බව ද සිසුන්ට අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 1 සඳහා සිසුන් යොමු කරන්න.**

## ක්‍රියාකාරකම් 3

පියවර 1

- ලේන්සුවක ප්‍රමාණයේ පිරිසිදු සුදු පැහැති කපු රෙදි කැබැල්ලක් පන්තියට ගෙන එන ලෙස පෙර දිනයේ සිසුන් දැනුවත් කරන්න. (එසේ නොමැති නම් සිසුන්ට තම ලේන්සුව භාවිත කළ හැකි ය.)
- විවේක කාලය අවසන් වූ පසු, එම රෙදි කැබැල්ල මදක් තෙත් කර මුහුණ, අත්, වැලමිට, දණහිස හා ඒ අවට ප්‍රදේශය එම රෙදි කැබැල්ලෙන් පිස දමන ලෙස උපදෙස් දෙන්න.
- මෙසේ පිස දැමීමෙන් පසු බොහෝ විට රෙදි කැබැල්ල මත කුණු සහ දූවිලි යම් ප්‍රමාණයක් හෝ දැකිය හැකි බව පෙන්වා දෙන්න.
- ඇසට නොපෙනුණත් දවස පුරා ම මේ ආකාරයට කුණු දූවිලි අප සම මත තැන්පත් වන බව සිසුන්ට පහදා දෙන්න.
- මේ ආකාරයට සම මත කුණු දූවිලි තැන්පත් වී සම අපිරිසිදු වීම නිසා ශරීරයේ ඇතිවිය හැකි අයහපත් තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කරන්න.

    උදා:

    - ♦ සම මත බිබිලි දැමීම
    - ♦ කැසීම
- කුණු දූවිලි ඉවත් කර සම පිරිසිදු ව තබා ගැනීමට ගත හැකි පියවර ලෙස දිනපතා නෑම/ ඇඟ සේදීම වැනි ක්‍රම අනුගමනය කළ හැකි බව ද පහදා දෙන්න.

පියවර 2

- සම මෙන් ම තම කොණ්ඩය පිළිබඳව ද සැලකිලිමත් විය යුතු අයුරු ගැන සිසුන්ට පහදා දෙන්න.
- කොණ්ඩය පිරිසිදු ව පිළිවෙළට පවත්වා ගැනීම සෞඛ්‍යට හිතකර මෙන් ම ප්‍රසන්න පෙනුමක් ඇති වීමට ද හේතු වන බව පහදන්න.
- තමාගේ කොණ්ඩය දෙස පන්තියේ ඇති කණ්ණාඩියකින් බලා සකස් කර ගැනීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම් 4

- සියලු ම සිසුන්ට සිට ගැනීමට පවසා තම සිරුරේ කොටස් ඉහළ සිට පහළට හඳුනා ගෙන පැවසීමට මග පෙන්වන්න.
- තම සිරුරේ ඇති පුද්ගලික කොටස් **කිසිම බාහිර පුද්ගලයෙකුට නිරාවරණය නොකළ යුතු** බව හා **ස්පර්ශයට ඉඩ නොදිය යුතු** බව සිසු අවබෝධයට ගැළපෙන පරිදි දනුවත් කරන්න.
- තව ද පිරිසිදු කම ගැන සැලකිලිමත් විය යුතු අන්දම පිළිබඳ කතා බහ කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 තම සුව පැවැත්ම සඳහා පෞද්ගලික ව පරිහරණය කළ යුතු භාණ්ඩ හඳුනා ගෙන ඒවා පිරිසිදු ව භාවිත කරයි. | ♦ පෞද්ගලික ව පරිහරණය කරන<br>° භාණ්ඩ<br>° ඇඳුම් පැළඳුම්වල පවිත්‍රතා ව | 2.1 පෞද්ගලික ව පරිහරණය කළ යුතු භාණ්ඩවල පිරිසිදු බව පවත්වා ගනියි. | 2.1.1 පිරිසිදු බව පවත්වා ගැනීම. |

## ක්‍රියාකාරකම් 5

- එදිනෙදා අප අවදි වූ අවස්ථාවේ පටන් රාත්‍රී නින්ද දක්වා සිදු කරන විවිධ කාර්යයන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

  උදා :-
  - ♦ දත් මැදීම
  - ♦ මුහුණ සේදීම
  - ♦ හිස පීරීම
  - ♦ ඇඳුම් ඇඳීම
  - ♦ ආහාර ගැනීම
  - ♦ පාසල් යාම
  - ♦ සෙල්ලම් කිරීම
  - ♦ පාඩම් කිරීම
  - ♦ නින්දට යාම
- ඉහත එක් එක් කාර්යයන් සඳහා භාවිත කරන භාණ්ඩ, උපකරණ හා ඇඳුම් පැලඳුම් හා රෙදි පිළි පිළිබඳව සිසු අද්දැකීම් විමසන්න.
  - ♦ දත් මැදීම - දත් බුරුසුව
  - ♦ මුහුණ සේදීම හා පිස දැමීම - සබන් හා තුවාය
  - ♦ හිස පීරීම - පනාව
  - ♦ ඇඳුම් ඇඳීම - පිරිසිදු ඇඳුම්
  - ♦ ආහාර ගැනීම - පිඟාන, කෝප්පය,  පිස්නාව, හැන්ද, ගෑරුප්පුව
  - ♦ පාසල් යාම - සපත්තු, මේස්, ටයි එක, පොත් බෑගය
  - ♦ සෙල්ලම් කිරීම - බෝලය, බැට් එක, බෝනික්කන් වැනි
  - ♦ පාඩම් කිරීම - ක්‍රියාකාරකම් පොත්, කතන්දර පොත්
  - ♦ නින්දට යාම - කොට්ටය, ඇතිරිලි, පැදුරු
- මේ අතරින්, තමා විසින් පෞද්ගලික ව පරිහරණය කළ යුතු දෑ මොනවා දැයි විමසන්න.
- ඒවා පෞද්ගලික ව පරිහරණය කිරීමට හැකි සෑම අවස්ථාවකදී ම උත්සාහ කළ යුතු බව අවධාරණය කරන්න.

- එවැනි දෑ පෞද්ගලික ව පරිහරණය කළ යුත්තේ ඇයි දැයි යන්න පිළිබඳ ව පහත දැක්වෙන කරුණු ද මතු කර දක්වමින් කතා බහ කරන්න.

  උදා:
    - ♦ පනාව - උකුණන් හා හිස්හොරි බෝ වීමෙන් වැළකිය හැකි වීම
    - ♦ තුවාය/පිස්නාව - සමේ රෝග බෝ වීමට ඇති අවස්ථා අවම වීම
    - ♦ කෝප්පය - රෝග බෝ වීමට ඇති අවස්ථා අවම වීම
- එසේ ම ඒවා පිරිසිදු ව පරිහරණය කිරීමේ හා ඒවා භාවිතයෙන් පසු ආරක්ෂිත ව නිශ්චිත ස්ථානයක තැබීමේ වැදගත්කම ද අවධාරණය කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 ජලය ප්‍රමාණවත් ව පරිභෝජනය කරයි. | ♦ ප්‍රමාණවත් ලෙස ජලය පානය කිරීම. | 3.1 පාසල් කාලය තුළදී ප්‍රමාණවත් ලෙස ජලය පානය කරයි. | 3.1.1 ප්‍රමාණවත් ලෙස ජලය පානය කිරීම. |

## ක්‍රියාකාරකම් 6

පියවර 1

- සිසුන් සෙල්ලම් මිදුල ඇසුරෙන් එළිමහන් ක්‍රීඩාවකට යොමුකරන්න.
- ක්‍රීඩාව අවසානයේ ඔවුන් පන්තියට කැඳවා ගන්න.
- ශරීරයට වෙහෙස දැනුන සිසුන් කවුරුන් දැයි විමසන්න.
- වෙහෙස නිවා ගැනීමට සිසිල් ජලය ටිකක් පානය කිරීමට යොමු කරන්න.
- ශරීරයට දැනුණු වෙනස අසා එම වෙනසට හේතුව කුමක් දැයි විමසන්න.
- වෙහෙස මහන්සිය නැති කිරීමට ජලය නැතිව ම බැරි අත්‍යවශ්‍ය දෙයක් බවත්, ජලය පානය කිරීම මගින් ශරීරයට ප්‍රාණවත් බවක් ඇති වන ආකාරයත් පෙනවා දෙන්න.
- ඉන් පසු දිනපතා ම පාසලට වතුර බෝතලයක් රැගෙන ඒමේ වැදගත්කම සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසු අදහස් ප්‍රකාශ කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ද සිසු අවධානයට යොමු කරන්න.
  - ♦ ශරීරයේ නිරෝගී පැවැත්මට
  - ♦ ආහාර දිරවීමට
  - ♦ බහිශ්‍රාවීය කටයුතු නිසි ලෙස සිදුවීමට
- පහත සඳහන් කරුණු මතු කර දක්වමින් සිසුන් පාසලේ දී බීමට රැගෙන එන ජලය පිළිබඳ ව කතා බහ කරන්න.
  - ♦ බීමට ජලය ලබා ගන්නේ කුමන ස්ථානකින් ද?
  - ♦ නටන තෙක් උණුකර නිවා ගත් ජලය ද?
  - ♦ ජලය පෙරා ගත්තේ ද යන වග?

පියවර 2

- සිසුන් රැගෙන ආ වතුර බෝතලයේ කොපමණ වතුර තිබේ දැයි සලකුණු කිරීමට සිසුන්ට පවසන්න.
- විවේක කාලය අවසන් වූ පසු බෝතලයේ වතුර ප්‍රමාණය සලකුණු කර තමා පානය කර ඇති ජලය ප්‍රමාණය කොපමණ දැයි නිරීක්ෂණය කර සැසඳීමට සිසුන් යොමු කරන්න.
- පාසලේ ගත කරන කාලය තුළ නිවසින් රැගෙන එන ජල බෝතලය පාසල් කාලය තුළදී ම පානය කිරීම අත්‍යවශ්‍ය බවත්, පානය කළ යුතු ප්‍රමාණය පිළිබඳ වැටහීමක් ඇති වන ආකාරයට බෝතල්වල සලකුණු යොදමින් (ඒකක පිළිබඳ සඳහන් නොකරමින්) සිසුන්ට පැහැදිලි කිරීම් සිදු කරන්න. (අවු. 6 - 10 අතර වයස් කාණ්ඩයට අයත් සිසුන් දිනකට වතුර ලීටර් 1 - 1.5 පමණවත් පානය කළ යුතු අතර පාසලේ ගත කරන කාලය තුළ **නිවසින් රැගෙන එන ජලය මිලිලීටර් 500ක්වත් පානය කළ යුතු ය.)**
- සිසුන්ට පාසල් කාලය තුළ වතුර බීම සඳහා වරින් වර අවස්ථාව ලබා දෙන්න. ඒ පිළිබඳ සිහි කැඳවීම් කරන්න.

- නිතර වැසිකිළි යාමට සිදුවේ යැයි බියෙන් ජලය පානය නොකර සිටින සිසුන් සිටිය හැකි බැවින් එය සෞඛ්‍ය සම්පන්න පුරුද්දක් නොවන බව පෙන්වා දෙන්න.
- සිසුන්ට අවශ්‍ය අවස්ථාවලදී වැසිකිළි යාමට අවස්ථා ලබා දෙන්න.

පියවර 3
- දිනපතා අප වතුර රැගෙන එන බෝතලය වතුර පිරවීමට පෙර එහි පිරිසිදුකම සලකා බැලීම ඉතා වැදගත් බවත් සාකච්ඡා කරන්න.
- මේ සඳහා පහත අද්දැකීම ලබාදීමට කටයුතු කරන්න.
- ගුරුවරයා විසින් පිරිසිදු හා අපිරිසිදු ජල බෝතල් දෙකක් සූදානම් කරගෙන එය සැම දෙනාට ම පෙනෙන පරිදි මේසය මත තබන්න.
- අපට තිබහ දැණුන විට බීමට සුදුසු ජලය ඇති බෝතලය මින් කුමක් දැයි විමසන්න.
- එසේ කීමට හේතු විමසමින් ජල බෝතලයේ පවිත්‍රතාව පිළිබඳ කතා කරන්න.
- බෝතලය සේදීමේදී,
  - ♦ බෝතලය ඇතුළත කට වටා ,කඳ සහ යට අඩිය කොටස
  - ♦ බෝතලයේ පිටත කට වටා, කඳ සහ යට අඩිය කොටස
  - ♦ බෝතලයේ පටිය (ඇත්නම්)
- යනාදිය කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් නිතර බෝතලය සෝදා භාවිත කළ යුතු බව පෙන්වා දෙන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 ගුණාත්මක බවින් යුතු ආහාර පාන ප්‍රමාණවත් ව නියමිත වේලාවට පරිභෝජනය කරයි. | ♦ ප්‍රමාණවත් ලෙස ආහාර ගැනීම<br>♦ ගුණාත්මක ආහාර පාන ගැනීම | 4.1 විවේක කාලය තුළදී ගෙනෙන ලද ගුණාත්මක ආහාර සියල්ල ආහාරයට ගනියි. | 4.1.1 ආහාර සියල්ල ආහාරයට ගැනීම. |
| 5 ආහාර පරිභෝජනයේදී යහ පුරුදු ප්‍රදර්ශනය කරයි. | ♦ ආහාර ගැනීමේදී පවත්වාගත යුතු යහ පුරුදු<br>♦ නාස්තියකින් තොර ව ආහාර ගැනීමේ වැදගත්කම | 5.1. ආහාර ගැනීමේදී නිවැරදි යහ පුරුදු අනුගමනය කරයි. | 5.1.1 නිවැරදි යහ පුරුදු අනුගමනය කිරීම. |
| | | 5.2 නාස්තියකින් තොර ව ආහාර ගැනීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව ආහාර පරිභොජනය කරයි. | 5.2.1 වැදගත්කම අවබෝධ කර ගැනීම. |

## ක්‍රියාකාරකම් 7

පියවර 1
- නිවැරදි ව ආහාර ගන්නා ආකාරය වීඩියෝ දර්ශනයක් මගින් හෝ ගුරුවරයා විසින් සකස් කර ගන්නා ලද සුදුසු ක්‍රමවේදයක් මගින් හෝ සිසුන්ට පෙන්වා දෙන්න. ඔබ භාවිත කරන ක්‍රමවේදය තුළ පහත සඳහන් කරුණු මතු කළ හැකි ආකාරයේ අවස්ථා අන්තර්ගත විය යුතු වේ.

  උදා.
  - ♦ ආහාර ගැනීමට සුදුසු පරිදි පුටුව, මේසය ආසන්නයට ගෙන නිවැරදි ව ඉඳ ගැනීම
  - ♦ ඇඟිලි තුඩුවලින් ආහාර සෙමින් අනා ගැනීම
  - ♦ ආහාර ගැනීමදී තම කටට ගත හැකි ප්‍රමාණයට පමණක් ගැනීම
  - ♦ ඉවත ලන ආහාර කොටස් ක්‍රමානුකූල ව බඳුනේ පසෙකින් තැබීම
  - ♦ ආහාර ගැනීම මනා සිහියෙන් යුතු ව කිරීම
  - ♦ ශබ්ද නොනැගෙන සේ ආහාර ගැනීම
  - ♦ අත්ල පුරා තැවරෙන සේ ආහාර නොගැනීම

- ලබා දුන් උපදෙස්වලට අනුව විවේක කාලය තුළ ආහාර ගන්නේ ද යන්න නිරන්තරයෙන් නිරීක්ෂණය කරන්න.
- මෙවැනි යහ පුරුදු පාසලේදී පමණක් නොව ආහාර ගන්නා ඕනෑ ම ස්ථානයකදී පවත්වා ගත යුතු බව පෙන්වා දෙන්න.

පියවර 2
- පන්තියේ සියලු ම සිසුන්ට උදේ/දිවා ආහාර වේලක් ලබා දීමට සැලසුම් කර ගන්න.
- පෝෂ්‍යදායී මෙන් ම සිසුන් වඩාත් ම ප්‍රිය කරන පැහැයෙන් යුතු ආහාර වේලක් විය යුතුය. අතුරු පසට දේශීය පලතුරක් ලබා දෙන්න.
  උදා.: රතු කැකුළු බත්, පරිප්පු, පලා මැල්ලුම, බීට්, බිත්තර/මාළු/කරවල/ හාල්මැස්සන්
- ස්වයං සේවා ක්‍රමයට සිසුන්ට අවශ්‍ය පහසුකම් සලසන්න.
  උදා.: කෑම මේසයකට සිසුන් කණ්ඩායමක් වන සේ.
- හැකි නම් හැඳි, ගෑරුප්පු ද තබන්න. (කැමති සිසුන්ට ලබා ගත හැකි වන පරිදි)
  ආහාර ගැනීමේදී නිවැරදි මේස පුරුදු (**Table manners**) හුරු පුරුදු කරවන්න.
- ආහාර ගත් පසු නිවැරදි ව දැත් සේදීමට හා පිඟන් සේදීමට යොමු කරන්න.
- අත හා බඳුන් සේදීමෙන් පසු එම ස්ථානය (**Sink**) අපිරිසිදු වී ඇති නම්, එය පිරිසිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. එහි පවිත්‍රතාව රැක ගැනීමේ වැදගත්කම සිසුන්ට පෙන්වා දෙන්න.

## ක්‍රියාකාරකම් 8

පියවර 1
- පාසලේදී ආහාර ගැනීම සඳහා වෙන් කරන විවේක කාලය තුළ තමා ගෙන ආ ආහාර සියල්ල ආහාරයට ගන්නවා දැයි අධීක්ෂණය කරන්න.
- ආහාර ලබා ගත් පසු කෑම බඳුන පෙන්වන ලෙස සිසුන්ට පවසන්න.
- ආහාර සියල්ල අනුභව කිරීම අගය කරන්න. ආහාර නාස්ති නොකළ යුත්තේ ඇයි ද යන්න සිසුන් සමග කතා කරන්න.
- සිසුන් රැගෙන එන ආහාර බඳුන් හෝ ඇසුරුම් තමන් විසින් ම පිරිසිදු කර ගැනීමට මග පෙන්වන්න.
- **සෑම දිනක ම නියමිත වේලාව තුළ ප්‍රමාණවත් තරමින් ආහාර ගැනීමට සිසුන් දිරිමත් කරන්න.**
- තවද එක ම ආහාරය රැගෙන ඒමෙන් වැළකී විවිධත්වයෙන් යුතු ස්වාභාවික ආහාර රැගෙන ඒමට ද සිසුන් දිරිමත් කරන්න.

  උදා:
  - ධාන්‍ය වර්ග
  - අල වර්ග
  - පලතුරු වර්ග
- හැකි නම් සුදුසු පරිදි දින වෙන්කර ඒ ඒ දිනවල ගෙන ඒමට නියමිත ආහාර සහිත සටහනක් සැලසුම් කර ඒ අනුව කෑම ගෙනෙන ලෙස උපදෙස් ලබා දෙන්න.

පියවර 2
- විවේක කාලය තුළ දී සිසුන් තමන් ආහාර ගත් ස්ථානය, මේසය, මේසය අවට බිම, ඇඳුම ආදිය හොඳින් නිරීක්ෂණයට අවස්ථාව දෙන්න.
- නිරීක්ෂිත දේ පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.
- පසුව තමා ආහාර ගත් ස්ථානය අවට විසිරුණු ආහාර කොටස් බඳුනකට රැස් කරන ලෙස සිසුන්ට පවසන්න.
- මෙසේ ආහාර විසිරීමට හේතු සිසුන් සමග සාකච්ඡා කරන්න.

  උදා :-
  - අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර බෙදා ගැනීම
  - අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර අනා ගැනීම.(පිඟානේ එක් තැනකින් පමණක් ආහාර අනාගෙන පිළිවළට කෑම නොගැනීම)
  - නිසි අවධානයකින් තොර ව ආහාර ගැනීම

♦ ඉඳ ගැනීමේදී නිවැරදි ඉරියවු පවත්වා නොගැනීම
♦ තමාගේ මුඛයට ප්‍රමාණවත් තරමට වඩා ආහාර දමා ගැනීම
♦ යහළුවන් සමග කතාබහ කරමින් ආහාර ගැනීම

පියවර 3

- සහල්, එළවළු, පලතුරු, කිරි ආදී අප ආහාරයට ගන්නා දේවල් නිපදවා ගැනීමට ගොවියා මහන්සි වන ආකාරය වීඩියෝ දර්ශන හෝ ඡායාරූප පදනම් කර ගෙන සිසුන්ට පෙන්වන්න.
- දරුවන්ට ආහාර ලබා දීමට දෙමාපියන් වෙහෙස වී වැඩ කරන ආකාරයත් දරුවාට ආහාර පිසීමට දෙමව්පියන්/වැඩිහිටියන් දරන මහන්සියත් හොඳින් පැහැදිලි කර දෙන්න.
- එහෙයින් ආහාර ගන්නා විට, බෙදා ගන්නා ලද ආහාර අපතේ නොදමා ආහාරයට ගත යුතු බවත්, ආහාර ගන්නා විට ප්‍රමාණවත් වන පරිදි බෙදා ගත යුතු බවත් පැහැදිලි කර දෙන්න.
- අපට ආහාර සපයා දුන් සහ සපයා දෙන සියලු දෙනාට අපි ස්තුතිවන්ත විය යුතු බව ද සිසුන්ට පවසන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 2 සඳහා සිසුන් යොමුකරන්න.**

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6. පෝෂ්‍යදායි ආහාරයක ආකෘතියක් සකස් කරයි. | ♦ ආකෘති නිර්මාණය | 6.1 පෝෂ්‍යදායී ආහාරයක ආකෘතියක් සකස් කිරීමට දායක වෙයි. | 61.1. ආකෘතියක් සකස් කිරීම. |

## ක්‍රියාකාරකම් 9

- පෝෂ්‍යදායී ආහාරයක ආකෘතියක් සකස්කිරීම සඳහා සිසුන්ට යුගල / කණ්ඩායම් වශයෙන් අවස්ථාව ලබා දෙන්න.
  උදා; එළවළු/ පලතුරු, සලාද
- මේ සඳහා මැටි, ක්ලේ, පිටිමෝලි **(play dough)** ඉවත ලන කඩදාසි සහ වෙනත් අවට පරිසරයෙන් සපයා ගන්නා දේ යොදා ගැනීමට සිසුන් යොමුකරන්න.
- සිසුන් ක්‍රියාකාරකමේ යෙදෙන අතරතුර ප්‍රශ්න විමසන්න.
  උදා
  ♦ සෑදීමට යොදා ගත්තේ මොනවා ද?
  ♦ වර්ණ කර ගත්තේ කොහොම ද?
- සිසුන්ගේ නිර්මාණශීලීත්වය ඉස්මතු වන පරිදි ක්‍රියාකාරකමේ යෙදීමට අවස්ථාව ලබාදෙන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 ස්වස්ථතා ව පවත්වා ගැනීමට අදාළ යහපුරුදු ප්‍රදර්ශනය කරයි. | ♦ වැසිකිළි භාවිතයට අදාළ යහපුරුදු<br>♦ වැසිකිළියේ පිරිසිදු බව | 7.1.වැසිකිළි භාවිතයට අදාළ යහපුරුදු ප්‍රදර්ශනය කරයි. | 7.1.1.යහපුරුදු ප්‍රදර්ශනය කිරීම. |

## ක්‍රියාකාරකම් 10

- "අපේ පාසල" තේමාවෙන් ලබාගත් අද්දැකීම් නැවත සිහිපත් කරමින් වැසිකිළි භාවිතයේදී සිසුන් විසින් පවත්වාගන්නා යහ පුරුදු පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- දවසේ උදෑසන ම කාලයේ පාසල් වැසිකිළියේ පවතින තත්ත්වය නිරීක්ෂණය සඳහා සිසුන් රැගෙන යන්න.
- ඉන්පසු විවේක කාලය අවසන් වීමෙන් පසු වැසිකිළියේ පවතින තත්ත්වය නිරීක්ෂණය සඳහා නැවත සිසුන් රැගෙන යන්න.

- පෙර හා පසු සිදුවී ඇති තත්ත්වය සසඳා එසේ වීමට හේතු විමසන්න.
- වැසිකිළි භාවිතයේදී,
  - ♦ වතුර හොඳින් ගසා තවත් අයෙකුට භාවිතයට සුදුසු පරිදි පිරිසිදු කළ යුතු බව
  - ♦ තම ශරීර අවශ්‍යතාවය සම්පූර්ණ වූ පසු නිසි පරිදි ඇඳුම් ඇඳ සකසා ගෙන පැමිණිය යුතු බව
  - ♦ වැසිකිළි භාවිතයෙන් පසු සබන්/අත් සෝදන දියර දමා හොඳින් අත් සේදිය යුතු බව වැනි කරුණු තහවුරු කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8 නම්‍යතාවය පවත්වා ගනිමින් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | ♦ ශාරීරික ක්‍රියාකාරකම් | 8.1 නම්‍යතාවය පවත්වා ගනිමින් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 8.1.1 ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වීම. |

- හොඳින් වාතාශ්‍රය ඇති එළිමහන් ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- පහත සඳහන් ඇඟ උණුසුම් කිරීමේ ව්‍යායාම සිදු කිරීමට අවස්ථාව දෙන්න. දී ඇති කාලය එම ඉරියව්වේ ම රැඳී සිටීමට උපදෙස් දෙන්න.

| | | | |
|---|---|---|---|
|  1. දෑත් ඔසවා ඉහළට ඇදීම (තත්පර 10ක්) |  2. ඉහත ක්‍රියාකාරකම පා ඇඟිලි තුඩු මත සිට දෑත් ඔසවා ඉහළට ඇදීම (තත්පර 10ක්) |  3. දෑත් ඉහළට ඔසවා වම් පැත්තට නැමීම (තත්පර 10ක්) |  4. දෑත් ඉහළට ඔසවා දකුණු පැත්තට නැමීම (තත්පර 10ක්) |
|  5. දෙපා නොනමා උදරයෙන් කඳ ඉදිරියට නැමීම මෙහිදී දෑත් ඉදිරියට දිගු කළ යුතු ය (තත්පර 10ක්) |  6. පා දණ හිසෙන් පිටු පසට නමමින් එක තැන දිවීම (තත්පර 25ක්) |  7. පා දණ හිසෙන් නමා ඉහළට ඔසවමින් එක තැන දිවීම (තත්පර 25ක්) |  8. දෑත් දෙපසට විහිදුවා දෙපා පොළව මත හැකි තරම් ඈත් කර තත්පර 25ක කාලයක් රැඳී සිටීම |

- අනතුරු ව පහත ශාරීරික ක්‍රියාකාරකම්වල නිරතවීමට අවස්ථාව ලබා දෙන්න.
  1. නිදහසේ ඇවිදීම
  2. නිදහසේ පැනීම
  3. මඳක් වේගයෙන් ඇවිදීම
  4. පියවරෙන් පියවර පැන පැන යාම
  5. වේගයෙන් ඇවිදීම

6. දෙපා එක් කොට දණහිස්, මදක් නමා ඉදිරියට පැනපැන යාම

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 3 සඳහා සිසුන් යොමුකරන්න.**

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | ත.නි.අ. | අපේක්ෂිත මට්ටමට ළඟා වී ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථයි |
|---|---|---|---|
| 1.1 දැත් නිවැරදි ව පිරිසිදු කර ගනියි. | 1.1.1 | නිවැරදි පියවර අනුගමනය කරමින් දැත් පිරිසිදු කර ගනියි. | නිවැරදි ව දැත් පිරිසිදු කර ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.2 දැත් හා දෙපාවල ඇඟිලි සහ නියපොතු පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගනියි. | 1.2.1 | දැත් හා දෙපාවල ඇඟිලි සහ නියපොතු පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගනියි. | දැත්/දෙපාවල ඇඟිලි සහ නියපොතු පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.3 හිසකෙස් පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගනියි. | 1.3.1 | හිසකෙස් පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගනියි. | හිසකෙස් පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.4 මුඛය හා දත් පිරිසිදුව පවත්වා ගනියි. | 1.4.1 | මුඛය හා දත් පිරිසිදු ව පවත්වා ගනියි. | මුඛය හා දත් පිරිසිදු ව පවත්වා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.5 සමෙහි පිරිසිදු බව පවත්වා ගනියි. | 1.5.1 | සමෙහි පිරිසිදු බව පවත්වා ගනියි. | සමෙහි පිරිසිදු බව පවත්වා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.6 ශරීරය පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 1.6.1 | ශරීරය පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | ශරීරය පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.1 පෞද්ගලික ව පරිහරණය කළ යුතු භාණ්ඩවල පිරිසිදු බව පවත්වා ගනියි. | 2.1.1 | පෞද්ගලික ව පරිහරණය කළ යුතු භාණ්ඩවල පිරිසිදු බව පවත්වා ගනියි. | පෞද්ගලික ව පරිහරණය කළ යුතු භාණ්ඩවල පිරිසිදු බව පවත්වා ගැනීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 3.1 පාසල් කාලය තුළදී ප්‍රමාණවත් ලෙස ජලය පානය කරයි. | 3.1.1 | පාසල් කාලය තුළදී ප්‍රමාණවත් ලෙස ජලය පානය කරයි. | පාසල් කාලය තුළදී ප්‍රමාණවත් ලෙස ජලය පානය නොකරයි. |
| 4.1 විවේක කාලය තුළදී ගෙනෙන ලද ගුණාත්මක ආහාර සියල්ල ආහාරයට ගනියි. | 4.1.1 | විවේක කාලය තුළදී ගෙනෙන ලද ගුණාත්මක ආහාර සියල්ල ආහාරයට ගනියි. | විවේක කාලය තුළදී ගෙනෙන ලද ගුණාත්මක ආහාර කිසිවක් ආහාරයට නොගනියි. |
| 5.1 ආහාර ගැනීමේ දී නිවැරදි යහ පුරුදු අනුගමනය කරයි. | 5.1.1 | ආහාර ගැනීමේදී නිවැරදි යහ පුරුදු අනුගමනය කරයි. | ආහාර ගැනීමේදී නිවැරදි යහ පුරුදු අනුගමනය කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

| | | | |
|---|---|---|---|
| 5.2 නාස්තියකින් තොර ව ආහාර ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | 5.2 | නාස්තියකින් තොර ව ආහාර ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. | නාස්තියකින් තොර ව ආහාර ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 6.1 පෝෂ්‍යදායී ආහාරයක ආකෘතියක් සකස් කිරීමට දායක වෙයි. | 6.1.1 | පෝෂ්‍යදායී ආහාරයක ආකෘතියක් සකස් කිරීමට දායක වෙයි. | පෝෂ්‍යදායී ආහාරයක ආකෘතියක් සකස් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 7.1 වැසිකිළි භාවිතයට අදාළ යහපුරුදු ප්‍රදර්ශනය කරයි. | 7.1.1 | වැසිකිළි භාවිතයට අදාළ යහපුරුදු ප්‍රදර්ශනය කරයි. | වැසිකිළි භාවිතයට අදාළ යහපුරුදු ප්‍රදර්ශනය නොකරයි. |

| | | | |
|---|---|---|---|
| 8.1 නම්‍යතාවය පවත්වා ගනිමින් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 8.1.1 | නම්‍යතාවය පවත්වා ගනිමින් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | නම්‍යතාවය පවත්වා ගනිමින් ශාරීරික ක්‍රියාකාරකම්වල නිරත විමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

## 06. තේමාව - අප අවට සත්තු

ජීවී අජීවී වශයෙන් බෙදා වෙන්වන පරිසරය තුළ සතුන්ට ද ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම අරභයා මෙම තේමාව සකස් වී ඇත. පාසල හා නිවස ආසන්න පරිසරයේ ගැවසෙන හා ජීවත්වෙන විවිධ සතුන්ගේ ස්වභාවය, හැසිරීම, කන බොන, ආකාර හා වසස්ථාන පිළිබඳ ගවේෂණය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ තවද, සතුන් පිළිබඳ අවිහිංසාවාදී ව කටයුතු කළ යුතු ආකාරය හා ඔවුන් වෙනුවෙන් අපට කළ හැකි බොහෝ දේ මෙහි අන්තර්ගතය. පරිසරයේ සුන්දරත්වය වැඩි කරන සතුන් අප රැකබලා ගනිමින්, ජෛව පරිසරයේ විවිධත්වය අගය කිරීම අරමුණු කර ගෙන සිසුන් තුළ ආදරය, කරුණාව, දයාව වැනි මානුෂීය ගුණාංග සතුන් වෙනුවෙන් ද දක්වමින් කටයුතු කිරීමේ අවශ්‍යතාව තහවුරු කෙරේ. තවද; සතුන්ගේ විචිත්‍රත්වය කවි, ගීත හා රංගනය කරමින් වින්දනාත්මක කුසලතා ඔප්නැංවීම ද මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් පිළිබඳ ව විමසා බලා තොරතුරු ඉදිරිපත් කරයි. | ♦ ආසන්න පරිසරයේ<br>° ගැවසෙන සතුන්<br>♦ බාහිර ලක්ෂණ<br>° හැසිරෙන ආකාරය<br>° විචිත්‍රත්වය | 1.1 ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් හඳුනා ගෙන නම් කරයි. | 1.1.1 සතුන් නම් කිරීම. |
| | | 1.2 ආසන්න පරිසරයේ ගැවසෙන සතුන්ගේ බාහිර ලක්ෂණ නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 1.2.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම. |
| | | 1.3 සතුන් හැසිරෙන ආකාරය රඟ දක්වයි. | 1.3.1 රඟ දැක්වීම. |
| | | 1.4 සතුන්ගේ චිත්‍ර/ ආකෘති නිර්මාණය කරයි. | 1.4.1 චිත්‍ර/ආකෘති නිර්මාණය කරීම. |

### ක්‍රියාකාරකම් 1

පියවර 1

- පාසල් පරිසරයේ හෝ පාසලට පිටත සතුන් ගැවසෙන ස්ථානයක් නිරීක්ෂණ කිරීම සඳහා චාරිකාවක් සූදානම් කර ගන්න.
- නිරීක්ෂණ චාරිකාවේදී සතුන්ට හිංසාවක්, පීඩාවක් නොවන ලෙස සතුන් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
- කුඩා සතුන් නිරීක්ෂණයට පහත උපකරණ සපයා ගන්න.
  - ♦ අත්කාච
  - ♦ දුරදක්න

පියවර 2

- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- නිරීක්ෂණය කරන ප්‍රදේශය තුළ එක් එක් කණ්ඩායම් සඳහා නිරීක්ෂණ ස්ථාන වෙන් කර දෙන්න. නිහඬ ව නිරීක්ෂණය කිරීමට පවසන්න.
- තම කණ්ඩායම සඳහා නියම වූ ස්ථානය තුළ ගැවසෙන සතුන් කවුද? ඔවුන් හැසිරෙන්නේ කෙසේ

දැයි නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

- නිරීක්ෂණයේ දී දුටු සතුන් හා ඔවුන් හැසිරෙන ආකාරය පන්තිය ඉදිරියේ විවිධ අයුරින් වාර්තා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදා : වාචික, භූමිකා රංගන, චිත්‍ර ආදිය මගින්

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 1 සඳහා සිසුන් යොමුකරන්න.**

පියවර 3

- වර්ණවත් පින්තූර, සත්ත්ව ආකෘති, සත්ත්ව රූකඩ යොදා ගනිමින් සතුන්ගේ විවිධත්වය පිළිබඳ කතා බහ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන් කැමති මාධ්‍යයක් භාවිතයට ගෙන සතුන් ඇඳීමට හෝ සත්ත්ව ආකෘති නිර්මාණයට අවස්ථාව දෙන්න.

  උදා :- ආකෘති නිර්මාණයට - මැටි, ක්ලේ, ඉවතලන විවිධ ද්‍රව්‍ය, පාට කඩදාසි, පත්තර කොළ
- සිසු චිත්‍ර / ආකෘති නිර්මාණ ප්‍රදර්ශනය කර සිසුන් අගය කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 ආසන්න පරිසරයේ සතුන් ගන්නා ආහාර පිළිබඳ ව විමසා බලා තොරතුරු ප්‍රකාශ කරයි. | ♦ ආසන්න පරිසරයේ සතුන් ආහාර ගන්නා අයුරු | 2.1 ආසන්න පරිසරයේ සතුන් ගන්නා ආහාර හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |
| | | 2.2 සතුන් ආහාර ගන්නා ආකාරයේ විවිධත්වය ප්‍රකාශ කරයි. | 2.2.1 විවිධත්වය ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම 2

පියවර 1

- උදෑසන ම අවදි වී කෑම සොයා යන සතුන් පිළිබඳ ව නිවෙස පාදක ව අද්දැකීම් ලබා ගැනීම සඳහා සිසුන්ට ප්‍රශ්න කිහිපයක් යොමු කරන්න.
  - ♦ අපට ආහාර අවශ්‍ය ඇයි ?
  - ♦ සතුන්ටත් ආහාර අවශ්‍ය ද?
  - ♦ අපට ආහාර සපයා දෙන්නේ කවු ද?
  - ♦ සතුන්ට ආහාර සපයා දෙන්නේ කවු ද?
  - ♦ ඔවුන් ආහාර සොයා ගන්නේ කෙසේ ද?
- සිසුන් ලබා ගෙන ඇති අද්දැකීම් ප්‍රකාශයට අවස්ථාව සලසා දෙන්න.
- ආසන්න පරිසරයේ සිටින සතුන්ටත් අපට වගේ ම ජීවත් වීමට ආහාර, ජලය, නිදහස් පරිසරයක් අවශ්‍ය බව පැහැදිලි කරන්න
- සතුන් කිහිප දෙනෙකු ගන්නා ආහාර ගැන කියවෙන පහත ගීත සිසුන් සමග තාල තබමින් ගායනා කරන්න.

  ලේන් පැංචෝ<br>
  ටිං ටිං ටිං ///<br>
  ගිරා පැටියෝ<br>
  ක්‍රීස් ක්‍රීස් ක්‍රීස් ///<br>
  දෙමලිච්චෝ<br>
  සිලි සිලි සිලි ///<br>
  මේ තියෙන්නේ රස පලතුරු<br>
  මේ තියෙන්නේ බත් ගුළියක්<br>
  කාලා බඩ පුරෝ ගන්න//

පියවර 2

- "අද අපි උදෙන් ම සතුන්ට කෑම තියමු" යැයි පවසමින් පන්තිය ආසන්නයේ සකස් කර ඇති කුරුලු ලෑල්ල හොඳින් පිරිසිදු කර ඒ මත විවිධ ආහාර වර්ග කිහිපයක් තබන්න.

  උදා: බත්, කෙසෙල්, අඹ............. වැනි පලතුරු, වී, මුං, මෑ වැනි ඇට වර්ග (විශේෂයෙන් සිසුන්

දිවා ආහාර ගැනීමට පෙර සතුන් වෙනුවෙන් තෙල් හා මිරිස් එකතු කරන නොකළ ආහාර ස්වල්පය බැගින් වෙන් කර එම ආහාර කුරුලු ලැල්ල වෙත තැබීම)

- සිසුන් පන්තියෙන් එළියට රැගෙන ගොස් කුරුලු ලැල්ල පෙනෙන දුරින් සිටිමින් සන්සුන් ව එතැනට පැමිණෙන සතුන් නිරීක්ෂණය කරන ලෙස උපදෙස් දෙන්න.
- පහත ආකාරයේ ප්‍රශ්න යොමු කරමින් සිසුන්ට නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසන්න.
  - කුරුලු ලැල්ලට ඉස්සෙල්ලා ම පැමිණියේ කවු ද?
  - ඊළඟට ආවේ කවු ද?
  - එම සතුන් එතැනට ආවේ තනිවම ද?
  - ආහාර ගැනීමේදී ඔවුන් හැසිරුණේ කෙසේ ද?
  - ඔබ තැබූ කෑම අතරින් එක් එක් සතා ප්‍රිය කළ ආහාර ඔබ හඳුනා ගත්තා ද?
  - ආහාර අතින් ගෙන කටට දමා ගත් සතුන් කවු ද?
  - හොටෙන් ආහාර ගන්නා සතුන් කවු ද?
  - දහවල් වන විට කුරුලු ලැල්ල මත තිබූ ඉතුරු ආහාර පලතුරු කොටස් වියළී තිබෙන බවත් සිසුන්ට දැක ගැනීමට සලස්වන්න.
- එම ඉතුරු වූ ආහාර කෑමට සතුන් පැමිණෙන්නේ ද යන්න කිහිප වරක් නිරීක්ෂණය කරන්න.
  - දහවල් වන විට ලැල්ල මත ඉතුරු වූ ආහාර ගැනීමට සතුන් පැමිණියේ ද?
  - ඒ ලෙස පැමිණි සතුන් කවු ද?
  - සතුන් නොපැමිණියේ නම් එයට හේතුව කුමක් විය හැකි ද? සාකච්ඡා කරන්න.
- සතුන්ටත් අපට මෙන් නැවුම් පිරිසිදු ආහාර ලබා දිය යුතු බවත්, කුරුලු ලැල්ල මත ආහාර හා ජලය තැබීමේදී එම ස්ථානය හා භාජන පිරිසිදු කළ යුතු බවත් පෙන්වා දෙන්න.
- තවද ; මේ සතුන් කුරුලු ලැල්ලට පැමිණෙන්නේ පරිසරයේ සතුන් ආහාරයට ගන්නා කොළ, ගෙඩි, මල් හිඟ නිසා බවත්, ඒ සඳහා අපට මෙන් ම සතුන්ටත් ආහාර ගැනීම සඳහා පරිසරයේ ගස් වර්ග සිටුවා එහි පලදාවෙන් කොටසක් ඉතුරු කළ යුතු බවත් සිසුන්ට පැහැදිලි කර ඒ හා සම්බන්ධ යහපත් ආකල්ප ගොඩනැගීමට කටයුතු කරන්න.
- සතුන් බොහෝ දෙනෙක් ශාකවලින් ලබා ගන්නා මල් පැණි, ගෙඩි, කොළ වැනි දේ ආහාරයට ගන්නා බැවින් පරිසරයේ එවැනි ගස් වැල් සිටුවීමෙන් සතුන් පැමිණීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර ගත හැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.
- එසේ ම ප්‍රමාණාත්මක ව ආහාර නොමැති බොහෝ දෙනා සිටින බැවින් ආහාර නාස්තිය අවම වන ලෙස කටයුතු කළ යුතු බව සිසුන්ට පෙන්වා දෙන්න.
- නිරන්තරයෙන් සතුන් ආහාර ගන්නා ආකරය පිළිබඳ ව තොරතුරු සෙවීමට හා නිවස ආසන්න පරිසරයට පැමිණෙන සතුන් හොඳින් නිරීක්ෂණය කිරීමට (ආරක්ෂිත ව/වැඩිහිටි අධීක්ෂණය යටතේ) සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 2 සඳහා සිසුන් යොමුකරන්න.**

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 ආසන්න පරිසරයේ ජීවත් වන සතුන්ගේ වාසස්ථාන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | ♦ තෝරා ගත් සතුන් කිහිප දෙනෙකුගේ වාසස්ථාන පිළිබඳ<br>° තොරතුරු<br>° නිර්මාණ | 3.1 සතුන්ගේ වාසස්ථාන හඳුනාගෙන නම් කරයි. | 3.1.1 සත්ව වාසස්ථාන නම් කිරීම |
| | | 3.2 සතුන්ගේ වාසස්ථාන නිර්මාණශීලී ව සකස් කිරීමට දායක වෙයි. | 3.2.1 නිර්මාණශීලී ව සකස් කිරීමට දායක වීම |

## ක්‍රියාකාරකම් 3

පියවර 1

- අපට ජීවත් වීමට නිවසක් අවශ්‍ය වන්නේ ඇයි දැයි සිසුන්ගෙන් විමසන්න.
- තම පවුලේ අය සමග ජීවත් විමට අපට නිවාස ඕනෑ වාගේ ම සතුන්ට ද, අව්වෙන්, වැස්සෙන්, වෙනත් සතුන්ගෙන් ආරක්ෂා වී ජීවත් වීමට නිවාස අවශ්‍ය බව සාකච්ඡා කරන්න.
- සැම සතෙකුට ම නිවසක් සාදා ගැනීමට හැකි දැයි විමසන්න. අප විසින් සමහර සතුන්ට නිවාස

සාදා දෙන අතර සමහර සතුන් ඔවුන්ගේ නිවෙස් සාදා ගන්නා බවත් සිසු අද්දැකීම් සමග සාකච්ඡා කරන්න.

- අප අවට පරිසරයේ නිතර දැකිය හැකි සතුන් ගැන සිසුන්ගෙන් තොරතුරු විමසන්න.
- පහත සඳහන් ආකාරයේ ගීත සිසුන් සමග ගායනා කර රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

  උදා :

  ලේන් පැංචො ලේන් පැංචො - මොක ද කරන්නේ
  පුංචි කටින් මොනව ද ඔය - අරන් දුවන්නේ
  පිදුරු ටිකයි පුළුන් ටිකයි - එකට ඔතන්නේ
  මහන්සි වී කාට ද ඔය - ගෙයක් හදන්නේ//

- අවට පරිසරයේ දක්නට ලැබෙන වාසස්ථාන කිහිපයක් නිරීක්ෂණයට පාසල් වත්තේ චාරිකාවක සිසුන් රැගෙන යන්න.

  උදා : කුරුලු කූඩු, රන් කුඹල් ගෙවල්, ලේන් කූඩු, අත්හරින ලද හුඹස්....... වැනි

- දක්නට නොලැබෙන වාසස්ථාන, පින්තූර/වීඩියෝ දර්ශන ආදිය යොදා ගනිමින් පෙන්වන්න.
- සුවිශේෂී ව නිරීක්ෂණය කිරීම සඳහා අතහැර දමන ලද වාසස්ථාන/කූඩු පන්ති කාමරයට සපයා ගන්න.

  උදා: වඩු කුරුලු කූඩුවක්
  ලේන් කූඩුවක්

- කූඩු නිරීක්ෂණය කිරීම සඳහා අත්වැසුම් (**gloves**), අත්කාච, විදුලි පන්දම් ආදිය යොදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- කූඩුව පිළිබඳ සිසුන් සොයාගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සතුන් ඒවා සෑදීමට යොදා ගෙන ඇති දේවල් නිරීක්ෂණය කර පැවසීමට කියන්න.
- මෙම වාසස්ථාන සෑදීමට සතුන් ගන්නා වෙහෙස පිළිබඳ කතාබහ කරන්න. සුළඟට කූඩුවක් බිමට වැටුණ ද අප එය ගසක් උඩ නැවත තැබිය යුතු බව පවසන්න.
- අපට මෙන් ම පරිසරයේ සතුන්ට ද ජීවත්වීමේ අයිතය ඇති බවත්, ඔවුන්ට ද නිදහස අවශ්‍ය බවත් අවබෝධ කරවන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 3 සඳහා සිසුන් යොමු කරන්න.**

පියවර 2

- පහත ආකාරයේ සත්ත්ව වාසස්ථාන ඇසුරින් නිර්මාණය කරගත් කතන්දර සිසුන්ට පවසන්න.

**කතන්දරය** - ඔන්න දවසක් කුරුල්ලො හැමෝම එකතුවෙලා දෙවියෝ හොයා ගෙන ගියා. එයාලා මෙහෙම ගියේ මේ වෙනකොට මේ ගොල්ලොන්ට ඉන්න තැනක් හරියට තිබුණේ නැහැ. ඇයි දන්නවා ද මෙයාලා කවුරුත් කූඩු හදන්න දැනගෙන හිටියේ නැහැ.

හැමෝම දෙවියෝ ළඟට ගිහිල්ලා ලොකු ඉල්ලීමක් කළා. එහෙම කළේ එයාලාට කූඩු හදලා දෙන්න කියලා. දෙවියෝ මේ ඉල්ලීම බොහොම කැමැත්තෙන් පිළිගත්තා. මොක ද ඉතින් මේ අහිංසක කුරුල්ලන්ට ඉන්න තැනක් තිබුනේ නැති නිසා. මේ ඉල්ලීම පිළිගෙන කූඩු හදන්න ඉගෙන ගන්න කියලා දිනයක් වේලාවක් තැනක් වෙන්කර ගත්තා. ඔන්න එදාට හරියට ම වෙලාවට කුරුල්ලෝ හැමෝට ම එන්න කියලා දෙවියෝ කිවුවා.

කුරුල්ලෝ හැමෝට ම හරිම සතුටුයි. හැබැයි වඩු කුරුල්ලාට නම් ඉවසුමක් නැහැ. ඇයි දන්නව ද කූඩු හදන්න ඉගෙන ගන්නකම් වඩුකුරුල්ලා ඇඟිලි ගැන ගැන හිටියේ. කැළේ හිටිය සමහර කුරුල්ලන්ට නම් ටික දවසකින් මේක අමතක වෙලා ගියා.

ඔන්න කූඩු හදන්න කියලා දෙන දිනය උදා වුණා. වඩු කුරුල්ලා බොහොම සතුටින් උදේ පාන්දරින් ම නැගිටලා ලක ලෑස්ති වෙලා වෙලාවටත් කලින් දෙවියෝ කියපු

තැනට ගිහිල්ලා ඉස්සරහ පේළියෙන් ම ඉඳගත්තා. දෙවියොත් ආවා. තවමත් වෙන එක කුරුල්ලෙක්වත් නැහැ. එන්න කියපු වෙලාවත් ටිකක් විතර පහු වුණා. කවුරුත් නැහැ. දෙවියෝ කූඩු හදන්න කියලා දෙන පාඩම පටන් ගත්තා. වඩුකුරුල්ලා ගොඩක් හොඳට අහගෙන හිටියා. එයාට තිබුණ ප්‍රශ්නත් ඔක්කොම ඇහුවා. මෙන්න එතකොටම කවු ද? දුවගෙන එනවා. ආ පැණි කුරුල්ලා....... මෙන්න තවත් ටික වෙලාවකින් චූටික්කත් ආවා. ඔය විදිහට මලිත්තෝ, බට්ටිත්තෝ පරක්කු වෙලා ආවා. එයාලට පස්සෙ තමයි මතක් වෙලා තියෙන්නෙ අද කූඩු හදන්න කියලා දෙනවා කියලා. ඔය විදිහට එක එක්කෙනා පරක්කු වෙලා හිමින් හිමින් එතනට ආවා.

හැබැයි කපුටු හාමි හිතුවා "මම නම් ටිකක් පරක්කු වෙලා යනවා. මොකට ද ඉස්සරවෙලා ම යන්නේ, පරක්කු වෙලා ගිහිල්ලා ඔන්න ඔහේ අහගෙන ඉඳල එනවා" කියලා. එහෙම හිතපු කපුටු හාමි පාඩම ඉවර වෙන්න ඔන්න මෙන්න කියලා තියෙද්දී අන්තිම වෙලාවේ හති හතිකට දුවගෙන ආවා. එයාට ඉතින් මුලින් කියපු කිසිම දෙයක් අහගන්න ලැබුණේ නැහැ. එයා අනිත් අයගෙන් ඇහුවෙත් නැහැ. එයා අන්තිමට කියලා දීපු ටික තමයි එහෙන් මෙහෙන් අහ ගත්තෙ.

හැබැයි තව කෙනෙක් හිටියා එයා තීරණය කළා මේ කූඩු හදන්න පාඩම ඉගෙන ගන්න යන්නෙ නෑ කියලා. ඒ කවුද දන්නවද කොහා. එයා පැත්ත පළාතෙවත් ගියේ නැහැ. එයාට නම් මේ ගැන එතරම් උනන්දුවකුත් තිබුණෙ නැහැ. ආසාවක් තිබුණෙත් නැහැ, කොහා හිතුවා "අනේ මොකටද ඔව්වා ඉගෙන ගන්නෙ" කියලා. "මං එක්කෝ කාගෙන් හරි අහගන්නවා". එහෙම හිතපු කොහා දෙවියෝ ඉන්න තැනට ගියේ නැහැ.

හැබැයි මේ පාඩම මුල ඉඳලා අහගෙන හිටිය වඩු කුරුල්ලා නං ලස්සනට කූඩුව හදන්න ඉගෙන ගත්තා. අර පරක්කු වෙලා ආපු කට්ටියත් එයාලට ඇහුණ තැන ඉඳන් තමයි කූඩු හදන්න ඉගෙන ගත්තෙ. ඔන්න දැන් පාඩම ඉවර වුණා. හැමෝම තම තමන් හිටපු ගස් උඩට ගියා. ඔන්න ගිහිල්ලා හති හතිකට තමන් ඉගෙන ගත්ත දේවල් යොදා ගෙන ලස්සනට කූඩු හදන්න පටන් ගත්තා. කවු ද දන්නව ද හොඳට ම ලස්සනට ම කූඩුව හැදුවේ? වඩුකුරුල්ලා. මොක ද එයා පාඩම හොඳට ම ඉගෙන ගත්තා.

ඉතිං අර පස්සෙ ආපු අය තමන්ට ඇහුණු විදිහට, තේරුණ විදිහට, ඉගෙන ගත්ත දේවල් ටික යොදාගෙන කූඩුව හැදුවා, කපුටු හාමි අන්තිමට ම නේ ගියේ. ඒ නිසා එයා ඉතින් බාගෙට ඔහේ කිසි පිළිවෙළක් නැති ව තමයි කූඩුව හැදුවේ. ඔය කොහෙටවත් ගියේ නැති කොහාට මොකද වුණේ? අනේ ඉතින් අදටත් එයාට කූඩුවක් හදාගන්න බෑ, එයා ඉන්නෙ කපුටගෙ කූඩුවෙ. එහෙනම් ඉතින් පුංචි ඔයාලට මේක හොඳ පාඩමක්. අපි දෙයක් ඉගෙන ගන්නකොට බොහොම උනන්දුවෙන් කම්මැළි නැතුව හොඳට ඉගෙන ගන්න ඕන. මතක ඇති ව වෙලාවට ම වැඩ කරන්න පුරුදු වෙන්න පුංචි ඔයාල හිතට ගන්න ඕනේ.

- සිසුන්ට ද ඉදිරිපත් වී ඉහත ආකාරයෙන් සතුන් පිළිබඳ නිර්මාණය කරගත් කතන්දර පැවසීමට අවස්ථාව ලබා දෙන්න.

### ක්‍රියාකාරකම් 4

- ඉහත ක්‍රියාකාරකමේදී නිරීක්ෂණය කළ කූඩුවලින් ඕනෑ ම සත්ත්ව වාසස්ථානයක ආකෘතියක් සිසුන්ට කුඩා කණ්ඩායම් වශයෙන් ගොඩ නැඟීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය සපයා දෙන්න.
  උදා : පුළුන්, කෙඳි වර්ග, පිදුරු, ගෝනි නූල්, මැටි, ක්ලේ වැනි
- සිසුන් සාදන වාසස්ථාන පිළිබඳ ප්‍රශ්න විමසන්න.
  උදා
  මේ වාසස්ථානය කාගේ ද?

එය හදන්නේ මොනවායින් ද?
කොයි වගේ තැන්වල ද මේ වාසස්ථානය තියෙන්නේ?

- සිසුන්ට තමන් සාදන වාසස්ථාන පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- හැකි නම් වාසස්ථානයේ සිටින සත්ත්වයා ද සකසා එතුළින් තැබීමට යොමු කරන්න.
- සිසුන් සෑදූ වාසස්ථාන පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් විසින් ම සිදු කරන නිර්මාණ අගය කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 ආසන්න පරිසරයේ ජීවත් වන සතුන් සඳහා අපට කළ හැකි දේ ප්‍රකාශ කරයි. | ♦ ආසන්න පරිසරයේ ජීවත් වන සතුන් සඳහා අපට කළහැකි දේ<br>♦ සතුන් හිංසා නොකිරීම. | 4.1 ආසන්න පරිසරයේ ජීවත්වන සතුන්ට හානි නොවන ආකාරයේ හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | 4.1.1 හැසිරීම් ප්‍රදර්ශනය කිරීම. |
| | | 4.2.1 ආසන්න පරිසරයේ ජීවත්වන සතුන්ට උපකාර කළ හැකි අවස්ථා ප්‍රකාශ කරයි. | 4.2.1 අවස්ථා ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 5

- සතුන්ටත් නිදහසේ ජීවත් වීම අවශ්‍ය බව සනාථ වන ආකාරයේ අද්දැකීම් යොදා ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  "පුතාලා කැමති ද දෙමව්පියො, නෑදැයෝ, යාළුවෝ මේ කවුරුවත් ම නැතුව කාමරයක හිරවෙලා ඉන්න. එතකොට ඔයාලා මොනව ද හිතන්නේ ?"
  "සත්තු එහෙම හිරකරල කූඩුවලට දමලා ඉන්නවා පුතාලා දැකලා තියෙනව ද? සතුන්ට මොනවාද හිතෙනවා ඇත්තේ ?"
- සතුන් සිර කරගෙන සිටින විට, තනි වුණා ම ඔබට දැනෙන දේ ම සතුන්ටත් දැනෙන බවත්, සතුනුත් තම පවුලේ අය, නෑදැයින් සමග ඉන්න ආසා කරන බවත්, නිදහසේ ජීවත් වෙන්න අපි කවුරුත් කැමති බවත් පෙන්වා දෙන්න.
- තවද සතුන්ට හානියක් වන බව දන්නේ නම් එවැනි ක්‍රියා සිදු නොකළ යුතු බව උදාහරණ හා අද්දැකීම් ඇසුරින් අවධාරණය කරන්න.
- සිසුන්ගේ සිත් ගන්නා ආකාරයට සතුන්ට සංවේදී වීම පිළිබඳ කතාවක් කියාදෙන්න.
  උදා;

  ඔන්න දුවේ පුතේ, එක ගෙදරක ඔයාලා වගේ පුංචි ළමයෙක් හිටියා. එයාගේ නම සවිඳු. සවිඳු පුතා හරිම ආසයි වටපිටාවේ සිදුවෙන දේ ගැන සොයා බලන්න. දවසක් උදේ එයා මිදුලට යනකොට ලස්සන මලක ලස්සන ම ලස්සන පාට පාට තටු තියෙන සමනලයෙක්. සවිඳුට හිතුණා සමනලයාව අල්ල ගන්න. එයා සමනලයා අල්ලන්න ළංවෙන කොට ම "හා හා සවිඳු පුතා, මෙහාට එන්න, මෙහාට එන්න." අම්මා හයියෙන් කතා කළා. සවිඳු එකපාරට ම ගැස්සුනා.එයා අම්මා ළඟට දුවන්න හැරෙන කොට ම එයාගෙ කකුල ගලක හැපුණා. සවිඳු වේදනාවෙන් අඬන්න වුණා. අම්මා සවිඳු ව තුරුළු කරගෙන හිස අත ගෑවා.

  "පුතා, සත්තු හරි ම අහිංසකයි. එයාලට කරදර කරන්න හොඳ නෑ. පුතාට රිදුණා වගේ සතුන්ටත් රිදෙනවා. සමනල තටු හරි ම සිනිඳුයි. තටුවලට හානි වුණොත් උංට පියාඹන්න බැරි වෙනවා." අම්මා සවිඳුට කියලා දුන්නා.

- කතාව ඇසුරෙන් සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න.
- සතුන්ටත් අපට මෙන් ම පණ ඇති බවත් ඔවුන්ටත් හානියක් වූ විට වේදනාව දැනෙන බවත් පවසන්න.
- එම නිසා සතුන් ට ආදරය, කරුණාව දැක්වීම අවශ්‍යවන බව පෙන්වා දෙන්න.

| | |
|---|---|
| මලක් වගේ මලක් යාළු | අල්ලන්නට එපා යාළු |
| හරි ලස්සන මලක් යාළු | තටු ගැල වී රිදෙයි යාළු |
| මලක් වගේ ඉන්නේ යාළු | ඈතට වී මෙහෙම යාළු |
| සමනලයෙක් නේද යාළු | ඒ ලස්සන බලමු යාළු |

**ගුරුවරයාගේ දැනුවත් භාවය සඳහා පමණි:**
සියලු ම සතුන් සහ ශාක ජීවීන් වේ.

## ක්‍රියාකාරකම් 6

- සතුන්ට කරදර සිදු වූ අවස්ථා සිසු අද්දැකීම් ඇසුරින් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න
  - ♦ වතුර කෝප්පයේ පාවෙන කුඩා සතෙක්
  - ♦ ලේන් කූඩුවකින් බිමට වැටුණ පැටවෙක්
  - ♦ ආහාර හෝ ජලය නොමැතිව සිටින අවස්ථා
  - ♦ සතෙකු සිර වී නිදහස් විය නොහැකි ව සිටින අවස්ථා
  - ♦ තුවාල වී සිටින හෝ ශාරීරික අපහසුතාවලින් පෙළෙන අවස්ථා
- ඔවුන්ගේ අදහස් පෝෂණය කරමින් ගුරුවරයා ද තම අද්දැකීම් ඉදිරිපත් කරන්න.
- සතුන්ට කරදරයක් වූ විට හෝ කරදරයක් බව දැණුන විට සමහර සතුන් කෑගසන ආකාරය අනුව අපට හඳුනා ගත හැකි අවස්ථා සාකච්ඡා කරන්න.
- මෙවැනි කරදරයට පත් වූ සතුන් ට කළ හැකි උදවු ගැන සිසු අදහස් විමසන්න.
- සතුන්ට උපකාර කිරීමෙන් අපට ලැබෙන සතුට පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සතුන්ට උදවු කිරීමේදී අපේ ආරක්ෂාව හා පරිස්සම ගැන ද සිතා කටයුතු කිරීමේ හා වැඩිහිටියන්ගේ උදවු ලබා ගැනීමේ වැදගත්කම සිසුන්ට පෙන්වා දෙන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 සත්ත්ව චලන ආශ්‍රිත ක්‍රීඩාවල නිරත වෙයි. | ♦ සත්ත්ව චලන ආශ්‍රිත ක්‍රීඩා | 5.1 සත්ත්ව චලන ආශ්‍රිත ක්‍රීඩා සිදු කරයි. | 5.1.1 ක්‍රීඩා සිදු කිරීම. |

## ක්‍රියාකාරකම් 7

- සිසුන් සමග ක්‍රීඩා පිටියට යන්න. "අපි අද අලුත් සෙල්ලමක් කරමු" යැයි පවසා සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එක කණ්ඩායමක් සතුන් බවත්, අනෙක් කණ්ඩායම සතුන්ගේ ගෙවල් කණ්ඩායම බවත් පවසන්න.
- ගෙවල් සාදන සිසුන් 3ක් හෝ 4ක් බැගින් එක් ව අත් ඔසවා ගෙවල් මෙන් සෑදිය යුතු බැව් පවසන්න.
- සතුන් මෙන් පෙනී සිටින සිසුන්ට සත්ත්ව චලන අනුව නිදහසේ ගමන් කළ හැකි බවත්, ගමන් කළ යුතු සීමාවත් පෙන්වන්න.
- සිසුන් සතුන් මෙන් ගමන් කරන අතර ගුරුවරයාට සවන් දිය යුතු බවත්, ගුරුවරයා පවසන වැකියට අනුව සතුන් නිවාසවලට යන අවස්ථා හඳුනා ගෙන කුමන හෝ වාසස්ථානයකට යා යුතු

බවත් පවසන්න.

- ගුරුවරයාට පහත සඳහන් ප්‍රකාශ යොදා ගත හැකිය.

  උදා:
  - ♦ රෑ බෝ වෙනවා
  - ♦ කෑම සොයනවා
  - ♦ පැටවුන්ට කෑම කවනවා
  - ♦ වැස්සක් එනවා
  - ♦ ඉර පායා එනවා
  - ♦ නිදා ගන්නවා

- නිවසකට ගිය විට නිවසින් පිටවීමට අදාළ වැකියක් කියන තුරු එළියට යා නොහැකි බව ද පවසන්න.
- ටික වේලාවකදී කණ්ඩායම් මාරු කරමින් සියලු දෙනාට ම නිවාස හා සතුන් වීමේ අවස්ථාව ලබා දෙන්න.
- මෙහිදී සතුන් ලෙස සිටින සිසුන්ට පෙරදී සකසා ගත් මුහුණු පැළඳීමට වුව ද හැකි ය.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6 සත්ත්ව හඬ අනුකරණය කර වින්දයක් ලබයි. | ♦ සත්ත්ව හඬ අනුකරණය | 6.1 සතුන්ගේ හඬ අනුකරණය කරයි. | 6.1.1 හඬ අනුකරණය කිරීම. |

## ක්‍රියාකාරකම් 8

පියවර 1

- ළමුන් එළිමහනකට හෝ නිදහස් ස්ථානයකට රැගෙන යන්න.
- පරිසරයේ සිටින සතුන්ගේ හඬට සවන්දී හඬ අනුව සතා කවුදැයි හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- නැතහොත් සතුන්ගේ හඬ ඇතුළත් හඬපටයකට සවන් දීමට සලස්වන්න. එක් එක් සතුන්ගේ එම හඬ පිළිබඳ සාකච්ඡා කරන්න.
- සතුන්ගේ හඬ අනුකරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2

- සිසුන් එළිමහනට /නිදහස් තැනකට රැගෙන යන්න.
- අද අපි මේ සතුන් හඳුනා ගනිමු යැයි පවසා ගුරුවරයා මෙම කවි තේරවිලි ලෙස ඉදිරිපත් කරන්න.

| | |
|---|---|
| උඩ පැන පැන<br>උඩ පැන පැන<br>බක බක බක බක ...... //<br>වැස්ස දාට හරි සතුටුයි<br>බක බක බක බක .....// | මල් අතු ගෙඩි කතී<br>නිතර ම පැන යතී<br>නිවසක් නම් නැතී<br>දිග වලිගය ඇතී<br>බුකුං බුකුං බුකුං |
| පුරු පුරු ගා ඇඟ දැවටෙන<br>ඤාව් ඤාව් හඬ පතුරන//<br>කාගෙත් අපෙ හුරතලා<br>අපේ පුංචි යාළුවා | එරබදු මල් පිපෙනේනේ<br>අවුරුද්දත් ළඟයිනේ<br>මෙයා තමයි කියන්නේ<br>කොහෝ කොහෝ කොහෝ |

ඎාව් ඎාව් ඎාව්//

- සිසුන් ලැබූ අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | ත.නි.අ. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථයි |
|---|---|---|---|
| 1.1 ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් හඳුනා ගෙන නම් කරයි. | 1.1.1 | ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් කිහිපදෙනෙකු හඳුනා ගෙන නම් කරයි. | ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් හඳුනා ගෙන නම් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.2 ආසන්න පරිසරයේ ගැවසෙන සතුන්ගේ බාහිර ලක්ෂණ නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 1.2.1 | ආසන්න පරිසරයේ ගැවසෙන සත්ත්වයෙක්ගේ බාහිර ලක්ෂණ නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | ආසන්න පරිසරයේ ගැවසෙන සත්ත්වයෙක්ගේ බාහිර ලක්ෂණ නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 1.3 සතුන් හැසිරෙන ආකාරය රඟ දක්වයි. | 1.3.1 | සතුන් හැසිරෙන ආකාරය රඟ දක්වයි. | සතුන් හැසිරෙන ආකාරය රඟ දැක්වීමේ දුෂ්කරතා දක්වයි. |
| 1.4 සතුන්ගේ චිත්‍ර/ ආකෘති නිර්මාණය කරයි. | 1.4.1 | සතුන්ගේ චිත්‍ර/ආකෘති නිර්මාණය කරයි. | සතුන්ගේ චිත්‍ර/ආකෘති නිර්මාණය කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 2.1 ආසන්න පරිසරයේ සතුන් ගන්නා ආහාර හඳුනා ගෙන ප්‍රකාශ කළ හැකියි. | 2.1.1 | ආසන්න පරිසරයේ සතුන් ගන්නා ආහාර හඳුනා ගෙන ප්‍රකාශ කළ හැකියි. | ආසන්න පරිසරයේ සතුන් ගන්නා ආහාර හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 2.2 සතුන් ආහාර ගන්නා ආකාරයේ විවිධත්වය ප්‍රකාශ කරයි. | 2.2.1 | සතුන් ආහාර ගන්නා ආකාරයේ විවිධත්වය ප්‍රකාශ කරයි. | සතුන් ආහාර ගන්නා ආකාරයේ විවිධත්වය ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 3.1 සතුන්ගේ වාසස්ථාන හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 | සතුන්ගේ වාසස්ථාන හඳුනා ගෙන නම් කරයි. | සතුන්ගේ වාසස්ථාන හඳුනා ගෙන නම් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 3.2 සතුන්ගේ වාසස්ථාන නිර්මාණශීලීව සකස් කිරීමට දායක වෙයි. | 3.2.1 | සතුන්ගේ වාසස්ථාන නිර්මාණශීලී ව සකස් කිරීමට දායක වෙයි. | සතුන්ගේ වාසස්ථාන නිර්මාණශීලී ව සකස් කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි.. |
| 4.1 ආසන්න පරිසරයේ ජීවත් වන සතුන-ට හානි නොවන ආකාරයේ හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | 4.1.1 | ආසන්න පරිසරයේ ජීවත් වන සතුන්ට හානි නොවන ආකාරයේ හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | ආසන්න පරිසරයේ ජීවත්වන සතුන්ට හානි නොවන ආකාරයේ හැසිරීම් ප්‍රදර්ශය කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 4.2 ආසන්න පරිසරයේ ජීවත් වන සතුන්ට උපකාර කළ හැකි අවස්ථා ප්‍රකාශ කරයි. | 4.2.1 | ආසන්න පරිසරයේ ජීවත් වන සතුන්ට උපකාර කළ හැකි අවස්ථා ප්‍රකාශ කරයි. | ආසන්න පරිසරයේ ජීවත් වන සතුන්ට උපකාර කළ හැකි අවස්ථා ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |
| 5.1 සත්ත්ව චලන ආශ්‍රිත ක්‍රීඩා සිදු කරයි. | 5.1.1 | සත්ත්ව චලන ආශ්‍රිත ක්‍රීඩා සිදු කරයි. | සත්ත්ව චලන ආශ්‍රිත ක්‍රීඩා සිදු කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

| | | | |
|---|---|---|---|
| 6.1 සතුන්ගේ හඬ අනුකරණය කරයි. | 6.1.1 | සතුන්ගේ හඬ අනුකරණය කරයි. | සතුන්ගේ හඬ අනුකරණය කිරීමේ දුෂ්කරතා පෙන්නුම් කරයි. |

## 07. තේමාව - ජල සම්පත

ජලය, අප සතු ස්වාභාවික මෙන් ම සීමිත සම්පතක් යන හැඟීමෙන් සහ අවබෝධයෙන් යුතු ව අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම පිළිබඳ ව කුඩා කල සිට ම ආකල්ප ජනනය කිරීම හා ජීවයේ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයක් ලෙස ජලය පිළිබඳ විවිධ පැතිකඩවලින් කතා කිරීම මෙම තේමාවේ ප්‍රධාන අරමුණකි. සිසුන් කුඩා කළ සිට ම විමසුම් මනසකින් යුතු ව පුංචි විද්‍යාඥයින් ලෙස පුරුදු පුහුණු කිරීම අවශ්‍ය විවිධ පරීක්ෂණාත්මක ක්‍රියාකාරකම් සඳහා යොමු කරවීමට ද මෙම ජල සම්පත තේමාව මගින් අපේක්ෂා කෙරේ. එසේ ම, ජලය ආශ්‍රයෙන් සිදු කළ හැකි විවිධ ක්‍රියාකාරකම්වල නියැලීමට සිසුන්ට අවස්ථාව හා අවශ්‍ය සහාය ලබා දීම මගින් විද්‍යාත්මක කුසලතා සංවර්ධනට මග පාදනු ලබයි. ජලය ඇසුරින් සිදු කළ හැකි සෞන්දර්යාත්මක හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදවීමෙන් සිසුන්ගේ සමස්ත සංවර්ධනයට ඔවුන් ළඟා කරවීම ද මෙම තේමාවෙන් තවදුරටත් අපේක්ෂා කෙරේ.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 එදිනෙදා කටයුතුවලදී ජලයෙන් ලබා ගන්නා ප්‍රයෝජන හඳුනා ගනියි. | ♦ ජලයෙන් ලබා ගන්නා ප්‍රයෝජන | 1.1 එදිනෙදා කටයුතුවලදී ජලයෙන් ලැබෙන ප්‍රයෝජන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |

### ක්‍රියාකාරකම් 1

**පියවර 1**

- සිසුන් එළිමහනට/ සෙල්ලම් මිදුලට කැඳවා ගෙන යන්න.
- සෙල්ලම් මිදුල ආශ්‍රයෙන් හෝ වෙනත් විනෝදජනක ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන් හෝ (සෙල්ලමක්) කිරීමට සිසුන් යොමු කරන්න.
- මද වෙලාවක් සෙල්ලම් කිරීමෙන් අනතුරු ව සිසුන් කැඳවා අත් ඉදිරියට යොමු කරන ලෙස පවසන්න.
- සිසු දෑත් අපිරිසිදු වී ඇති අයුරු පෙන්වන්න.
- දෑත් හොඳින් පිරිසිදු කර ගැනීමට නම් කුමක් කළ යුතු දැයි විමසන්න.
- සිසු ප්‍රතිචාර අනුව සබන් ගා නිවැරදි ව දෑත් සෝදා ගන්නා ආකාරය ආදර්ශනය කරන්න. ("අපේ සුව පැවැත්ම" තේමාවේ සඳහන් වී ඇති පරිදි)
- ඒ ආකාරයෙන් සිසුන්ට ද දෑත් සෝදා ගැනීමට මග පෙන්වන්න.

**පියවර 2**

- දෑත් සේදීමේදී, සබන් යෙදීමෙන් කුණු, දූහුවිලි සහ ඇසට නොපෙනෙන විෂබීජ ඉවත්වන අයුරු අත්හදා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.



- ජලය සහිත බඳුනකට ගම්මිරිස් කුඩු ස්වල්පයක් දමා ඒ මත සබන් තවරන ලද ඇඟිල්ලක් සෙමෙන් තබන ලෙස පවසන්න.
- ගම්මිරිස් කුඩුවලින් නියෝජනය වන අපද්‍රව්‍ය සහ විෂබීජ ඇසිල්ලකින් ඇත් වන අයුරු නිරීක්ෂණයට සලස්වන්න.

### ක්‍රියාකාරකම් 2

- සිසුන් ගෙනෙන ලද වතුර බෝතලය සිසු මේස මතට ගෙන නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගෙනෙන ලද වතුර බෝතලයේ තිබූ වතුර අඩු වී ඇත්තේ කෙසේ දැයි විමසන්න.
- සිසුන් කරුණු පැවසූ පසු ජලයේ අවශ්‍යතාව පිළිබඳ සිසුන් සමග කතා බහ කරන්න.
- උදෑසන අවදි වූ අවස්ථාවේ සිට මේ දක්වා අපට ජලය ප්‍රයෝජනවත් වූ ආකාරය සිසුන්ගෙන් විමසන්න. ඒ ගැන කතා කරන්න.
- ජලය හා සම්බන්ධ අද්දැකීම් සිසුන්ගෙන් විමසන්න.
- ජලය පානය, ස්නානය, සේදීම, පිරිසිදු කිරීම, වගාවන්ට දැමීම ආදී ජලයෙහි ඇති ප්‍රයෝජන ගැන සිසු අද්දැකීම් ඇසුරින් කතා බහ කරන්න. ඒ අතරින් සිසුන් ජලය යොදා ගන්නා අවස්ථා පිළිබඳ වැඩිදුර කතා කරන්න.
- පහත ආකාරයේ අවස්ථා සිසුන්ට නිරීක්ෂණයට ලබා දීම තුළින් අපට පමණක් නොව සතුන්ට හා ශාකවලට ද ජලය යනු අත්‍යවශ්‍ය දෙයක් බව අද්දැකීමට යොමු කරන්න.

  උදා  කුරුලු ලැල්ලක තැබූ ජලය පානයට හා ස්නානයට සතුන් පැමිණීම<br>ජලය නොලැබීමෙන් ශාක මැල වී යාම හා ජලය ලැබෙන ශාක ප්‍රාණවත් ව තිබීම

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 1 සඳහා සිසුන් යොමුකරන්න.**

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 නීරෝගී දිවිපැවැත්මක් සඳහා අවශ්‍ය ප්‍රමාණයට ජලය පානය කළ යුතු බව හඳුනා ගෙන කටයුතු කරයි. | ♦ අවශ්‍ය ප්‍රමාණයට ජලය පානය කිරීම. | 2.1 ශරීරයේ පැවැත්මට ජලයේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් පාසල් කාලය තුළ දී ප්‍රමාණවත් ලෙස ජලය පානය කරයි. | 2.1.1 ජලය පානය කිරීම. |

## ක්‍රියාකාරකම් 3

- කතන්දරයක් ඇසීමට කැමති දැයි සිසුන්ගෙන් විමසන්න.
- ජලය ප්‍රමාණවත් පරිදි පානය කළ යුතුය යන පණිවිඩය රැගත් පහත සඳහන් කතන්දරය හෝ නිර්මාණය කරගත් වෙනත් කතන්දරයක් හෝ මේ සඳහා යොදා ගන්න.

  අදීශ කියන්නේ හරිම ලස්සන, හරි ම හොඳ පුංචි පුතෙක්.<br>දවසක් හදිසියේ ම අදීශ බඩ අල්ලගෙන කෑ ගහන්න ගත්තා. අම්මයි, තාත්තයි හරියට කලබල වෙලා දුවගෙන ආවා.<br>"අනේ ඇයි මගේ පුතේ ඔයාට මොක ද වුනේ" අම්මා ඇහුවේ හරි ම දුකෙන්. අම්මා දැනගෙන හිටියා ගෙදර ම සෑදුව පිරිසිදු ආහාර අදීශ දැත් හොඳින් පිරිසිදු කරගෙන ආහාරයට ගත්තා කියලා.<br>"ඔය වතුර අඩු වෙලා බඩ කොරවෙලා වගේ ඇත්තේ, අපි වතුර ටිකක් බීලා බලමුකෝ." කියපු තාත්තා ඉක්මනින් ම වතුර ටිකක් ගෙනත් අදීශට පෙවුවා.<br>වතුර බීලා ටික වෙලාවකින් අමාරුව අඩු වුණ බව අදීශ කිවුවා.<br>"අනේ ඒකනේ පුතේ ඔයාට මං හැමදාම කියන්නේ හොඳට වතුර බොන්න කියලා" අම්මා අදීශගේ බඩ අතගාන ගමන් කිව්වා.<br>"ඔව් අම්මේ මං අද ඉඳලා හොඳට වතුර බොනවා." පුංචි අදීශ අම්මාට පොරොන්දු වුණා.
- සිසුන්ට ඉදිරිපත් වී එම කතන්දර ආශ්‍රයෙන් භූමිකා රංගන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රමාණවත් පරිදි දිනකට ජලය පානය කිරීමේ අවශ්‍යතාව සිසුන් සමඟ කතා කරන්න.
- සිසුන් නිවසින් පාසලට ගෙන එන වතුර බෝතලයේ ඇති ජලය සම්පූර්ණයෙන් පානය කරනවා දැයි විමසන්න. සිසුන් ජලය ප්‍රමාණවත් පරිදි පානය කරනවා දැයි දිනපතා නිරීක්ෂණය කරන්න.
- ජලය පානය කිරීම අඩු වුවහොත් අපි පිටකරන මුත්‍රාවල පැහැයෙන් ඒ බව සොයා ගත හැකි බව පවසන්න.
- මෙය සමහර ඖෂධ හෝ විටමින් වර්ග හෝ ලබා ගන්නා විට වෙනස් විය හැකි බව ද පහදා

දෙන්න.

- ක්‍රියාකාරකම් පොතේ සඳහන් ක්‍රියාකාරකම උචිත පරිදි සතියේ දින හා සති අන්තය යොදා ගනිමින් මෙය සිදු කිරීමට සිසුන් යොමු කරන්න. එහිදී, සිසුන් පානය කරන කෝප්ප, බෝතල් සංඛ්‍යාව ඇඳ දැක්වීමට යොමු කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 ජලය ඇති ස්ථානවල ඇති අලංකාරය සෞන්දර්යාත්මක ව ඉදිරිපත් කරයි. | ♦ ජලය ඇති ස්ථානවල ඇති අලංකාරය පිළිබඳ කවි/ගී/රංගන | 3.1 ජලය ඇති ස්ථානවල ඇති අලංකාරය කවි/ගී/රංගන මඟින් ඉදිරිපත් කරයි. | 3.1.1 ඉදිරිපත් කිරීම. |
| 4 ද්‍රව්‍යවලට ජලය උරා ගන්නා ආකාරය අත්හදා බලමින් වින්දනයක් ලබයි. | ♦ පාවෙන කඩදාසි මල් පරීක්ෂණය | 4.1 කඩදාසි නිර්මාණයක් සකස් කර එය ජලයේ පාවීමේදී සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 4.1.1 නිර්මාණයක් සකස් කිරීම. |
| | | | 4.1.2 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම. |
| | | 4.2 ජලය උරා ගන්නා/ නොගන්නා ද්‍රව්‍ය නිරීක්ෂණ කර ප්‍රකාශ කරයි. | 4.2.1 ජලය උරා ගන්නා ද්‍රව්‍ය නිරීක්ෂණ කර ප්‍රකාශ කිරීම. 4.2.2 ජලය උරා නොගන්නා ද්‍රව්‍ය නිරීක්ෂණ කර ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 4


පියවර 1

- අවට පරිසරයේ ජලය දැක ඇති තැන් පිළිබඳ කතාබහ කරන්න.
- ජලය නිසා පරිසරයේ සුන්දරත්වය වැඩි වී ඇති අයුරු පිළිබඳ කතා කරන්න. පින්තූර, වීඩියෝ දර්ශන ආදිය මේ සඳහා යොදා ගන්න.
- ඒ සම්බන්ධ කවි, ගී සිසුන් සමග ගායනා කරන්න.

උදා. වැස්ස නිසා වැටෙන ජලය
කඳු හෙල් මත තැවරී ගෙන
බින්දු බින්දු එකතු වෙලා
උල්පත් හැදිලා
බලා ඉන්න හරි ලස්සන
පරිසරය ම සුන්දර වන
පුංචි පුංචි දිය ඇළිවල
එකමුතු වීලා

පියවර 2

- ජලය හා කඩදාසි මල් යොදා ගනිමින් විනෝදජනක ක්‍රියාකාරකමක නිරත වීමට කැමති දැයි සිසුන්ගෙන් විමසන්න.
- මේ සඳහා සාමාන්‍ය කඩදාසි, තෙල් කඩදාසිවලින් නිර්මාණය කර ගත් මල් සහ ජල බේසම් සපයා ගන්න.
- පහත ආකාරයට කඩදාසි මල් සෑදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.




- සාදා ගත් කඩදාසි මල්, ජල බඳුනට දැමුවහොත් කුමක් සිදුවේවි දැයි සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් අදහස් දැක් වූ පසු සාමාන්‍ය කඩදාසි මල් එක් බේසමකටත්, තෙල් කඩදාසි මල් තවත් බේසමකටත් එකවර දැමීමට පවසන්න.
- මඳ වේලාවකින් ජල භාජනයට දැමූ මල්වලට සිදු වූ දේ පිළිබඳ විමසන්න. ජලය කඩදාසිය දිගේ උරා ගන්නා අයුරු නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- සාමාන්‍ය කඩදාසියෙන් සකස් කර ගන්නා ලද මල් හා තෙල් කඩදාසියෙන් සකස් කර ගන්නා ලද මල් ජල භාජනයට දැමූ පසු දකින ලද වෙනස්කම් පිළිබඳ ව සිසුන් සමග කතාබහ කරන්න.
- සිසු අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ අදාළ ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන්න.

**ගුරුවරයාගේ දැනුවත් භාවය සඳහා පමණි:**
කඩදාසි සදා ඇති ද්‍රව්‍යයේ සිදුරු තුළින් එයට උරා ගත් ජලය ගමන් කිරීමේදී කඩදාසි මල් පෙති නැමුම් වලින් දිග හැරේ. තෙල් කඩදාසියට මෙලෙස ජලය උරා ගැනීමක් සිදු නොවේ.

## ක්‍රියාකාරකම් 5

- එළිමහනේ ඉඩකඩ සහිත ස්ථානයක් තෝරා ගන්න.
- සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම්වලට වෙන් කරන්න.
- සැම කණ්ඩායමකට ම පහත සඳහන් ද්‍රව්‍ය සපයා දෙන්න.
  - ♦ සමානව ජලය පිරවූ බේසම්
  - ♦ සමාන ප්‍රමාණයේ ස්පොන්ජ්(sponge) කැබලි
  - ♦ සමාන ප්‍රමාණයේ භාජන (විනිවිද පෙනෙන භාජන වඩා සුදුසු ය)

  රූප සටහනේ ආකාරයට කණ්ඩායම් පෙළගස්වා ගන්න.



- සීමා රේඛාවට පසුපසින් ජලය පිරවූ බේසම් දෙක තබන්න.
- බේසම් දෙකට පිටුපසින් සිසු කණ්ඩායම් දෙක පෙළගස්වා ගන්න.
- සීමා රේඛාවට 10 m (මීටර්) පමණ ඉදිරියෙන් හිස් භාජන දෙක තබන්න.
- සැම සිසුවෙකු අතට ම ස්පොන්ජ් කැබැල්ල බැගින් ලබා දෙන්න.
- සැම කණ්ඩායමකම පළමු සිසුවාට ස්පොන්ජ් කැබැල්ල ජල බේසමේ පොඟවා ගෙන ගොස් එය අනිත් කෙළවරෙහි ඇති බඳුනට පුරවා නැවත තම පේළියේ පිටුපසට පැමිණිය යුතු ය.
- ඒ ආකාරයට කණ්ඩායමේ සැම සිසුවකුට ම ස්පොන්ජ් කැබැල්ලෙන් ජලය පිරවීමේ ක්‍රීඩාවේ යෙදීමට ඉඩ ලබා දෙන්න.
- ස්පොන්ච් කැබැල්ල ජල බේසමේ ගිල්වූ විට සිදු වූ දේ විමසන්න.
  උදා. ස්පොන්ජ් කැබැල්ල බර වැඩි වුණා...
  බේසමේ ජලය අඩු වුණා.
  ස්පොන්ජ් කැබැල්ලට වතුර උරා ගත්තා.....

- ඒ පිළිබඳ අදහස් දැක්වීමට සිසුන්ට අදහස් ලබා දෙන්න.
- කණ්ඩායම් කිහිපයකට සිසුන් වෙන්කර ගන්න.
- කණ්ඩායමට කුඩයක් හා වතුර බෝතලයක් බැගින් සපයා දෙන්න.
- කුඩය දිගහැර එයට හෙමින් වතුර වත්කර සිදුවන දේ පරීක්ෂා කිරීමට යොමු කරන්න.
- සිසු අදහස්/අද්දැකීම් විමසන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 4 සඳහා සිසුන් යොමුකරන්න.**

## ක්‍රියාකාරකම් 6

- කණ්ඩායම් කිහිපයකට සිසුන් වෙන්කර ගන්න.
- කණ්ඩායමට කුඩයක් හා වතුර බෝතලයක් බැගින් සපයා දෙන්න.
- කුඩය දිගහැර ඒ මතට හෙමින් වතුර වත්කර සිදුවන දේ පරීක්ෂා කිරීමට යොමු කරන්න.
- සිසු අදහස්, අද්දැකීම් විමසන්න.
- අනතුරු ව, සිසු කණ්ඩායම් සඳහා පහත සඳහන් ද්‍රව්‍ය සමාන ප්‍රමාණයෙන් සපයන්න.
  - ♦ ස්පොංජ් කැබැල්ලක්, සෑප්ුෆෝම් කැබැල්ලක්, කපු රෙදි, පුළුන්, ප්ලාස්ටික් අඩිරූලක්, මකනයක්, කඩදාසි කැබැල්ලක්, ඉටිරෙදි, හබරල කොළයක්, නෙලුම් කොළයක් ආදී
  - ♦ සිරින්ජරයක් (කටුව ඉවත් කළ) හෝ බිංදු දමනයක් (**Dropper**)
  - ♦ කොළ හා රතු පාටින් කපා ගත් කුඩා වෘත්ත
- කණ්ඩායමේ සපයා ගත් ද්‍රව්‍ය මේසය මත පෙළ ගස්වා ගැනීමට උපදෙස් දෙන්න
- එක් එක් සිසුවා විසින් සිරින්ජරයට ජලය පුරවා ගෙන මේසය මත ඇති ද්‍රව්‍ය මතට ජලය විදීමට අවස්ථාව දෙන්න.
- සිදුවූ දේ ගැන විමසන්න.
- ජලය උරා ගත්තේ නම් කොළ පාට වෘත්තයක් ද එයට ජලය උරා නොගත්තේ නම් රතු වෘත්තයක් ද තැබීමට උපදෙස් දෙන්න.
- ඒ අනුව ජලය උරා ගන්නා ද්‍රව්‍ය එක් පැත්තකට ද උරා නොගන්නා ද්‍රව්‍යය අනෙක් පැත්තකට ද ලෙස වෙන් කිරීමට උපදෙස් දෙන්න.
- ජලය උරා නොගත් දේවල් මත ජල බිඳු හැසිරෙන ආකාරය නිරීක්ෂණය කර අදහස් දැක්වීමට සිසුන් යොමු කරන්න.

| ඉගෙනුම් පල | විෂය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5. ජලය තුළින් බැලීමේදී විවිධ ද්‍රව්‍ය වෙනස් වී පෙනෙන ආකාරය පරීක්ෂා කරයි. | ♦ ජලය තුළින් බැලීමේදී විවිධ ද්‍රව්‍ය වෙනස් වී පෙනෙන ආකාරය | 4.1 ජලය තුළින් බැලීමේදී විවිධ ද්‍රව්‍ය වෙනස් වී පෙනෙන ආකාරය පරීක්ෂා කර නිරීක්ෂණ ප්‍රකාශ කරයි. | 4.1.1 පරීක්ෂා කර නිරීක්ෂණ ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 7

පියවර 1


- හිස් ජෑම් බෝතල්/විනිවිද පෙනෙන වීදුරු බඳුන් සපයා ගන්න.
- එම බඳුන්වලට පහත ආකාරයේ දේවල් දැමීමට සලස්වන්න.

  උදා

  මුඩියක්, කාසියක්, පැන්සලක්, කෝදුවක් වැනි
- එම ද්‍රව්‍ය බඳුන් තුළ පෙනෙන අයුරු පිළිබඳ සිසු අදහස් විමසන්න.
- බඳුනට ක්‍රමයෙන් ජලය පිරවීමට සලස්වන්න. බඳුන තුළ ඇති දේවල් පෙනෙන අන්දමෙහි වෙනසක් තිබේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- නිරීක්ෂණය කරන ලද දේ පිළිබඳ නිදහසේ අදහස් දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ ආකාරයේ විවිධ අත්හදා බැලීම් සිදු කිරීමටත් ඒවා ඉදිරිපත් කිරීමටත් සිසුන් උනන්දු කරන්න.

පියවර 2

- සිසුන්ට නිදහසේ වටපිටාව නරඹන්නට පවසන්න. ඉන්පසු, සිසුන්ගේ ජල බෝතල් (විනිවිද පෙනෙන) තුළින් වටපිටාව බැලීමට යොමු කරන්න. අවස්ථා දෙකේ වෙනසක් තිබුණි ද? එසේ නම් කුමක් ද වෙනස? ආදි ලෙස ප්‍රශ්න විමසමින් සිසුන් සමග කතා කරන්න. ඒ පිළිබඳ සිසු අදහස් හුවමාරු කර ගැනීමට ඉඩ දෙන්න.
- ඉන්පසු, ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා පහත ආකාරයේ දේවල් සපයා දෙන්න.
උදා: අකුරක්/ ඉලක්කමක්, ඊතලයක්, රූපයක් ඇලවූ කාඩ්පත්




ජෑම් බෝතල්/ විනිවිද පෙනෙන වීදුරු බඳුන් (කැටයම්, මෝස්තර නොමැති)

- ජෑම් බෝතල් සහ කාඩ්පත් නිදහසේ විවිධ අයුරින් තබමින් හා බලමින් සිසු අදහස් පැවසීමට අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව, සිසු කණ්ඩායම්වලට ජෑම් බෝතල් දෙක බැගින් ලබා දී එක් බෝතලයකට ජලය පුරවා අනෙක් බෝතලය හිස් ව තැබීමට උපදෙස් දෙන්න.
- ජලය පිරවූ හා නොපිරවූ බෝතල් දෙක පිටුපසින් (බඳුනට ස්පර්ශ වන ලෙස) ඒක් ඒක් කාඩ්පත තබා ඒ දෙස බෝතලයට ඉදිරියෙන් ඇස තබා බැලුවහොත් කෙසේ පෙනේවි දැයි විමසන්න.
- අත්හදා බලා නිරීක්ෂණ පිළිබඳ අදහස් දැක්වීමටත් ඉඩ දෙන්න.
- බඳුනට පිටුපසින් තබන ලද කාඩ් පත එහා මෙහා කරමින් නිදහසේ අද්දැකීම් ලබාගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 5 සඳහා සිසුන් යොමුකරන්න.**

| |
|---|
| ගුරුවරයාගේ දැනුවත් භාවය සඳහා පමණි:<br>පින්තූරයේ සිට ඇස දක්වා එන ආලෝකය, එක් මාධ්‍යයක සිට තවත් මාධ්‍යයකට ගමන් කිරීමේ දී හැරීමට ලක්වීම නිසා මෙලෙස වෙනස් වී පෙනෙයි. |

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6. සරල පරීක්ෂණ ඇසුරින් ජලයේ අවස්ථා හඳුනා ගනියි. | ♦ ජලයේ අවස්ථා<br>° ජලය<br>° අයිස්<br>° වාෂ්ප | 5.1 ජලය සහ අයිස් ඇසුරින් සරල පරීක්ෂණ සිදු කර නිරීක්ෂණ ප්‍රකාශ කරයි. | 5.1.1 නිරීක්ෂණ ප්‍රකාශ කිරීම. |
| | | 5.2 සරල පරීක්ෂණ මගින් ජල වාෂ්ප ඇතිවන ආකාරය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 5.2.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම. |
| | | 5.3 අයිස් සහ වාෂ්ප ලෙස ද පවතින්නේ ජලය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 5.3.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 8

- පූර්වව, විවිධ හැඩයේ කුඩා අච්චුවලට ජලය දමා අයිස් ලබා ගන්න.
- එම අයිස්, භාජනයකට දමා නිදහස් ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ පිළිබඳ සිසුන් දක්වන අදහස් පිළිබඳ විමසිලිමත් වන්න.
- අනතුරුව, තවත් අයිස් කැට කිහිපයක් සහ සමාන ප්‍රමාණයේ විනිවිද පෙනෙන බඳුන් දෙක බැගින් සිසු කණ්ඩායම්වලට සපයා ගන්න.
- මින් එක් බඳුනකට අයිස් කැට දැමුවහොත් කුමක් සිදුවේවි දැයි සිසුන්ගෙන් විමසන්න. සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසු අනුමානවලින් පසුව එක් බඳුනකට අයිස් කැට කිහිපයක් එක් කරන්න. අනික් බඳුනට ජලය ස්වල්පයක් එක් කරන්න.
- අයිස් කැටවලට සිදුවූ දේ හා අනුමාන කළ දේ සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න. ජල බඳුන සමග සසඳමින් අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න.
- තව ටික වේලාවකින් සිදුවිය හැකි දේ ගැන සිසු අනුමාන ලබා ගන්න.
- පහත ආකාරයේ ප්‍රශ්න විමසමින් සිසුන් නිරීක්ෂණයට යොමු කරන්න.
  - අයිස් කැටවලට සිදුවූයේ කුමක් ද?
  - ටිකවේලාවක් යාමේදී අයිස් කැටවල ප්‍රමාණය කුඩා වන්නේ ඇයි?
  - අවසානයේ වීදුරුවේ දක්නට ලැබෙන්නේ මොනවා ද?
- සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම් 9

පියවර 1

- නිවසේදී වැඩිහිටියකු විසින් ජලය රත් කරන අවස්ථා දැක තිබේ දැයි විමසන්න.
- ඒ අයුරින් ජලය උණු කිරීම සඳහා කේතලයක් හෝ වෙනත් සුදුසු උපකරණයක් සපයා ගන්න.
- සිසුන්ට කේතලයට/භාජනයට ජලය පිරවීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් නිරීක්ෂණය කරන අතරතුර ජලය රත් කර ගැනීම ආරම්භ කරන්න.
- තව ස්වල්ප වේලාවකින් කුමක් සිදුවේවි දැයි එක් එක් සිසුවාගෙන් අනුමාන සපයා ගන්න අනුමාන සඳහා මීට පෙර අද්දැකීම් මතකයට නගන්න.
- සිසු උද්යෝගය හා කුතුහලය වැඩි කිරීම සඳහා නටන තෙක් ජලය රත් වන අතරතුර සිසුන්ගෙන් ප්‍රශ්න කරන්න.
  - ගින්දර වැඩි කළොත් කුමක් සිදු වේවි ද?
  - ගින්දර අඩු කළොත් කුමක් සිදු වේවි ද?
- ජලය රත් වීමත් සමග නැගෙන ශබ්දය වෙනස් වන අයුරු පිළිබඳ සිසු අවධානය යොමු කරන්න.
- කේතලයේ කෙමියෙන් දුම මෙන් එන්නේ ජල වාෂ්ප / හුමාලය බව සාකච්ඡා කරන්න.
- නිවසේදී, නීරෝගී බව රැක ගැනීම සඳහා ජල වාෂ්ප අල්ලා ඇත්දැයි සිසු අද්දැකීම් විමසන්න.
- ජලය හොඳින් රත් වී ඇති නිසා අපි ආරක්ෂාකාරී ව සිටිය යුතු බවත් **වැඩිහිටි සහය ඇති ව පමණක්** ජලය රත් කිරීම සිදු කළ යුතු බවත් අවධාරණය කරන්න.

පියවර 2

- සිසුන්ට හොඳින් පෙනෙන පරිදි කේතලයේ කෙමියට ඉහළින් වීදුරු කැබැල්ලක්/පිරිසියක් අල්ලන්න.
- එය හොඳින් නිරීක්ෂණයට යොමු කරන්න.
- කෙමියෙන් නිකුත් වන ජල වාෂ්ප වීදුරුවේ බැඳී ජල බින්දු බවට පත්වන ආකාරය පෙන්වන්න.
- වීදුරුව ගෙන එහි එකතු වූ ජල බින්දු කුඩා බඳුනකට එක්කර සිසු නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 6 ට අදාළ ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමුකරන්න.**

පියවර 3

- ජලයේ පවතින අවස්ථා ඇසුරෙන් තවදුරටත් අද්දැකීම් ලැබීම සඳහා සිසුන් සමග පහත ක්‍රියාකාරකම සිදු කරන්න.
- පාසලේ ජලය ඇති ස්ථානයක් වෙත සිසුන් රැගෙන යන්න. ජලය හොඳින් නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- එම ස්ථානයෙන් බෝතලයකට ජලය පුරවා ගන්න.
- එම බෝතලයේ ඇති ජලය කුඩා භාජන තුනකට සම සම ව වෙන් කර,
  - ඉන් එක් බඳුනක් අධිශීතකරනයේ තබන්න. (ශීතකරණ නොමැති පාසල් සඳහා විකල්ප ක්‍රම භාවිත කරන්න.)
  - අනෙක් ජල බඳුන සාස්පානකට දමා රත්කර වාෂ්ප වන බව පෙන්වන්න.

- ♦ අනෙක් බඳුන කාමර උෂ්ණත්වයේ ම තබන්න.
- පහත ආකාරයේ ප්‍රශ්න විමසමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - ♦ පාසලෙන් ලබා ගත් ජලය අධි ශීතකරණයේ තැබූ විට සිදු වූයේ කුමක්ද?
  - ♦ රත් කළ විට සිදු වූයේ කුමක් ද?
- සිසුන්ට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

| |
|---|
| **ගුරුවරයාගේ දැනුවත් භාවය සඳහා පමණි:**<br>ජලය ඝන, ද්‍රව හෝ වායු ලෙස පැවතිය හැකි ය. |

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 ජලය ජීවීන්ට අත්‍යාවශ්‍ය බව හඳුනා ගෙන අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි. | ♦ ජලය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය | 6.1 ජලය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කිරීමේ චර්යා ප්‍රදර්ශනය කරයි. | 6.1.1 චර්යා ප්‍රදර්ශනය කිරීම |

## ක්‍රියාකාරකම් 11

පියවර 1

- ජලය අපතේ යන අවස්ථා නිරීක්ෂණය කිරීම සඳහා සිසුන් සමග පාසල් වත්තේ ක්ෂේත්‍ර චාරිකාවක් සැලසුම් කර ගන්න.
- එහිදී, ජලය අපතේ යන අවස්ථා තිබේ නම් නිරීක්ෂණය කිරීමට සලස්වන්න. ඒ පිළිබඳ සිසු අදහස් දැක්වීමට අවස්ථාව සපයන්න.
- හැකි නම්, සිසුන් අතින් ජලය අපතේ යන අවස්ථා වීඩියෝ කර ඉදිරිපත් කරන්න.

  උදා. කරාම ඇර දමා වෙනත් කාර්යයක නිරත වීම
  ජල කරාම හොඳින් නොවැසීම
  කරාමයකින් ජලය පානය කරන විට කෝප්පයක් අතට නොගෙන පානය කිරීම
- ජල කරාමයකින් ජලය බින්දුව බැගින් කාන්දු වන ආකාරයට තබා ඉන් පිට වන ජලය විනාඩි දහයක පමණ කාලයක් බේසමකට එකතු කර පෙන්වන්න.
- ජලය නොමැති වීම නිසා මිනිසාට, සතුන්ට සහ ශාකවලට මුහුණ දීමට සිදු වන අපහසුතා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. පින්තූර, වීඩියෝ දර්ශන ආදිය පෙන්වන්න.

  උදා. පොළොව ඉරි තැලී ඇති අවස්ථා
  ජලය නොමැති ව ගස් කොළන් වියළී ඇති ආකාරය
  ජලය නොමැති ව සතුන් මිය ගොස් ඇති ආකාරය
  මිනිසුන් ජලය සොයා යන අවස්ථා
- ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ වැදගත්කම හා ඒ සඳහා කළ හැකි දේවල් සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 7 ට අදාළ ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමුකරන්න.**

### තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිතිය | ත.නි.අ. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථයි |
|---|---|---|---|
| 1.1 එදිනෙදා කටයුතුවල දී ජලයෙන් ලැබෙන ප්‍රයෝජන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 | එදිනෙදා කටයුතුවල දී ජලයෙන් ලැබෙන ප්‍රයෝජන කිහිපයක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | එදිනෙදා කටයුතුවල දී ජලයෙන් ලැබෙන ප්‍රයෝජන හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 2.1 ශරීරයේ පැවැත්මට ජලයේ අවශ්‍යතාවය හඳුනාගනිමින් පාසල් කාලය තුළ දී ප්‍රමාණවත් ලෙස ජලය පානය කරයි. | 2.1.1 | අවශ්‍යතාවය හඳුනාගනිමින් පාසල් කාලය තුළ දී ප්‍රමාණවත් ලෙස ජලය පානය කරයි. | පාසල් කාලය තුළ දී ප්‍රමාණවත් ලෙස ජලය පානය නොකරයි. |
| 3.1 ජලය ඇති ස්ථානවල ඇති අලංකාරය කවි/ ගී/ රංගන මගින් ඉදිරිපත් කරයි. | 3.1.1 | ජලය ඇති ස්ථානවල ඇති අලංකාරය කවි/ ගී හා රංගන මගින් ඉදිරිපත් කරයි. | ජලය ඇති ස්ථානවල ඇති අලංකාරය කවි/ ගී/ රංගන මගින් ඉදිරිපත් කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.1 කඩදාසි නිර්මාණ-යක් සකස් කර එය ජලයේ පාවීමේ දී සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 4.1.1 | කඩදාසි නිර්මාණයක් සකස් කරයි | කඩදාසි නිර්මාණයක් සකස් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| | 4.1.2 | එය ජලයේ පාවීමේ දී සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | එය ජලයේ පාවීමේ දී සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.2 ජලය උරා ගන්නා/ නොගන්නා ද්‍රව්‍ය නිරීක්ෂණ කර ප්‍රකාශ කරයි. | 4.2.1. | ජලය උරා ගන්නා ද්‍රව්‍ය 2ක් නිරීක්ෂණ කර ප්‍රකාශ කරයි. | ජලය උරා ගන්නා ද්‍රව්‍යයක් නිරීක්ෂණ කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| | 4.2.2. | ජලය උරා නොගන්නා ද්‍රව්‍ය 2ක් නිරීක්ෂණ කර ප්‍රකාශ කරයි. | ජලය උරා ගන්නා ද්‍රව්‍යයක් නිරීක්ෂණ කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 5.1 ජලය තුළින් බැලීමේදී විවිධ ද්‍රව්‍ය වෙනස් වී පෙනෙන ආකාරය පරීක්ෂා කර නිරීක්ෂණ ප්‍රකාශ කරයි. | 5.1.1 | ජලය තුළින් බැලීමේදී විවිධ ද්‍රව්‍ය වෙනස් වී පෙනෙන ආකාරය පරීක්ෂා කර නිරීක්ෂණ ප්‍රකාශ කරයි. | ජලය තුළින් බැලීමේදී විවිධ ද්‍රව්‍ය වෙනස් වී පෙනෙන ආකාරය පරීක්ෂා කිරීම / නිරීක්ෂණ ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.1 ජලය සහ අයිස් ඇසුරින් සරල පරීක්ෂණ සිදු කර නිරීක්ෂණ ප්‍රකාශ කරයි. | 6.1.1 | ජලය සහ අයිස් ඇසුරින් සරල පරීක්ෂණ සිදු කර නිරීක්ෂණ ප්‍රකාශ කරයි. | ජලය සහ අයිස් ඇසුරින් සරල පරීක්ෂණ සිදු කිරීම/නිරීක්ෂණ ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.2 සරල පරීක්ෂණ මඟින් ජල වාෂ්ප ඇතිවන ආ-කාරය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 6.2.1 | සරල පරීක්ෂණ මඟින් ජල වාෂ්ප ඇතිවන ආකාරය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | සරල පරීක්ෂණ මඟින් ජල වාෂ්ප ඇතිවන ආකාරය නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 6.3 අයිස් සහ වාෂ්ප ලෙස ද පවතින්නේ ජලය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6.3.1 | අයිස් සහ වාෂ්ප ලෙස ද පවතින්නේ ජලය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | අයිස් හෝ වාෂ්ප ලෙස ද පවතින්නේ ජලය බව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 7.1 ජලය අරපිරිමැස්මෙ-න් යුතු ව පරිහරණය කිරීමේ චර්යා ප්‍රදර්ශනය කරයි. | 7.1.1 | ජලය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කිරීමේ චර්යා ප්‍රදර්ශනය කරයි. | ජලය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කිරීමේ චර්යා ප්‍රදර්ශනය ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

## 08. තේමාව - පොළොව හා අහස

මෙම තේමාවේ අන්තර්ගත වනුයේ පොළොව හා අහස ආශ්‍රිත ස්වාභාවික සංසිද්ධීන් සම්බන්ධයෙන් ගවේෂණාත්මක ක්‍රියාකාරකම් සමූහයකි. අව්ව වැස්ස සුළඟ වැනි ස්වභාවික සංසිද්ධීන් වඩාත් විමර්ශනාත්මක ව අද්දැකීමට සැලැස්වීම මගින් ඒ සමග පරිසරයේ සිදු වන වෙනස්කම් පිළිබඳ වැඩිදුර විමසුමට ලක්කරනු ලැබේ. දවසේ විවිධ අවස්ථාවලදී අහසේ සිදුවන වෙනස්කම් ද පොළොවේ විවිධ ස්ථානවල ඇති වෙනස්කම් ද පිළිබඳ ගවේෂණය කරමින් ඒ ඇසුරින් අද්දැකීම් ලබා ගැනීමට සැලැස්වීම මෙම තේමාවේ විශේෂත්වයයි. මූලික විද්‍යාත්මක සංකල්ප හා විද්‍යාත්මක ක්‍රියාවලියට අදාළ කුසලතා කේන්ද්‍රගත කර ගනිමින් සහ සෞන්දර්යාත්මක හා නිර්මාණාත්මක කුසලතා සමෝධානය කර ගනිමින් වඩාත් ප්‍රායෝගික ව පරිසර ගවේෂණයේ සිසුන් යෙදවීම මෙම තේමාවේ අරමුණයි.


| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. දවසේ විවිධ අවස්ථා වලදී පරිසරයේ සිදුවන වෙනස්කම් හඳුනා ගනියි. | ♦ උදය, දහවල් සහ රාත්‍රී කාලයේ<br>° පරිසරයේ සිදු වන වෙනස්කම් | 1.1 උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 1.1.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම |
| | | 1.2 උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි. | 1.2.1 නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම |

### ක්‍රියාකාරකම් 1

පියවර 1

- සිසුන් උදෑසන පාසලට පැමිණි විගස සිසුන් එළිමහන වෙත කැඳවා ගෙන යන්න.
- ගස්වල මල් පිපී ඇති ආකාරය, පක්ෂීන් හා විවිධ සතුන් සැරිසරන ආකාරය, මිනිසුන් වැඩපළෙහි යෙදී සිටින ආකාරය ආදිය ගැන නිරීක්ෂණය සඳහා සිසුන් යොමු කරන්න.
- හිරු උදාවත් සමග පරිසරයේ විශාල වෙනස්කම් ප්‍රමාණයක් සිදු වන අයුරු පෙන්වන්න.
- ඉන්පසු අහස නිරීක්ෂණය සඳහා සිසුන් යොමු කරන්න.
- උදෑසන අහසේ වර්ණය හා අහසේ දැකිය හැකි දේ ගැන සිසුන් සමග නිරීක්ෂණය කරන්න. හිරු දෙස පියවි ඇසින් බැලීම හානිකර බව පූර්ව ව සිසුන්ට අවධාරණය කරන්න.
- වලාකුළු නිරීක්ෂණයට සිසුන්ට දුරදක්න/ සෙල්ලම් දුරදක්න හෝ සකස්කරගත් දුරදක්න ආකෘති සපයා ගන්න.
- වලාකුළු නිරීක්ෂණය කර ඒවායේ හැඩ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. නිරීක්ෂණය කරන ලද හැඩ සිසු ක්‍රියාකාරකම් පොතේ සලකුණු කර ගැනීමට සිසුන් යොමු කරන්න.
- ක්‍රමයෙන් හිරු මුදුන් වීමත් සමග දහවල් අහසේ වර්ණය සහ පරිසරයේ දැකිය හැකි වෙනත් වෙනස්කම් ගැන නිරීක්ෂණයට සලස්වන්න.
- නිවසේදී රාත්‍රී අහස නිරීක්ෂණය කිරීමට පවසන්න. පසු දින සිසුන් රාත්‍රී අහසේ දුටු දෑ මොනවා දැයි විමසන්න.

- සිසුන්, කුඩා කණ්ඩායම්වලට කොටස් 3කට සමාන ව බෙදන ලද බ්‍රිස්ල්බෝඩ් එකක්/කඩදාසියක් බැගින් ලබාදෙන්න.



- ඒ ඒ කොටස්වල උදෑසන, දහවල සහ රාත්‍රිය නිදහසේ නිර්මාණය කිරීමට සිසුන්ට ඉඩ ලබාදෙන්න.
- ඒ සඳහා පුලුන් විවිධ වර්ණයේ කඩදාසි කැබලි, පැස්ටල්, ගම්, කතුරු හා අවශ්‍ය වෙනත් ද්‍රව්‍ය ලබා දෙන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 1 සඳහා සිසුන් යොමුකරන්න.**

පියවර 2
- ඉහත දී නිරීක්ෂණය කළ අහසින් එපිටට ගොස් බැලුවහොත් අප සිටින තැන කෙලෙස පෙනේවිදැයි සිසුන්ගෙන් විමසන්න.
- අප සිටින ලෝකය, ලෝක ගෝලයක් ඇසුරින් පෙන්වන්න.
- එහි හැඩය පිළිබඳ කතා කරන්න
- නිල් පැහැයෙන් මුහුද ද, දුඹුරු පැහැයෙන් ගොඩබිම ද, දිස්වන අන්දම පෙන්වන්න.
- වැඩිපුර නිල් පැහැයත්, අඩුවෙන් දුඹුරු පැහැයත් ඇති අන්දම පෙන්වා දෙන්න.
- අප සිටින රට "ශ්‍රී ලංකාව" ලෙස පෙන්වා දෙන්න.
- සිසුන්ට ප්‍රශ්න විමසීමට අවස්ථාව දෙන්න. සිසුන්ගේ මට්ටමට ගැළපෙන පරිදි සරල නිවැරදි පිළිතුරු ලබා දෙන්න

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 2 සඳහා සිසුන් යොමුකරන්න.**

පියවර 3
- හිරු, සඳ, මල්, කුරුල්ලන්, සමනලුන්, ගස් වැල් ආදී දේවල්වල වෙස් මුහුණු කිහිපයක් සකසා ගන්න.
- සිසුන් ව එළිමහනට රැගෙන යන්න.
- සිසුන්ට එම සකස් කරගත් වෙස් මුහුණු පලඳවා උදේ, දවල්, රාත්‍රී පරිසරයේ සිදුවෙන වෙනස්කම් රඟ දක්වමු යි පවසන්න.
- සිසුන්ට නිදහසේ අංග චලන දක්වමින් රඟ පෑමට අවස්ථාව දෙන්න.
- මේ අවස්ථා සම්බන්ධයෙන් ලියැවී ඇති සරල ගී ගායනා කරන්න.
  උදා. නිල් අහස් තලේ අගේ
- සියලු ම සිසුන්ගේ හැකියා අගය කරන්න.

| ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 හිරු එළිය තම දෛනික කාර්යයන්ට යොදා ගත හැකි ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි. | ♦ හිරු එළියෙන්<br>° ලැබෙන ප්‍රයෝජන<br>° කාර්යයක් සිදු කරගත හැකි අයුරු අත්හදා බැලීම<br>° ආරක්ෂා වීමට නිර්මාණයක් සිදු කිරීම | 2.1 හිරු එළියෙන් ලැබෙන ප්‍රයෝජන ප්‍රකාශ කරයි. | 2.1.1 ප්‍රකාශ කිරීම. |
| | | 2.2 හිරු එළියෙන් යම් කාර්යයක් සිදු කරගත හැකි අයුරු අත්හදා බලයි. | 2.2.1 අත්හදා බැලීම. |
| | | 2.3 දැඩි හිරු එළියෙන් ආරක්ෂා වීම සඳහා සුදුසු නිර්මාණයක් සිදු කරයි. | 2.3.1 නිර්මාණයක් සිදු කිරීම. |

## ක්‍රියාකාරකම 2

පියවර 1

- වර්ණක යොදා ගනිමින් කළ හැකි නිදහස් ක්‍රියාකාරකමක නියැළීමට සිසුන්ට අවස්ථාව සපයන්න.
- ඒ සඳහා පහත සපයා ඇති උදාහරණවලින් සුදුසු ක්‍රියාකාරකමක් තෝරා ගන්න.

  උදා:
  - ♦ වර්ණක මත අත්ල තබමින් රටා මැවීමට
  - ♦ බණ්ඩක්කා, හබරල පිති ආදියෙන් සීල් තැබීමට
  - ♦ වෙනත් ඉවත ලන දේ හෝ ස්පොංචි ආදිය යොදා ගනිමින් රටා මැවීමට
- දැත් පිරිසිදු කරගැනීම සඳහා සැම සිසුවෙකුට ම ලේන්සුවක්/රෙදි කඩක් ද ළඟ තබා ගැනීමට පවසන්න.
- ක්‍රියාකාරකම අතරතුරදී තැවරෙන සායම් රෙදි කැබැල්ලේ පිස දා ගැනීමට යොමු කරන්න.
- සීල් තබා අවසන් වූ පසු එම සායම් වියළාගැනීමට නම් කුමක් කළ යුතුදැයි සිසුන්ගෙන් විමසන්න.
- සිසු යෝජනා අනුව එළිමහනේ තබා සායම් වියළා ගැනීමට යොමු කරන්න.
- මද වේලාවක් අව්වේ වියළා ගත් පසු කලින් අතේ ගෑවුන සායම් දැන් ගෑවේ දැයි විමසන්න.
- එසේ වූයේ ඇයි දැයි සිතා බැලීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- දැන්, අපිරිසිදු වී ඇති ලේන්සුව/ රෙදි කැබැල්ල සිසුන්ට හැකි පමණින් ජලයෙන් සෝදා ගැනීමට යොමු කරන්න.
- සෝදා ගත් ලේන්සු කිහිපයක් අව්වේ තැබීමටත් තව ලේන්සු කිහිපයක් පන්ති කාමරයේ හෝ සෙවණ සහිත තැනකින් තැබීමටත් පවසන්න.
- මද වේලාවකින් අව්වේ තැබූ හා සෙවණේ තැබූ ලේන්සු ගෙනැවිත් පරීක්ෂා කිරීමටත්, අදහස් දැක්වීමටත් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදා:

  අව්වේ දැමූ ලේන්සු ඉතා හොඳින් උණුසුම් වී, වියළී ඇති අයුරු සහ පන්ති කාමරයේ වැනූ ලේන්සු මද වශයෙන් වියළී ඇති අයුරු

- එමඟින්, හිරු එළියෙන් සිදු කරගත් සරල වැඩ (කාර්යයන්) පිළිබඳ සාකච්ඡා කරන්න.
- හිරුගෙන් ලැබෙන ආලෝකය සහ උණුසුමෙන් කාර්යයන් සිදු කරගන්නා වෙනත් අවස්ථා පිළිබඳ කතා බහ කරන්න.
- ඒ අතරින් එක් කාර්යයක් අත්හදා බැලීමට අවස්ථාව ලබා දෙන්න.

  උදා: ඖෂධීය ද්‍රව්‍ය කිහිපයක් පාසලේදී වේලා තම්බා පානය කිරීමට සැලැස්වීම.
- හිරු දෙස පියවි ඇසින් බැලීම ඇසට හානි කර බැවින් එසේ නොකළ යුතු බව අවධාරණය කරන්න.
- වීඩියෝ දර්ශන/ ඡායාරූප/ආකෘති ඇසුරින් හිරුගේ සැබෑ ස්වරූපය පෙන්වන්න.
- පහත ප්‍රශ්න විමසන්න
  - ♦ හිරුගෙන් අපට ලැබෙන්නේ මොනවා ද?
  - ♦ හිරු නැති වුණොත් කුමක් වෙයි ද?


- සිසුන්ට සිතා බැලීමටත්, අදහස් ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- එමඟින් අපට ආලෝකය මෙන් ම උණුසුම ලැබෙන ප්‍රධාන ආකාරය ලෙස හිරු හඳුන්වා දෙන්න

## ක්‍රියාකාරකම 3

පියවර 1

- ඉර එළිය සහිත අවස්ථාවක සිසුන් ව පිට්ටනියට රැගෙන යන්න.
- සිසුන්ට මද වේලාවක් නිදහසේ ක්‍රීඩාවක් කිරීමට ඉඩ ලබා දෙන්න.
- ඉන්පසු පාසල් භූමියේ ගස් සෙවනකට හෝ සෙවණ ඇති වෙනත් තැනකට හෝ සිසුන් කැඳවා ගන්න.

- සිරුරට දැනෙන වෙනස පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් පවසන වෙහෙසකාරී දැනීම් හටගත්තේ ඇයි දැයි විමසන්න.
- අව්වට නිරාවරණය වී වැඩි වේලාවක් සිටීම සමට අහිතකර බව පෙන්වා දෙන්න.
- තද අව්වෙන් ආරක්ෂා වීමට අපට කළ හැකි දේ ගැන සිසුන්ගෙන් අදහස් විමසන්න.
- කැමැති ඕනෑ ම දෙයක් යොදා ගනිමින් හිරු එළියෙන් ආරක්ෂා විය හැකි ආකාරයේ සරල උපක්‍රමයක් නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සිසුන් ට නිර්මාණශීලි ව ගොඩ නැඟීමට සහාය වන්න.
  උදා : තොප්පියේ (**Cap**) ඉදිරිපස ආවරණය



- ඒ සඳහා අවශ්‍ය සම්පත් ලබාදෙමින් අවශ්‍ය මඟ පෙන්වීම කරන්න.

| ඉගෙනුම්පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 සුළඟ නිසා පරිසරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කරමින් වින්දනයක් ලබයි. | ♦ සුළඟ නිසා අවට පරිසරයේ සිදු වන වෙනස්කම් | 3.1 සුළඟ නිසා අවට පරිසරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 3.1.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම. |
| | ♦ කඩදාසි රොකට්ටුව නිර්මාණය | 3.2 සුළඟේ පාකර යැවිය හැකි කඩදාසි රොකට්ටුවක් නිර්මාණය කරයි. | 3.2.1. නිර්මාණය කිරීම. |

## ක්‍රියාකාරකම් 4

පියවර 1

- සුළං හමන අවස්ථාවක පරිසරය හොඳින් නිරීක්ෂණය කළ හැකි පරිදි එළිමහන් ස්ථානයකට සිසුන් කැඳවා ගෙන යන්න.
- දෑස් වසා ගෙන සවන් දීමට යොමු කරන්න. සුළඟට ගස්වැල් සෙලවෙන ශබ්දය ඇසීමට සලස්වන්න.
- ඇසෙන ශබ්දය කුමක් විය හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඉන්පසු දෑස් විවර කර සුළඟට ගස්වැල් සෙලවෙන ආකාරය ශාක පත්‍ර බිම වැටෙන ආකාරයත් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- අවට පරිසරයේ ගස්වල කොළ අතු සෙලවෙන ආකාරය අනුව සුළං හමන්නේ කුමන පැත්තට දැයි සිසුන්ගෙන් විමසන්න.
- සුළඟ හමන්නේ කුමන පැත්තට දැයි සොයා ගැනීමට වෙනත් නිරීක්ෂණ අවස්ථා ද සපයන්න.
  - ♦ ඇතින් හඳුන්කූරක් දල්වා එහි දුම ගමන් කරන ආකාරය නිරීක්ෂණය කිරීම
  - ♦ කොඩියක් සෙලවෙන අයුරු නිරීක්ෂණය
- පාසල පිහිටි පරිසරයට අනුව සුළඟ ආශ්‍රිත ව පරිසරයේ සිදුවන වෙනස්කම් තව දුරටත් නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න. අවශ්‍ය පරිදි වීඩියෝ දර්ශන යොදා ගන්න.
  උදා : ගොයම් පැළ සුළඟට නැළවෙන අවස්ථාවක්
  ගඟක දිය රැළි නැඟෙන අවස්ථාවක්

පියවර 2

- සිසුන් ලබාගත් අද්දැකීම් ඇසුරෙන් පහත චලන ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.
  - ♦ සුළඟට සෙලවෙන ගස් මෙන් චලනය වීම
  - ♦ වලාකුළක් මෙන් පා වීම
- සුළං හමන පරිසරයකට කැඳවා ගෙන ගොස්, පහත කවිය ගයනා කරමින් නිදහස් රංගනයේ

යෙදෙමින් සිසුන්ගේ වෙහෙස නිවා ගැනීම සඳහා අවස්ථාව ලබාදෙන්න.

සුළඟ හමනවා
ගස් සෙලවෙනවා
අර බලන්න වේළුණු කොළ
බිමට වැටෙනවා

අන්න අන්න වලාකුළක්
පාවී එනවා
ගොයම් පැළත් සුළඟ නිසා
හැඩට නටනවා

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 3 සඳහා සිසුන් යොමුකරන්න.**

## ක්‍රියාකාරකම් 5

- කඩදාසි රොකට්ටුවක් සාදා එය සුලඟේ පාකර හරිමින් වින්දනයක් ලැබීමට කැමති දැයි අසන්න.
- සැම සිසුවෙකුට ම කඩදාසිය බැගින් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් කර කඩදාසි රොකට්ටුවක් සෑදීමට අවස්ථාව ලබා දෙන්න. අද්දැකීම් සහිත සිසුන්ට අනෙක් සිසුන්හට සහය වීමට යොමු කරන්න.
- රොකට්ටුව පා කර හැරීම සඳහා එළිමහනට රැගෙන යන්න.
- සියලු ම සිසුන්ට නිදහසේ තම රොකට්ටුව පා කර හරිමින් වින්දනයක් ලැබීමට අවස්ථාව ලබාදෙන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 4 සඳහා සිසුන් යොමුකරන්න.**

| ඉගෙනුම්පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 පාසල /ඒ අවට භූමියේ වෙනස්කම් පිළිබඳ ප්‍රායෝගික අද්දැකීම් ලබයි. | ♦ පාසල /ඒ අවට භූමියේ ස්වභාවය<br>° තණකොළ සහිත<br>° බොරලු සහිත<br>° වැලි<br>° මඩ සහිත භූමි | 4.1 පාසල හෝ ඒ අවට භූමියේ ස්වභාවය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 4.1.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම. |
| | | 4.2 පාසල් වත්තෙන් ලබාගත් පස් නියැදියක් නිරීක්ෂණය කර දුටු දේ ප්‍රකාශ කරයි. | 4.2.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම. |
| | | 4.3 භූමිය මතුපිට වෙනස්කම් යොදාග නිමින් ශාරීරික ක්‍රියාකාරකම් සිදුකරයි. | 4.3.1 ශාරීරික ක්‍රියාකාරකම් සිදු කිරීම. |

## ක්‍රියාකාරකම් 6

පියවර 1

- පාසල් වත්තේ හෝ ගෙවත්තේ ඇවිද ගිය අවස්ථාවකදී සිසුන් මුහුණ දුන් විවිධ අවස්ථා සිහිපත් කරන්න.
  උදා: ගලක වැදී පය පැටලී වැටීමට ගිය අවස්ථාවක්
- අපේ පාසල් භූමියේත් මෙවැනි විවිධ ස්ථාන තිබේ දැයි බලමු යැයි පවසා පාසල් භූමිය මතුපිට වෙනස්කම් නිරීක්ෂණය කිරීම සඳහා පාසල් භූමියේ චාරිකාවක් සංවිධානය කර ගන්න. මේ සඳහා තණකොළ සහිත බිමක්, වැලි සහිත බිමක්, ගල් බොරළු සහිත බිමක්, මඩ සහිත බිමක් වැනි ස්ථාන චාරිකාවට පෙර හඳුනා ගන්න. (එවැනි ස්ථාන නොමැති නම් ආදර්ශ බිම් සකස්කර ගන්න.)
- එම ස්ථානවල මතුපිට භූමියේ ඇති වෙනස්කම් නිරීක්ෂණයට සලස්වන්න. පාවහන් ගලවා ඇවිදීම සඳහා එම භූමි අතරින් අරාක්ෂාකාරී ස්ථාන කිහිපයක් (ඇනෙන සුළු හා අපිරිසිදු ද්‍රව්‍යවලින් තොර) තෝර ගන්න.
  උදා: තණකොළ සහිත බිමක් හා වැලි බිමක්
- එම ස්ථානවල පාවහන් ගලවා ඇවිදිමේදී පතුලට දැනෙන්නේ කුමක්දැයි විමසන්න.



- එවැනි තෝරා ගත් වෙනස් ස්ථානවල ඇවිදීමේදී පතුලට දැනෙන වෙනස පිළිබඳ කතාබහ කරන්න.
- පාසල් වත්තේ චාරිකාවේදී සුදුසු ස්ථානයකින් පස් සාම්පල රැගෙන ඒමට සිසුන් යොමු කරන්න
- එම පස් සාම්පලය පන්ති කාමරයට ගෙනැවිත් පළමු ව පියවි ඇසින් ද,දෙවනු ව අත් කාචයෙන් ද නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
- සිසුන් දුටු දේ ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 5 සඳහා සිසුන් යොමුකරන්න.**

පියවර 2

සංවේදක ඇවිදීමේ මග **(Sensory walking path)**




- රූප සටහනේ දැක්වෙන ආකාරයට සංවේදක ඇවිදීමේ මගක් සකස් කර ගන්න.
- මේ සඳහා තණකොළ, වැලි, තිරුවානා ගල් වැනි පාදයට ස්පර්ශ වීමේදී වෙනස්කමක් දැනෙන විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් නිර්මාණශීලී ආකාරයකට සකස් කර ගන්න.
- මෙම මග ඇවිදීමට මෙන් ම පැන පැන යාමට සහ නැවී දැතින් පොළොව ස්පර්ශ කර යාමට ද විශේෂ කොටස් වෙන් කරන්න.
- දිනපතා මෙම මග මත මිනිත්තු කිහිපයක් පාවහන් රහිත ව ඇවිදීමට සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම් 7

පියවර 1

- ඉඩකඩ සහිත එළිමහන් ස්ථානයකට සිසුන් කැඳවා ගෙන යන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- රූපයේ දක්වා ඇති ආකාරයට වැලි-මඩ-ගල්-මඩ-තණකොළ ආදී ලෙස හඳුන්වමින් බිම ඉරි ඇඳ වෙන් කරන්න.




- ඒ ඒ කොටසේ යා යුතු ආකාරය පැහැදිලි කරන්න
  - ♦ වැලි - දුවන්න
  - ♦ මඩ - පනින්න
  - ♦ ගල් - තනි කකුලෙන් පැන පැන යන්න.
  - ♦ මඩ - නැවතත් පනින්න

♦ තණකොළ - දුවන්න

- කණ්ඩායම්වල ඉදිරියෙන් සිටින සිසුන් ඉහත ආකාරයට ගමන් සම්පූර්ණ කර කොඩිය පසු කළ පසු ඒ ඒ කණ්ඩායමේ ඊළඟට සිටින සිසුවා ගමන් ආරම්භ කළ යුතු වේ.
- මේ ආකාරයට විනෝද වෙමින් එකිනෙකාගෙ හැකියා අගය කරමින් ක්‍රියාකරකමේ නිරත වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

| ඉගෙනුම්පල | අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5. වැසි අවස්ථා නිරීක්ෂණය කරමින් ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් මඟින් වින්දනයක් ලබයි. | ♦ වැසි අවස්ථාවක් නිරීක්ෂණය<br>♦ සරල බෝට්ටුවක් නිර්මාණය | 5.1 වැසි අවස්ථාවක් නිරීක්ෂණය කර අද්දැකීම් ප්‍රකාශ කරයි. | 5.1.1 අද්දැකීම් ප්‍රකාශ කිරීම. |
| | | 5.2 වැහි ජලයේ පාකර යැවිය හැකි සරල බෝට්ටුවක් නිර්මාණය කරයි. | 5.2.1 නිර්මාණය කිරීම. |

## ක්‍රියාකාරකම් 8

පියවර 1

- ''වැසි දින චාරිකාව'' සඳහා සිසුන්ට කුඩ හෝ වැහි කබා රැගෙන ඒමට පූර්ව ව උපදෙස් දෙන්න.
- තද සුළඟ හෝ අකුණු රහිත, මද වැසි සහිත අවස්ථාවක් මේ සඳහා යොදාගන්න. දෙමාපියන් පූර්වයෙන් දැනුවත් කිරීම මේ සඳහා යෝග්‍ය වේ. (වැස්සට තෙමීමෙන් වැළකී සිටිය යුතු අසනීප තත්තව සහිත සිසුන් පිළිබඳ සැලකිලිමත් වන්න).
- හබරල කොළ, කෙසෙල් කොළ ආදී පරිසරයෙන් සපයා ගත හැකි ස්වභාවික වැසි ආවරණ අතරින් කිහිපයක් ද මෙම ක්‍රියාකාරකමට යොදා ගන්න.
- වැසි දිනක ලක්ෂණ නිරීක්ෂණය කළ හැකි වන අයුරින් පාසල් පරිසරය තුළ සිසුන් ගෙන ආ වැසි ආවරණ යොදා ගනිමින් ''වැසි දින චාරිකාව'' සිදු කරන්න.
- චාරිකාව අතරතුර වැසි වතුර ස්පර්ශ කිරීමට, ගලා යන ජලයට බාධක දැමීම ආදී අවස්ථා සිසුන්ට ලබා දෙන්න.
- සිසුන්ගේ පිරිසිදුකම හා ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙමින් චාරිකාව අවසානයේ සිසුන් පන්ති කාමරයට කැඳවා ගන්න.
- සිසු අද්දැකීම් හුවමාරුවට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම් 9

පියවර 1

- වැසි සහිත දිනයකදී පන්ති කාමරයේ සිට අවට පරිසරය නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
  උදා: වැසි බිඳු වැටෙන ආකාරය නැරඹීමට හා එම ශබ්දය ඇසීම.

- වැහි බිඳු වැටෙන්නේ කොහෙන් දැයි විමසන්න. සිසුන්ට ද ප්‍රශ්න විමසීමට අවස්ථාව දෙන්න. සිසුන්ගේ මට්ටමට ගැළපෙන පරිදි සරල නිවැරදි පිළිතුරු ලබා දෙන්න

- වැස්සට පෙර පරිසරයේ සිදු වූ වෙනස්කම් ගැන සිසුන් සමග කතා කරන්න.
  උදා: කළු වලාකුළු දක්නට ලැබීම
  අවට පරිසරය අඳුරුවීම
  තද සුළං හැමීම

- වැස්ස අවස්ථාවේදී සිසුන් දුටු දේ හා ඇසූ දේ අනුකරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  සුළං හමන විට ගස් වැල් ආදිය සෙලවුණු ආකාරය
  තද සුළඟේ හඬ
  වැහි බිඳු වැටෙන හඬ ආදිය
- සිසු ඉදිරිපත් අගයමින් වැසි අවස්ථාවක සිදුවන දේ පිළිබඳ ගුරු අද්දැකීම් ද ඉදිරිපත් කරන්න.

**පියවර 2**

- බෝට්ටු සදා වැසි වතුරේ පා කර හරිමින් වින්දනයක් ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කෙසෙල් බඩ කැබැල්ලක් ගෙන එහි ඉරටු කුඩා රුවලක් සහිත ඉරටුවක් ගසා රුවල් බෝට්ටුවක් හෝ ඉවත ලන කඩදාසි කැබැල්ලක් ආධාරයෙන් කඩදාසි බෝට්ටුවක් හෝ සාදා ගැනීමට මගපෙන්වන්න.
- මේ අතරින් සිසුන් කැමති බෝට්ටුවක් /බෝට්ටු දෙවර්ගය ම සාදා ගැනීමට ඉඩ ලබා දෙන්න.
- වර්ෂාව නිසා පාසල් එළිමහනේ නිර්මාණය වූ ජල පහරක් අසලට සිසුන් ආරක්ෂාකාරී ව රැගෙන යන්න.
- සිසුන් විසින් සාදන ලද බෝට්ටු ජලයේ පා කර හැරීමට අවස්ථාව දෙන්න.
- සිසුන් විසින් පා කරන හරින ලද බෝට්ටු සමග ගමන් කිරීමට ද එය ගමන් ගන්නා අයුරු නිරීක්ෂණය කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ක්‍රියාකාරකම අවසානයේදී සිසුන්ට තම අද්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාව දෙන්න.

වැහි බින්දුව වැටෙනවා - මිදුලෙ වතුර පිරෙනවා
හිමින් හිමින් දිය පාරක - මිදුලෙ දිගේ ඇදෙනවා

කඩදාසිය නමනවා - බෝට්ටුවක් හදනවා
වැහි වතුරේ දිය පාරේ - බෝට්ටු පා කරනවා

**ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 6 සඳහා සිසුන් යොමුකරන්න.**

**තක්සේරු කිරීම**

| කාර්ය සාධන ප්‍රමිතිය | ත.නි.අ. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථයි |
|---|---|---|---|
| 1.1 උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 1.1.1 | උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | උදය/දහවල්/රාත්‍රී කාලයේ පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 1.2 උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි. | 1.2.1 | උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරය නිර්මාණය කරයි. | උදය/දහවල්/රාත්‍රී කාලයේ පරිසරය නිර්මාණය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| | 1.2.2 | උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරය ඇසුරින් ගායන හා රංගන ඉදිරිපත් කරයි. | උදය, දහවල් සහ රාත්‍රී කාලයේ පරිසරය ඇසුරින් ගායන/රංගන ඉදිරිපත් කිරීමේ දුෂ්කරතා දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 2.1 හිරු එළියෙන් ලැබෙන ප්‍රයෝජන ප්‍රකාශ කරයි. | 2.1.1 | හිරු එළියෙන් ලැබෙන ප්‍රයෝජන ප්‍රකාශ කරයි. | හිරු එළියෙන් ලැබෙන ප්‍රයෝජන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 2.2 හිරු එළියෙන් යම් කාර්යයක් සිදු කරගත හැකි අයුරු අත්හදා බලයි. | 2.2.1 | හිරු එළියෙන් යම් කාර්යයක් සිදු කරගත හැකි අයුරු අත්හදා බලයි. | හිරු එළියෙන් යම් කාර්යයක් සිදු කරගත හැකි අයුරු අත්හදා බැලීමට දුෂ්කරතා දක්වයි. |
| 2.3 දැඩි හිරු එළියෙන් ආරක්ෂා වීම සඳහා සුදුසු නිර්මාණයක් සිදු කරයි. | 2.3.1 | දැඩි හිරු එළියෙන් ආරක්ෂා වීම සඳහා සුදුසු නිර්මාණයක් සිදු කරයි. | දැඩි හිරු එළියෙන් ආරක්ෂා වීම සඳහා සුදුසු නිර්මාණයක් සිදු කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 3.1 සුළඟ නිසා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 3.1.1 | සුළඟ නිසා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | සුළඟ නිසා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 3.2 සුළඟේ පාකර යැවිය හැකි කඩදාසි රොකට්ටුවක් නිර්මාණය කරයි. | 3.2.1 | සුළඟේ පා කර යැවිය හැකි කඩදාසි රොකට්ටුවක් නිර්මාණය කරයි. | සුළඟේ පා කර යැවිය හැකි කඩදාසි රොකට්ටුවක් නිර්මාණය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.1 පාසල හෝ ඒ අවට භූමියේ ස්වභාවය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 4.1.1 | පාසල හෝ ඒ අවට භූමියේ ස්වභාවය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | පාසල හෝ ඒ අවට භූමියේ ස්වභාවය නිරීක්ෂණය කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.2 පාසල් වත්තෙන් ලබා ගත් පස් නියැදියක් සමීප ව නිරීක්ෂණය කර දුටු දේ ප්‍රකාශ කරයි. | 4.2.1 | පාසල් වත්තෙන් ලබා ගත් පස් නියැදියක් සමීප ව නිරීක්ෂණය කර දුටු දේ ප්‍රකාශ කරයි. | පාසල් වත්තෙන් ලබා ගත් පස් නියැදියක් සමීප ව නිරීක්ෂණය කර දුටු දේ ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.3 භූමිය මතුපිට වෙනස්කම් යොදාග නිමින් ශාරීරික ක්‍රියාකාරකම් සිදුකරයි. | 4.3.1 | භූමිය මතුපිට වෙනස්කම් යොදාග නිමින් ශාරීරික ක්‍රියාකාරකම් සිදුකරයි | භූමිය මතුපිට වෙනස්කම් යොදාගනිමින් සිදු කරන ශාරීරික ක්‍රියාකාරකම් වලට සහභාගි නොවෙයි. |
| 5.1 වැසි අවස්ථාවක් නිරීක්ෂණය කර අද්දැකීම් ප්‍රකාශ කරයි. | 5.1.1 | වැසි අවස්ථාවක් නිරීක්ෂණය කර අද්දැකීම් ප්‍රකාශ කරයි. | වැසි අවස්ථාවක් නිරීක්ෂණය කර අද්දැකීම් ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 5.2 වැහි ජලයේ පා කර යැවිය හැකි සරල බෝට්ටුවක් නිර්මාණය කරයි. | 5.2.1 | වැහි ජලයේ පා කර යැවිය හැකි සරල බෝට්ටුවක් නිර්මාණය කරයි. | වැහි ජලයේ පා කර යැවිය හැකි සරල බෝට්ටුවක් නිර්මාණය කිරීමේ දුෂ්කරතා දක්වයි. |

# සෞන්දර්ය අධ්‍යාපනය
# ගුරු මාර්ගෝපදේශය

| ක්‍රියාකාරකම 01 | වර්ණ අභ්‍යාස කරමු |
| --- | --- |
| විෂය අන්තර්ගතය<br>ප්‍රාථමික/මූලික වර්ණ - **Primary Colors** | කාලය : කාලච්ඡේද 01යි.<br>හැඳින්වීම : මෙම ක්‍රියාකාරකමින් චිත්‍ර කලාවේ ප්‍රාථමික/මූලික වර්ණ වන රතු, නිල්, කහ යන වර්ණ සම්බන්ධ අභ්‍යාස සිදු කරනු ලැබේ. |

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**


- චිත්‍ර අඳින කඩදාසි
- රතු, නිල් සහ කහ ප්ලාස්ටික් බෝල හෝ බැලුම් බෝල
- ගම්
- වර්ණ කඩදාසි
- ගම්, කතුරු
- පැන්සල්
- වර්ණ (පැස්ටල් හෝ දියර සායම්)

**1 වන පියවර**


- අවට පරිසරයේ ඇති විවිධ වර්ණ පෙන්වමින් ඒවා නම් කිරීමට යොමු කරන්න. පන්ති කාමරයේ වටපිටාව ඇති විවිධ භාණ්ඩ කෙරෙහි ළමුන්ගේ අවධානය යොමු කරමින් ඒවායේ වර්ණ මොනවාදැයි හඳුන්වා දෙන්න. ඒ ගැන ළමුන්ගෙන් විමසමින් ඔවුනොවුන් අතර අදහස් හුවමාරු කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**2 වන පියවර**

- ළමුන් කණ්ඩායම් කරමින් නිල්, රතු කහ යන බෝල ලබා දෙන්න. ඒවායේ වර්ණ හඳුනා ගැනීමට යොමු කරන්න.
- එම හඳුනා ගැනීමෙන් පසු පහත දැක්වෙන ලෙස රේඛාවෙන් ඇඳි බැලුම් බෝල සමග කපා ගත් කහ, නිල් සහ රතු වර්ණවත් බැලුම් ලබා දෙන්න. නම් කර ඇති රේඛා බැලුම් සමග එම වර්ණවත් බැලුම් ගළපමින් ඇළවීමට මඟ පෙන්වන්න.



නිල් රතු කහ



- එම අභ්‍යාසයෙන් පසු නැවත බැලුම් බෝල එකතුවක් ඇඳීමට යොමු කරන්න. බෝල ඇඳ ඒවා නූලකින් එකට එකතු කර බැලුම් නිර්මාණය කිරීමට හැකි බව පෙන්වා දෙන්න. අඳින ලද බැලුම් සමුහය රතු නිල් කහ යන වර්ණවලින් පමණක් වර්ණ ගැන්වීමට යොමු කරවන්න. ඒ සඳහා පහත නිදර්ශන අවධානයට ගන්න.

3 වන පියවර

- නිම කරන අභ්‍යාස සම්බන්ධ ව සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට හා අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරු ඇගයීම මගින් තක්සේරු කිරීමට අවස්ථාව සලසා ගන්න.

## ක්‍රියාකාරකම 02 — වර්ණවත් මල් සහිත බඳුනක් සිතුවම් කරමු.

| | | |
|---|---|---|
| විෂය අන්තර්ගතය | කාලය : | කාලච්ඡේද 01යි. |
| අතරමැදි වර්ණ - **Intermediate Colors** | හැඳින්වීම : | මෙම ක්‍රියාකාරකමින් මල් බඳුනක් සිතුවම් කරනු ලැබේ. ඒ සඳහා බඳුනක හැඩ දක්වමින් වර්ණ තැවරීම යන ක්‍රමවේදය යටතේ මල් කිනිති දැක්වීමත් සිදු කෙරේ. වර්ණ තැවරීම මගින් ප්‍රකාශනාත්මක සිතුවම් නිර්මාණය කිරීමට අවස්ථාව මෙමගින් සලසා දෙනු ලැබේ. |
| වර්ණ තැවරීම - **Color Touching** | | |

ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ

- චිත්‍ර අඳින කඩදාසි
- රෙදි පින්තාරු තීන්ත **(Fabric paints)**
- පැස්ටල් **(Pastel)**
- කුඩා ප්‍රමාණයේ ස්පොන්ජ් කැබලි කිහිපයක්
- තීන්ත මිශ්‍ර කිරීමට කුඩා භාජනයක් (පැතලි දීසියක් හෝ පිඟානක්)

1 වන පියවර


- පෙර ක්‍රියාකාරකම ඇසුරෙන් ලබා ගත් ඉගෙනුම් අද්දැකීම් නැවත සාකච්ඡාවට ලක් කරන්න.
- වර්ණ ඇසුරෙන් මල් බඳුනක් නිර්මාණය කිරීමට සඳහා ළමුන්ට අවශ්‍ය ආදර්ශ පෙන්වන්න.






2 වන පියවර

- මල් බඳුනක් ඇඳීමට සිසුන් යොමු කරන්න.
- සිසුන්ට බඳුන් ඇඳීමේ අපහසුවක් ඇත් නම් බඳුන් හැඩ වර්ණවත් කොළවල කපා ඔවුන්ට ලබා දෙන්න. එය පොතේ/කඩදාසියක අලවා ගැනීමට උපදෙස් ලබා දෙන්න.







- අඳින ලද හෝ අලවා ගන්නා ලද මල් බඳුනෙහි මල් දැක්වීම සඳහා විවිධ වර්ණ තැවරූ ස්පොංච් භාවිත කිරීමට සහය වන්න

3 වන  පියවර

- මල් සමග බඳුන ද අලංකරණයට ඉඩ සලසා දෙන්න. සිතුවම නිමා කිරීමට මඟ පෙන්වන්න.
- නිම සිතුවම් තෝරාගත් තැනක ප්‍රදර්ශනය කරන්න. ප්‍රදර්ශනය කරන සිතුවම් සඳහා භාවිත වර්ණ හා සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න. එසේම අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරුවරයාගේ අගය කිරිම මඟින් තක්සේරු කිරීමට අවස්ථාව සලසා ගන්න.

## ක්‍රියාකාරකම 03 ප්‍රකාශන චිත්‍ර නිර්මාණය කරමු.

| | | |
|---|---|---|
| විෂය අන්තර්ගතය | කාලය : | කාලච්ඡේද 01යි. |
| කොලාජ් - **Collage**<br>මිශ්‍ර මාධ්‍ය - **Mixed medium** | හැඳින්වීම : | මෙම ක්‍රියාකාරකමින් 'වර්ණවත් මල් සහිත බඳුනක් සිතුවම් කරමු' යන ක්‍රියාකාරකම තවදුරටත් සංවර්ධනය කරමින් මල් වත්තක් ඇඳීමට යොමු කරනු ලැබේ. එම තේමාව කොලාජ් හා මිශ්‍ර මාධ්‍ය ඇසුරු කරමින් නිර්මාණශීලී ව හා ප්‍රකාශනාත්මක ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසනු ලැබේ. |

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පාට කඩදාසි
- ගම්, කතුරු
- වර්ණ (පැස්ටල් හෝ දියර සායම්)

1 වන පියවර

- පෙර ක්‍රියාකාරකම් ඇසුරෙන් ලබා ගත් ඉගෙනුම් අද්දැකීම් නැවත සාකච්ඡාවට ලක් කරන්න.
- මල් බඳුනක් හා මල් වත්ත අතර වෙනස සාකච්ඡාවට ලක් කරන්න
- මෙම නිර්මාණය සඳහා විවිධ මාධ්‍ය හා වර්ණ කඩදාසි භාවිත කිරීම සාකච්ඡා කරන්න.
- අත්හදා බැලීම් සඳහා ළමුන්ගේ කැමැත්ත උනන්දුව ගොඩනගන්න. ඒ සඳහා සුදුසු ආදර්ශ පෙන්වන්න.

නිදසුන්






2 වන පියවර

- මල් වත්තක් ඇඳීමට අවශ්‍ය වර්ණ හා කඩදාසි සූදානම් කර ගැනීමට යොමු කරන්න.
- අත්හදා බැලීම් අනුව ක්‍රියා කිරීමට මග පෙන්වන්න. මෙහිදි වර්ණ කිරීම, වර්ණ කඩදාසි ඇලවීම හෝ එම ක්‍රම දෙකම මිශ්‍ර කිරීමෙන් හෝ නිර්මාණ කිරීමට මග පෙන්වන්න. අවශ්‍ය උදව් ලබා දෙන්න. සුදුසු ගොනු කිරීම් අනුව මල් ගස්, මල්, සමනල්ලු, කුරුල්ලන් ඇඳ වර්ණ කිරීමෙන් පසු සුදුසු පසුබිමක් හා රේඛාකරණයක් යොදා ගනිමින් සිතුවම නිමා කිරීමට මඟ පෙන්වන්න.

3 වන  පියවර

- නිම සිතුවම් තෝරාගත් තැනක ප්‍රදර්ශනය කරන්න. ප්‍රදර්ශනය කරන සිතුවම් සඳහා භාවිත වර්ණ හා සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න. එසේම අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරු වරයාගේ අගය කිරීම මගින් තක්සේරු කිරීමට අවස්ථාව සලසා ගන්න.

# සංගීතය

**ක්‍රියාකාරකම 01**

- මිහිරි නාද අමිහිරි නාද වෙන්කර හඳුනා ගැනීම සඳහා සිසුන්ව එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- සිසුන්ට අවට පරිසරයෙන් ඇසෙන ශබ්දවලට හොඳින් සවන් දීමට විනාඩි කිහිපයක් ලබා දෙන්න.
- තමන් ට ඇහුණු මිහිරි මෙන් ම අමිහිරි නාද මොනවා ද යන්න ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් සමග ඇසුණු ශබ්ද පිළිබඳ සාකච්ඡා කරමින් ඔවුන්ට ඇසුණු ශබ්ද අනුකරණය කිරීමට ඉඩ ලබා දෙන්න.

  උදා - මිහිරි නාද - කුරුළු නාද, ගීතයක්...<br>
  අමිහිරි නාද - වාහන නලා ශබ්ද, අහසේ ගිගුරුම් හඬක්...

- මේ පිළිබඳ සාකච්ඡා කරමින් අපි එකිනෙකා සමග සන්නිවේදනය කිරීමේදී, ගීතයක් ගායනා කිරීමේ දී මිහිරි ව සියලු ම දෙනාට ශ්‍රවණය කළ හැකි අකාරයෙන් කටයුතු කළ යුතු බව සිසුන්ට පහදා දෙන්න.

**ක්‍රියාකාරකම 02**
**මානසික සංවේදීතාවය ඇති කිරීම සඳහා අභ්‍යාස - 2 කොටස**
**ඉගෙනුම් සම්පත්:**

ශ්‍රැති මංජුසාවක් (**Shruthi Box**), සර්පිනාවක්, ලොකු බිත්ති ඔරලෝසුවක්

- කට හඬ පුහුණු කිරීම සහ ශ්වසන අභ්‍යාස පළමු ශ්‍රේණියේ පළමු වාරයේ සිදු කළ ආකාරයෙන් දරුවන්ගේ මානසික සමාධිය පුහුණු කිරීම තුළින් පාඩමට අවධානය රඳවා තැබීමට පුහුණු කළ හැකිය.
- එබැවින් සිසුන් නම්‍යශීලී කිරීමට **ඕම්**කාරයට හෝ **ඕම්**කාරය වෙනුවට සුදුසු වචනයක් (උදා - 'ම්', 'හා', 'ලා' වැනි උච්ඡාරණයට පහසු ශබ්ද) යොදා ගනිමින් දැහැන් ගත කරවීම කළ යුතුය.

**පියවර 01**

- සර්පිනාවෙන් මධ්‍ය 'ප' ස්වරය වාදනය කරන්න.
- එය දෑස් පියාගෙන හොඳින් ශ්‍රවණය කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- මෙය විනාඩි පහක් පමණ කරන්න.
- දැන් සියලුම සිසුන් 'ප' ස්වරයෙහි කටහඬ පිහිටුවන්නට උපදෙස් දෙන්න.

**පියවර 03**

- දැන් 'ප' ස්වරයට අනුගත වී එය 'ඕම්', 'ම්', 'හා', 'ලා' හඬ දක්වා හඬ විහිදුවන්න.
- එම හඬ විනාඩි 05 ක් පමණ අභ්‍යාස කරන්න.

**පියවර 02**

- 'ප' ස්වරයට හුරු වූ සිසුන් ක්‍රමයෙන් 'ධ' ස්වරය, 'නි' ස්වරය, 'ස' (උච්ඡ ස ස්වරය) ස්වරයට හුරු කරවන්න.

**පියවර 04**

- ඔරලෝසු මුහුණත සිසුන්ට පෙනෙන්න තබන්න.
- දැන් එහි තත්පර කටුව 12න් පටන්ගෙන තත්පර කිහිපයක් හෝ සිසුන්ට හුස්ම රඳවා ගත හැකි තරම් පමණ වේලාවක් 'ඕම්' කාරයේ ('ම්', 'හා', 'ලා' හඬ) එකසේ හුස්ම රඳවා තබා ගැනීමට උපදෙස් දෙන්න.
- ශ්‍රැතියේ හඬ පවත්වා ගනිමින් ඕම් කාරය දවසින් දවස ප්‍රගුණ කිරීමේදී මානසික සමාධිය සිසුන්ට ඉබේම ඇති වේ.

- හුස්ම රඳවා තබා ගන්නා තප්පර ගණන සංවර්ධනය කර ගැනීමට සිසුන්ට උපකාර කරන්න.
- ක්‍රමයෙන් තත්පර 15 ට වඩා 'ඕම්'කාරයේ සිටීමට දරුවන්ට ක්‍රම ක්‍රමයෙන් හැකියාව ලැබේ.
- අවසානයේ එය භාවනාවක තත්වයට වර්ධනය වේ.

**නාට්‍ය හා නර්තනය**

**ක්‍රියාකාරකම 01**

- රිද්ම හඳුනාගැනීම සඳහා උදාහරණ
    - ✓ අච්ච
    - ✓ වැස්ස
    - ✓ සුළඟ
    - ✓ මුහුදු රළ
    - ✓ ගංගා
    - ✓ දිය ඇළි

- මේ සියලු රිද්ම නිරන්තර වෙනස් වේ. ඒකාකාරී බවක් නොමැත. මෙම රිද්මයන්ට ආවේණික හඬ වෙනස්වන අයුරු ස්වභාවික පරිසරය ඇසුරෙන් අත්විඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
    - ✓ දුම්රියේ හඬ
    - ✓ මුහුදේ හඬ
    - ✓ වැස්සේ හඬ
    - ✓ සුළගේ හඬ

- මේ එක් එක් අවස්ථාවල සුවිශේෂත්වය හඳුනාගැනීමට සිසුන් යොමු කරන්න.

ඒවායේ විවිධත්වය නිරූපණය කිරීමට සිසුන්ගේ හැකියාව/ දක්ෂතාව අනුව අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 02**

**නම්‍යශීලී අභ්‍යාසය**

- පළමුවාරයේ කළ ආකාරයට නම්‍යශීලී අභ්‍යාස තව දුරටත් සිසුන්ට පුහුණු කරන්න.
- එම අභ්‍යාස සඳහා සරල රිද්මයානුකූල නාදයක් සහිත හඬ පටයක් භාවිත කරන්න.
- සිසුන්ට සුදුසු ගීත දෙකක් තෝරාගෙන ගීතයට අනුව සිසුන්ට පාදයෙන් චලන දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම අගය කරන්න.

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

# Activity Based Oral English

**Activity: Greeting – Good Morning to you - Song**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| **2.1 Greets and re-sponds to greetings** | **Good morning to you //<br>Good morning, dear children.<br>Good morning to you //<br><br>Good morning to you //<br>Good morning, dear teacher.<br>Good morning to you //<br><br>Good morning, children.<br>Good morning teacher.** | **Greets appropriately<br>Greets politely<br>Greets using a song appropriately** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, ගීත හඬ පටය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- එකිනෙකාට ආචාර කිරීමේ දී දෑත් තබා ගත යුතු ආකාරය සිසුනට කියා දෙන්න, පාට පැන්සල් හෝ පැස්ටල්
- **Good morning** යැයි පැවසීමේ දී අත් දෙකෙහි අත්ල දෙක එකිනෙක මත ස්පර්ශ වන සේ සිරස් ව නිකටට පහතින් ළය මත තබා ගෙන **"Good morning"** කියා පැවසීමට කියා දෙන්න.
- ගීතයේ පළමු කොටස ඔබ ගැයූ පසු ගීතයේ දෙවන කොටස එනම් 4, 5, 6 පේළි සිසුන් ලවා ගැයීමට උපකාර වන්න.
- මෙලෙස දිනපතා ඉංග්‍රීසි පාඩම ආරම්භයේ දී මේ ගීතය ගයා ආරම්භ කරන්න.

**Classroom Language**

| | |
|---|---|
| **Teacher:** | **Children, Stand up. Good morning, children!** |
| **Students:** | **Good morning, teacher!** |
| **Teacher:** | **Now we are going to sing a song.<br>First, let's listen. Are you ready?** |
| **Students:** | **Yes, teacher** |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Greets using a song. | |
| Greets. | |

**Activity: 1 Song – Head, Shoulders, Knees and Toes ….**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life. | Song:<br>Head shoulders,<br>Head shoulders<br>Knees and toes ///<br>Head shoulders<br>Knees and toes<br>Eyes, ears, mouth<br>And nose //<br><br>Vocabulary:<br>Head, eyes, shoulders, ears,<br>Knees, mouth, toes | Introduces parts of the body appropriately. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ගීතයට අදාළ අංග චලන ඉදිරිපත් කරමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.
  උදා - ඔබ **head** යන වචනය ගායනා කරන විට හිස පෙන්වන්න.

> **Teacher:** Children, today we are going to sing a song with actions.
> Are you ready?
> First, let's listen to the song.
>
> (Teacher sings/ plays the audio and does the actions. Eg: Shows 'head' when they sing the word 'head', etc.
>
> **Teacher:** Now, let's sing the song with actions

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Names the parts of the body. | |

**Activity - 2 Listen and Colour: Parts of the Body**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1Follows simple instructions (2-3 word) related to real life and learning areas | Listen and Colour- Parts of the body | Listens and colours the parts of the body correctly. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- මෙහි සඳහන් කර ඇති පරිදි මව්බස සහ ඉංග්‍රීසි බස යන භාෂා දෙකෙන්ම ඔවුනට උපදෙස් දෙන්න.

  අද අපි පින්තූරයක් පාට කරන්නයි යන්නේ.

  **"Children we are going to colour a picture today."**
- සිසුන්ට පාට පැන්සල් සහ ක්‍රියාකාරකම් පොත ගෙන සූදානම් වෙන ලෙස පවසන්න.

  **"Now, get ready with your colour pencils and the ABOE Activity Book."**
- පාට කිරීමට පැවසීමට පෙර ඔවුනට වචන මතක දැයි බැලීමට **"What can you see in this picture?"** යැයි විමසන්න.
- ඔබට හොඳින් ඇහුම්කන් දී ඔබ පවසන වචනයට අදාළ කොටස පමණක් පාට කිරීමට උපදෙස් දෙන්න.
- ඔවුන් පාට කරන අතරතුරේදී පන්තිකාමරය තුළ ඇවිදිමින් ඔවුන්ව නිරීක්ෂණය කරන්න.
- මෙම ක්‍රියාකාරකම තුළින් දරුවන්ගේ සවන් දීමේ කුසලතාවය දියුණු කිරීමත් වචන නැවත නැවතත් අසන්නට ලැබීමෙන් මතකයේ රැඳීමට උපකාර වීමත් බලාපොරොත්තු වේ.
- වැරදියට පාට කර ඇත්නම් වැරදි ලකුණ නොදමන්න. නිවැරදි කොටස පාට කිරීමට උදව් වෙන්න. හැකි සෑම විට ම ඉංග්‍රීසි භාෂාවෙන් උපදෙස් දෙන්න.
- **"Colour the mouth˜** යනුවෙන් පවසා, එය මව්බසින් නොපවසන්න ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ම උපදෙස් දෙන්න(හරි සළකුණ යොදන අතර ගුරුතුමිය විසින් **'What is this?' / 'Show me the doll's mouth'** යන්න සිසුන්ගෙන් විමසන්න.

| | |
|---|---|
| **Teacher:** | **This is Meena's doll. Today, we are going to colour Meena's doll.**<br>**Now get ready with your coloured pencils.**<br>**Are you ready?** |
| **Students:** | **Yes, teacher.** |
| **Teacher:** | **Colour the mouth.**<br>**Colour the nose.**<br>**Colour the two ears.**<br>**Colour the two hands.**<br>**Colour the two eyes.**<br>**Colour the two legs.** |

**(Teacher goes around the classroom observing whether they are colouring the correct picture.)**

- සිසුනට මෙම වචන නොදැනුවත්වම විනෝද ජනක ලෙස ඉගෙනීමට හැකි වන ලෙස **"Simon says…"** ක්‍රීඩාව කළ හැක.

**Assessment:**

| **Criteria** | **Yes** |
|---|---|
| **Listens, colours and says the parts of the body.** | |

**Activity - 3 Game: Listen, Show and Say**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| **2.5 Introduces things, places, persons and actions related to real life.** | **Food: Healthy Food & Unhealthy (junk) food**<br><br>**Vocabulary:**<br>**rice and curry, bread, hoppers, buns, ice cream, manioc, lollipop, banana, green leaves, French fries** | **Introduces the food appropriately.** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ් පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සෑම සිසුවෙකුටම පින්තූර කාඩ් පතක් ලබා දෙන්න.
- පළමුව ගුරුතුමා අත ඇති පින්තූරය පෙන්වා, අදාල වචනය පවසන්න.
- ගුරුතුමා එසේ පවසන විට, තමා අතෙහි, පවසන ලද වචනයට අදාළ පින්තූර පත ඇත්නම්, එය පෙන්වා, වචනය හඬ නගා පැවසීමට උපදෙස් දෙන්න.
- සියලු පින්තූර පත් ක්‍රීඩාවක ආකාරයෙන් හඳුන්වා දෙන්න.
- දෙවන වටයේ දී ගුරුතුමා වචනය හඬ නගා පවසන විට තමා අත අදාළ පින්තූරය ඇත්නම් පෙන්වා, අදාළ වචනය පැවසීමට උපදෙස් දෙන්න.
- තුන්වන වටයේ දී ගුරුතුමා පින්තූරය පෙන් වුවත්, වචනය නොපවසයි. තමා අත අදාළ පින්තූරය ඇත්නම් පෙන්වා, අදාළ වචනය පැවසීමට උපදෙස් දෙන්න.
- මේ ආකාරයෙන් විනෝද ජනක ක්‍රීඩාවක් ලෙස සිසුන් සමඟ කරන්න.

**Teacher:** We are going to do a game. Do you like?
**Students**: Yes, teacher.
**Teacher**: Good. Let's make a circle (In the classroom or outside)

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Identifies the food items** | |

**Activity: 4 – Song - I like …. Do you like ….? Yes, I do.**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| **2.2 Asks for and gives information related to personal details.** | **Song :**<br>**I like banana //**<br>**How about you? //**<br>**Do you like banana? //**<br>**Yes, I do. //**<br>**Vocabulary:**<br>**rice and curry, manioc, hoppers, banana, ice-cream, green leaves.**<br><br>**Structures:**<br>**I like… Do you like…? Yes, I do.** | **Asks for and gives information politely.** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ් පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ගීතයට අදාළ අංග චලන ඉදිරිපත් කරමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.
  උදා - ඔබ **banana** යන වචනය ගායනා කරන විට අදාළ පින්තූරය පෙන්වන්න.
- මේ අයුරින් අනෙක් වචන ද එකින් එක හඳුන්වා දෙමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.

**Teacher: Children, today we are going to sing a song with actions.**
**Are you ready?**
**First, let's listen to the song.**
**(Teacher sings/plays the audio) and shows the picture of a banana.**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Says the likes. | |
| Asks the likes. | |

**Activity: 5 - Song – I Like ….? No, I Don't …**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| **2.2 Asks for and gives information related to personal details.** | **Song :**<br>**I like hoppers // How about you? // Do you like hoppers? // No, I don't. //**<br><br>**Vocabulary:**<br>**hoppers, bread, buns, French fries, lollipop**<br><br>**Structures:**<br>**I like… Do you like…? No, I don't.** | **Asks for and gives information politely.** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ් පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ගීතයට අදාළ අංග චලන ඉදිරිපත් කරමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.
  උදා - ඔබ **hoppers** යන වචනය ගායනා කරන විට අදාළ කෑම වර්ගයේ (ආප්ප) පින්තූරය පෙන්වන්න.
- මේ අයුරින් අනෙක් වචන ද එකින් එක හඳුන්වා දෙමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.

> **Teacher: Children, today we are going to sing a song with actions.**
> **Are you ready?**
> **First, let's listen to the song.**
> **(Teacher sings/plays the audio) and shows a picture of hoppers.**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Says the likes and dislikes. | |
| Asks the likes and dislikes. | |

**Activity: 6 - Song – I Drink Milk ….**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| **2.5 Introduces things, places, persons and actions related to real life.** | **Song:**<br>**I drink milk in the morning ///**<br>**And then I go to school.**<br><br>**Vocabulary:**<br>**tea, milk**<br>**water, fruit juice** | **Introduces the drinks appropriately.** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, පින්තූර කාඩ් පත්, හඬ පටය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ගීතයට අදාළ අංග චලන ඉදිරිපත් කරමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.
  උදා - ඔබ **milk** යන වචනය ගායනා කරන විට කිරි වීදුරුව සහිත පින්තූර කාඩ් පත පෙන්වන්න.
- මේ අයුරින් අනෙක් වචන ද එකින් එක හඳුන්වා දෙමින් ගීතය ගයන්න/හඬ පටය වාදනය කරන්න.

**Teacher: Children, today we are going to sing a song with actions.**
**Are you ready?**
**First, let's listen to the song.**
**(Teacher sings/plays the audio and shows a picture of milk.)**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Introduces the drinks. | |

**Activity 7(A) – Song: Religious Festivals - Vesak**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.1 Greets and responds to greetings. | Song:<br>We are celebrating//<br>We are celebrating Vesak<br>Happy Vesak<br>We wish you a happy Vesak///<br>La la la la la<br><br>Structure:<br>We are celebrating Vesak.<br>Happy Vesak! | Greets appropriately.<br><br>Greets politely. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ක්‍රියාකාරකම් පොතේ පින්තූරය සිසුන්ට පෙන්වා එහි සිටින ළමුන් පිළිබඳව ඔවුන්ගෙන් විමසන්න.
- එහි අවට ඇති දේ පිළිබඳව ද ඔවුන්ගෙන් විමසන්නග
- පන්තියේ සිසුන් දෙදෙනෙකු ඉදිරියට ගෙන **"We are celebrating Vesak."** යනුවෙන් පැවසීමට උපදෙස් දෙන්න. පන්තියේ අනික් සිසුන්ට **"Happy Vesak!"** යනුවෙන් සුභ පැතීමට උපදෙස් දෙන්න.

**Teacher: Children, what can you see in this picture?**
**Students: moon, temple, clouds, Vesak lanterns, flags**
**Teacher: Yes, very good. We can see the moon, Vesak lanterns, Buddhist flags, oil lamps, clouds, and children. Now let's listen to them.**

**We are celebrating//**
**We are celebrating Vesak**
**Happy Vesak**
**We wish you a happy Vesak/// La la la la la**

**Two Students: We are celebrating Vesak.**

**Assessment:**

| **Criteria** | **Yes** |
|---|---|
| **Greets** | |

**Activity: 7B – Religious Festivals - Ramazan**

| **Learning Outcomes** | **Subject Content** | **Performance Standards** |
|---|---|---|
| **2.1 Greets and responds to greetings.** | **Song:**<br>**We are celebrating//**<br>**We are celebrating Ramazan**<br>**Happy Ramazan**<br>**We wish you a happy Ramazan ///**<br>**La la la la la**<br><br>**Structure:**<br>**We are celebrating Ramazan.**<br>**Happy Ramazan!** | **Greets appropriately.**<br><br>**Greets politely.** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ක්‍රියාකාරකම් පොතේ පින්තූරය සිසුන්ට පෙන්වා එහි සිටින ළමුන් පිළිබඳව ඔවුන්ගෙන් විමසන්න.
- එහි අවට ඇති දේ පිළිබඳව ද ඔවුන්ගෙන් විමසන්න.
- පන්තියේ සිසුන් දෙදෙනෙකු ඉදිරියට ගෙන **"We are celebrating Ramazan."** යනුවෙන් පැවසීමට උපදෙස් දෙන්න. පන්තියේ අනික් සිසුන්ට **"Happy Ramazan!"** යනුවෙන් සුභ පැතීමට උපදෙස් දෙන්න.

**Teacher:** Children, what can you see in this picture?
**Students:** crescent, clouds, mosque
**Teacher:** Yes, very good. We can see the crescent, clouds, mosque and children. Now let's listen to them.
**Two Students:** We are celebrating Ramazan.
**Other Students:** Happy Ramazan!
**We are celebrating//**
**We are celebrating Ramazan**
**Happy Ramazan**
**We wish you a happy Ramazan ///**
**La la la la la**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Greets | |

**Activity: 7C – Religious Festivals - Deepavali**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.1 Greets and responds to greetings. | Song:<br>We are celebrating//<br>We are celebrating Deepavali<br>Happy Deepavali<br>We wish you a happy Deepavali<br>///<br>La la la la la<br><br>Structure:<br>We are celebrating Deepavali.<br>Happy Deepavali! | Greets appropriately.<br>Greets politely. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ක්‍රියාකාරකම් පොතේ පින්තූරය සිසුන්ට පෙන්වා එහි සිටින ළමුන් පිළිබඳව ඔවුන්ගෙන් විමසන්න.
- එහි අවට ඇති දේ පිළිබඳව ද ඔවුන්ගෙන් විමසන්න.
- පන්තියේ සිසුන් දෙදෙනෙකු ඉදිරියට ගෙන **"We are celebrating Deepavali."** යනුවෙන් පැවසීමට උපදෙස් දෙන්න. පන්තියේ අනික් සිසුන්ට **"Happy Deepavali!"** යනුවෙන් සුභ පැතීමට උපදෙස් දෙන්න.

**Teacher:** Children, what can you see in this picture?
**Students:** kovil, children
**Teacher:** Yes, very good. We can see a kovil.
**Two Students:** We are celebrating Deepavali.
**Other Students:** Happy Deepavali!

**We are celebrating//**
**We are celebrating Deepavali**
**Happy Deepavali**
**We wish you a happy Deepavali ///**
**La la la la la**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Greets. | |

**Activity: 7D – Religious Festivals - Christmas**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.1 Greets and responds to greetings. | Song:<br>We are celebrating//<br>We are celebrating Christmas<br>Happy Christmas<br>We wish you a happy Christmas ///<br>Structure:<br>We are celebrating Christmas.<br>Happy Christmas! | Greets appropriately.<br>Greets politely. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- ක්‍රියාකාරකම් පොතේ පින්තූරය සිසුන්ට පෙන්වා එහි සිටින ළමුන් පිළිබඳව ඔවුන්ගෙන් විමසන්න.
- එහි අවට ඇති දේ පිළිබඳව ද ඔවුන්ගෙන් විමසන්න.
- පන්තියේ සිසුන් දෙදෙනෙකු ඉදිරියට ගෙන **“We are celebrating Christmas.”** යනුවෙන් පැවසීමට උපදෙස් දෙන්න. පන්තියේ අනික් සිසුන්ට **“Happy Christmas!”** යනුවෙන් සුභ පැතීමට උපදෙස් දෙන්න.

| |
|---|
| **Teacher:** **Children, what can you see in this picture?**<br>**Students:** **Santa Claus, Christmas tree, Christmas star, stars, clouds, church, sack, balloons**<br>**Teacher:** **Yes, very good. We can see a Christmas tree, a Santa claus, a Christmas star, stars, clouds, a church, a sack, balloons**<br>**Two Students: We are celebrating Christmas.Other Students: Happy Christmas!**<br><br>**We are celebrating//**<br>**We are celebrating Christmas**<br>**Happy Christmas**<br>**We wish you a happy Christmas ///** |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Greets | |

**Activity: 8 A - How Do We Celebrate…**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| **2.6 Asks for and gives information related to real life situations.** | **Structures:**<br>**We go to the temple. We observe sil.**<br>**We go to the mosque. We pray.**<br>**We go to the kovil. We pray.**<br>**We go to church. We pray.** | **Uses vocabulary and structures related to festivals appropriately to give information.** |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- සිසුන් ආගමික උත්සව සැමරීමට යන බව පවසන්න.
- පළමු කණ්ඩායමට ඔවුන් වෙසක් උත්සවය සමරන බව පවසන්න.
- දෙවන කණ්ඩායම රාමසාන් උත්සවය සමරන බව පවසන්න.
- තුන්වනකණ්ඩායම දීපවාලී උත්සවය සමරන බව පවසන්න.
- හතරවන කණ්ඩායම නත්තල් උත්සවය සමරන බව පවසන්න.
- වෙසක් උත්සවය සමරන කණ්ඩායම වෙත ගොස් **“We go to the temple. We observe sil.”** යනුවෙන් පවසන්න. සිසුන්ට ද එම වැකි පැවසීමට උපකාර වන්න.
- දෙවන කණ්ඩායම වෙත ගොස් **“We go to the mosque. We pray.”** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.
- තුන්වන කණ්ඩායම වෙත ගොස් **“We go to the kovil. We pray.”** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.

- හතරවන කණ්ඩායම වෙත ගොස් **" We go to church. We pray."** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.
- කණ්ඩායම තුළ සහ කණ්ඩායම් අතර මෙම වැකි යොදා ගනිමින් ආගමික උත්සව සමරන අයුරු පිළිබඳව සාකච්ඡා කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.

**Teacher: Children, today we are going to celebrate festivals.**
**Let's form four groups.**

**We go to the temple. We observe sil.**
**We go to the mosque. We pray.**
**We go to the kovil. We pray.**
**We go to church. We pray.**

**Students: We go to the temple. We observe sil.**
**We go to the mosque. We pray.**
**We go to the kovil. We pray.**
**We go to church. We pray.**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Uses vocabulary and structures related to festivals. | |

**Activity: 8B – How Do We Celebrate… What Do We Make for…?**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations. | Structures:<br>We make ……..<br>We draw …… | Uses vocabulary and structures related to festivals appropriately to give information. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- සිසුන් ආගමික උත්සව සැමරීමට යන බව පවසන්න.
- පළමු කණ්ඩායමට ඔවුන් වෙසක් උත්සවය සමරන බව පවසන්න.
- දෙවන කණ්ඩායම රාමසාන් උත්සවය සමරන බව පවසන්න.
- තුන්වනකණ්ඩායම දීපවාලී උත්සවය සමරන බව පවසන්න.
- හතරවන කණ්ඩායම නත්තල් උත්සවය සමරන බව පවසන්න.
- වෙසක් උත්සවය සමරන කණ්ඩායම වෙත ගොස් **"We make Wesak lanterns."** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.
- දෙවන කණ්ඩායම වෙත ගොස් **"We make watalappan."** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.

- තුන්වන කණ්ඩායම වෙත ගොස් **"We draw kolam."** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.
- හතරවන කණ්ඩායම වෙත ගොස් **" We make Christmas tree, crib and stars."** යනුවෙන් පවසන්න. සිසුන්ටද එම වැකි පැවසීමට උපකාර වන්න.
- කණ්ඩායම තුළ සහ කණ්ඩායම් අතර මෙම වැකි යොදා ගනිමින් ආගමික උත්සව සමරන අයුරු පිළිබඳව සාකච්ඡා කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.

**Teacher: Children, today we are going to celebrate festivals.**
**Let's form four groups.**

**We make Vesak lanterns.**
**We make watalappan.**
**We draw kolam.**
**We make Christmas tree, crib and stars.**

**Students: We make Vesak lanterns.**
**We make watalappan.**
**We draw kolam.**
**We make Christmas tree, crib and stars.**

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Uses vocabulary and structures related to festivals | |

**Activity: 8C – How Do We Celebrate? – Draw and Colour**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.6 Asks for and gives information related to real life situations. | Structures:<br>We go to ……..<br>We …… (observe sil /pray )<br>We make …… (Vesak lanterns / watalappan, Christmas tree / stars / crib.)<br>We draw kolam. | Uses vocabulary and structures related to festivals appropriately to give information. |

**ඉගෙනුම් සම්පත්:** සිසු ක්‍රියාකාරකම් පොත, පාට පැන්සල් හෝ පැස්ටල්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- සිසුන්ට ආගමික උත්සව සමරන ආකාරය පිළිබඳව චිත්‍ර ඇඳීමට යන බව පවසන්න.
- එක් එක් කොටුව තුළ ගුරුතුමිය පවසන ආගමික උත්සවයට අදාළ වන සේ එම ආගමික උත්සවය සමරන අයුරු චිත්‍රයට නැගීමට සහ පාට කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන්ගේ පොත් ලකුණු කරන අවස්ථාවේදී **"How do you celebrate Vesak / Ramazan / Deepavali / Christmas?"** යනුවෙන් අසන්න.
- අදාල උත්සවය අනුව එය සමරන ආකාරය පිළිබඳව වැකියක් පැවසීමට සිසුන්ට පවසන්න.

| | |
|---|---|
| **Teacher:** | **Children, take out your activity books.<br>Today we are going to draw and colour pictures.<br>How do we celebrate vesak? Draw a picture in box 1.<br>How do we celebrate Ramazan? Draw a picture in box 2.<br>How do we celebrate Deepavali? Draw a picture in box3.<br>How do we celebrate Christmas? Draw a picture in box 4.** |
| **Teacher:** | **How do you celebrate vesak / Ramazan / Deepavali / Christmas?** |
| **Teacher:** | **Children, today we are going to draw the objects in the night sky.<br>Do you like it?<br>Draw them, and colour them.<br>Now children, come to the front one by one and describe your picture.** |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Draws, colours and says the objects in the night sky.** | |

# දෙවන ජාතික භාෂාව (දෙමළ)

## 03 ඉගෙනුම් පලය

# උපන් දිනවල දී සුබ පැතීමේ හා ප්‍රතිචාර දැක්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| இனிய பிறந்தநாள் வாழ்த்துகள் (ඉනිය පිරන්දනාළ් වාළ්ත්තුහළ්) සුබ උපන් දිනයක් වේවා ! | ■ 3.1 උපන් දිනවල දී නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් සුබ පතයි. | 3.1.1 නිවැරදි උච්චාරණය |
| | | 3.1.2 ආචාරශීලීබව |
| நன்றி (නන්රි) ස්තුති යි. | ■ 3.2 උපන් දින සුබ පැතුම් ලැබීමේ දී ආචාරශීලී ස්වරයෙන් නිවැරදි ව ප්‍රතිචාර දක්වයි. | 3.2.1 නිවැරදි උච්චාරණය |
| | | 3.2.2 ආචාරශීලීබව |

**යෝජිත කාලය - පැය 01 මි.30**

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය**

**ක්‍රියාකාරකම 1**

**ඉගෙනුම් සම්පත්**
**බෝනික්කෙක්**

**පියවර 1**

- ගුරුවරයා පන්තියේ සිසුන්ට "**வணக்கம்**" (වණක්කම්) ලෙස ආචාර කරන්න.
- පන්තියේ සිසුන් ද "**வணக்கம்**" (වණක්කම්) ලෙස ප්‍රතිචාර දැක්වීමට යොමු කරන්න.
- සෑම අයකුගේ ම උපන් දිනයක දී අප විසින් සුබ පැතුම් ලබා දීම හොඳ පුරුද්දක් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- අප "සුබ උපන් දිනයක් වේවා" ලෙස සිංහල භාෂාවෙන් කරන සුබ පැතීම "**இனிய பிறந்தநாள் வாழ்த்துகள்.**" (ඉනිය පිරන්දනාළ් වාළ්ත්තුහළ්) ලෙස දෙමළ බසින් කළ හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න.
- මෙම වගන්තිය සිසුන් ලවා කිහිප වරක් උච්චාරණය කරවන්න.
- නිවැරදි උච්චාරණය හුරු කරවීම සඳහා වචනයෙන් වචනය වෙන් වශයෙන් උච්චාරණයට යොමු කරවන්න.

පියවර 2

- සුබ පැතීම සඳහා භාවිත කරන වැකි හොඳින් තහවුරු කර ගත් පසු ගුරුවරයා සිසුන්ට බෝනික්කකු පෙන්වා ඇයට සුදුසු නමක් සිසුන් ලවා යෝජනා කරගන්න.
- අද දිනට බෝනික්කාගේ උපන් දිනය යෙදී ඇති හෙයින් සියලු දෙනා එක් වී බෝනික්කාට සුබ පතමු යැයි පවසා දෙමළ බසින් බෝනික්කාට සුබ පතන්න.
- සිසුන් බෝනික්කා වෙත සුබ පැතීම කළ පසු, ගුරුවරයා ඒ සඳහා "**நன்றி**" (නන්රි) ලෙස ප්‍රතිචාර දක්වන්න.
- අපට යම් අයකු සුබ පැතීමක් කළ විට හෝ අප යම් උදවුවක්/උපකාරයක් කළ විට හෝ අප විසින් "ස්තුතියි" යැයි පැවසීම හොඳ පුරුද්දක් බව ද දෙමළ බසින් "**நன்றி**" (නන්රි) යන වචනයෙන් " ස්තුතියි" යන අදහස ප්‍රකාශ වන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනකු අතට බෝනික්කා වරින් වර ලබා දී අනෙක් සිසුන් ලවා බෝනික්කාට සුබ පැතීමටත් බෝනික්කා අත ඇති සිසුන් විසින් "**நன்றி**" (නන්රි) ලෙස ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.


## ක්‍රියාකාරකම 2

- සිසුන්ට රවුමක් ආකාරයට සිටගැනීමට සලස්වන්න. රවුමේ මැද ගුරුවරයා සිටගන්න.
- 'අද මගේ උපන් දිනය. හැම දෙනා ම මට සුබ පතන්න.' යනුවෙන් පවසා එක් එක් සිසුවාට දෙමළ බසින් උපන් දින සුබ පැතීම් සඳහා ඉගෙන ගත් වැකිය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා විසින් "**நன்றி**" (නන්රි) යනුවෙන් ප්‍රතිචාර දැක්වීම සිදු කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඉන් එක් සිසුවකුට කණ්ඩායමේ මැද සිට ගැනීමට සලස්වා අනෙක් සිසුන් ලවා එම සිසුවාහට උපන් දින සුබ පැතීම් සිදු කරන්න.
- සුබ පැතුම් ලබන සිසුවා "**நன்றி**" (නන්රි) යනුවෙන් ප්‍රතිචාර දැක්වීමට ද යොමු කරන්න.
- මේ ආකාරයට කණ්ඩායමේ සියලු සිසුන්ට රවුම මැදට පැමිණ සුබ පැතුම් ලැබීමට හා ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම 3

**ඉගෙනුම් සම්පත්**
**විවිධ වර්ණවලින් සකසා ගත් මල්**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිට ගැනීමට සලස්වන්න.
- පහත සඳහන් පරිදි සකසා ගත් වර්ණ සහිත මල් එක බැගින් සිසුන්ට ලබා දෙන්න.




- ගුරුවරයා රවුම මැද සිටගන්න.

- ඔබ ක්‍රියාකාරකම සිදු කරන දිනයේ හෝ ආසන්න දිනයක හෝ උපන් දිනය යෙදී ඇති සිසුවකු රවුම මැදට කැඳවන්න.
- ගුරුවරයා විසින් එක් වර්ණයක මල් අත ඇති සිසුන් ඉදිරියට කැඳවන්න.


- ඉන් පසු එක් එක් සිසුවා තමා අතැති මල රවුම මැද සිටින සිසුවා අතට දී "**இனிய பிறந்தநாள் வாழ்த்துகள்.**" (ඉනිය පිරන්දනාල් වාල්ත්තුහල්) යනුවෙන් සුබ පැතීමට යොමු කරන්න.
- මෙහි දී රවුම මැද සිටින සිසුවා විසින් "**நன்றி**" (නන්රි) යනුවෙන් ප්‍රතිචාර දැක්විය යුතු ය.
- නැවතත් සිසුන් රවුමේ තමන් සිටින තැනට යොමු කරන්න.
- නැවත වෙනත් වර්ණයක් පවසන්න.
- එම සිසුන්ට ද ඉහත ආකාරයට සුබ පැතීම සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට සියලු වර්ණ නම් කරමින් සියලු සිසුන් ක්‍රියාකාරකම සඳහා සම්බන්ධ කරගන්න.
- මෙහි දී සිසුන් "**இனிய பிறந்தநாள் வாழ்த்துகள்.**" හා "**நன்றி**" යන ප්‍රකාශ නිවැරදි ව උච්චාරණය කරන්නේ ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වන්න.

## ක්‍රියාකාරකම 4

- ක්‍රියාකාරකම 3 සඳහා යොදා ගත් මල් මෙම ක්‍රියාකාරකම සඳහා ද භාවිත කරන්න.
- එක් වර්ණයක මල් අතැති සිසුන් හා තවත් වර්ණයක මල් සහිත සිසුන් මුහුණට මුහුණ ලා සිටින සේ රූපයේ දැක්වෙන ආකාරයට පේළියට ස්ථානගත කරන්න.



නිල් වර්ණය සහිත
මල් අතැති සිසුන්



කොළ වර්ණය සහිත
මල් අතැති සිසුන්

උදා :

- නිල් වර්ණය සහිත මල් රැගත් සිසුන් විසින් කොළ වර්ණයේ මල් සහිත සිසුන්ට තමා ළඟ ඇති මල ලබා දී උපන්දින සුබ පැතීම් සිදු කිරීමටත් කොළ වර්ණය සහිත අයට ඒ සඳහා "**நன்றி**" (නන්රි) ලෙස ප්‍රතිචාර දැක්වීමටත් උපදෙස් ලබා දෙන්න.
- නැවත කොළ වර්ණය සහිත සිසුන් තමා අතැති කොළ පාට මල තමා ඉදිරියෙන් සිටින සිසුන්ට ලබා දී පෙර පරිදි ම සුබ පැතීම් සිදු කිරීමටත් අනෙක් කණ්ඩායමේ සිසුන් ප්‍රතිචාර දැක්වීමටත් යොමු කරන්න.
- පන්තියේ සියලු ම සිසුන් සහභාගි වන ආකාරයට මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.

## ක්‍රියාකාරකම 5

- උපන් දින සුබ පැතීම ගීතයකින් සිදු කිරීමට සූදානම් වන ලෙස සිසුන්ට පවසන්න.
- ආසන්න දිනයක දී උපන් දිනය සමරන හෝ උපන්දිනය සැමරූ හෝ සිසුවකු ඉදිරියට කැඳවන්න.

(**Happy birthday to you…..** ගීතයේ තනුවට අනුව මෙම ගීතය ගායනා කරන්න.)

| | |
|---|---|
| பிறந்தநாள் வாழ்த்துகள். | පිරන්ද නාළ් වාළ්ත්තුහළ් |
| பிறந்தநாள் வாழ்த்துகள். | පිරන්ද නාළ් වාළ්ත්තුහළ් |
| பிறந்தநாள் வாழ்த்துகள். | පිරන්ද නාළ් වාළ්ත්තුහළ් (සමන්/...) |
| இனிய பிறந்தநாள் வாழ்த்துகள். | ඉනිය පිරන්ද නාළ් වාළ්ත්තුහළ්... |

- සෑම සිසුවකුගේ ම උපන් දින යෙදෙන දවස්වල දී මේ ආකාරයට සිසුන් ලවා සුබ පැතීම් සිදු කරවන්න.
- ඉහත සඳහන් සෑම ක්‍රියාකාරකමක දී ම සිසුන් නිවැරදි උච්චාරණය සහිත ව සුබ පැතීම් හා ප්‍රතිචාර දැක්වීම් සිදු කරන්නේ ද යන්න පිළිබඳවත් සුබ පැතීමේ දී හා ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී වන්නේ ද යන්න පිළිබඳවත් සැලකිලිමත් වන්න.

## තක්සේරු නිර්ණායක

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායකය | ප්‍රවීණතාවට පැමිණ ඇත | ප්‍රවීණතාවට පැමිණ නැත |
|---|---|---|---|
| 3.1 උපන් දිනවල දී නිවැරදි ව ආචාරශීලී ස්වරයෙන් සුබ පතයි. | 3.1.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්ඡාරණය කරයි. | නිවැරදි ව උච්ඡාරණය නොකරයි. |
| | 3.1.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, උපන් දිනවල දී සුබ පතයි. | උපන් දිනවල දී සුබ පැතීමේ දී ආචාරශීලී බවක් නොපෙන්වයි. |
| 3.2 උපන්දින සුබ පැතුම් ලැබීමේ දී ආචාරශීලී ස්වරයෙන් නිවැරදි ව ප්‍රතිචාර දක්වයි. | 3.2.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්ඡාරණය කරයි. | නිවැරදි ව උච්ඡාරණය නොකරයි. |
| | 3.2.2 ආචාරශීලීබව | ආචාරශීලී ස්වරයෙන්, නිවැරදි ව ප්‍රතිචාර දක්වයි. | ආචාරශීලී ස්වරයෙන්, නිවැරදි ව ප්‍රතිචාර නොදක්වයි. |

# 04 ඉගෙනුම් පලය

## 1-5 තෙක් සංඛ්‍යා ගණන් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| ஒன்று (ඔන්රු) එක<br>இரண்டு (ඉරණ්ඩු) දෙක<br>மூன்று (මූන්රු) තුන<br>நான்கு (නාන්ගු) හතර<br>ஐந்து (ඓන්දු) පහ | ■ (4.1) 1 - 5 තෙක් සංඛ්‍යා නාම නිවැරදි ව පවසයි | 4.1.1 නිවැරදි උච්චාරණය |
| | ■ (4.2) 1 - 5 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි | 4.2.1 අනුපිළිවෙළ |
| | ■ (4.3) 1 - 5 තෙක් සංඛ්‍යා අතරින් අහඹු ලෙස කවර වුව ද සංඛ්‍යාවක් ප්‍රකාශ කරයි | 4.3.1 අහඹු ලෙස සංඛ්‍යා ප්‍රකාශනය |


**යෝජිත කාලය - පැය 02**

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය**

**ක්‍රියාකාරකම 1**

**ඉගෙනුම් සම්පත්**

1 - 5 තෙක් සංඛ්‍යා සහිත පුවරු




- 1 ඉලක්කම සහිත පුවරුව සිසුන්ට ඉදිරිපත් කොට එය, "ஒன்று" (ඔන්රු) ලෙස හඳුන්වා දෙන්න. සිසුන් ලවා "ஒன்று" (ඔන්රු) යන්න කිහිප වතාවක් කියවන්න.

- මේ අයුරින් 2,3,4,5 යන ඉලක්කම් සඳහා සකසා ගත් පුවරු ඉදිරිපත් කරන්න.
- සිසුන්ට ඉලක්කම්වලට යෙදන දෙමළ වචනය හුරු කරවන්න.

| | | |
|---|---|---|
| **ஒன்று** | ඔන්රු | 1 |
| **இரண்டு** | ඉරණ්ඩු | 2 |
| **மூன்று** | මූන්රු | 3 |
| **நான்கு** | නාන්ගු | 4 |
| **ஐந்து** | ඓන්දු | 5 |

- සෑම සිසුවකුට ම 1-5 තෙක් සංඛ්‍යා අනුපිළිවෙළින් ප්‍රකාශ කළ හැකි දැයි යන්න පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- සිසුන් සියලු දෙනා සමඟ මෙම ගීතය ගායනා කරන්න.

| | | |
|---|---|---|
| **ஒன்று ஒன்று லல்ல லா** | ඔන්රු ඔන්රු ලල්ල | ලා |
| **இரண்டு இரண்டு லல்ல லா** | ඉරණ්ඩු ඉරණ්ඩු ලල්ල | ලා |
| **மூன்று மூன்று லல்ல லா** | මූන්රු මූන්රු ලල්ල | ලා |
| **நான்கு ஐந்து லல்ல லா** | නාන්ගු ඓන්දු ලල්ල | ලා |

- ගීතය ගායනා කරන අතර අතැගිලි යොදා ගනිමින් එම අදාළ සංඛ්‍යා පෙන්වීමට ද සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම 2

### ඉගෙනුම් සම්පත්

**1 - 5 තෙක් සංඛ්‍යා සහිත කාඩ්පත් කට්ටල**
**කාඩ්පත් දැමීමට සුදුසු ප්‍රමාණයේ පෙට්ටි**

- 1 - 5 තෙක් සංඛ්‍යා සඳහන් කාඩ්පත් සහිත පෙට්ටි සිසු කණ්ඩායම්වලට ගැළපෙන ප්‍රමාණයක් සකස් කර ගන්න.
- එයින් එක් පෙට්ටියක් ගුරුවරයා විසින් ගෙන ඉන් එක කාඩ්පතක් ඉවතට ගන්න.
- එය පන්තියට පෙන්වා එහි ඇති ඉලක්කම කුමක් දැයි දෙමළ බසින් හඳුන්වන ලෙස සිසුන්ට පවසන්න.
- මේ ආකාරයට සියලු ම සංඛ්‍යා කාඩ් පත් පෙන්වා සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්න.
- කාඩ් පත්වල සඳහන් සංඛ්‍යා නාම සිසුන් හොඳින් අවබෝධ කර ගත් පසු සෑම කණ්ඩායමකට ම කාඩ් පත් සහිත පෙට්ටිය බැගින් ලබා දෙන්න.
- කණ්ඩායමේ එක් සිසුවකු පෙට්ටියෙන් වරකට එක් කාඩ් පත බැගින් පිටතට ගෙන එහි සඳහන් සංඛ්‍යාව දෙමළ බසින් ප්‍රකාශ කළ යුතු වේ.
- මේ ආකාරයට සියලු සංඛ්‍යා කාඩ් පත් එම සිසුවා විසින් ප්‍රකාශ කළ පසු නැවත ඒවා පෙට්ටියට දමා කණ්ඩායමේ වෙනත් සිසුවකු පෙර සිසුවා සිදු කළ ආකාරයට ම සංඛ්‍යා නාම ශබ්ද නඟා ප්‍රකාශ කළ යුතු ය.
- මේ ආකාරයට සෑම කණ්ඩායමක ම සෑම සිසුවකුට ම ඉහත ක්‍රියාකාරකමෙහි නිරත වීමට අවස්ථාව සලසන්න.

## ක්‍රියාකාරකම 3

### ඉගෙනුම් සම්පත්

**1 - 5 තෙක් සංඛ්‍යා මුහුණත්වල යෙදූ දාදු කැට**

- කණ්ඩායමකට එක බැගින් වන සේ දාදු කැට සකසා ගන්න.
- ඒවායේ එක් මුහුණතක එක ඉලක්කම බැගින් වන සේ 1 -5 තෙක් ඉලක්කම් සඳහන් කරන්න.

- සය වන මුහුණතෙහි 1 - 5 තෙක් සංඛ්‍යා අතරින් කවර හෝ සංඛ්‍යාවක් සඳහන් කරන්න.
- කණ්ඩායමේ සෑම සිසුවකුට ම දාදු කැටය උඩ දැමීමට අවස්ථාව ලබා දී ලැබෙන සංඛ්‍යාව දෙමළ බසින් කීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 4

- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.
- ඔවුන්ට නිදහසේ ඇවිදින ලෙස පවසන්න.
- "**ஒன்று**" (ඔන්රු) කී විට තනිවමත් "**இரண்டு**" (ඉරණ්ඩු) කී විට සිසුන් දෙදෙනකු ලෙසත් ආදි වශයෙන් ගුරුවරයා පවසන සංඛ්‍යාව අනුව සිසුන් එකතු වී අත් අල්ලා ගත යුතු බවට උපදෙස් ලබා දෙන්න. (1 - 5 තෙක් සංඛ්‍යා පමණක් මේ සඳහා යොදා ගන්න.)
- මුලින් සංඛ්‍යා අනුපිළිවෙළට පවසා සිසුන්ට සංඛ්‍යා හොඳින් අවබෝධ වූ පසු සංඛ්‍යා මාරු කරමින් විනෝදාත්මක ආකාරයෙන් ක්‍රියාකාරකම මෙහෙයවන්න.

## තක්සේරු නිර්ණායක

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක | ප්‍රවීනතාවට පැමිණ ඇත | | ප්‍රවීනතාවට පැමිණ නැත | |
|---|---|---|---|---|---|
| | | 4 මට්ටම | 3 මට්ටම | 2 මට්ටම | 1 මට්ටම |
| 4.1 1 - 5 තෙක් සංඛ්‍යා නාම නිවැරදි ව පවසයි. | 4.1.1 නිවැරදි උච්ඡාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | | නිවැරදි ව උච්චාරණය නොකරයි. | |
| 4.2 1 - 5 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි. | 4.2.1 අනුපිළිවෙළ | 1 - 5 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි. | 1 - 4 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි. | 1 - 3 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි. | සංඛ්‍යා නාම අනුපිළිවෙළින් ප්‍රකාශ නොකරයි. |
| 4.3 1 - 5 තෙක් සංඛ්‍යා අතරින් අහඹු ලෙස ඕනෑ ම සංඛ්‍යාවක් ප්‍රකාශ කරයි | 4.3.1 අහඹු ලෙස සංඛ්‍යා ප්‍රකාශනය | 1 - 5 තෙක් සංඛ්‍යා අතරින් අහඹු ලෙස විමසන ඕනෑ ම සංඛ්‍යාවක් ප්‍රකාශ කරයි. | 1 - 4 තෙක් සංඛ්‍යා අතරින් අහඹු ලෙස විමසන ඕනෑ ම සංඛ්‍යාවක් ප්‍රකාශ කරයි. | 1 - 3 තෙක් සංඛ්‍යා අතරින් අහඹු ලෙස විමසන ඕනෑ ම සංඛ්‍යාවක් ප්‍රකාශ කරයි. | අහඹු ලෙස විමසන කිසිදු සංඛ්‍යාවක් පිළිබඳ ප්‍රතිචාර නොදක්වයි. |

05
ඉගෙනුම් පලය

# අවස්ථෝචිත ඉල්ලීම් සහ ඉල්ලීම් සඳහා සවන් දී ප්‍රතිචාර දැක්වීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| **வாருங்கள்** (වාරුංගළ්) එන්න **போங்கள்** (පෝංගළ්) යන්න **ஓடுங்கள்** (ඕඩුංගළ්) දුවන්න **நில்லுங்கள்** (නිල්ලුංගළ්) නවතින්න **கை தட்டுங்கள்** (කෛ තට්ටුංගළ්) අත්පුඩි ගසන්න | 5.1 ඉල්ලීම් සඳහා නිවැරදි වචන භාවිත කරයි | 5.1.1 නිවැරදි ප්‍රකාශ |
| | 5.2 ඉල්ලීම් කිරීමේ දී වචන නිවැරදි ව උච්චාරණය කරයි. | 5.2.1 නිවැරදි උච්චාරණය |
| | 5.3 ඉල්ලීම් සඳහා සවන් දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි. | 5.3.1 නිවැරදි ප්‍රතිචාර |

**යෝජිත කාලය - පැය 02 මි.30**

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:**

### ක්‍රියාකාරකම 1

- ගුරුවරයා සිසුන් ඉදිරියට පැමිණ අංග චලනය සමග "එන්න" යනුවෙන් සිසුවකුට පවසන්න.
- නැවතත් අතින් සංඥා කරමින් "යන්න" යැයි පවසන්න.
- එම සිසුවාට ම පෙර පරිදි නැවත අතින් සංඥා කරමින් "**வாருங்கள்**" (වාරුංගළ්) ලෙස පවසන්න.
- නැවත සංඥා කරමින් "**போங்கள்**" (පෝංගළ්) ලෙස පවසන්න.
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනෙකුට විධාන ලබා දෙමින් වචන සිසුන්ට හොඳින් හුරු වන තුරු ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- පසු ව මෙම වචන සිසුන් ලවා ද උච්චාරණය කරවන්න.

### ක්‍රියාකාරකම 2

- දිනය තුළ හොඳ වැඩක් කළ සිසුවකු පන්තියේ ඉදිරියට කැඳවා ගුරුවරයා විසින් සිසුවාට ප්‍රශංසා, කර අනෙක් සිසුන්ට එම සිසුවා වෙනුවෙන් අත්පුඩි ගසන ලෙස පවසන්න.
- ගුරුවරයා ද අත්පුඩි ගසමින් පන්තියේ සිසුන්ට, " **கை தட்டுங்கள்** " (කෛ තට්ටුංගළ්) ලෙස පවසා ඔවුන් ද අත්පුඩි ගැසීමට යොමු කරන්න.
- මේ ආකාරයට හොඳ වැඩ කළ තවත් සිසුන් ඉදිරියට කැඳවා "**கை தட்டுங்கள்**" (කෛ තට්ටුංගළ්) යන වචනය තව දුරටත් අවබෝධ වන සේ ඔවුනට ද අත්පුඩි ගසන ලෙස පෙර ආකාරයට ම පවසන්න.
- එහි දී "**கை தட்டுங்கள்**" (කෛ තට්ටුංගළ්) යන වචනය භාවිත කරන්න.
- මෙම වචන සිසුන් ලවා ද උච්ඡාරණය කරවන්න.
- සිසුන් නිවැරදි ව උච්ඡාරණය කරන්නේද යන්න පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- මේ ආකාරයට හොඳ වැඩ කළ සිසුන් අගය කිරීමේ ක්‍රියාකාරකම වර්ෂය පුරා ම සිදු කරන්න.

## ක්‍රියාකාරකම 3


- සිසුන් රවුමක් ආකාරයට ස්ථානගත කරන්න.
- ගුරුවරයා රවුමේ මැද සිට පහත විධාන සිංහල භාෂාවෙන් ලබා දෙන්න.
  උදා: "දුවන්න" (සිසුන් රවුම වටේ දිව යා යුතු ය.)
  "නවතින්න"(සිසුන් රවුමේ ම නැවතිය යුතු ය.)
- අනතුරු ව "දුවන්න" වෙනුවට "**ஓடுங்கள்**" (ඕඩුංගළ්) ද,"නවතින්න" වෙනුවට "**நில்லுங்கள்**" (නිල්ලුංගළ්) ද යන දෙමළ වචන භාවිත කරමින් ළමයින් නැවත ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- සිසුන් කුඩා කණ්ඩායම් වශයෙන් වෙන් කර එක් කණ්ඩායමක් විධානය ලබා දෙන කණ්ඩායම වශයෙන් ද තවත් කණ්ඩායමක් එය ක්‍රියාවට නංවන කණ්ඩායම වශයෙන් ද නම් කරන්න. පසු ව ඔවුන්ට ද පෙර පරිදි ම ක්‍රියාකාරකමෙහි යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් වචන නිවැරදි ව උච්චාරණය කරන්නේ ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වන්න.

## ක්‍රියාකාරකම 4

- සිසුන් රවුමක් ආකාරයට ස්ථානගත කරන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා පෙර ක්‍රියාකාරකම් අංක 1,2,3,හි ඉගෙන ගත් විධාන භාවිත කරන්න.
- පහත සඳහන් ආකාරයේ ප්‍රකාශ ඉදිරිපත් කරන්න.
  උදා: සයිමන් කීවා "**கை தட்டுங்கள்**" (කෛ තට්ටුංගළ්)
- මෙසේ කියන විට සිසුන් ප්‍රතිචාර දැක්විය යුතු ය.
- "සයිමන්" යන නම හැර වෙනත් නම් යොදා ගනිමින් දෙන විධාන සඳහා සිසුන් ප්‍රතිචාර නො දැක්විය යුතු ය.
- වැරදි ප්‍රතිචාර දක්වන සිසුන් රවුමෙන් ඉවත් විය යුතු අතර, ඔවුන් අනෙකුත් සිසුහු නිවැරදි ව ක්‍රියාකාරකමෙහි නිරත වෙත් දැයි නිරීක්ෂණය කළ යුතු ය.

## ක්‍රියාකාරකම 5

- ඉහත 1 - 4 තෙක් ක්‍රියාකාරකම්වල දී ඉගෙන ගත් වචන තවදුරටත් තහවුරු කිරීම සඳහා මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.
- පන්තියේ සිසුන් එළිමහනට හෝ සුදුසු ස්ථානයකට හෝ කැඳවා ගෙන යන්න.
- පහත රූපයේ දැක්වෙන ආකාරයට රවුමක් ඇඳ එහි සෑම සිසුවකුට ම සිට ගෙන සිටිය හැකි ආකාරයෙන් ස්ථාන ලකුණු කරන්න.
- සිසුන් දෙදෙනෙකු අවම දුර මීටරයක් වත් විය යුතු ය.



- සිසුන්ට සලකුණු කරන ලද ස්ථානවල සිට ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- ගුරුවරයා විසින් "போங்கள்" (පෝංගළ්) ලෙස විධානයක් ලබා දෙන විට සිසුන් රවුම වටේ ඇවිද යා යුතු ය.
- නැවත ගුරුවරයා විසින් "நில்லுங்கள்" (නිල්ලුංගළ්) යන විධානය ලබා දෙන විට තමාට ඉදිරියෙන් ආසන්නයෙහි ම ඇති සලකුණ මත නැවතිය යුතු ය.
- නැවත ගුරුවරයා "ஓடுங்கள்" (ඕඩුංගළ්) ලෙස විධාන කළ යුතු අතර පෙර පරිදි ම සිසුන් රවුම වටා දිව යා යුතු ය.
- ගුරුවරයා "நில்லுங்கள்" (නිල්ලුංගළ්) ලෙස විධාන කළ විට සිසුන් තමාට ආසන්නයේ ඉදිරියෙන් ඇති ස්ථානයේ නැවතිය යුතු ය.
- "கை தட்டுங்கள்" (කෛ තට්ටුංගළ්) ලෙස විධාන කිරීමේ දී සිසුන් අත්පුඩි ගැසිය යුතු ය.
- "வாருங்கள்" (වාරුංගළ්) ලෙස පැවසීමේ දී සිසුන් ගුරුවරයා වෙත පැමිණිය යුතු අතර "போங்கள்" (පෝංගළ්) ලෙස පැවසීමේ දී නැවත රවුමේ පෙර සිටි ස්ථානයට යා යුතු ය.
- මේ ආකාරයට මෙම විධාන සුදුසු පරිදි මාරු කරමින් එම වචන හොඳින් අවබෝධ කර ගන්නා තෙක් සිසුන් ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
- ඔබගේ පන්තියේ සිටින සිසුන් ප්‍රමාණය අනුව සිසුන් කණ්ඩායම් කර වුව ද එම ක්‍රියාකාරකම සිදු කළ හැකි ය.


## ක්‍රියාකාරකම 6

**ඉගෙනුම් සම්පත්**

**අන්තර්ගතයෙහි සඳහන් ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වන ආකාරයේ රූප කාඩ්පත්**

- ඉගෙනුම් පලයේ අන්තර්ගතය යටතේ සඳහන් ඉල්ලීම් නිරූපණය වන ආකාරයේ රූප පහක් සිසුන්ට හොඳින් දර්ශනය වන ප්‍රමාණයෙන් සකස් කරගන්න.

උදා-



- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- ගුරුවරයා විසින් එක් රූපයක් එක් කණ්ඩායමක සිසුන්ට පෙන්වූ විට ඔවුන් ඉන් නිරූපණය වන ඉල්ලීම හඬ නගා නොනවත්වා ප්‍රකාශ කළ යුතු ය.
- ඒ අනුව අනෙක් කණ්ඩායමේ සිසුන් ඊට ප්‍රතිචාර දැක්විය යුතු ය.

  උදා:

  රූපයේ දැක්වෙන්නේ දුවන ළමයකුගේ රූපය නම් රවුමේ සිටින සිසුන් "ஓடுங்கள்" (ඕඩුංගළ්) ලෙස ශබ්ද නගා ප්‍රකාශ කරන අතර අනෙක් සිසුන් දිව යා යුතු ය.

- මේ ආකාරයට වරින් වර ගුරුවරයා අතෙහි ඇති කාඩ් පත් මාරු කරමින් සිසුන්ට පෙන්විය යුතු අතර ඊට අදාළ ඉල්ලීම එම සිසුන් හඬ නගා ප්‍රකාශ කළ යුතු ය. අනෙක් කණ්ඩායමේ සිසුන් ඊට අනුකූල ව ප්‍රතිචාර දැක්විය යුතු ය.
- මෙසේ කණ්ඩායම් දෙක මාරු කරමින් සියලු සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

## තක්සේරු නිර්ණායක

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත | ප්‍රණතාවට පැමිණ නැත |
|---|---|---|---|
| 5.1 ඉල්ලීම් සඳහා නිවැරදි වචන භාවිත කරයි. | 5.1.1 නිවැරදි ප්‍රකාශ | ඉල්ලීම් කිරීමේ දී නිවැරදි වචන භාවිත කරයි. | ඉල්ලීම් කිරීමේ දී නිවැරදි වචන භාවිත නොකරයි. |
| 5.2 ඉල්ලීම් කිරීමේ දී වචන නිවැරදි ව උච්චාරණය කරයි. | 5.2.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | නිවැරදි ව උච්චාරණය නොකරයි. |
| 5.3 ඉල්ලීම් සඳහා සවන් දී නිවැරදිව ප්‍රතිචාර දක්වයි. | 5.3.1 නිවැරදි ප්‍රතිචාර | නිවැරදි ප්‍රතිචාර දක්වයි. | නිවැරදි ප්‍රතිචාර නොදක්වයි. |

# ගුරු මාර්ගෝපදේශය

**(මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, සෞන්දර්ය අධ්‍යාපනය,**

**ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, දෙවන ජාතික භාෂාව)**

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

## 1 ශ්‍රේණිය

## තුන්වන වාරය

# 9. තේමාව - අපේ රටේ සම්පත්

අපේ රටේ සම්පත් තේමාව තුළින් විවිධ පළාත් තුළ ඇති සම්පත් හඳුනා ගැනීම, හා විවිධ සම්පත් පිළිබඳ අවබෝධය ලබා ගනිමින්, ඒ තුළින් මිනිසුන් ජීවිකාව සකසා ගන්නා ආකාරයත්, නිර්මාණශීලී ව සම්පත් යොදා ගනිමින් නිපදවනු ලබන භාණ්ඩ හා සේවා පිළිබඳ ව අවබෝධය ලබාගැනීමත්, අපේක්ෂිත ය. මෙම තේමාව තුළින් සැම ප්‍රදේශයකට ම සුවිශේෂී වන සම්පත් යොදා ගනිමින්, තේමාව සංවර්ධනය කිරීමේ නිදහස ද ගුරුවරයාට තිබේ. තව ද, මෙම තේමාව තුළින් තමා තුළ සැඟවී ඇති නිසඟ කුසලතා හඳුනා ගනිමින්, නිර්මාණශීලී හා ඵලදායී පුරවැසියෙකු ලෙස කටයුතු කරමින් දේශීය කර්මාන්ත කෙරෙහි සුභවාදී ආකල්ප ඇති කිරීම ද අපේක්ෂිත ය.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 පන්ති කාමරය හා අවට පරිසරයේ ඇති සම්පත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | ◆ පන්ති කාමරය හා අවට පරිසරයේ ඇති භාණ්ඩ හා උපකරණ<br>° සකස් කිරීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය<br>° ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව පරිහරණය | 1.1 පන්ති කාමරය හා අවට පරිසරයේ භාණ්ඩ /උපකරණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | 1.2 භාණ්ඩ හා උපකරණ සාදා ඇති විවිධ අමුද්‍රව්‍ය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 1.2.1 නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීම |
| | | 1.3 දෙන ලද අමුද්‍රව්‍යයකින් සකසා ඇති භාණ්ඩයක් / උපකරණයක් සොයාගෙන ප්‍රකාශ කරයි. | 1.3.1 සොයාගෙන ප්‍රකාශ කිරීම |
| | | 1.4 පන්ති කාමරයේ හා අවට පරිසරයේ ඇති භාණ්ඩ හා උපකරණ ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව පරිහරණය කරයි. | 1.4.1 ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව පරිහරණය කිරීම |
| 2 දේශීය ව නිෂ්පාදනය කරන භාණ්ඩ කෙරෙහි ප්‍රමුඛත්වය ප්‍රදර්ශනය කරයි. | ◆ දේශීය ව නිශ්පාදනය කරන භාණ්ඩ හඳුනා ගැනීම | 2.1 දේශීය ව නිශ්පාදනය කරන භාණ්ඩ කෙරෙහි ප්‍රමුඛතාවය දක්වයි. | 2.1.1 ප්‍රමුඛතාවය දැක්වීම |

## ක්‍රියාකාරකම් 1

**පියවර 1**

- පහත උදාහරණයේ දක්වා ඇති ආකාරයේ කවියක් ගායනා කරමින් පාඩමට පිවිසෙන්න.

  මල් බඳුනේ සුවඳ හමයි  
  පොත් රාක්කේ පිළිවෙළයි  
  පුංචි කොස්ස පිරිසිදු කර  
  අපෙ පන්තිය හැඩ කරයි

- කවියේ කියැවෙන භාණ්ඩ හා උපකරණ ගැන සිසුන් සමග කතා කරන්න. පන්ති කාමරයේ හා අවට ඇති, මිනිසුන් විසින් සාදන ලද එවැනි තවත් භාණ්ඩ හා උපකරණ හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒවා මිනිසුන් විසින් සාදා ගෙන ඇත්තේ කුමන කාර්යයක් කිරීමට දැයි විමසන්න. ඒවායින් අපි ලබා ගන්නා ප්‍රයෝජන පිළිබඳ කතා බහ කරන්න.

- ඒ පිළිබඳ පූර්ව සූදානම් කරගත් වීඩියෝ දර්ශන, පින්තූර ආදිය සිසුන්ට පෙන්වන්න.
- සිසුන් හඳුනා ගත් භාණ්ඩය/ උපකරණය කඩදාසියක ඇඳීමට පවසන්න.
- සියලුදෙනා ම අවසන් කළ පසු පන්තිය ඉදිරියට පැමිණ තමා අඳින ලද භාණ්ඩය/ උපකරණය ගැන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඉතාමත් ආදරණීය ලෙස ප්‍රශ්න විමසමින් තොරතුරු ලබා ගන්න.

  උදා.: මම ඇන්දේ කොස්සක්.
  කොස්සට දිග ලී මිටක් තියෙනවා.
  කොහු දමා හදලා තිබෙනවා.
- එම භාණ්ඩය/ උපකරණය සාදා ඇති දේවල් පිළිබඳ සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න.

  උදා
  කොහු ලැබිලා තිබෙන්නේ කොහෙන් ද?
  සාදා තිබෙන්නේ කොහොම ද? ආදිය පිළිබඳ තොරතුරු සිසුන් දන්නා දේ ඇසුරෙන් ලබා ගන්න. සිසු අදහස් නිවැරදි ව පෝෂණය කරන්න.
- මේ ආකාරයට සිසුන් අඳින ලද භාණ්ඩ /උපකරණ පිළිබඳ ව කතාබහ කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 01 සඳහා සිසුන් යොමුකරන්න.

## ක්‍රියාකාරකම් 2

**පියවර 1**

- පන්ති කාමරයේ හා අවට නිතර දක්නට ලැබෙන භාණ්ඩ හා උපකරණ සාදා ඇති අමුද්‍රව්‍යවලින් සාම්පලය බැගින් පන්ති කාමරයට සපයා ගන්න.

  උදා
  ලී කැබැල්ලක්, කොහු, මැටි, නූල් වැනි
- සිසුන් කැමති අමුද්‍රව්‍යයක් තෝරා ගැනීමට ඉඩ දෙන්න.
- එය ස්පර්ශ කර බලමින් එහි ස්වභාවය නිරීක්ෂණය කර අදහස් පැවසීමට අවස්ථාව ලබාදෙන්න.

  උදා
  එම ද්‍රව්‍ය අතට බර ද? සැහැල්ලු ද?
  රළුද? ගොරෝසුද?
- එම අමුද්‍රව්‍යයෙන් සාදා ඇති පන්ති කාමරයේ හෝ අවට ඇති වෙනත් භාණ්ඩ/ උපකරණ මොනවා දැයි විමසන්න.
- සමහර භාණ්ඩ/ උපකරණ සෑදීමේදී පරිසරයට හානි වන බැවින් සාදා ඇති භාණ්ඩවලට හානි නොකර ඉතා ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව භාවිත කළ යුතු බව පෙන්වා දෙන්න. මේ සඳහා සුදුසු වීඩියෝ දර්ශන යොදා ගන්න.

  උදා
  ලී බඩු සෑදීම සඳහා ගස් කැපීමට සිදු වන බව
  ගසක් කැපීමට සිදු වුවහොත් ඒ වෙනුවෙන් පැළ දෙකක්වත් සිටුවිය යුතු බව පෙන්වා දෙන්න.
- පන්තිය හා අවට ඇති භාණ්ඩ / උපකරණ සාදා ඇති අමු ද්‍රව්‍ය අනුව ඒවා ශ්‍රී ලංකාවේ සාදනවා ද නැතිනම් වෙනත් රටකින් ගෙන එනවාදැයි අනුමාන කර පැවසීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදා
  කොස්ස - ලී, කොහු
  වතුර බෝතලය - ප්ලාස්ටික්
- සිසුන් අදහස් ප්‍රකාශ කිරීමෙන් අනතුරු ව ඒ පිළිබඳ නිවැරදි තොරතුරු ලබා දෙන්න.
- එම භාණ්ඩ හා උපකරණ සාදා ඇති ද්‍රව්‍ය අපේ රටේ තියෙනවා ද? (ස්වභාවිකව) සාදනවා ද? නැතිනම් වෙනත් රටකින් ගෙන එනවා ද? විමසමින් වෙනත් රටකින් ගෙන එන ද්‍රව්‍ය හා අපේ රටේ සාදා ඇති ද්‍රව්‍ය සසඳමින් නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- හැකි සෑම විට ම අපේ රටේ සෑදීමට හැකියාව ඇති දේවල් අපේ රටේ ම සෑදිය යුතු බව පෙන්වා දෙන්න.

- එහි වැදගත්කම සිසු මට්ටමට ගැළපෙන අයුරින් සරල ව කතා කර කලින් අවධානය යොමු කළ භාණ්ඩ හා උපකරණ මෙන් විශිෂ්ටත්වයේ නිශ්පාදන අපේ රටේ ද නිපදවන බව ද පෙන්වා දෙන්න.
- නිවසේ හෝ සමීප ස්ථානයක ද එවැනි සරල නිශ්පාදන කටයුතු සිදු කරන්නේ නම් එය අගය කරන්න.
- වෙළඳපොළෙන් භාණ්ඩයක්/ උපකරණයක් මිලට ගැනීමේදී ද හැකි සෑම විට ම අපේ රටේ දේවල් තෝරා ගත යුතු බව පෙන්වා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරක 02 සඳහා සිසුන් යොමුකරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 භාණ්ඩ හා උපකරණ අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරයි. | ◆ භාණ්ඩ හා උපකරණ අරපිරිමැස්මෙන් යුතු ව භාවිතය | 3.1 තමන් පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරයි. | 3.1.1 අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කිරීම. |

## ක්‍රියාකාරකම් 3

- සිසුන් පසුගිය කාලය තුළ භාවිත කර ඉවත ලන දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

    උදා

    සෙල්ලම් බඩු, වතුර බෝතල්, පැන්සල් උල් කරන උපකරණ වැනි
- එම ද්‍රව්‍ය ඉවත ලීමට හේතු පිළිබඳ ව සිසුන් සමග කතාබහ කරන්න.

    උදා

    සෙල්ලම් බඩු - කැඩී බිඳී යාම

    වතුර බෝතල් - බිඳී යාම වැනි
- මෙවැනි දේවලින් උපරිම ප්‍රයෝජනයක් නොගෙන ඉවත ලීම නිසා අපට අත් වන අවාසි පිළිබඳ ව මෙම සාකච්ඡාවේදී සිසුන් දැනුවත් කරන්න.
- එසේ ම පරිහරණය කරන දේ නිවැරදි ව හා ආරක්ෂාකාරී ව පරිහරණය කිරීමේ වැදගත්කම ද සිසුන්ට අවධාරණය කරන්න.

    උදා

    පැන්සල - අතින් ඇල්ලීමට හැකි උපරිමය දක්වා පාවිච්චි කිරීම

    තමා සතුව පොත්පත්, වතුර බෝතල්, පාසල් බෑග්, සපත්තු, මකන, කතුරු ආදිය නාස්තියෙන් තොර ව උපරිම අයුරින් පරිහරණය කිරීම... වැනි
- අරපිරිමැස්මෙන් යුතු ව කටයුතු කිරීමට පෙළඹීමක් ඇති වන අයුරින් තම තමන් පරිහරණය කරන දේ නිවැරදි ව පරිහරණය කරන සිසුන් අගය කරන්න.
- එයින් වඩා වැදගත් දෙයක් සිදු කිරීමට මුදල් ඉතුරු වීම හා පරිසරයට හානියක් නොවීම පිළිබඳ අවධාරණය කරන්න.

උදා

කඩදාසි ආදිය සෑදීම සඳහා දැව යොදා ගන්නා බව, ඒ සඳහා ගස් කැපීමට සිදුවන බව, ශාක අපට මෙන් ම සතුන්ට ද ආහාර, වාතය හා සිසිලස ලබාදෙන බව, එම නිසා කඩදාසි අපතේ නොයැවිය යුතු බව

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 මැටි ආශ්‍රිත භාණ්ඩයක් සකස් කරන ආකාරය හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ මැටි ආශ්‍රිත භාණ්ඩයක් සකස් කිරීමේ මූලික පියවර නිර්මාණය කිරීම | 4.1 මැටි ආශ්‍රිත භාණ්ඩයක් සකස් කිරීමේ පියවර කිහිපයක් ප්‍රකාශ කරයි | 4.1.1 පියවර ප්‍රකාශ කිරීම |
| | | 4.2 මැටි යොදාගනිමින් නිර්මාණයක් සිදු කර අදහස් ප්‍රකාශ කරයි | 4.2.1 නිර්මාණයක් සිදු කිරීම |

## ක්‍රියාකාරකම් 4

- අප සිටින මහ පොළොව අපට මහත් සම්පතක් වන අයුරු දැක්වෙන පින්තූර/වීඩියෝ දර්ශන ඉදිරිපත් කරමින් සිසුන් සමග කතා කරන්න.

  උදා

  ආහාර බෝග වගා කළ හැකි වීම
  මැණික් වැනි අගනා සම්පත් තිබීම
  මැටිවලින් අලංකාර හා ප්‍රයෝජනවත් නිර්මාණ සැදිය හැකි වීම
- මැටි කර්මාන්තය සිදු කරන ස්ථානයක් නැරඹීමට සිසුන් රැගෙන යන්න.
- එසේ රැගෙන යාමට නොහැකිනම් පමණක් මැටි ආශ්‍රිත භාණ්ඩ සකස් කිරීම පිළිබඳ වීඩියෝ වැඩසටහනක් සිසුන්ට පෙන්වීමට යොමු කරන්න.
- එහිදී පහත කරුණු නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව සලසන්න.

  මැටි අනන අයුරු
  සකපෝරුව යොදා ගනිමින් භාණ්ඩ සාදන අයුරු
  සකපෝරුවෙන් භාණ්ඩ සැකසීමේදී ඇඟිලි හසුරවන ආකාරය
  ඒවා වියළීමට ලක් කරන අයුරු
  විවිධ හැඩ රටා යොදමින් සකස් කළ භාණ්ඩ අලංකාර කර ගන්නා අයුරු
  කෙරෙහි අවධානය යොමුවන කතා බහකට යොමු වන්න.
- මැටි කර්මාන්තය පිළිබඳ සිසු කුතුහලය වඩවන ආකාරයෙන් සැබෑ අද්දැකීම් සහ වීඩියෝ දර්ශන යොදා ගනිමින් තොරතුරු ඉදිරිපත් කරන්න.
- ප්ලාස්ටික් ඇලුමිනියම් වැනි භාජනවලට වඩා **ආහාර පිසිමේදී මැටි භාජනවල ඇති ශරීර සෞඛ්‍යයට හිතකර** බව පහදන්න.

  එහිදී, ආහාර පානවලට විස එක් නොවන බව
  ජලයේ සිසිලස වැඩිවන බව ........ආදිය අවධාරනය කරන්න.
- මැටි ආශ්‍රිත භාණ්ඩ අපනයනය කරන නවීන ශ්‍රී ලංකීය කර්මාන්ත ශාලාවක වීඩියෝ දර්ශන පෙන්වන්න.
- සම්ප්‍රදායික මැටි කර්මාන්ත වර්තමානය මේ වන විට වෙනස් වී ඇති ආකාරය පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව සලසන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර සිසු කණ්ඩායම්වලට ප්‍රමාණවත් පරිදි මැටි සපයා ගන්න. එම මැටිවලින් පහන්, බඳුන්, රූප ආදී සිසුන් කැමති දෙයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිර්මාණ පිළිබඳ ප්‍රශ්න විමසමින් ඔවුන් උනන්දු කරවන්න.
- ඒවා වියළීමට තබා සිදුවන වෙනස්කම් නිරීක්ෂණයට ලක් කරන්න එසේ වන්නේ ඇයි දැයි විමසන්න.
- සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. හැකි පරිදි වර්ණ රටා දමමින් අලංකාර කර ගැනීමට ද අවස්ථාව දෙන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. අගය කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 03 සඳහා සිසුන් යොමුකරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 භාණ්ඩ/උපකරණ ආශ්‍රිත වින්දනාත්මක ප්‍රකාශන ඉදිරිපත් කරයි. | ◆ භාණ්ඩ/උපකරණ ආශ්‍රිත<br>° කවි/ගීත<br>° රංගන | 5.1 භාණ්ඩ/උපකරණ ආශ්‍රිත කවි/ගීත තාලානුකූල ව ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | 5.1.1 ගායනා කිරීම<br>5.1.2 රංගන ඉදිරිපත් කිරීම |

## ක්‍රියාකාරකම් 5

- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- කළගෙඩි නැටුමේ කවි ගායනා කරමින් රංගන දැක්වීමට සිසුන් යොමු කරන්න.

කළගෙඩි නැටුම් කවි

අහසට පිඹිනා එරං කළේ යා
පොළවට පිඹිනා භූමි කළේ යා
රන්මසු දහසක් වටින කළේ යා
නොබිඳින් නැනෝ මගේ කළේ යා

- භාණ්ඩ/උපකරණ ගැන කියැවෙන වෙනත් කවි/ගීත ගායනා කරමින් වින්දනයක් ලැබීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6 භාණ්ඩ/උපකරණ ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදෙමින් ශාරීරික යෝග්‍යතාවය ප්‍රදර්ශනය කරයි. | ◆ සෙල්ලම් මිදුලේ උපකරණ ආශ්‍රිත ක්‍රීඩා<br>◆ භාණ්ඩ/උපකරණ ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩා | 6.1 භාණ්ඩ/උපකරණ ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදීමෙන් නම්‍යතාවය ප්‍රදර්ශනය කරයි. | 6.1.1 නම්‍යතාවය ප්‍රදර්ශනය කිරීම |


## ක්‍රියාකාරකම් 6

**පියවර 01**

- භාණ්ඩ/උපකරණ ආශ්‍රිත පහත සඳහන් නිර්මාණාත්මක ක්‍රීඩවල ද සිසුන් යොමුකරන්න.
- සිසුන් සෙල්ලම් මිදුලට රැගෙන යන්න.
- සෙල්ලම් මිදුලෙහි ඇති උපකරණ භාවිත කරමින් වේගය සහ නම්‍යතාවය දියුණු වන පරිදි ක්‍රීඩා කිරීමට පළමු ව යොමු කරන්න.

**පියවර 02**

- මේ සඳහා මීටර් 2ක් පමණ විෂ්කම්භය ඇති කවයක් තුළ විවිධ බෝල/වෙනත් භාණ්ඩ හා උපකරණ තැනින් තැන තබන්න.
- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් කිහිපයකට බෙදා කවය දෙපස මීටර් 6ක් පමණ ඈතින් පෙළට සිටුවන්න.
- ගුරුවරයාගේ සංඥාවට අනුව සිසු කණ්ඩායම්වලින් වරකට එක් සිසුවා බැගින් කවය තුළට දුව ගොස් එක් භාණ්ඩයක් /උපකරණයක් රැගෙනවිත් තම පේළියේ පිටුපසින් හිඳ ගැනීමට පවසන්න.
- මෙලෙස ඉක්මනින් සියලු ම සිසුන් භාණ්ඩයක් /උපකරණයක් ගෙන හිඳගත් කණ්ඩායම් ජයග්‍රහණය හිමිවන බව පවසන්න.
- ජය ගත් කණ්ඩාවම මෙන්ම සහභාගී වූ සියලු ම සිසුන්ට අත්පොළොසන්දී අගය කරන්න.



## තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි.අ. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථය |
|---|---|---|---|
| 1.1 පන්ති කාමරය හා අවට පරිසරයේ භාණ්ඩ / උපකරණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 | ◆ පන්ති කාමරය හා අවට පරිසරයේ භාණ්ඩ / උපකරණ 4-5 ක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ පන්ති කාමරය හා අවට පරිසරයේ භාණ්ඩ /උපකරණයක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. |
| 1.2 භාණ්ඩ / උපකරණ සාදා ඇති අමුද්‍රව්‍ය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | 1.2.1 | ◆ භාණ්ඩ /උපකරණ සාදා ඇති අමුද්‍රව්‍ය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | ◆ භාණ්ඩ /උපකරණ සාදා ඇති අමුද්‍රව්‍ය නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 1.3 දෙන ලද අමුද්‍රව්‍යයකින් සකසා ඇති භාණ්ඩයක් / උපකරණයක් සොයා ප්‍රකාශ කරයි. | 1.3.1 | ◆ දෙන ලද අමුද්‍රව්‍ය වර්ග සකසා ඇති භාණ්ඩයක් / උපකරණයක් සොයා ප්‍රකාශ කරයි. | ◆ දෙන ලද අමුද්‍රව්‍යයකින් සකසා ඇති භාණ්ඩයක් / උපකරණයක් සොයා ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 1.4 පන්ති කාමරයේ හා අවට පරිසරයේ ඇති භාණ්ඩ හා උපකරණ ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව පරිහරණය කරයි. | 1.4.1 | ◆ පන්ති කාමරයේ හා අවට පරිසරයේ ඇති භාණ්ඩ හා උපකරණ ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව පරිහරණය කරයි. | ◆ පන්ති කාමරයේ හා අවට පරිසරයේ ඇති භාණ්ඩ හා උපකරණ ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් නොවන අයුරින් පරිහරණය කරයි. |
| 2.1 දේශිය ව නිෂ්පාදනය කරන භාණ්ඩ කෙරෙහි ප්‍රමුඛතාවය දක්වයි. | 2.1.1 | ◆ දේශිය ව නිෂ්පාදනය කරන භාණ්ඩ කෙරෙහි ප්‍රමුඛතාවය දක්වයි | ◆ දේශිය ව නිෂ්පාදනය කරන භාණ්ඩ කෙරෙහි ප්‍රමුඛතාවය නොදක්වයි. |
| 3.1 තමන් පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරයි. | 3.1.1 | ◆ තමන් පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරයි. | ◆ තමන් පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ අරපිරිමැස්මෙන් තොර ව භාවිත කරයි. |
| 4.1 මැටි ආශ්‍රිත භාණඩයක් සකස්කිරීමේ මූලික පියවර කිහිපයක් ප්‍රකාශ කරයි | 4.1.1 | ◆ මැටි ආශ්‍රිත භාණඩයක් සකස්කිරීමේ මූලික පියවර ප්‍රකාශ කරයි | ◆ මැටි ආශ්‍රිත භාණ්ඩයක් සකස් කිරීමේ පියවර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 5.1 භාණ්ඩ/උපකරණ ආශ්‍රිත කවි/ගීත තාලානුකූල ව ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | 5.1.1 | ◆ භාණ්ඩ/උපකරණ ආශ්‍රිත කවි/ගීත තාලානුකූල ව ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | ◆ භාණ්ඩ/උපකරණ ආශ්‍රිත කවි/ගීත තාලානුකූල ව ගායනා කිරීමේ /රංගන ඉදිරිපත් කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 6.1 භාණ්ඩ/උපකරණ ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදීමෙන් නම්‍යතාවය ප්‍රදර්ශනය කරයි. | 6.1.1 | ◆ භාණ්ඩ/උපකරණ ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදීමෙන් නම්‍යතාවය ප්‍රදර්ශනය කරයි. | ◆ භාණ්ඩ/උපකරණ ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදීමෙන් නම්‍යතාවයේ දුෂ්කරතා ප්‍රදර්ශනය කරයි. |

# 10. තේමාව - ගමනාගමනය





ගමන් බිමන් යැමේදී මාර්ග නීතිරීතිවලට අනුගත ව, තමන්ගේ හා අන්‍යයන්ගේ ද ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කටයුතු කරන ආකාරය ක්‍රියාකාරකම් පාදක ව සිදු කරමින් සිසුන්ට අද්දැකීම් ලබාදීම හා පොදු වාහන, පොදු මාර්ග ආරක්ෂා කරමින් ඒවායෙහි වටිනාකම පිළිබඳ ව දැනුවත් වෙමින් ඒවා ආරක්ෂාකාරී ව හා ඵලදායී ලෙස පරිහරණය කිරීමට මූලික හුරුකම් ලබා දීම මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 පන්තියේ සිසුන් පාසලට පැමිණෙන ආකාර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | ◆ පන්තියේ සිසුන් පාසලට පැමිණෙන ආකාර | 1.1 පාසලට පැමිණෙන ආකාර හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 1

පියවර 1

- සිසුන් සියලු දෙනා සුදුසු පරිදි එළිමහනකට රැගෙන එන්න.
- සැම සිසුවෙකුට ම ඇලවිය හැකි සිනා මුහුණක පින්තූරයක් ලබාදෙන්න.
- "අපි දූන් පුංචි ක්‍රියාකාරකමක් කරමු" යන්න පවසා පහත පරිදි වගුවක් සියලු ම සිසුන්ට පෙනෙන පරිදි පුවරුවක සවිකර ගන්න. සිසුන් ජීවත් වෙන පරිසරය අනුව බහුලව ම පවතින ගමනාගමන ක්‍රමයන් මේ සඳහා උපයෝගී කර ගන්න.

| පාසලට යන එන ආකාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| යතුරු පැදිය  | ත්‍රී වීලය  | පා ගමනින්  | වෑන් රථය  | බස් රථය  | කෝච්චිය  | කාරය  |

- එම වගුවේ දක්වෙන තීරු දෙස හොඳින් බලා එහි දක්වෙන ක්‍රම අතරින් තමන් පාසලට පැමිණෙන ආකාරය දක්වා ඇති තීරුවේ හිනා මූණ ඇලවීමට පවසන්න.
- එම තීරුවල අලවා ඇති හිනා මූණු දෙස බලා පන්තියේ සිසුන් පාසල් පැමිණෙන ආකාර ගැන කතා කරන්න.
- මෙහි දක්වා ඇති අවස්ථාවන්ට වෙනස් අයුරකින් පාසල් පැමිණෙන්නේ නම් ඒ පිළිබඳ ව කතා කරන්න.

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
- සිසුන් පාසල් පැමිණෙන ක්‍රම අතරින් ඒ ඒ කණ්ඩායමට කැමති ක්‍රමයක් තෝරා ගෙන සාමූහික ව රඟ දක්වීමට අවස්ථාව දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම අගය කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 මිනිසුන් ගමන් බිමන් යන ක්‍රම ඉදිරිපත් කරයි. | ◆ ගමන බිමන් යන ක්‍රම<br>° පයින්<br>° වාහන -<br>° (ගොඩබිම/ජලය/ අහස) | 2.1 වාහන ගමන් කරන ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 2.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 2

පියවර 1

- සිසුන් පන්ති කාමරයෙන් පිටතට රැගෙන යන්න.
- පහත දැක්වෙන අවස්ථා නිර්මාණශීලී ව රංගන අවස්ථා ලෙස ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
- සෙල්ලම් මිදුලේ ඇති සමබර දණ්ඩ හෝ එසේ නොමැති නම් පොළවේ දිග ඉරක් ඇඳ මේ සඳහා යොදා ගන්න.

**ඒදණ්ඩකින් එගොඩ විම**

අපි දැන් ඇළක් හරහා තිබෙන ඒදණ්ඩකින් එගොඩ වෙන්නයි හදන්නේ.

සමබර දණ්ඩ පෙන්වා "ඒ තමයි ඇළ හරහා තිබෙන ඒදණ්ඩ. ප්‍රවේශමෙන් එගොඩට යන්න ඕනෑ. වතුරට වැටුණොත් අනතුරු සිදු වෙනවා" යයි පවසමින් ගමන් කිරීමට උපදෙස් දෙන්න. හැමෝම එගොඩට ගොස් අත්පුඩියක් ගසන්න.

**ගඟෙන් එගොඩ වීම**

"දැන් අර තිබෙන ලොකු ගඟෙන් එගොඩට යාමටයි අපි හදන්නේ." ගුරුවරයා පළමු ව හබල අතට ගෙන තදින් දැතින් ම හබල ගෙන ඔරුව පැද පෙන්වන්න. "දැන් හැමෝම ඔරුවලට නඟින්න." හබල තදින් අල්ලා ඔරුව පැදවීමට සිසුන්ට උපදෙස් දෙන්න. හැමෝම යම් සීමාවකට පැමිණීමෙන් පසු අත්පුඩි ගසන්න. "දැන් දුම්රිය නැවතුම් පොළට යාම සඳහා බයිසිකල්වලට තනියම නගින්න. අපි දැන් ප්‍රවේශමෙන් පැදගෙන යමු." සිසුන්ට ටික දුරක් ගමන් කිරීමට උපදෙස් දී දෙන ලද සංඥාවකට අනුව බයිසිකලය නවත්වා දුම්රියක් සේ නැවත පේළියට සකස් වන ලෙස උපදෙස් දෙන්න.

දුම්රියක් පදවාගෙන යාම සහ දුම්රියේ මඟීන් ලෙස ගමන් කිරීම

- දුම්රිය පොදු වාහනයක් බැවින් දුම්රියට නැගීමට පෙර ටිකට් ගත යුතු බව පැහැදිලි කර දෙන්න.
- සිසුන් එකිනෙකාගේ කර මත අත් තබා හූ.....හොස්....හොස්.... හඬ නගිමින් කෝච්චිය ඉදිරියට ගමන් ගන්නා ලෙස ගුරුවරයාට උපදෙස් දෙන්න.
- ගුරුවරයා දෙන ලද සංඥාවකට අනුව කෝච්චිය නවත්වා සිසුන්ට ගුරුවරයා දෙසට පැමිණීමට උපදෙස් දෙන්න.

  බස් රථය පදවාගෙන යාම සහ බස් රථයේ මඟීන් ලෙස ගමන් කිරීම
- දැන් අපි ගුවන් තොටුපලට යාම සඳහා අර බස් රථයට නගින්න ඕනෑ. හැමෝම බස් රථයට නැගලා ටිකට් ගන්න ඕනෑ.
- දැන් අපි බස් රථය පදවා ගෙන ගුවන් තොටුපලට යමු. ගුරුවරයා දෙනු ලබන සංඥාවකට අනුව බස් රථය පණගන්වාගෙන නළා හඬ නංවමින් සිසුන්ට ඉදිරියට ගමන් කිරීමට උපදෙස් දෙන්න. ගුවන් නියමුවකු ලෙස පියාසර කරවීම
- ගුවන්යානයේ ගමන් කිරීමට පෙර ටිකට්පතක් ලබාගත යුතු බව (මුලින් වෙන් කරගත යුතු බව) සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- දැන් හැමෝම ගුවන්යානාවක් වෙලා අහසේ නිදහසේ පියාසර කරන ලෙසට ගුරුවරයා උපදෙස් දෙන්න.
- ගුරුවරයා දෙන ලද සංඥාවකට අනුව සිසුන්ට පේළියට පන්තියට යාමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 01 සඳහා සිසුන් යොමුකරන්න.

## ක්‍රියාකාරකම් 3

පියවර 1

- පාසල් භූමියේ ඇති විවිධ පාරවල් ඔස්සේ සිසුන් කැඳවා ගෙන යන්න. අවට පරිසරයේ සුන්දරත්වය විඳිමින්, ඇවිදන මාර්ගය හා ඒ අවට හොඳින් නිරීක්ෂණය කරමින් සිසුන් කැඳවා ගෙන යන්න.
- පයින් ගමන් කිරීමට සිදු වන රූප රාමු කිහිපයක් සූදානම් කර ගන්න.

    උදා

    වෙල්යායක්, අඩිපාරක්, ඒදඬු ආදී...
- එම රූප රාමු හොඳින් නිරීක්ෂණය කර ගමන් බිමන් යාම කළ හැක්කේ කෙසේ දැයි විමසන්න.
- එම අවස්ථාවලදී පමණක් නොව හැකි සෑම විටදී ම පයින් ගමන් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ ගැන සිතා බැලීමට සිසුන් යොමු කරන්න.
- කායික නිරෝගී බව, ඉන්ධන වැය නොවීම, අවට පරිසරයේ සුන්දරත්වය විඳීමට හැකි වීම ආදී වාසි ලැබෙන බව සාකච්ඡාවේදී සිසුන්ගේ අදහස්වලින් ම මතු කර ගන්න.
- වාහනයක ගමන් කිරීමේදී පයින් යාමේදී තරම් මෙම වාසි අත් නොවන බව සාකච්ඡාවේදී මතු කරගන්න.
- කෙටි දුර වුවද පයින් නොයා වාහනයක ගමන් කිරීම නිසා පරිසර දූෂණයත්, වාහන තදබදයත්, කායික රෝගවලට හේතු වන බව සාකච්ඡා කරන්න.
- "ඇවිද්ද පය දහස් වටී"යන පැරණි කියමන පිළිබඳ නිදහස් දැක්වීමට සිසුන් යොමු කර ගන්න.
- පයින් ගමන් කිරීම, අඩු වටිනාකමක් සහිත දෙයක් නොවන බවත් විශාල වාසි ගෙන දෙන බවත් සිසුන් සමග කථාබහ කර තහවුරු කරන්න. තවද ගමනාගමනයේ දී පොදු වාහනවල ගමන් කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳ අවධාරණය කරන්න.

## ක්‍රියාකාරකම් 4

පියවර 1

- ක්‍රියාකාරකම 1 හිදී රැස් කර ගත් තොරතුරු එනම් ගමන් බිමන් යන ආකාර ගැන මතකයට නඟන්න.
- මාර්ගයක් අසලට සිසුන් ඉතා ආරක්ෂිතව කැඳවා ගෙන ගොස් ගමන් ගන්නා වාහන නිරීක්ෂණයට අවස්ථාව සපයන්න.
- ඒ ඇසුරින් ගොඩබිම ගමන් කරන වාහන, එම වාහනවල ලක්ෂණ සහ ප්‍රයෝජන ආදිය කතා කතා කරන්න.

පියවර 2

- ජලය යොදා ගෙන මිනිසුන් ගමන් බිමන් යන ආකාර පිළිබඳ ඡායාරූප/වීඩියෝ දර්ශන මගින් සිසු අවධානය යොමු කරන්න.

    උදා

    ඔරුවක, අඟුලක, පාලම් පාරුව, බෝට්ටු නැව් ආදි...
- ජලය යොදා ගෙන මිනිසුන් ගමන් බිමන් යෑමට හේතු සාකච්ඡා කරන්න.

පියවර 3

- ගුවන් යානා, හෙලිකොප්ටර්, වායු බැලුන් වැනිදේ යොදා ගනිමින් ගමන් කරන පින්තූර/වීඩියෝ දර්ශන කිහිපයක් පෙන්වීමට සූදානම් කර ගන්න.
- අහසේ මිනිසුන් ගමන් බිමන් යන ආකාර පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

    උදා

    ගුවන් යානා, හෙලිකොප්ටර්, රොකට්,වායු බැලුන් වැනි.....
- අහස යොදා ගෙන මිනිසුන් ගමන් බිමන් යෑමට හේතු සාකච්ඡා කරන්න.
- වත්මන් ලෝකයේ රටවල් ඉක්මනින් ගමන්බිමන් යාම සඳහා ඉහත ආකාරයේ විවිධ ක්‍රම සොයාගෙන ඇති බව පෙන්වා දෙන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 ගමනාගමනයේ දී පොදු වාහන භාවිතයේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි. | ◆ පොදු වාහන<br>◆ පොදු වාහනවල ගමන් කිරීමේ දී<br>° පිරිසිදුකම රැක ගැනීම<br>° තමගේ ආරක්ෂාව | 3.1 ගමනාගමනයේදී යොදා ගන්නා පොදු වාහන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |
| | | 3.2 පොදු වාහන පිරිසිදු ව හා ආරක්ෂාකාරී ව පවත්වා ගත යුතු ආකාර ප්‍රකාශ කරයි. | 3.2.1 ප්‍රකාශ කිරීම. |
| | | 3.3 තම ආරක්ෂාව හා හැසිරීම පිළිබඳ සැලකිලිමත් වෙමින් පොදු වාහනවල ගමන් කරන ආකාරය ප්‍රකාශ කරයි. | 3.1.3 ප්‍රකාශ කිරීම. |
| | | 3.4 වාහන පිළිබඳ කියවෙන කවි/ ගීත ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | 3.1.4 ගායනා /රංගන ඉදිරිපත් කිරීම. |

## ක්‍රියාකාරකම් 5

- බස් රථයේ හා දුම්රියේ ගමන්කිරීම පිළිබඳ සිසු අදහස් විමසන්න.
- බසය හා දුම්රිය පිළිබඳ සිසු අද්දැකීම් විමසන්න.
- බසය හා දුම්රිය තිබෙන්නේ කොහේ ද ?
- එම වාහනවලට නගින්නේ කොතැනින් ද ?
- එම වාහන හැමතැන ම නවත්වනවා ද නැතිනම් නැවැත්වීමට තැනක් තිබෙනවා ද ?
- මුදල් නොමැති ව එම වාහන වල ගමන් කරන්න පුළුවන් ද ?
- මුදල් ලබාදුන් විට ප්‍රවේශ පත්‍රයක් (ticket) ලැබුණා ද ?
- එම ටිකට් පත් දුම්රියට නැගීමට පෙර ලැබුණු බවත් බස් රථයට නැගුණු පසු ලැබුණු බවත් මතක් කර දෙන්න.
- අපි එම වාහනවල ගමන් කරන විට හැසිරිය යුත්තේ කෙසේ දැයි? සිසුන්ගෙන් විමසන්න.
  **අන් මගීන්ට හිරිහැරයක් නොවන ලෙස හැසිරීම**
  **එම වාහන අපිරිසිදු වන පරිදි කුණු කසල නොදැමීම**
  **ආසන කුරුටු ගෑම නොකිරීම**
  **හිස/ අත්/ පා එළියට නොදැමීම**
  **ජනේල වලින් පිටතට කෙළ නොගැසීම**
  **අපද්‍රව්‍ය පිටතට නොදැමීම** වැනි පොදු ගමනාගමනයේදී අනුගමනය කළ යුතු යහපත් ඇවතුම් පැවතුම් අවධාරණය කරන්න.
- පූජ්‍ය පක්ෂයට, ගැබිනි කාන්තාවන්ට, කායික විශේෂ අවශ්‍යතා ඇති අයට ආසන ලබා දිය යුතු බව
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 02 සඳහා සිසුන් යොමුකරන්න.

පියවර 2

- පහත ආකාරයේ ගීත වලට සවන් දෙමින් රස විඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  උදා
  උදෑසනම පොඩි අපි දිව එනවා ගීතය
  පහ සමත් ළමා චිත්‍රපටයේ එන "අහස් ගැබේ පා වෙවී - වලාකුළේ හැපි හැපී " යන ගීතය
- ගීතවලට සවන් දෙමින් ගුරුවරයා සමග රිද්මයානුකූල චලන දැක්වීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් අගය කරන්න.

පියවර 3

- බස් රථයක් පාසලට ගෙන්වා හෝ සිසුන් ව බස් නැවතුම්පොළකට හෝ කැඳවාගෙන ගොස් සජීවී අද්දැකීමක් ලබාදීමට අවස්ථාවක් ලබා ගන්න.

- එසේ නොහැකි අවස්ථාවක පහත උපදෙස් අනුව භූමිකා රංගනයක් සැලසුම් කර ගන්න.
- පහත සටහන අනුව බසයක ආසන ඇති ආකාරය ආදර්ශනය කර පුටු පේළි තබා ගන්න.

X ← රියදුරු මහතා

| | |
|---|---|
| X X | X X |
| X X | X X |
| X X | X X |
| X X | X X |
| X X | X X |
| X X | X X |
| X X | X X |
| X X | X X |

හැකි නම් සිසුන්ට විවිධ අයුරින් ඇඳුම් සපයා ගන්න.

උදා

පැවිදි නමක්
මහලු අයෙක්
ගැබිනි කාන්තාවක්
දරුවෙකු වඩාගත් කාන්තාවක්

- සිසුන් පේළියකට බසයට ගොඩ වීමට යොමු කරන්න. **(තමාගේ වාරය එන තෙක් ඉවසීමට පුරුදු පුහුණු කරවන්න)**
- වාඩි වී සිටින සිසුන් අවශ්‍යතාවයන් ඇති අයට ආසන පිරිනැමීමට පුරුදු විය යුතු බව අවබෝධ කරවන්න.
- **ආසන කුරුටු ගෑම, රටකජු පොතු ආදිය දැමීම, හිස/ අත්/ පා එළියට දැමීම** නුසුදුසු බව පෙන්වා දෙන්න.
- පොදු වාහනවල ගමන් කරන විට හැසිරිය යුතු ආකාරය හොඳින් නිරූපණය වන පරිදි භූමිකා රංගනය සිදු කරවන්න.

## ක්‍රියාකාරකම් 6

**පියවර 1**

- දුම්රිය ගැන කියැවෙන ගීතයක්/ වීඩියෝ පටයක් නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.

උදා

හොස හොස හොස ///
පෙට්ටි ගොඩයි
ගෙවල් වගෙයි // යන ගීතය

- සිසුන්ට නිසි තාල තබා ගායනා කරමින් රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 2**


- දුම්රියක සිසුන් රැගෙන යාම/දුම්රිය පෙට්ටියක නංවා සජීවී අද්දැකීම් ලබා දීමට හැකි නම් වඩාත් වැදගත් වන අතර එවැනි පහසු කමක් නොමැති නම්, සිසුන් එළිමහනට රැගෙන ගොස් කෝච්චියක් ලෙස සිසුන් පෙළ ගස්වන්න.
  - ♦ දුම්රිය නැවතුම් ස්ථාන තැන් කිහිපයක සලකුණු කරගන්න. එම ස්ථානවල දුම්රිය ස්ථානාධිපතිවරු තබන්න.
  - ♦ දුම්රිය නවත්වන්න. මගීන්ට නැගීමට හා බැසීමට අවස්ථාව ලබා දෙන්න.
  - ♦ නැවතත් දුම්රිය ධාවනය කරන්න.
- බස් රිය මෙන්ම දුම්රිය ද පොදු වාහනයක් බැවින් බස් රියේදී මෙන් ම ලබා දුන් උපදෙස් අනුගමනය කරමින් දුම්රිය **අපවිත්‍ර නොකර නිසි පරිදි හැසිරිය යුතු** බව පෙන්වා දෙන්න.
- නිවාඩු දිනයකදී දෙමාපියන් සමග දුම්රිය චාරිකාවක් යන ලෙස සිසුන්ට පවසන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 පාරේ ආරක්ෂිත ව ගමන් කරන ආකාර පැහැදිලි කරයි. | ◆ පාරේ ගමන් කිරීමේදී භාවිත<br>° සරල නීතිරීති<br>° රථවාහන ආලෝක සංඥ<br>° ආචාර ධර්ම | 4.1 පයින් ගමන් කිරීමේ නීතිරීති හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 4.1.1 නීතිරීති හඳුනා ගැනීම |
| | | 4.2 රථවාහන ගමන්කිරීමේදී භාවිත ආලෝක සංඥ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 4.2.1 ආලෝක සංඥ හඳුනා ගැනීම. |
| | | 4.3 පයින් ගමන් කිරීමේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම හඳුනා ගෙන ඊට අනුගත ව ක්‍රියා කරයි. | 4.3.1 හඳුනා ගැනීම. |
| | | | 4.3.2 අනුගතව ක්‍රියාකිරීම. |
| | | 4.4 රථ වාහන ආලෝක සංඥ ආශ්‍රයෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවක නිරත වෙයි. | 4.4.1 ක්‍රීඩාවක නිරත වීම. |

## ක්‍රියාකාරකම් 7

පියවර 1

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- කණ්ඩායම් දෙකකට සිසුන් වෙන් කරන්න. එක කණ්ඩායමක් වාහන ලෙසත් අනෙක් කණ්ඩායම පදිකයින් ලෙසත් නම් කරන්න.
- කහ/ සුදු ඉර ඇති හෝ නැති තැනක පාර මාරුවෙන ආකාරය ප්‍රායෝගික ව අද්දැකීම් ලබා දෙන්න. මේ සඳහා පාසල තුළ පාරක් යොදාගත හැකි ය.





- සිසුන් සමග පාර මාරුවෙන ආකාරය පිළිබඳ ව වූ මෙම කවිය ගායනා කරන්න.

  "දකුණ බලා වම බලන්න
  නැවතත් දකුණ ම බලන්න
  පාරේ වාහන නැතිනම්
  ඉක්මනින් ම මාරු වෙන්න "

- මෙම ක්‍රියාකාරකමේදී වාහන ලෙස සිටි ළමුන් පදිකයින් ලෙසත්, පදිකයින් වාහන ලෙසත් මාරුවෙමින් සියලු සිසුන්ට මෙම අද්දැකීම ලබා දෙන්න.
- ලබාගත් අද්දැකීම් ඇසුරින් සාකච්ඡාවක් කරන්න.
- පාරේ ගමන් කරන විට යා යුත්තේ කුමන පැත්තෙන් දැයි විමසන්න.
- මෙහිදී දකුණු පස අයිනෙන් යා යුතු බව අවධාරණය කරන්න.
- පාර නිවැරදි ව මාරුවීමේදී දෙපැත්ත බලන ආකාරය සිසුන්ට තහවුරු කරවන්න.
- කහ හෝ සුදු ඉරක් ඇති විට වුව ද ඒ මතින් පාර මාරුවීමේදී මෙම ක්‍රමය අනුගමනය කළ යුතු බව සිසුන්ට පෙන්වා දෙන්න.
- තව ද, ඕනෑ ම ආකාරයක වාහනයකින් (පොදු/පෞද්ගලික) යන විට හෝ පදිකයන් ලෙස මාර්ග යේ ගමන් කිරීමේදී **මාර්ගයට අපද්‍රව්‍ය විසි කිරීම සිදු නොකළ යුතු** බව පෙන්වා දෙන්න. එලෙස කිරීමෙන් පරිසරය අවලස්සන වන බවත්, අනතුරු සිදු විය හැකි බවත් පවසන්න. **ඉවත ලන දේ තිබේ නම් තම නිවසට ම ගොස් එය බැහැර කළ යුතු** බව පවසන්න.

පියවර 2

- රථවාහන ආලෝක සංඥා හඳුන්වාදීමෙන් පසු ඉහත පියවර 1 සමග ම පියවර 2 සිදු කළ හැකි ය.
- මාර්ගයේ සමහර ස්ථානවල ඇති රථවාහන ආලෝක සංඥා දැක තිබේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඒවාට අනුගත වෙමින් වාහන ගමන් කරන ආකාරය සිහිපත් කරන්න.
- රථවාහන ආලෝක සංඥා හඳුන්වා දීමෙන් අනතුරු ව ඉහත පියවර 1හි සඳහන් ක්‍රියාකාරකම රථවාහන ආලෝක සංඥා යොදා ගනිමින් ද සිදු කරන්න. මේ සඳහා රථවාහන ආලෝක සංඥාවලට අනුව සකස් කරගත් කොඩි/ පුවරු (රතු, කහ, කොළ තුනක්) සපයා ගන්න




- රතු එළිය දල්වෙන විට වාහන නතර කිරීම, තැඹිලි එළිය දල්වෙන විට වාහන ගමන් කිරීමට සූදානම් වීම,
- කොළ එළිය දල් වූ පසු වාහන ගමන් කළ යුතු බව පවසා සිසුන් සමග ක්‍රියාකාරකමට යොමු වන්න.
- වාහන ලෙස සිටින සිසුන් ගමන් කරන අතර ගුරුවරයා රතු කොඩිය / පුවරුව එසවිය යුතු ය.
- එවිට සියලු සිසුන් නතර විය යුතු වේ.
- නැවත ගුරුවරයා කහපාට කොඩිය/ පුවරුව එස වූ විට එතන ම සිටිමින් ගමනට සූදානම් වන ආකාරය පෙන්විය යුතු ය.
- කොළ පැහැති කොඩිය එස වූ විට වාහන මෙන් සිටින සිසුන් ගමන් ඇරඹිය යුතු ය.
- ගුරුවරයා සැම විට ම රතු, කහ, කොළ පුවරු පිළිවෙලින් පෙන්වීම කළ යුතු ය.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 03 සඳහා සිසුන් යොමුකරන්න.

පියවර 3

- රථවාහන ආලෝක සංඥා ආශ්‍රයෙන් නිර්මාණය කර ගත් ක්‍රීඩාවක සිසුන් නිරත කරවන්න

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 ගමන් බිමන්වලදී සිදු විය හැකි අනතුරුවලින් වැළකී සිටීමට අවස්ථාවෝචිත ව කටයුතු කරයි. | ◆ අනතුරුවලින් වැළකී පාරේ ආරක්ෂිත ව ගමන් කරන ආකාරය | 5.1 පාරේ ආරක්ෂිත ව ගමන් කරන ආකාරය ප්‍රකාශ කරයි. | 5.1.1 ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 8

පියවර 1

- සිසුන් දැක හෝ අසා ඇති හෝ මාර්ග අනතුරු ගැන විමසන්න.
- නිදහසේ තම අදහස් දන්නා දේ පැවසීමට අවස්ථාව දෙන්න.
- එවැනි අනතුරු සිදු විය හැකි ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.

පියවර 2

- පාසල ආසන්නයේ ඇති මාර්ගය අසලට ඉතා ආරක්ෂාකාරී ව සිසුන් රැගෙන යන්න.
- මාර්ගයේ ගමන් කරන වාහන හා පදිකයන් දෙස බලා සිටීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන්ට හැඟෙන පරිදි වැරදි අයුරින් වාහන හා පදිකයන් (මිනිසුන්) ගමන් කළ අවස්ථා පිළිබඳ විමසන්න.
- මාර්ගයේ සිදු විය හැකි අනතුරුවලින් වැළකීමට කළ හැකි දේවල් සිසුන් සමග සාකච්ඡා කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6. තම සිතැඟි පරිදි වාහන ආකෘති ගොඩනගයි. | වාහන ආකෘති ගොඩනැඟීම | 6.1 සුදුසු ද්‍රව්‍යයක්/ද්‍රව්‍ය තෝරා ගනිමින් වාහන ආකෘති ගොඩනගයි. | 6.1.1 ආකෘති ගොඩනැඟීම. |

## ක්‍රියාකාරකම් 9

- පහසුවෙන් සොයා ගත හැකි වාහන ආකෘති ගොඩනැඟීමට සුදුසු ද්‍රව්‍ය කිහිපයක් සපයා ගන්න.
  උදා මූඩි/සෙල්ලම් රෝද/බොත්තම්, හිස් පෙට්ටි, මැටි, ඉරටු, කෝටු කැබලි...... වැනි
- සපයාගත් ද්‍රව්‍යවලින් ඕනෑ ම දෙයක් යොදා ගනිමින් තමන් කැමති ආකාරයක වාහනයක් ගොඩනැඟීමට අවස්ථාව ලබා දෙන්න.
- ගොඩබිම, ජලයේ, අහසේ යන ඕනෑම වාහනයක් (සැබෑ/මනඃකල්පිත) සෑදීමට හැකිය.
- තමා ගොඩනැඟීමට යන වාහනය සැලසුම් කර, ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ තෝරා ගනිමින් ක්‍රම ක්‍රමයෙන් ගොඩනැඟීමට ඉඩ දෙන්න.
- ඒ පිළිබඳ ප්‍රශ්න විමසමින් සිසුන් ගොඩනැඟීමට උත්සාහ කර ඇති දේ පිළිබඳ තොරතුරු දැන ගන්න.
- වෙනස් ආකාරයේ නිර්මාණශීලි වාහන ආකෘති සෑදීමට වඩාත් උනන්දු කරවන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරමින් අගය කරන්න.

### තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි.අං. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථය |
|---|---|---|---|
| 1.1 පාසලට පැමිණෙන ආකාර හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 | ◆ පාසලට පැමිණෙන ආකාර කිහිපයක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ පාසලට පැමිණෙන ආකාර හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 2.1 වාහන ගමන් කරන ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි | 2.1.1 | ◆ වාහන ගමන් කරන ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි | ◆ වාහන ගමන් කරන ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 3.1 ගමනාගමනයේදී යොදා ගන්නා පොදු වාහන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 | ◆ ගමනාගමනයේදී යොදා ගන්නා පොදු වාහන හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ ගමනාගමනයේදී යොදා ගන්නා පොදු වාහන හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි.. |
| 3.2 පොදු වාහන පිරිසිදුව හා ආරක්ෂාකාරී ව පවත්වා ගත යුතු ආකාර ප්‍රකාශ කරයි. | 3.2.1 | ◆ පොදු වාහන පිරිසිදු ව හා ආරක්ෂාකාරී ව පවත්වා ගතයුතු ආකාර ප්‍රකාශ කරයි. | ◆ පොදු වාහන පිරිසිදු ව හා ආරක්ෂාකාරී ව පවත්වා ගතයුතු ආකාර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 3.3 තම ආරක්ෂාව හා හැසිරීම පිළිබඳ සැලකිලිමත් වෙමින් පොදු වාහනවල ගමන් කරන ආකාරය ප්‍රකාශ කරයි. | 3.3.1 | ◆ තම ආරක්ෂාව හා හැසිරීම පිළිබඳ සැලකිලිමත් වෙමින් පොදු වාහනවල ගමන් කරන ආකාරය ප්‍රකාශ කරයි. | ◆ තම ආරක්ෂාව හා හැසිරීම පිළිබඳ සැලකිලිමත් වෙමින් පොදු වාහනවල ගමන් කරන ආකාරය ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 3.4 වාහන පිළිබඳ කියවෙන කවි/ ගීත ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | 3.4.1 | ◆ වාහන පිළිබඳ කියවෙන කවි/ ගීත ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි. | ◆ වාහන පිළිබඳ කියවෙන කවි/ ගීත ගායනා කිරීමට/රංගන ඉදිරිපත් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 4.1 මාර්ගයක ගමන් කිරීමේ නීති රීතී හා රථවාහන ආලෝක සංඥා ප්‍රකාශ කරයි. | 4.1.1 | ◆ මාර්ගයක ගමන් කිරීමේ නීති රීතී හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ මාර්ගයක ගමන් කිරීමේ නීති රීතී හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 4.2 රථවාහන ගමන් කිරිමේදී භාවිත ආලෝක සංඥා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 4.1.2 | ◆ රථවාහන ගමන්කිරීමේදී භාවිත ආලෝක සංඥා හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ රථවාහන ගමන්කිරීමේදී භාවිත ආලෝක සංඥා හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.3 පයින් ගමන් කිරීමේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම හඳුනා ගෙන ඊට අනුගත ව ක්‍රියා කරයි. | 4.3.1 | ◆ පයින් ගමන් කිරීමේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම හඳුනා ගන ප්‍රකාශ කරයි. | ◆ පයින් ගමන් කිරීමේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| | 4.3.2 | ◆ පයින් ගමන් කිරීමේදී පිළිපැදිය යුතු ආචාර ධර්මවලට අනුගත ව ක්‍රියා කරයි. | ◆ පයින් ගමන් කිරීමේදී පිළිපැදිය යුතු ආචාර ධර්මවලට අනුගත ව ක්‍රියා කිරීමේ දුෂ්කරතා දක්වයි |
| 4.4 රථවාහන අලෝක වර්ණ සංඥා ආශ්‍රයෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවල නිරත වෙයි | 4.4.1 | ◆ වර්ණ සංඥා ආශ්‍රයෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවල නිරත වෙයි | ◆ වර්ණ සංඥා ආශ්‍රයෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවල නිරත නොවෙයි |
| 5.1 පාරේ ආරක්ෂිත ව ගමන් කරන ආකාරය ප්‍රකාශ කරයි. | 5.1.1 | ◆ පාරේ ආරක්ෂිතව ගමන් කරන ආකාරය ප්‍රකාශ කරයි. | ◆ පාරේ ආරක්ෂිතව ගමන් කරන ආකාරය ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.1 සුදුසු ද්‍රව්‍ය තෝරා ගෙන වාහන ආකෘති ගොඩනගයි. | 6.1.1 | ◆ සුදුසු ද්‍රව්‍ය තෝරා ගෙන වාහන ආකෘති ගොඩනගයි. | ◆ සුදුසු ද්‍රව්‍ය තෝරා ගෙන වාහන ආකෘති ගොඩනැගීමේ දුෂ්කරතා දක්වයි. |

# 11 තේමාව - තොරතුරු හුවමාරුව

විසි එක්වන සියවසේ සිටින අප සියලු දෙනාට ම එදිනෙදා සිදු වන සිදුවීම්, විවිධ තොරතුරු පිළිබඳ දැනුවත් වීම් ලබා ගැනීම අත්‍යවශ්‍ය කාරණාවක් බවට පත් වී ඇත. අතීතයේ දී මිනිසුන් ශබ්ද, සංඥා හා සංකේත මඟින් අදහස්, තොරතුරු හුවමාරු කරගත් අතර වර්තමානය වනවිට තාක්ෂණික සහය ඇති ව ද එම කාර්යය නිරන්තරයෙන් ම සිදු වන තත්ත්වයක් උදාවී ඇත. තොරතුරු හුවමාරුව නම් මෙම තේමාව මඟින් අදහස් හා තොරතුරු නිවැරදි ව මෙන් ම වින්දනාත්මක ව හුවමාරු කර ගැනීමත්, ඒ සඳහා යොදා ගන්නා තාක්ෂණික උපකරණ භාවිත කරන ආකාරය පිළිබඳ මූලික හුරුකම් ලබා දීමත් මෙම තේමාවෙන් සිදු කරයි. තාක්ෂණික උපකරණ නිවැරදි උපදෙස් යටතේ ඒවා භාවිතයට ගැනීමට අවස්ථාව ලබා දෙමින් අනාගතය වෙනුවෙන් නිර්මාණශීලී දරුවෙකු බිහි කිරීම මෙම තේමාවෙන් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. සුහදශීලී මිතුරෙකු සමග තොරතුරු හුවමාරු කරයි. | ◆ තමන් පිළිබඳ තොරතුරු | 1.1 පංතියේ සිසුන් තමා පිළිබඳ තොරතුරු තම මිතුරාට ප්‍රකාශ කරයි. | 1.1.1 තොරතුරු ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 1

පියවර 1

- සිසුන් එකිනෙකා සමග සුහද ව තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකමක් සිදු කිරීමට ඉඩ කඩ ඇති ස්ථානයක් තෝරා ගන්න.
- මේ සඳහා සාමාන්‍ය ප්‍රමාණයේ අතින් අත හුවමාරු කළ යැවිය හැකි බෝල දෙකක්/තොප්පි දෙකක් වැනි එකම වර්ගයේ ද්‍රව්‍ය දෙකක් සපයා ගන්න.
- සිසුන් සියලු දෙනාගේ ම මුහුණු එකිනෙකාට හොඳින් පෙනෙන සේ කවයක් ආකාරයට අසුන් ගැනීමට සලස්වන්න.
- සිසුන් වෙත සංඥාවක් ලබා දුන් පසු සැවොම දන්නා ගීයක් ගයමින් අතැති ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය දෙකක් අතින් අත යැවීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා නැවත සංඥාවක් නිකුත් කළ පසු ගීතය ගායනා කිරීම නවතා ද්‍රව්‍ය අත ඇති සිසුවාට/ සිසුන් දෙදෙනාට කවයේ හරි මැදට පැමිණ තමන් පිළිබඳ තොරතුරු (නම, ගම, වයස, පවුලේ සාමාජිකයන් වැනි) පවසා කැමති ඉදිරිපත් කිරීමක් (නැටුමක්/ගැයුමක්/භූමිකා රංගනයක්) සිදු කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් දෙදෙනෙක් නම් එක් සිසුවෙකුට අනෙක් සිසුවාගෙන් තොරතුරු ඇසීමට අවස්ථාව ලබා දෙන්න. ආචාරශීලී වචන ලෙස සුබ උදෑසනක්, සුබ දහවලක් වේවා මගේ යාළුවෝ හැම දෙනාටම... වැනි වාක්‍ය ඛණ්ඩ භාවිත කරමින් මෙම තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකම කිරීමට මඟ පෙන්වන්න.
- ගුරුවරයා ද තවත් සිසුවෙකු සමග එකතු වී එම තොරතුරු හුවමාරුව කරන ආකාරය ආදර්ශනය කරන්න
- මේ ආකාරයට අනෙක් සිසුන්ට ඇසෙන සේ සිසුන්ගේ තොරතුරු හුවමාරු කර ගන්න.
- සුහද ව, නිවැරදි ව හඬ හසුරුවමින්, ඉරියවු නිසි ආකාරව පවත්වා ගනිමින් ක්‍රියාකාරකම කිරීමට මඟ පෙන්වන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 01 සඳහා සිසුන් යොමුකරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2 තොරතුරු ඉදිරිපත් කිරීමේදී හඬ හා උචිත ඉරියව් ප්‍රකාශ කරයි. | ◆ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී<br>° හඬ හැසිරවීම<br>° උචිත ඉරියවු | 2.1 අවස්ථානුකූල ව හඬ හසුරුවයි. | 2.1.1 හඬ හැසිරවීම. |
| | | 2.2 අවස්ථානුකූල ව උචිත ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 2.2.1 උචිත ඉරියවු ප්‍රදර්ශනය කිරීම. |

## ක්‍රියාකාරකම් 2

- තමන් දන්නා කතන්දරයක් පන්තිය ඉදිරියට පැමිණ හඬනගා පැවසීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. කතන්දර ප්‍රමාණවත් ව ඉදිරිපත් නොවේ නම් ගුරුවරයා ද කෙටි, රසවත් කතන්දරයක් සිසුන්ට කියා දෙන්න.

    උදා අන්දාර් සීනි කාපු හැටි
    කලුවා මාරපන ගිය හැටි
    ගමරාල දිව්‍ය ලෝකේ ගිය හැටි
    පුහුල් හොරා කරෙන් දැනෙයි
    අබරා සිල්ගත්ත හැටි

- එම කතන්දර අතරින් සිසුන්ට කැමති කතන්දරයක් තෝරා ගෙන එහි සිටින චරිතවලට සිසුන් අභිමත පරිදි යහළුවන් තෝරා ගැනීමට යොමු කරන්න. (සැම සිසුවෙකුට ම චරිතයක් ලැබෙන ලෙසට වගබලා ගන්න)
- කතන්දරයේ දෙබස් යහළුවන් සමග පවසමින් පුහුණු වීමට කාලය ලබා දෙන්න.
- කතන්දරයේ එන චරිතවලට අදාළ ව ඇඟිලි රූකඩ (**finger puppets**) සකසා ගැනීමට සිසුන් යොමු කරන්න.
- පසු දිනයේදී එම ඇඟිලි රූකඩ යොදා ගනිමින් කතන්දරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 02 සඳහා සිසුන් යොමුකරන්න.

## ක්‍රියාකාරකම් 3

- දෙබසක්, කෙටි භූමිකා රංගනයක් වැනි වින්දනාත්මක ඉදිරිපත් කිරීමකට සිසුන් ට අවස්ථාව ලබා දෙන්න.

    උදා - **වෛද්‍යවරයා සහ රෝගියා**
    **රෝගියා** - දොස්තර මාමේ මගේ බඩ රිදෙනවා
    **වෛද්‍යවරයා** - මොනව ද දුව අද කෑවේ?
    **රෝගියා** - අද එන ගමන් කඩෙන් මාළුපාන් ගෙඩියක් කෑවා
    **වෛද්‍යවරයා** - මීට පස්සේ දුව ගෙදර හදපුවා විතරක් කන්න. දැනට මේ බේත් ටික බොන්න.
    **රෝගියා** - ස්තුතියි දොස්තර මාමේ
    උදා - **වෙළෙන්දා හා මිලදී ගන්නා**
    **වෙළෙන්දා** - ලාබයි ලාබයි
    එන්න පුතා.. පුතාට මොනව ද ඕනේ ?
    **මිලදී ගන්නා** - මාමේ මට රුපියල් 50ක අඹ දෙන්න
    **වෙළෙන්දා** - ආ මෙන්න පුතා. මෙන්න ඉතුරු සල්ලි
    **මිලදී ගන්නා** - ස්තුතියි මාමේ

- වැනි අවස්ථාවක් නිරූපණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් සියලු දෙනාට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. සිසු ඉදිරිපත් කිරීම් අගය කරන්න.
- හඬ නිවැරදි හසුරවමින් හා උචිත ඉරියවු භාවිත කරමින් තොරතුරු හුවමාරු කරගැනීම පිළිබඳ එළෙස අද්දැකීම් ලැබීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 තාක්ෂණික උපකරණ නිවැරදි ව භාවිත කරමින් තොරතුරු හුවමාරු කර ගනියි. | ◆ තාක්ෂණික උපකරණ<br>° නිවැරදි භාවිතය<br>° ආරක්ෂාකාරී බව | 3.1 තොරතුරු හුවමාරු කරගැනීම සඳහා සුදුසු තාක්ෂණික උපකරණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම |
| | | 3.2 දුරකතන භාවිත කරමින් තොරතුරු හුවමාරු කර ගනියි | 3.2.1 තොරතුරු හුවමාරු කරගැනීම |
| | | 3.3 ආරක්ෂාකාරී ව දුරකතන භාවිතකරන ආකාරය ප්‍රකාශ කරයි. | 3.3.1 ප්‍රකාශ කිරීම |
| 4 තාක්ෂණික උපකරණයක ආකෘතියක් ගොඩ නගයි. | ◆ ආකෘතියක් ගොඩනැගීම | 4.1 සෙල්ලම් දුරකතනයක් නිර්මාණය කරයි. | 4.1.1 නිර්මාණය කිරීම |

## ක්‍රියාකාරකම් 4

පියවර 1

- අපි තොරතුරු හුවමාරු කර ගැනීමට යොදා ගන්නා තාක්ෂණික උපකරණ කිහිපයක් සපයා ගන්න හෝ තිබෙන ස්ථානවලට සිසුන් ගෙන යන්න.

ස්ථාවර දුරකතන 

ජංගම දුරකතන 

- මේවා සපයාගත නොහැකි නම් පමණක් පින්තූර හෝ ආකෘති සිසුන්ට පෙන්වන්න.
- එම එක් එක් උපකරණය පෙන්වමින් ඒ පිළිබඳ තොරතුරු කතා කරන්න

  උදා

  මෙය කුමක් ද ?

  මෙය භාවිත කරන්නේ කුමකට ද?
- සිසු අද්දැකීම් පැවසීමට අවස්ථාව ලබා දෙන්න.
- දුරකතන භාවිත කළ යුතු අවස්ථා පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- එක් දුරකතනයකින් අනිත් දුරකතනයට පණිවිඩ යන අයුරු පිළිබඳ සිසුන් සිතන පරිදි අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.
- ස්ථාවර දුරකතන වල ඇති රැහැන් (wire) නිරීක්ෂණයට ඉඩ දෙන්න. ඒ හරහා දුරකතන අතර සංඥා (signals) ලැබෙන බව පහදන්න.
- ජංගම දුරකතනවලට එලෙස රැහැන් (wire) තිබේදැයි විමසන්න.
- එසේ නම් ඒවා මගින් තොරතුරු හුවමාරු කරගන්නේ කෙසේ දැයි විමසන්න.
- අවට පරිසරයේ විවිධ ස්ථානවල සංඥා කුළුණු දැක තිබේ දැයි සිසුන්ගෙන් විමසන්න. ආසන්නයක තිබේ නම් පෙන්වන්න.
- සංඥා කුළුණු මගින් ජංගම දුරකතන අතර සංඥා හුවමාරු කිරීම නිසා අපට ඇමතුම් ලබා ගැනීමට හැකි බව සරලව පහදන්න.
- පෙර දැනුම් දීමකින් පාසලේ විදුහල්පති/අංශභාර ගුරුවරයා ආදීන්ට දුරකතන ඇමතුමක් ලබා දී නිවැරදි ව කෙටියෙන් තොරතුරු හුවමාරු කරගන්නා අයුරු ආදර්ශනය කර පෙන්වන්න.

- එම උපකරණ ආරක්ෂිතව භාවිත කළයුතු බව පහත උදාහරණ සපයමින් අවධාරණය කරන්න.

  උදා

  **ජංගම දුරකථන භාවිත කිරීමේ දී**

  ° විදුලියට සම්බන්ධ කර ඇති විටදී භාවිත කිරීම

  ° අකුණු ගසමින් වර්ෂාව පතනය වන විටදී භාවිත කිරීම

  ° දීර්ඝ වේලාවක් එකම කනක රඳවාගෙන භාවිත කිරීම **නොකළයුතු බව අවධාරණය කරන්න.**

## ක්‍රියාකාරකම් 5

- සෙල්ලම් දුරකතන සාදා ගැනීම සඳහා සිසුන් යොමු කරන්න.

උදා

පිරිසිදු කරගත් ඉවතලන යෝගට් කෝප්ප/ ප්ලාස්ටික් බීම කෝප්ප, ට්වයින් නූල්, ඉරටු කැබලි

- සකසා ගත් සෙල්ලම් දුරකතන රැගෙන පාසලේ එළිමහන් ස්ථානයක් කරා සිසුන් කැඳවා ගෙන යන්න.
- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර සිසුන් විසින් සකස් කර ගන්නා ලද සෙල්ලම් දුරකතන භාවිත කර පණිවිඩ හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- කතා කරන්නා සහ සවන් දෙන්නා මාරු වෙමින් ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා යොදා ගන්නා නූලට ඉටි කිරි ආලේප කිරීමෙන් කතා කරන විට ඇසෙන හඬට වෙනසක් වේ දැයි අත්හදා බැලීමට අවස්ථාව දෙන්න.
- මෙම ක්‍රියාකාරකමේ දී සිසුන්ට මුණ ගැසෙන විවිධ චරිත හා අවස්ථා අනුකරණය කරමින් සංවාද ගොඩනගා ගැනීමට මග පෙන්වන්න.
- වෙනත් සෙල්ලම් දුරකතන සකස් කරන ලද සිසුන් වෙත්නම් ඒ පිළිබඳ සිය අද්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 03 සඳහා සිසුන් යොමුකරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 5 තොරතුරු හුවමාරුව සඳහා භාවිත වන තාක්ෂණික උපකරණයක් ලෙස පරිගණකය හඳුනා ගනියි. | ◆ පරිගණකය හඳුනා ගැනීම | 5.1 පරිගණකය ක්‍රියාත්මක කරන අයුරු **(switch on)** ආදර්ශනය කරයි. | 5.1.1 ආදර්ශනය කිරීම. |
| | | 5.2 පරිගණකයට සම්බන්ධ කර ඇති සරල උපාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 5.2.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |
| 6 පටිගත කිරීමක් සඳහා සිය කුසලතාවක් ඉදිරිපත් කරයි. | ◆ ඉදිරිපත් කිරීමේ කුසලතා | 6.1 පටිගත කිරීමක් සඳහා සිය කුසලතාවක් ප්‍රදර්ශනය කරයි. | 6.1.1 කුසලතාවක් ඉදිරිපත් කිරීම. |

## ක්‍රියාකාරකම් 6

**පියවර** 1

- අපට තොරතුරු හුවමාරු කරගත හැකි තවත් තාක්ෂණික උපකරණයක් වන පරිගණකය සිසුන්ට හඳුන්වා දෙන්න.
- පරිගණකයක් සිසුන්ට නිරීක්ෂණය කිරීමට හා භාවිත කිරීමට හැකි තැනකට සිසුන්ව කුඩා කණ්ඩායම් වශයෙන් කැඳවා ගෙන යන්න. ඕනෑ ම පරිගණකයක් (සාමාන්‍ය පරිගණකය/උකුල් පරිගණකය **desktop / laptop**)මේ සඳහා යොදා ගන්න.
- පරිගණකය ක්‍රියාත්මක කරන අයුරු **(switch on)** පෙන්වන්න.

- පරිගණකයට සවිකර ඇති වෙනත් උපාංග සරල ව හඳුන්වා දෙන්න.

    උදා

    මූසිකය **Mouse,** යතුරු පුවරුව **key board**
- **Mouse** එහා මෙහා කිරීමේදී පරිගණක තිරයේ **mouse pointer** ද ඒ අනුව එහා මෙහා යන අයුරු පෙන්වන්න. සිසුන්ට අත්හදා බැලීමට අවස්ථාව දෙන්න. **key board** එක භාවිත කරන අයුරු අවශ්‍ය පරිදි පෙන්වන්න. මෙම ඉංග්‍රීසි යෙදුම් සිසුන්ට හුරුවන පරිදි භාවිත කරන්න.
- පරිගණකයේ **Paint** මෘදුකාංගය විවෘත කර සිසුන්ට කැමති පරිදි චිත්‍රයක් ඇඳීමට මග පෙන්වන්න.

පියවර 2


- සුහුරු ජංගම දුරකථනයක්/කැමරාවක් ආධාරයෙන් සිසු ඉදිරිපත් කිරීමක් (චිත්‍ර ප්‍රදර්ශනයක්, නැටුමක්, ගීත ගායනයක්, රංගනයක් වැනි) පටිගත කර එය පරිගණක තිරයකින් නරඹා වින්දනයක් ලැබීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම් සඳහා මයික්‍රෝෆෝනය අවශ්‍ය පරිදි භාවිත කිරීමට ඉඩ ප්‍රස්ථාව සපයන්න.
- අන්තර්ජාලය භාවිත කරමින් ළමා වෙබ් අඩවිවල ඇති අධ්‍යාපනික වැඩසටහන්, ගීත, කවි සහ කතන්දර නැරඹීමට හා ඇසීමට අවස්ථාව ලබා දෙන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 තොරතුරු හුවමාරුව ඇසුරෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවල සාර්ථකත්වය ප්‍රදර්ශනය කරයි. | ◆ තොරතුරු හුවමාරුව ඇසුරෙන් නිර්මාණය කර ගත් ක්‍රීඩා | 7.1 තොරතුරු හුවමාරුව ඇසුරෙන් ක්‍රීඩාවක නියැළී සාර්ථකත්වය ප්‍රදර්ශනය කරයි. | 7.1.1 සාර්ථකත්වය ප්‍රදර්ශනය කිරීම. |

## ක්‍රියාකාරකම් 7

- එක් කණ්ඩායමකට අවම වශයෙන් සිසුන් පස් දෙනෙකු සිටින සේ සිසුන් ව කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- පහත දැක්වෙන පරිදි රූප කාඩ් පත් එක් කණ්ඩායමක සිටින සමාජිකයින් සංඛ්‍යාවට ගැළපෙන පරිදි නිර්මාණය කර ගන්න.

    උදා



කණ්ඩායමේ අවසානයට සිටින සිසුවාට පාට පැන්සල් / පාට කූරු, සුදුකඩදාසි, පැන්සල්, මකන ලබා දෙන්න.

- පළමුව සිටින සිසුවාට රූප කාඩ් පතක් ලබා දෙන්න.
- එය හොඳින් නිරීක්ෂණය කර නැවත ගුරුවරයාට ලබා දෙන ලෙසට පවසන්න.
- පසුව එම කාඩ්පතේ තිබූ රූප සටහන්වල විස්තර කණ්ඩායමේ ඊළඟ සිසුවාට රහසින් පැවසීමට කියන්න.
- එලෙස කණ්ඩායමේ අවසානයට සිටින සිසුවා තෙක් පිළිවෙලින් එම තොරතුරු අනෙක් සිසුන්ට නොඇසෙන සේ පැවසීමට යොමු කරන්න.

- අවසානයට සිටින සිසුවා ඇසූ තොරතුරු විස්තර අනුව කාඩ්පතේ තිබූ රූප සටහන් ඇඳීමට යොමුකරන්න.
- ගුරුවරයා අතැති රූප අවසන් සිසුවා ඇඳි රූප ආකාරය සමඟ සසඳා තොරතුරු ලැබී ඇති අයුරු පිළිබඳ සිසු අදහස් විමසන්න.
- අඩු පාඩු වී ඇති නම් ඒ මොනවා දැයි විමසන්න.
- මේ ආකාරයට පන්තියේ සැම සිසුවෙකුට ම අවස්ථාව ලැබෙන සේ ක්‍රියාකාරකම සිදු කරන්න.
- මෙහිදී කෙටි පණිවිඩයක් රහසක් ලෙස පවසමින් **රහස් කෝච්චිය** ක්‍රීඩාව සිදු කරන්න. අවසානයට පැමිණි පණිවිඩය සහ මුල් පණිවිඩය අතර වෙනසක් තිබේ දැයි බලන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවාගෙන ගොස් එක පෙළකට සිටුවා පේළියේ අවසානයට සිටින සිසුවා අනිත් පස හරවා ඔහුට / ඇයට පමණක් පෙනෙන පරිදි සරල අංග චලන 2-3ක් සිදු කර පෙන්වන්න.
- එම අංග චලන තමාට ඉදිරියෙන් සිටින සිසුවාට පමණක් සිදුකර පෙන්වීමට යොමුකරන්න.
- ඒ ආකාරයෙන් සිසුවාගෙන් සිසුවාට පැමිණ ඉදිරියෙන් ම සිටින සිසුවාට ලබා ගත් අංගචලනය සහ මුලින් ම ලබාදුන් අංග චලනය සිදුකර පෙන්වා වෙනසක් සිදුවී ඇත් දැයි සිසුන්ගෙන් විමසන්න. හැකි නම් සිසුන් ක්‍රීඩාවේ නිරත වන අයුරු වීඩියෝ කර සිසුන් සමග නරඹමින් පණිවිඩය ගමන් කර ඇති අයුරු, සුළු වෙනස්කම් විශාල වෙනස්කම් බවට පත් වී ඇති අයුරු නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- මෙම ක්‍රීඩාවල සතුටෙන් නියැළීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### තක්සේරු කිරීම

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි.අං. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථය |
|---|---|---|---|
| 1.1 සුහදශීලී ව තොරතුරු හුවමාරු කර ගනියි. | 1.1.1 | ◆ සුහදශීලී ව තොරතුරු හුවමාරු කර ගනියි. | ◆ සුහදශීලී තොරතුරු හුවමාරු කර ගැනීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.1 අවස්ථානුකූල ව හඬ හසුරුවයි. | 2.1.1 | ◆ අවස්ථානුකූල ව හඬ හසුරුවයි. | ◆ අවස්ථානුකූල ව හඬ හැසිරවීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 2.3 අවස්ථාවට උචිත ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 2.2.1 | ◆ අවස්ථාවට උචිත ඉරියවු ප්‍රදර්ශනය කරයි. | ◆ අවස්ථාවට උචිත ඉරියවු ප්‍රදර්ශනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 3.1 තොරතුරු හුවමාරු කරගැනීම සඳහා සුදුසු තාක්ෂණික උපකරණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 | ◆ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා සුදුසු තාක්ෂණික උපකරණ හඳුනා ගනියි. | ◆ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා සුදුසු තාක්ෂණික උපකරණ හඳුනා ගැනීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 3.2 දුරකතන භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගන්නා අයුරු ආදර්ශනය කරයි. | 3.2.1 | ◆ දුරකතන භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගන්නා අයුරු ආදර්ශනය කරයි. | ◆ දුරකතන භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගන්නා අයුරු ආදර්ශනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 3.3 ආරක්ෂාකාරී ව දුරකතන භාවිත කරන ආකාරය ප්‍රකාශ කරයි. | 3.3.1 | ◆ ආරක්ෂාකාරී ව දුරකතන භාවිත කරන ආකාරය ප්‍රකාශ කරයි. | ◆ ආරක්ෂාකාරී ව දුරකතන භාවිත කරන ආකාරය ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 4.1 සෙල්ලම් දුරකතනයක් නිර්මාණය කර තොරතුරු හුවමාරු කරගනියි. | 4.1.1 | ◆ සෙල්ලම් දුරකතනයක් නිර්මාණය කර තොරතුරු හුවමාරු කරගනියි. | ◆ සෙල්ලම් දුරකතනයක් නිර්මාණය කිරීම/තොරතුරු හුවමාරු කරගැනීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 5.1 පරිගණකය ක්‍රියාත්මක **(switch on)** කරයි. | 5.1.1 | ◆ පරිගණකය ක්‍රියාත්මක කරන අයුරු **(switch on)** ආදර්ශනය කරයි. | ◆ පරිගණකය ක්‍රියාත්මක කිරීමේ**(switch on)** කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 6.1 පරිගණකයට සම්බන්ධකර ඇති සරල උපාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6.1.1 | ◆ පරිගණකයට සම්බන්ධකර ඇති සරල උපාංග හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ පරිගණකයට සම්බන්ධකර ඇති සරල උපාංග හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 7.1 පටිගත කිරීමක් සඳහා සිය කුසලතාවයක් ප්‍රදර්ශනය කරයි. | 7.1.1 | ◆ පටිගත කිරීමක් සඳහා සිය කුසලතාවක් ප්‍රදර්ශනය කරයි. | ◆ පටිගත කිරීමක් සඳහා සිය කුසලතාවක් ප්‍රදර්ශනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 7.2 තොරතුරු හුවමාරුව ඇසුරෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවක නියැළී සාර්ථකත්වය ප්‍රදර්ශනය කරයි. | 7.2.1 | ◆ තොරතුරු හුවමාරුව ඇසුරෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවක නියැළී සාර්ථකත්වය ප්‍රදර්ශනය කරයි. | ◆ තොරතුරු හුවමාරුව ඇසුරෙන් නිර්මාණය කරගත් ක්‍රීඩාවක නියැළී සාර්ථකත්වය ප්‍රදර්ශනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |

# 12 තේමාව - අපේ වැඩට ශක්තිය

මෙම තේමාව මගින් බලය හා ශක්තිය සම්බන්ධ ව සිසුන්ට හඳුන්වා දීම අපේක්ෂා කෙරේ. එනම්, තල්ලු කිරීම, ඇදීම, ආලෝකය, සුළඟ, ශබ්දය සහ චුම්බක ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ප්‍රධාන වශයෙන් සිසුන් තුළ විද්‍යාත්මක ක්‍රියාවලියට අදාළ කුසලතා සංවර්ධනය හා මූලික විද්‍යාත්මක සංකල්ප සිසුන් තුළ ස්ථාපනය කිරීම අරමුණු වන අතර ඊට අමතර ව සෞන්දර්යාත්මක කුසලතා, භාෂාමය කුසලතා, ගණිත කුසලතා, නිර්මාණාත්මක කුසලතා, සතිමත් බව සහ සමාජ හා ආවේදන කුසලතා සංවර්ධනය අපේක්ෂා කරයි.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1 බලයක් යොදා තල්ලු කිරීම හා ඇදීම මගින් යම් දෙයක් පිහිටි ස්ථානය වෙනස් කළ හැකි බව හඳුනා ගනියි. | ◆ බලයක් යොදා පිහිටි ස්ථානය වෙනස් කිරීම<br>° තල්ලු කිරීම<br>° ඇදීම. | 1.1 බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් තල්ලු කිරීම සිදු කරන අයුරු ආදර්ශනය කරයි.<br><br>1.2 බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් ඇදීම සිදු කරන අයුරු ආදර්ශනය කරයි.<br><br>1.3 තල්ලු කිරීමේදී/ඇදීමේදී බලය යෙදූ දිශාවට වස්තුවේ පිහිටීම වෙනස් වන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.1.1 අත්හදා බැලීම.<br><br>1.2.1 අත්හදා බැලීම.<br><br>1.3.1 ප්‍රකාශ කිරීම. |
| 2 කාර්යයක් සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ආහාරවලින් ලැබෙන බව පෙන්වා දෙයි. | ◆ කාර්යයක් සිදු කිරීමට<br>° ශක්තිය අවශ්‍ය බව<br>◆ ආහාර අවශ්‍ය බව | 2.1 නිසි ආහාරපාන ලබා ගැනීමෙන් ශරීරයට අවශ්‍ය ශක්තිය ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි | 2.1.1 ප්‍රකාශ කිරීම. |
| | | 2.2 ශක්තිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ආහාර පාන ලබා ගනියි. | 2.2.1 ආහාර පාන ලබා ගැනීම. |

## ක්‍රියාකාරකම් 1

පියවර 1

- සිසුන් සෙල්ලම් මිදුලට හෝ පොළොවේ සිට සෙ.මී.12 පමණ උසින් හෝ ආරක්ෂාකාරී ඔංචිල්ලාවක් සාදා ඇති ස්ථානයකට කැඳවා ගෙන යන්න.
- ඔංචිල්ලාව පැදීමේදී ආරක්ෂාකාරී ව කටයුතු කරන අයුරු පෙන්වා දෙන්න.
- ඔංචිලි පැදීම හා සම්බන්ධ කවි, ගී ගායනා කරමින් ඔංචිලි පැදීමට අවස්ථාව ලබා දෙන්න.
  උදා ඔංචිලි චිලි චිලි චිල්ල මලේ
- සැම සිසුවෙකුට ම ඔංචිල්ලාව පැදීමට අවස්ථාව ලැබෙන පරිදි මාරු වෙමින් එහි නිරත වීමට යොමු කරන්න.
- එහිදී, ඔංචිල්ලාව තල්ලු කරන වාර සංඛ්‍යාව ගණන් කිරීමට ද පවසන්න.
- ඔන්චිල්ලාව පැද්දවීමට අවශ්‍ය තල්ලු කිරීම පිළිබඳ සිසුන් ලබා ගන්නා අද්දැකීම් ගැන විමසන්න.
- යොදන බලය අඩු වැඩිකරමින් ඔංචිල්ලාව තල්ලු කිරීම පිළිබඳ අද්දැකීම් ලැබීමට **(ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙමින්)** හා අදහස් දැක්වීමට සැම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.
- ඔංචිල්ලාව තල්ලු කරන ලද දිශාවට ගමන් කරන අයුරු සිසු නිරීක්ෂණයට ලක් කරන්න.

පියවර 2

- සිසුන්ට බෝල (පැසිපන්දු/ පා පන්දු බෝලයක ප්‍රමාණයේ) කිහිපයක් සපයා දී නිදහසේ සෙල්ලම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉන්පසු පහත දැක්වෙන ආකාරයේ සැලසුම්ගත සෙල්ලම් ක්‍රියාකාරකමක ද සිසුන් නිරත කරවන්න.
- සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- රූපයේ ආකාරයට සීමා රේඛාව දෙපසින් මීටර 4-5ක පමණ පරතරයකින් සිසු කණ්ඩායම් පෙළගස්වා ඉදිරියෙන් ම සිටින සිසුන්ට බෝලය බැගින් ලබා දෙන්න.
- A පිලෙහි ඉදිරියෙන් සිටින සිසුවාට බෝලය තල්ලු කර ඉදිරිපසින් සිටින කණ්ඩායමේ මුල් සිසුවාට යැවීමට උපදෙස් දෙන්න.



**A** **B**

- බෝලය B පිලෙහි මුලින් සිටින සිසුවා දක්වා ගමන් කළ පසු, බෝලය යැවූ සිසුවා තම කණ්ඩායමේ පිටුපසට ගොස් වාඩි විය යුතු අතර ඊළඟට සිටින සිසුවා ඉදිරියට පැමිණිය යුතු වේ. එලෙස සැම සිසුවෙකුට ම බෝලය තල්ලු කිරීමට අවස්ථාවක් ලැබෙන පරිදි සෙල්ලමක් ආකාරයෙන් ක්‍රියාකාරකම සිදු කරන්න.
- මෙම ක්‍රියාකාරකම රෝද සහිත පෙට්ටි හෝ සිසුන්ට තල්ලු කළ හැකි වෙනත් ඕනෑම දෙයක් යොදා ගනිමින් සිදු කළ හැකි ය.
- පහත ආකාරයේ ප්‍රශ්න විමසමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.

  උදා : බෝලය ගමන් කළේ ඇයි?

  තල්ලු කළේ මොන පැත්තට ද? බෝලය ගියේ මොන පැත්තට ද?
- බලය **(force)** යෙදූ පැත්තට බෝලය තල්ලු වුණ අයුරු පිළිබඳ කතා කරන්න.
- එදිනෙදා ජීවිතයේ බලයක් යොදා තල්ලු කිරීම සිදු කරන වෙනත් අවස්ථා සිහිපත් කරන්න.

පියවර 2

- කාඩ්බෝඩ් පෙට්ටියක් වැනි සුදුසු දෙයක් ඇසුරෙන් තල්ලු කිරීම තවදුරටත් සිසුන්ට ආදර්ශනය කරන්න. මෙහිදී සිසු සහභාගීත්වය සක්‍රියව ලබා ගන්න.
- තල්ලු කළ පැත්ත (දිශාව), එවිට පෙට්ටිය ගමන් කළ දිශාව හා පෙට්ටිය නැවතුන තැන ආදිය පිළිබඳ සිසුන්ට අද්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

## ක්‍රියාකාරකම් 2

පියවර 1

- එදිනෙදා ජීවිතයේදී ඇදීම සිදු කරන අවස්ථා සිහිපත් කරන්න. සිසුන්ට මතකයේ රැඳී ඇති එවැනි අවස්ථා පිළිබඳ කතා බහ කරන්න.

  උදා: අවුරුදු උත්සවයේ කඹ ඇදීම
- පහත සඳහන් කතාන්දරය හෝ වෙනත් එවැනි නිර්මාණශීලි කතන්දරයක් (ශක්තිය හා බලය යොදා ඇදීම තේමා කර ගත්) පවසන්න. කතන්දරය පියවරින් පියවර ගොඩනැගීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදා: ඊට පස්සෙ මොනවා වෙන්න ඇති ද?
- ශක්තිය, බලය වැනි වචන සිසුන්ට සමීප වන පරිදි නිරායාසයෙන් භාවිත කරන්න.
- ඒ සඳහා පහත දැක්වෙන කතාව සිසුන්ට කට හඬ මනාව මෙහෙයවමින් චරිතවල ස්වභාවය ඉස්මතුවන පරිදි ඉදිරිපත් කරන්න.

## කැලේ බලය

එක දවසක් කැලෑවේ රජා සිංහ රාළට හොඳට ම අසනීප උණා. කෑම කන්නත් බැරි වුණා. එන්න එන්නම එයාගෙ ශක්තිය අඩු වුණා.

"මට දැන් නායකයා වෙන්න අමාරුයි, අපි වෙන කෙනෙක් ව තෝරගමු" කියලා සිංහ රාළ හා හාමිට කතා කරලා කිව්වා.

"ඉතිං කොහොමද නායකයෙක් තෝර ගන්නේ?" හා හාමි ඇහුවා. "නායකයාට හොඳට ශක්තිය තියෙන්න ඕනි. ඒවගේ ම ඒ ශක්තිය යොදවලා අනිත් අයට යහපතක් කරන්නත් පුළුවන් වෙන්න ඕනි, ඒ නිසා අපි කැලෑවේ කඹ ඇදීමේ තරඟයක් තියලා ශක්තිමත් ම කෙනා තෝරමු." සිංහ රාළ කිව්වා.

හා හාමි කැලේ පුරා ම ඇවිද ගිහින් "අපේ සිංහ රාළට අසනීපයි, ඒ නිසා නායකයෙක් තෝර ගන්න යන්නේ, හැමෝම එන්න ගල් ගුහාව ළඟ පිට්ටනියට, එතැනදී කඹ ඇදීමේ තරඟයක් තියලා බලමු" යැයි කියමින් හා හාමි හැමෝම දැනුවත් කළා.

අලි රාළට මේක ඇහුණා. මට පුළුවන් මේක දිනන්න. සතුටින් ගීතයක් කියලා නැටුවා.

> "මම යනවා හොඳට කන්න
> කෑම ගොඩක් කාලා එන්න
> ශක්තිය අරගෙන මම දැන්
> අදිනවා මේ හැම දෙනාම"

හෙට සිට නායකයා මමයි කියමින් අලි රාළ සතුටින් තරඟයට සහභාගී වුණා. පහසුවෙන් ම අලි රාළ කැලැවේ හැමෝව ම බලය යොදලා ඇදලා විසිකරලා දැම්මා. මොක ද එයාට ශක්තිය වැඩි නිසා වැඩි බලයකින් අදින්න පුළුවන්. එයා ආඩම්බර වුණා. අනිත් හැමෝම කනගාටු වුණා.

"මේ කැලෑවේ හැමෝටම වඩා මමයි ශක්තිවන්තයා, පුළුවන් නම් හැමෝම එකතුවෙලා හරි මාව පරද්දන්න." අලි රාළ ආඩම්බරයෙන් කිව්වා,

"හොඳයි අලි රාළට ශක්තිය වැඩියි. අපි අවසන් වටය බලමු" සිංහ රාළ කිව්වා.

"එහෙනම් මම තනියම අදින්නම්, පුළුවන් නම් බලය යොදලා අදින්න බලන්න,"


අනිත් පැත්තට වලස් හාමියි, කුළුහරක් හාමියි ආවා. දැන්නම් කලින්ට වඩා ටිකක් අමාරුයි, අලි හාමිත් බලය යොදලා අදිනවා. දෙපැත්තෙන් ම අදිනවා.

"අපි තව ටිකක් බලය වැඩිකරලා අදිමු. මමත් යනවා උදව්වට..." සිංහ රාලත් කුළුහරක් හාමි ළඟට ගිහින් අදින්න ගත්තා. දැන් බලය වැඩි වුණා. අලි හාමි ඇදි ඇදි ආවා, හා හාමියි කැලේ යාළුවොයි කෑ ගැහැවා...,බලය වැඩි කරන්න තවත් බලය වැඩි කරන්න.

වලස් හාමියි, කුළුහරක් හාමියි, සිංහ රාළයි තුන්දෙනා ම එකතුවෙලා බලය යොදලා අලි හාමි ව පැරද්දුවා. හැමෝම එකතු වුණා ම යොදන බලය වැඩි වෙනවා, එතකොට ඕන දෙයක් පහසුවෙන් කර ගන්න පුළුවන් සිංහ රාළ හැමෝටම කියලා දුන්නා.

පියවර 2

- ඇදීම ආශ්‍රිත අද්දැකීම් සිසුන්ට ලබා දීම සඳහා පහත ක්‍රියාකාරකම් වලින් සුදුසු එක් ක්‍රියාකාරකමක සිසුන් නිරත කරවන්න.
  - කොළපත් ඇදීම (කොළපතක් /ගෝනියක් ආධාරයෙන්)
  - ටයරයක්/ වැලි මල්ලක් බැඳි ලණුවක් ඇදීම - සීමා රේඛාවෙන් එපිට වෙරළ බව ද සීමාරේඛාවෙන් අනෙක් පස මුහුද බව ද පවසා "ඔඩි හෙළෙයි හෙළෙයි .....ඔඩි හෙළෙයි යා" කියමින් දැල අදින ස්වරූපයෙන් ඇදීමට සිසුන් යොමු කළ හැකිය (හෝ වෙනත් නිර්මාණශීලි ආකාරයකට)



- ක්‍රියාකාරකම 1 සඳහා භාවිත කළ කාඩ්බෝඩ් පෙට්ටිය යොදා ගනිමින් ඇදීම ද ආදර්ශනය කරන්න.
- ක්‍රියාකාරකම අවසානයේ සිසුන් ලැබූ අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථා දෙන්න.
- ප්‍රථමයෙන්, සිසුන් අදින ලද දෙය තිබූ ස්ථානයත්, දැන් එය තිබෙන ස්ථානයත් සැසඳීමට යොමු කරන්න. එසේ වීමට හේතුව විමසන්න. සිසුන් අදින ලද දිශාවට/පැත්තට එම ද්‍රව්‍ය ඇදී ආ අයුරු පෙන්වා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 01 සඳහා සිසුන් යොමුකරන්න.

පියවර 3

- සිසුන් ක්‍රියාකාරකමේ නිරත වූ පසු ශරීරයට දැනෙන දේ විමසන්න.
- ශරීරයට වෙහෙසක් දැනෙනවා නම් එසේ වන්නේ ශක්තිය වැය වූ නිසා බව පෙන්වා දෙන්න.
- වැය වූ ශක්තිය නැවත ලබා ගැනීමට කුමක් කළ යුතු දැයි විමසන්න.
- ඒ සඳහා පෝෂ්‍ය ගුණය සහිත ආහාර ලබා ගත යුතු බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසුන්ට දැත් පිරිසිදු කර පන්ති කාමරය වෙත රැගෙන යන්න.
- සපයා ගත හැකි පෝෂ්‍යදායී ආහාරයක් සිසුන්ට ලබාදෙන්න.
- සුව පැවත්ම තේමාවේදී ලබා ගත් අද්දැකීම් මේ සඳහා පාදක කරගන්න.
- ආහාර ගැනීමෙන් ප්‍රමාණවත් කාලයක් ගතවූ පසු ශරීරයට දැනුණු වෙහෙස කෙසේ වී දැයි සිසුන්ගෙන් විමසන්න.
- සිසු අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැය වූ ශක්තිය නැවත ලබා ගැනීම සඳහා ආහාර ලබා ගැනීමේ වැදගත්කම සිසුන් සමග සාකච්ඡා කිරීම තුළින් අවධාරණය කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3 හිරු එළියේ අපට ප්‍රයෝජනවත් ශක්ති ආකාර හඳුනා ගනියි. | ◆ හිරු එළියේ අපට ප්‍රයෝජනවත් ශක්ති ආකාර<br>° ආලෝකය<br>° උණුසුම | 3.1 හිරුගෙන් ආලෝකය සහ උණුසුම ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>3.2 හිරු එළිය ජීවීන්ට අත්‍යවශ්‍ය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම.<br><br>3.2.1 හඳුනා ගෙන ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම 3

පියවර 1

- හිරු උදාවත් සමග පරිසරයේ ඇතිවෙන වෙනස්කම් නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ ආශ්‍රිත වීඩියෝ දර්ශන, පින්තූර ආදිය පෙන්වන්න. "පොළව හා අහස" තේමාවේ දී කතා කළ දෑ ද මෙහිදී සිහිපත් කරන්න.
- හිරු ගැන කියවෙන කවි, ගී සිසුන් සමග ගායනා කරන්න.

    උදා:

    හිරු උදාව ලස්සනයි
    ආලෝකය විහිදුවයි
    පුංචි අපට බලන්න නම්
    බැරි විදිහට රැස් ගොඩයි

    උණුසුම අප හට ලැබෙයි
    මල් පෙති සතුටෙන් දිලෙයි
    හිරු එළියෙන් ලැබෙන සවිය
    ගත සිත සතුටින් තියයි

- උදෑසන හිරු උදාවත් සමග ආලෝකය සහ උණුසුම වැඩි වෙන ආකාරයත්, නැවත සවස් කාලයේදී ක්‍රමයෙන් අඳුරු වී උණුසුම අඩුවන අයුරුත් පිළිබඳ කතා කරන්න.
- හිරු පෑයුවේ නැති නම් කුමක් වේවි දැයි විමසන්න.
- සිසුන්ට තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- එමගින් මිනිසුන්, සතුන් සහ ශාක යන මේ සැම ජීවියෙකුට ම හිරුගෙන් ලැබෙන ශක්තිය වැදගත් වන අයුරු සරල ව කතාබහ කරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4 අපට යමක් පෙනෙන ආකාරය පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | ◆ යමක් පෙනීමට ඇස හා ආලෝකය අවශ්‍ය බව | 4.1 පෙනීමට ඇස් හා ආලෝකය අවශ්‍ය බව පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | 4.1.1 පරීක්ෂා කර ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම 4

පියවර 1



- සිසුන් එළිමහනට කැඳවා ගෙන ගොස් ඔවුන්ට මද වේලාවක් "අල්ලන සෙල්ලම්" ක්‍රීඩාවේ යෙදීමට ඉඩ දෙන්න.
- ඉන්පසු ක්‍රීඩාව මදක් වෙනස් කරන බව පවසා කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුන් කිහිප දෙනෙකුගේ දෑස් ආරක්ෂාකාරී ව රෙදි පටියකින් හෝ Sleeping mask එකකින් ආවරණය කරන්න. ඔවුන් මැදි වන පරිදි අනෙක් සිසුන්ට දෑත් අල්ලාගෙන වෘත්තයක සිට ගැනීමට සලස්වන්න. අනතුරුව දෑස් වසා ගෙන සිටින සිසුන්ට තම යහළුවන් ඇල්ලීමට පවසන්න. (මේ සඳහා ආරක්ෂිත භූමියක් තෝරා ගන්න.)
- සිසුවෙකු අල්ලා ගත් විට එම සිසුවා අල්ලන්නෙක් බවටත්, අල්ලන්නා සිසු රවුමේ සාමාජිකයෙක් බවටත් පත් වේ.
- දෑස් වසා ගත් විට ඇල්ලීම පහසු දැයි විමසන්න
- එමගින් අපට යමක් දැකීමට ඇස් අවශ්‍ය බව පෙන්වා දෙන්න.

- ඇස් ආරක්ෂා කරගත යුතු බව ද, දෑස් නොපෙනෙන අය ගැන සංවේදී වෙමින් උදවු කළ යුතු බව ද පෙන්වා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි අදාළ ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන්න.

පියවර 2

- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාවට ගැළපෙන පරිදි කාඩ්බෝඩ් පෙට්ටි එකක් හෝ කිහිපයක් සපයා ගන්න.
- කාඩ්බෝඩ් පෙට්ටියේ ඉහළින් ඇති පියනෙහි තරමක විශාල සිදුරක් ද, පෙට්ටියේ පැති පියනෙහි කුඩා සිදුරක් ද (බැලීමට ප්‍රමාණවත් පරිදි) සකස් කර ගන්න.
- පෙට්ටිය තුළ යම් දෙයක් තබා ඉහළින් ඇති සිදුර ආවරණය කරන්න.
- සිසුවෙක් ඉදිරියට කැඳවා පැති සිදුරෙන් බලා පෙට්ටිය තුළ වූ දෙය හඳුනා ගත හැකි දැයි විමසන්න. සිසුවාට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දෙන්න.
- දැන් ආලෝකය පෙට්ටිය තුළට වැටෙන පරිදි සිදුර විවෘත කර නැවත නිරීක්ෂණයට සලස්වන්න.





- දැන් පෙට්ටිය තුළ තැබූ ද්‍රව්‍ය සිසුවාට පෙනේ දැයි විමසන්න. එයට හේතුව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එමගින්, **අපට පෙනීමට ආලෝකය අවශ්‍යබව** පෙන්වා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 02 සඳහා සිසුන් යොමුකරන්න.


| **ඉගෙනුම් පලය** | **විෂය අන්තර්ගතය** | **කාර්ය සාධන ප්‍රමිති** | **නිර්ණායක** |
|---|---|---|---|
| 5 දවසේ විවිධ අවස්ථාවලදී සෙවණැල්ල වෙනස් වන ආකාරය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | ◆ උදේ, දහවල්, සවස් කාලයන්හි සෙවණැල්ලේ වෙනස්කම්<br>○ සෙවණැල්ලේ දිග<br>○ පතිත වන දිශාව | 5.1 හිරු එළිය පතිත වන දිශාව අනුව සෙවණැල්ලේ දිග සහ දිශාව වෙනස් වන ආකාරය නිරීක්ෂණය කර ඉදිරිපත් කරයි. | 5.1.1 නිරීක්ෂණය කර ඉදිරිපත් කිරීම. |
| 6 විවිධ ආලෝක ප්‍රභව ඇසුරින් සෙවණැල්ල ඇති වන ආකාරය අත්හදා බලමින් නිර්මාණ සිදු කරයි. | ◆ සෙවණැල්ල ඇති වන ආකාරය<br>○ පරීක්ෂා කිරීම<br>○ නිර්මාණ කිරීම | 6.1 අපට ආලෝකය ලැබෙන ප්‍රධාන ම ස්වභාවික ක්‍රමය හිරු එළිය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6.1.1 ප්‍රකාශ කිරීම. |
| | | 6.2 ආලෝකය ලැබෙන කෘත්‍රිම ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6.2.1. ප්‍රකාශ කිරීම. |
| | | 6.3 ඕනෑම ආලෝක ප්‍රභවයක් යොදා ගනිමින් සෙවණැලි නිර්මාණ ගොඩනගයි. | 6.3.1 සෙවණැලි නිර්මාණ ගොඩනැගීම. |

## ක්‍රියාකාරකම් 5

පියවර 1

- හිරු එළිය පවතින ස්ථානයක සිටින විට සෙවණැල්ල ඇති වෙන අයුරු නිරීක්ෂණයට සලස්වන්න.
- තමන්ගේ සෙවණැල්ල දෙස බලා ගෙන නිදහස් චාලක ක්‍රියාකාරකම්වල නිරත වීමට සිසුන් යොමු කරන්න.
- මද වේලාවක් සෙවණැලි පෑගීමේ ක්‍රීඩාවේ යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- දැන් සෙවණ සහිත ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න. සෙවනැල්ල තිබේ දැයි විමසන්න.

පියවර 2



- හිරු එළිය ඇති ස්ථානයකදී සිසුන්ට තම සෙවණැල්ල පතිත වී ඇති දිශාව (පැත්ත) සහ සෙවණැල්ලේ දිග නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. තම යහළුවෙකුගේ උදව්වෙන් තම සෙවණැල්ල වටා කෝටු කැබල්ලකින් හෝ පාට කූරකින් ඇඳීමට යොමු කරන්න.
- හිරු එළිය වැටෙන සුදුසු ස්ථානයක රිටක් සිටුවා එහි සෙවණැල්ල දවසේ විවිධ වේලාවන්හි වෙනස් වන අයුරු නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- දවසේ විවිධ වේලාවන්හිදී සිටුවා ඇති රිටෙහි සෙවණැල්ල අවසන් වන ස්ථානයේ කොඩියක් සිටුවීමට සිසුන් යොමු කරන්න.
- එහිදී, සෙවණැල්ලේ දිග ලණුවක් ආධාරයෙන් සන්සන්දනාත්මක ව මැන බැලීමටත්, හැකි නම් සිසුන්ගේ පියවර ගණනින් මැන බලා අද්දැකීම් ලබා ගැනීමටත් යොමු කරන්න.
- ඒ අනුව දවසේ විවිධ වේලාවන්හි සෙවණැල්ල පතිත වී ඇති දිශාව සහ දිග වෙනස් වන අයුරු නිරීක්ෂණය කිරීමට ඉඩ සලස්වන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 04-05 සඳහා සිසුන් යොමුකරන්න.

## ක්‍රියාකාරකම් 6

පියවර 1

- හොඳින් හිරු එළිය පවතින අවස්ථාවක ඉටි පන්දමක්, විදුලි පන්දමක්, විදුලි බල්බයක් ආදිය දල්වා එහි එළිය හොඳින් පෙනෙයි දැයි සිසුන්ගෙන් විමසන්න.
- එමගින් අපට දිවා කාලයේ ස්වභාවික ව ආලෝකය ලැබෙන ප්‍රධාන ආකාරය හිරු එළිය බව පෙන්වා දෙන්න.
- හිරු එළිය නොමැති විට දී ඉහත පෙන්වූ විවිධ ආකාරවලට අපට ආලෝකය ලබාගත හැකි අයුරු කතාබහ කරන්න.
- නමුත් එම සෑම ක්‍රමයකටම මුදල් වැයවන බව පෙන්වා දෙන්න.
- එම ක්‍රම මගින් ලැබෙන ආලෝකය අපට අවශ්‍ය පරිදි හසුරුවා ගත හැකි බැවින් (දැල්වීම/නිවීම) අපට අවශ්‍ය විට දී පමණක් දල්වා ගත යුතු බවත් එමගින් අරපිරිමැස්මට හුරු විය යුතු බවත් පෙන්වා දෙන්න.


පියවර 2

- හිරු එළිය ඇති විටදී මෙන් ම ඉහත ආලෝක ප්‍රභව ඇති විටදී ද සෙවනැල්ල ඇතිවේ දැයි නිරීක්ෂණය කිරීමට පහත පරිදි ඉඩ ලබා දෙන්න.

- සිසුන්ගෙන් පහත ආකාරයේ ප්‍රශ්න අසන්න.
    - සෙවනැල්ල කොහොම ද ඇතිවුණේ?
    - සෙවනැල්ල අඳුරු ඇයි?
- සිතා බැලීමට සහ සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

පියවර 3

- තරමක විශාල ප්‍රමාණයේ සුදු කඩදාසියක් ලෑල්ලක අලවන්න.
- සිසුන්ට විදුලි පන්දමක් ලබා දී සුදු තිරය මතට සෙවණැලි ලබාගත හැකි දැයි සොයා බැලීමට අවස්ථාව ලබා දෙන්න. සෙවණැලි පැහැදිලි ව නිරීක්ෂණය වන පරිදි එම ස්ථානය අඳුරු කර දෙන්න.
- විදුලි පන්දම් එළිය විවිධ ද්‍රව්‍යවලට යොමු කළ විට තිරය මත සෑදෙන සෙවණැලි නිරීක්ෂණයට ඉඩ සලසන්න.
- සිසුන්ට තම දෑතේ ඇඟිලි හා විවිධ ද්‍රව්‍ය ආධාරයෙන් නිර්මාණාත්මක ව සෙවණැලි ගොඩනගා ගනිමින් නිදහස් ක්‍රියාකාරකම්වල යෙදීමට, කතන්දරය ගොඩනැගීමට අවස්ථාව ලබා දෙන්න.




| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7 සුළඟින් සරල කාර්යයක් කර ගන්නා අයුරු අත්හදා බලයි. | ◆ සුළඟින් සරල කාර්යයක් කර ගන්නා අයුරු<br>○ සුළං පිඹීම<br>○ සුළං ඇදීම | 7.1 සුළං පිඹීමෙන් හා සුළං ඇදීමෙන් සරල කාර්යයක් කර ගන්නා අයුරු අත්හදා බලා අදහස් ප්‍රකාශ කරයි. | 7.1.1 අත්හදා බැලීම.<br>7.1.2 අදහස් ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 7

පියවර 1

- සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවා ගෙන යන්න.
- සිසුන් සියලු දෙනාට හොඳ හුස්මක් ගැනීමටත්, පහළ හෙළීමටත් යොමු කරන්න.
- අප සෑම මොහොතක ම හුස්ම ඉහළ පහළ හෙළන බවත්, අප හුස්ම ගන්නේ පරිසරයේ ඇති වාතය බවත් පෙන්වා දෙන්න.
- එය අපට නොපෙනෙන බව පවසා වාතය තිබෙන බව හඳුනා ගනිමු යැයි යෝජනා කරන්න.
- අවට පරිසරියේ ඇති ගස්වැල් දෙස විමසිල්ලෙන් බලා සිටීමට උපදෙස් දෙන්න.
- ගස්වැල් සෙලවීම, ගස්වැල් සෙලවෙන විට ඇඟට දැනෙන වෙනස, වියළි කොළ බිම වැටීම ආදිය පිළිබඳ කතා කරන්න.
- එසේ වන්නේ කුමක් නිසා දැයි සිසුන්ගෙන් විමසන්න. සිසු අදහස් ලබා ගන්න.
- සෑම සිසුවෙකුට ම පිරිසිදු බීම බටයක් /කඩදාසියකින් සකසා ගත් බටයක් බැගින් සපයා දෙන්න.
- එලෙස සපයා ගත් සිහින් බටයේ එක් පසකින් පිඹින විට අනෙත් පසින් අත්ලට දැනෙන්නේ කුමක් දැයි අසන්න.
- අප හුස්ම ගන්නා වාතය වේගයෙන් ගලා යන විට සුළඟ ඇති වන අයුරු එමගින් පෙන්වා දෙන්න.

පියවර 2



- සුළං පිඹීමෙන් සහ ඇදීමෙන් සිදුකළ හැකි පහත ආකාරයේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් දෙදෙනා බැගින් එකිනෙකට මුහුණ ලා අසුන් ගත කරවන්න.
- මේසය මැදින් සීමා ඉරක් අඳින්න.
- දෙදෙනාට ම බීම බට හා යෝගට් කෝප්ප හෝ ඒ ආකාරයේ වෙනත් සැහැල්ලු දෙයක් බැගින් ලබා දෙන්න.
- තම යෝගට් කෝප්පයට බීම බටයෙන් පිඹිමින් ඉක්මනින් ම සීමා ඉර දක්වා රැගෙන ඒමට යොමු කරන්න.

හෝ

- මේසය හෝ වෙනත් සුදුසු ස්ථානයක රූපයේ දැක්වෙන පරිදි සෘජිෆෝම් බෝලයක් යැවිය හැකි වන පරිදි මාර්ගයක් සාදා ගන්න.
- සෘජිෆෝම් වැනි සැහැල්ලු බෝල කිහිපයක් සපයන්න.
- සුළං පිඹීමෙන් මාර්ගය දිගේ බෝලය ගෙන යා හැකි දැයි උත්සාහ කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 08 සඳහා සිසුන් යොමුකරන්න.

පියවර 3

- සැම සිසුවෙකුට ම සුදු පාට කඩදාසිය බැගින් ලබා දෙන්න.
- පළමුව නිල් ,කහ ,රතු වර්ණ තුනෙන් බින්දු කිහිපය බැගින් කඩදාසිය මතට ඉසින්න.
- බටය යොදා ගනිමින් නිදහස් නිර්මාණයක් කිරීමට සිසුන් යොමු කරන්න. බටයෙන් පිඹිමින් හෝ වෙනත් ආකාරයකට යොදා ගනිමින් හෝ නිර්මාණ සිදු කරන අයුරු නිරීක්ෂණය කරන්න.
- අනතුරු ව තවත් කඩදාසියක් ලබා දී වර්ණ බින්දුවලට බටය ආධාරයෙන් පිඹීමට යොමු කරන්න.
- වර්ණ බින්දුව වියළෙන තෙක් කඩදාසිය එහා මෙහා හරවමින් පිඹීමට යොමු කරන්න.
- ඒවා තුළින් ඉස්මතුවන විවිධ රූප සහ වර්ණ පිළිබඳ සිසු අදහස් විමසන්න.
- කඩදාසියට යෙදූ නිල්, කහ, රතු වර්ණවලට අමතර ව දැකිය හැකි වර්ණ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- අවසානයේ සියලු ම සිසු නිර්මාණ අගය කරන්න. නිර්මාණය ක්‍රියාකාරකම් පොතෙහි ඇලවීමට සිසුන් යොමු කරන්න.

පියවර 4

- සුළං පිඹිමින් සිදු කළ ක්‍රියාකාරකම් පිළිබඳ කතාබහ කරන්න.
- එපරිදි, සුළඟ ඇදීමෙන් යම් කාර්යයක් සිදු කළ හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.
- එවැනි සිසුන් දන්නා අවස්ථා තිබේ නම් පැවසීමට යොමු කරන්න.
- සුළං අදිමින් සිදු කළ හැකි පහත ආකාරයේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- බඳුනකට, බෝල හෝ රූපයේ හෝ දැක්වෙන ආකාරයෙන් විවිධ හැඩ වලට සකසා ගත් සැහැල්ලු කාඩ්පත් /කඩදාසි දමාගන්න.
- සිසුන්ට බීම බට ලබාදී ඒවයින් සුළං අදිමින් බඳුනෙන් පිටතට එම ද්‍රව්‍ය ඇද ගත හැකි දැයි අත්හදා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහිදී ද්‍රව්‍ය ඇද ගන්නා විට ගණන් කරමින් ගැනීමටත් එමගින් තමන් පිටතට ගත් මුළු ද්‍රව්‍ය සංඛ්‍යාව සොයා ගැනීමට සිසුන් යොමු කරන්න.
- අප එදිනෙදා ජීවිතයේ දී භාවිත කරන සුළං නිපදවන සහ ඇදගන්නා විදුලි උපකරණ පිළිබඳ කතා කරන්න. ස්වභාවික සුළඟ මෙන් නොව ඒ සැම උපකරණයකට ම විදුලිය වැය වන බැවින් අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය ට හුරු පුරුදු කරවන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 07-08-09 සඳහා සිසුන් යොමුකරන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
| --- | --- | --- | --- |
| 8 ශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම පිළිබඳ මූලික හුරුකම් ලබයි. | ◆ ශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම | 8.1 ශක්තිය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි. | 8.1.1 අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කිරීම. |

## ක්‍රියාකාරකම් 9

- සිසුන් අවදි වූ අවස්ථාවේ සිට මේ වන තෙක් සිදු කළ දේවල් විමසන්න.

  උදා අවදි වීම
  මුහුණ සෝදා ගැනීම
  ආහාර ගැනීම
  වාහනයක නැගී පාසලට ඒම
- ඒ එක් එක් කාර්යය කර ගැනීමට අපිට උදවු වූ දේවල් පිළිබඳ විමසන්න.

  උදා වැඩ කරගන්න එළිය ලැබුණේ කොහොම ද?
  වාහනය ක්‍රියාත්මක වුණේ මොනවයින් ද?
- සිසුන්ට ගැළපෙන මට්ටමින් අපිට විවිධ දේවලින් අපේ වැඩ කර ගැනීමට ශක්තිය ලැබෙන අයුරු කතාබහ කරන්න.

  උදා හිරුගෙන්, සුළඟින්, විදුලියෙන්, පෙට්‍රල්/ ඩීසල්වලින්
- හිරු එළිය, සුළඟ වැනි ස්වාභාවික ක්‍රම හැර අනිකුත් බොහෝ ක්‍රමවලින් අපිට ලැබෙන ශක්තිය ඉතා සීමිත බව හා මුදල් වැය වෙන බවත්, එබැවින් ඉතා අරපිරිමැස්මෙන් භාවිතයට හුරු විය යුතු බවත් පවසන්න. ඒ සඳහා අපිට කළ හැකි දේවල් සිසුන් සමග සාකච්ඡා කරන්න.

  උදා කාර්ය අවසන් වූ පසු ස්විච් වසා දැමීම
  හිරු එළියෙන්, සුළඟින් උපරිම ප්‍රයොජන ගැනීම
- සිසුන් එවැනි දේ පාසලේදී, නිවසේදී සිදු කරන අවස්ථා පිළිබඳ කතාබහ කරන්න.
- ශක්තිය සැමවිට ම අරපිරිමැස්මෙන් භාවිත කිරීමට සිසුන් උනන්දු කරවන්න.

| ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 9 චුම්භකයකට ආකර්ෂණය වන හා ආකර්ෂණය නොවන ද්‍රව්‍ය ඇසුරෙන් අද්දැකීම් ලබයි. | ◆ චුම්භකයකට<br>° ආකර්ෂණය වන ද්‍රව්‍ය<br>° ආකර්ෂණය නොවන ද්‍රව්‍ය | 10.1 චුම්භකයකට ආකර්ෂණය වන හා ආකර්ෂණය නොවන ද්‍රව්‍ය වෙන් කර හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 10.1.1 ප්‍රකාශ කිරීම. |

## ක්‍රියාකාරකම් 10

පියවර 1

- චුම්භක ආශ්‍රිත ක්‍රියාකාරකමක් කිරීම සඳහා පහත ද්‍රව්‍ය රැස් කර ගන්න.
- චුම්භක, විනිවිද පෙනෙන තරමක් උස බෝතල්, කඩදාසි ඇමුණුම් කටු
- සිසු කුතුහලය අවධි කිරීම පිණිස "මැජික් සෙල්ලමක්" කරන බව පවසා පහත ක්‍රියාකාරකම සිදු කළ හැකි ය.
- විනිවිද පෙනෙන බෝතල් සිසුන්ට ලබා දෙන්න. බෝතල් තුළට ඇමුණුම් කටු හෝ ආයාකටු කිහිපයක් දමා මූඩිය වැසීමට පවසන්න.
- දැන් බෝතලය උඩු-යටිකුරු නොකර ඇමුණුම් කටු ටික බෝතලයේ ඉහළට ගන්න කාට ද පුළුවන්? යැයි විමසන්න.
- සිසු යෝජනා ක්‍රියාත්මක කර බැලීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන්ට චුම්භක ලබා දී නැවත උත්සාහ කිරීමට ඉඩ දෙන්න.
- ඉන්පසු ගුරුවරයා චුම්භකයක් ගෙන බෝතලය මතුපිට තබා චුම්භකයට ඇමුණුම් කටු ආකර්ෂණය වූ පසු සෙමින් බෝතලය දිගේ ඇමුණුම් කටු නොවැටෙන ලෙස අත ඉහළට රැගෙන යන්න.
- ඇමුණුම් කටු ක්‍රමයෙන් ඉහළට යන අයුරු සිසුන්ට පෙන්වන්න.
- දැන් අත සෙමින් ඉවත් කරන්න. එවිට ඇමුණුම් කටු වැටෙන ආකාරය නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.



- සිදු වූ දේ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට හා අත්හදා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2
- එදිනෙදා ජීවිතයේ චුම්භක භාවිත වන අවස්ථා දැක තිබේ දැයි විමසන්න. උදාහරණ පෙන්වමින් සිසුන්ට අද්දැකීම් ලබා ගැනීමට සලස්වන්න.
  උදා පැන්සල් පෙට්ටි පියන්වල පැන්ට්‍රි කබඩ් දොර පියන්වල

පියවර 3
- චුම්භකයකට ඇදී එන සහ ඇදී නො එන ද්‍රව්‍ය කිහිපයක් රැස් කර ගන්න.
  උදා: යකඩ ඇණයක්, කාසියක්, ඇමුණුම් කටු, යතුරක්, මකන කැබැල්ලක්, ප්ලාස්ටික් මූඩියක්, වීදුරු බෝලයක් සහ ඇලුමිනියම්, පිත්තල,රෙදි, කඩදාසි, මැටි ආදියෙන් සකස් කළ විවිධ ද්‍රව්‍ය
- විනිවිද පෙනෙන බඳුනක් සපයා ගන්න. ඉහත සඳහන් කළ ද්‍රව්‍ය සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කර තබන්න
- ඉහත ද්‍රව්‍ය එකින් එක බඳුනෙන් තැබුවහොත්, අත බඳුනට නොදා එම ද්‍රව්‍ය එළියට ගත හැකි ක්‍රමයක් සිතා බැලීමට සිසුන් යොමු කරන්න.
- සිසු අදහස් ක්‍රියාත්මක කර බැලීමට ඉඩ ලබා දෙන්න.
- එසේ නොවුණි නම්, කෝටුවක් ගෙන එහි කෙළවර නූලක් ගැටගසා නූලේ අනෙක් කෙළවර කාන්දමක් ගැට ගසා ගන්න. (බිලි පිත්තක ආකාරයට)
- එක් එක් ද්‍රව්‍ය බඳුනෙන් තබා කාන්දම් බිලිපිත්ත දැමුව හොත් එම ද්‍රව්‍ය ඉවතට ගත හැකි දැයි පුරෝකථනය කිරීමට **(predict)** සිසුන් යොමු කරන්න.
- දැන් කාන්දම් බිලිපිත්ත දමා එම ද්‍රව්‍ය ඉවතට ගැනීමට හැකි දැයි පරීක්ෂා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සැම සිසුවකුට ම මෙය අත්හදා බැලීමට අවස්ථාව ලබා දෙන්න.
- සමහර ද්‍රව්‍ය කාන්දම් බිලිපිත්ත මගින් ගැනීමට නොහැකි වූයේ ඇයි දැයි විමසන්න.
- කාන්දම්වලට ඇදී එන හා ඇදී නොඑන ද්‍රව්‍ය ඇති බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසු රුචිකත්වය අනුව ද්‍රව්‍ය කිහිපයක් පිළිබඳ පුරෝකථනය කිරීමටත්, පරීක්ෂා කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි අදාළ ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන්න.

## ක්‍රියාකාරකම් 11

පියවර 1
- මෙම ක්‍රියාකාරකම සඳහා ද චුම්භක, චුම්භකයකට ඇදී එන සහ ඇදී නො එන ද්‍රව්‍ය කිහිපයක් සහ කාඩ්බෝඩ් පෙට්ටි 4ක් සපයා ගෙන සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
- ඉදිරියෙන් මේස දෙකක් තබා ඒ මත කාඩ්බෝඩ් පෙට්ටි දෙක බැගින් තබන්න. ඉන් එක් පෙට්ටියක

✓සලකුණ ද අනිත් පෙට්ටියේ ✗ සලකුණ ද සිසුන්ට පැහැදිලි ව පෙනෙන පරිදි සලකුණු කරගන්න.



කාන්දමට ඇදෙන ද්‍රව්‍ය දැමීමට



කාන්දමට නොඇදෙන ද්‍රව්‍ය දැමීමට

- සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් කිහිපයකට වෙන් කර පළමුව කණ්ඩායම් දෙකක් ඉදිරියට කැඳවන්න. (ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි තබේ නම් සියලු ම කණ්ඩායම්වලට එකවර ක්‍රියාකාරකමේ නිරතවිය හැකි පරිදි සැලසුම් කරගන්න)
- සපයා ගත් ද්‍රව්‍ය කට්ටලයෙන් අහඹු ලෙස ද්‍රව්‍ය 2 බැගින් ගෙන මැද ඇති මේසය මත තබන්න.
- කණ්ඩායම් දෙකේ පළමු සිසුන් දෙදෙනාට කාන්දම බැගින් ලබා දී ක්‍රියාකාරකම අරඹන්න.
- ගුරු සංඥාවට අනුව කණ්ඩායම් දෙකේ මුලින් සිටින සිසුන් දෙදෙනාට දිව ගොස් කැමති දෙයකට කාන්දම තබා ඇදී එනවා නම් ✓සලකුණ ඇති පෙට්ටියට ද, කාන්දමට ඇදී නො එන්නේ නම් ✗ සලකුණ ඇති පෙට්ටියට ද දැමීමට උපදෙස් දෙන්න.
- පෙට්ටියට දැමීමෙන් පසු කණ්ඩායමේ පසුපසට ගොස් හිඳ ගැනීමටත් ඊළඟ සිසුවාට ඉදිරියට පැමිණීමටත් අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම අවසානයේ ඒ ඒ පෙට්ටියේ එකතු වී ඇති ද්‍රව්‍ය මොනවා දැයි පිටතට ගෙන බලන්න. ඒ පිළිබඳ සිසු අදහස් විමසමින් සාකච්ඡා කරන්න.

පියවර 2

- සිසුන් කණ්ඩායම් කරන්න. කණ්ඩායම් සඳහා පෙර දී යොදා ගත් ආකාරයේ ද්‍රව්‍ය මෙම ක්‍රියාකාරකම සඳහා ද සපයා ගන්න
- තරමක විශාල කඩදාසියක පහත සඳහන් දක්වා ඇති ආකාරයට වගුවක් සටහන් කර සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න

| කාන්දමට ඇදෙන දේ ✓ | කාන්දමට නොඇදෙන දේ ✗ |
|---|---|
| | |

- එම වගුවේ ✗ ලෙස සටහන් පැත්තේ සියලු ද්‍රව්‍ය තබා කාන්දම භාවිතකර ✓ පැත්තට ඇදගත හැකි ද්‍රව්‍ය ඇද ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- කාන්දමට නොඇදෙන ද්‍රව්‍ය එලෙසම ✗ පැත්තේ තැබීමට උපදෙස් ලබා දෙන්න.
- ඒ අනුව වගුවේ කාන්දමට ඇදෙන හා නොඇදෙන ද්‍රව්‍ය යන පැතිවල ඇති ද්‍රව්‍ය නිරීක්ෂණය කර අදහස් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 10 සඳහා සිසුන් යොමුකරන්න.

| කාර්ය සාධන ප්‍රමිති | ත.නි.අං. | අපේක්ෂිත මට්ටමට පැමිණ ඇත | අපේක්ෂිත මට්ටමට දුරස්ථය |
|---|---|---|---|
| 1.1 බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් තල්ලු කිරීම සිදු කරන අයුරු අත්හදා බලයි. | 1.1.1 | ◆ බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් තල්ලු කිරීම සිදු කරන අයුරු අත්හදා බලයි. | ◆ බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් තල්ලු කිරීම අත්හදා බැලීමේ දුෂ්කරතා දක්වයි. |
| 1.2 බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් ඇදීම සිදු කරන අයුරු අත්හදා බලයි. | 1.2.1 | ◆ බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් ඇදීම සිදු කරන අයුරු අත්හදා බලයි. | ◆ බලයක් යෙදීමෙන් යම්කිසි ද්‍රව්‍යයක් ඇදීම අත්හදා බැලීමේ දුෂ්කරතා දක්වයි. |
| 1.3 තල්ලු කිරීමේදී හා ඇදීමේදී බලය යෙදූ දිශාවට වස්තුවේ පිහිටීම වෙනස් වන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 1.3.1 | ◆ තල්ලු කිරීමේදී හා ඇදීමේදී බලය යෙදූ දිශාවට වස්තුවේ පිහිටීම වෙනස් වන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ තල්ලු කිරීමේදී හා ඇදීමේදී බලය යෙදූ දිශාවට වස්තුවේ පිහිටීම වෙනස් වන බව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 2.1 නිසි ආහාරපාන ලබා ගැනීමෙන් ශරීරයට අවශ්‍ය ශක්තිය ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 2.1.1 | ◆ නිසි ආහාරපාන ලබා ගැනීමෙන් ශරීරයට අවශ්‍ය ශක්තිය ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ නිසි ආහාරපාන ලබා ගැනීමෙන් ශරීරයට අවශ්‍ය ශක්තිය ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 2.2 ශක්තිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ආහාර පාන ලබා ගනියි. | 2.2.1 | ◆ ශක්තිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ආහාර පාන ලබා ගනියි. | ◆ ශක්තිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ආහාර පාන ලබා නොගනියි. |
| 3.1 හිරුගෙන් ආලෝකය සහ උණුසුම ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.1.1 | ◆ හිරුගෙන් ආලෝකය සහ උණුසුම ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ හිරුගෙන් ආලෝකය/උණුසුම ලැබෙන බව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 3.2 හිරු එළිය ජීවීන්ට අත්‍යාවශ්‍ය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 3.2.1 | ◆ හිරු එළිය ජීවීන්ට අත්‍යාවශ්‍ය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ හිරු එළිය ජීවීන්ට අත්‍යාවශ්‍ය බව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 4.1 පෙනීමට ඇස් හා ආලෝකය අවශ්‍ය බව පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | 4.1.1 | ◆ පෙනීමට ඇස් හා ආලෝකය අවශ්‍යබව පරීක්ෂා කර ප්‍රකාශ කරයි. | ◆ පෙනීමට ඇස්/ආලෝකය අවශ්‍ය බව පරීක්ෂා කර ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 5.1 හිරු එළිය පතිත වන දිශාව අනුව සෙවණැල්ලේ දිග සහ දිශාව වෙනස් වන ආකාරය පරීක්ෂා කර ඉදිරිපත් කරයි. | 5.1.1 | ◆ හිරු එළිය පතිත වන දිශාව අනුව සෙවණැල්ලේ දිග සහ දිශාව වෙනස් වන ආකාරය පරීක්ෂා කර ඉදිරිපත් කරයි. | ◆ හිරු එළිය පතිත වන දිශාව අනුව සෙවණැල්ලේ දිග/දිශාව වෙනස් වන ආකාරය පරීක්ෂා කර ඉදිරිපත් කිරීමේ දුෂ්කරතා දක්වයි. |

| | | | |
|---|---|---|---|
| 6.1 අපට ආලෝකය ලැබෙන ප්‍රධාන ම ස්වාභාවික ක්‍රමය හිරු එළිය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6.1.1 | ◆ අපට ආලෝකය ලැබෙන ප්‍රධාන ම ස්වාභාවික ක්‍රමය හිරු එළිය බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ අපට ආලෝකය ලැබෙන ප්‍රධාන ම ස්වාභාවික ක්‍රමය හිරු එළිය බව හඳුනා ගෙන ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.2 ආලෝකය ලැබෙන කෘත්‍රිම ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 6.2.1 | ◆ ආලෝකය ලැබෙන කෘත්‍රිම ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ ආලෝකය ලැබෙන කෘත්‍රිම ක්‍රමයක් හඳුනා ගෙන කිරීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.3 ඕනෑ ම ආලෝක ප්‍රභවයක් යොදා ගනිමින් සෙවණැලි නිර්මාණ ගොඩනග යි. | 6.3.1 | ◆ ඕනෑ ම ආලෝක ප්‍රභවයක් යොදා ගනිමින් සෙවණැලි නිර්මාණයක් ගොඩනගයි. | ◆ ඕනෑ ම ආලෝක ප්‍රභවයක් යොදා ගනිමින් සෙවණැලි නිර්මාණ ගොඩනැඟීමේ දුෂ්කරතා දක්වයි. |
| 7.1 සුළං පිඹීමෙන් හා සුළං ඇදීමෙන් සරල කාර්යයක් කර ගන්නා අයුරු අත්හදා බලයි. | 7.1.1 | ◆ සුළං පිඹීමෙන් හා සුළං ඇදීමෙන් සරල කාර්යයක් කර ගන්නා අයුරු අත්හදා බලයි. | ◆ සුළං පිඹීමෙන් /සුළං ඇදීමෙන් සරල කාර්යයක් කර ගන්නා අයුරු අත්හදා බැලීමේ දුෂ්කරතා දක්වයි. |
| 8.1 බලශක්තිය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි. | 8.1.1 | ◆ බලශක්තිය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි. | ◆ බලශක්තිය අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය නොකරයි. |
| 9.1 චුම්භකයකට ආකර්ෂණය වන හා ආකර්ෂණය නොවන ද්‍රව්‍ය වෙන් කර හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 9.1.1 | ◆ චුම්භකයකට ආකර්ෂණය වන හා ආකර්ෂණය නොවන ද්‍රව්‍ය වෙන් කර හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ◆ චුම්භකයකට ආකර්ෂණය වන හා ආකර්ෂණය නොවන ද්‍රව්‍ය වෙන් කර හඳුනා ගැනීමේ දුෂ්කරතා දක්වයි. |

# සෞන්දර්ය අධ්‍යාපනය
# ගුරු මාර්ගෝපදේශය

## ක්‍රියාකාරකම 01 — මුද්‍රණ සිතුවම් නිමවමු.

විෂය අන්තර්ගතය
මුද්‍රණ - **Prints**
රිද්මය - **Rhythm**
රටා - **Pattern**

කාලය : කාලච්ඡේද 01යි.

හැඳින්වීම : මෙම ක්‍රියාකාරකමින් මුද්‍රණ ක්‍රමය යටතේ නිර්මාණ කිරීමට අවස්ථාව සැලසේ. ඒ අනුව පැස්ටල් හා තීන්ත භාවිත කර ශාක පත්‍ර රිද්මයකට අනුව අලංකාර රටා මවමින් මුද්‍රණ නිර්මාණ සිදු කරනු ලැබේ.

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- ඝනකම් නාරටියකින් යුත් එක ම වර්ගයට අයත් විවිධ ප්‍රමාණයේ ශාක පත්‍ර
- රෙදි පින්තාරු තීන්ත (Fabric paints)
- කුඩා ප්‍රමාණයේ ස්පොන්ජ් කැබලි කිහිපයක්
- තීන්ත මිශ්‍ර කිරීමට කුඩා භාජනයක් (පැතලි දීසියක් හෝ පිඟානක්)

**පෙර සූදානම**

- සිසුන්ට ඔවුන්ගේ නිවස හෝ පාසල වටපිටාවේ බිම වැටී ඇති ශාඛ පත්‍ර අහුලා ගෙන ඒමට උපදෙස් ලබා දෙන්න. ඔබ විසින් ද ඉහත ද්‍රව්‍ය සූදානම් කර ගත යුතු වේ.

1 වන පියවර


- සිසුන් විසින් පන්ති කාමරයට රැගෙන ආ ශාඛ පත්‍ර නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසා දෙන්න. ශාඛ පත්‍රවල හැඩය, වර්ණ, ඒවායේ නාරටිවල ලක්ෂණ හොඳින් පෙන්වා දෙන්න. ඒ අනුව ඔවුන්ගේ දැනුම හා අද්දැකීම් සාකච්ඡාවට ලක් කරන්න.
- හැඩ, රේඛා හා වර්ණ සම්බන්ධ පෙර දැනුම ආවර්ජනය කරමින් මෙම ක්‍රියාකාරකමට පදනම සපයා ගන්න.
- ශාඛ පත්‍රවල හැඩය, වර්ණ, ඒවායේ නාරටිවල ලක්ෂණ මුද්‍රණ සිතුවමට යොදා ගත හැකි බව පෙන්වා දෙන්න.
- අත්හදා බැලීම් සඳහා ළමුන්ගේ කැමැත්ත හා උනන්දුව ගොඩනගන්න. ඒ සඳහා සුදුසු ආදර්ශ පෙන්වන්න.





ආදර්ශ සඳහා නිදසුන්

2 වන පියවර




- මුද්‍රණය කිරීම සඳහා පළමු ව ශාක පත්‍ර මත වර්ණ තැවරීමටත්, එම වර්ණ තැවරූ ශාක පත්‍රය චිත්‍ර කඩදාසිය මත තැබීමටත් උපදෙස් ලබා දෙන්න. මෙම අභ්‍යාසය කිහිප වාරයක් කර අතේ හුරුව ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
- අනතුරුව වෙනත් සුදු කඩදාසියක් භාවිත කර, විවිධ වර්ණ තැවරූ විවිධ ශාක පත්‍ර භාවිත කිරීමට ඉඩ සලසන්න. කඩදාසිය මත මුද්‍රණය කරන එම ශාක පත්‍ර මගින් අලංකාර රටා මැවෙන ලෙස නිර්මාණයක් කිරීමට මඟ පෙන්වන්න.

3 වන පියවර

- නිම කළ සිතුවම් තෝරාගත් තැනක ප්‍රදර්ශනය කරන්න. ප්‍රදර්ශනය කරන සිතුවම්වල දැකිය හැකි ශාක පත්‍ර හැඩ, නාරටිවල රේඛා හා යොදා ගත් වර්ණ සම්බන්ධ සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න. එසේ ම අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරුවරයා සිසුනගේ අගය තක්සේරු කිරීමට අවස්ථාව සලසා ගන්න.

## ක්‍රියාකාරකම 02 — අකුරු එකතුවෙන් සිතුවම් නිමවමු

විෂය අන්තර්ගතය
අක්ෂර - **Pont**
සැලසුම් - **Design**

කාලය : කාලච්ඡේද 01යි.

හැඳින්වීම : මෙම ක්‍රියාකාරකමින් අකුරු ඇඳීම සිදු කරයි. අකුරු විවිධ හැඩ අනුව අඳිමින් ඒවා අලංකාර ලෙස ඉදිරිපත් කිරීම මෙමගින් සිදු කරනු ලැබේ.

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- අඟල් දෙකක ප්‍රමාණයේ කපන ලද අකුරු (සිංහල/දෙමළ/ඉංගීසි)
- රෙදි පින්තාරු තීන්ත (Fabric paints)/පැස්ටල් (Pastel), ඇක්‍රිලික් (Acrylic) වැනි වර්ණ


පියවර 01



- කපා සකස් කරගත් අකුරු ළමුන්ට ලබා දෙන්න. එම අකුරුවල ලක්ෂණ පළමුවාරයේ හැඩ හා රේඛා සමග විමසා බැලීම සිදු කරන්න.





- අකුරු කිහිපයක් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසා දෙමින් ඔවුන්ගේ දැනුම පරීක්ෂාවට ලක් කරන්න. ඔබගේ සහයෝගය ලබා දෙන්න.
- අකුරු ඇසුරෙන් චිත්‍ර ඇඳීම සඳහා ළමුන්ගේ කැමැත්ත උනන්දුව ගොඩනගන්න. ඒ සඳහා සුදුසු ආදර්ශ පෙන්වන්න.




පියවර 02

- කලු හෝ වෙනත් වර්ණයක් සහිත කඩදාසි තලයක් මත නිදහසේ අකුරු ඇඳ ගැනීමට යොමු කරන්න. මෙහිදි පහත ආකාරයෙන් ක්‍රියාකාරකම කිරීමට සිසුන්ට උපදෙස් හා මඟ පෙන්වීම ලබා දෙන්න.
  - අකුරු තබා ඇඳ ගැනීම
  - නිදහසේ අකුරු ඇඳ ගැනීම
  - සිරිම් චිත්‍ර ලෙස ඇඳ ගැනීම (වර්ණ කිහිපයක් මත කලු තැවරන මතුපිටක)

  මේ කුමන ආකාරයෙන් වුව ද එකම අකුර හෝ අකුරු කිහිපයක් කඩදාසි තලය මත ඇඳ ගැනීම සිදු කළ හැකි ය.

පියවර 03

- නිම සිතුවම් තෝරාගත් තැනක ප්‍රදර්ශනය කරන්න. ප්‍රදර්ශනය කරන සිතුවම් සඳහා භාවිත අක්ෂර, ඒවායේ හැඩ, රේඛා හා යොදා ගත් වර්ණ සම්බන්ධ සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න. එසේම අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරු අගය කිරීම මගින් සිසුන් තක්සේරු කිරිමට අවස්ථාව සලසා ගන්න.

| ක්‍රියාකාරකම 03 | මුහුණු සිතුවම් රසවිඳමු |
|---|---|
| විෂය අන්තර්ගතය<br>උඩුකය රූප - **Portrait**<br>ඇගයීම - **Appriciation** | කාලය : කාලච්ඡේද 01යි.<br>හැඳින්වීම : මෙම ක්‍රියාකාරකමින් පැබ්ලෝ පිකාසෝගේ උඩුකය රූප සිතුවම් කිහිපයක් නිරීක්ෂණය කර එම ලක්ෂණ ඇගයීමට අවස්ථාව සැලසේ. එමගින් ළමුන්ගේ නිරීක්ෂණ ශක්තිය, දැනුම මත කතන හැකියාව සඳහා භාෂාව සංවර්ධනයට මෙන් චිත්‍ර භාෂාව භාවිතයට ද පදනමක් සකසා ගනු ලැබේ. |

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**
- පිකාසොගේ මුහුණු චිත්‍ර

1 වන පියවර
- පහත දැක්වෙන පැබ්ලෝ පිකාසොගේ නිර්මාණ සුදුසු ලෙස ප්‍රදර්ශනය කරන්න.




- ළමුන් කණ්ඩායම් කරන්න. කණ්ඩායම් වශයෙන් එම නිර්මාණ සම්බන්ධ සාකච්ඡා කිරීමට ළමුන්ට අවස්ථාව සලසා දෙන්න. ඇස්, නාසය, කට හා කන වැනි අංගවල හැඩ විමසා බලන්න. මෙහිදී පළමුවන වාරයේ මූලික හැඩ සමග මෙම අංග සන්සන්දනය කර පෙන්වා දෙන්න.

පියවර 02
- මුහුණු නිරීක්ෂණය සඳහා පහත ප්‍රශ්න යොමු කරන්න.
  - මුහුණේ අංග
  - එක් එක් අංගවල හැඩය
  - යොදා ඇති වර්ණ
  - රේඛා
  - පසුබිම හා නිමාව

  මෙම ප්‍රශ්න සමග ළමුන්ට කණ්ඩායම් වශයෙන් එකතු වී රිසි ලෙස තමන්ගේ කතන හැකියා සංවර්ධනය කිරීම සඳහා සලසා දෙන්න.

පියවර 03
- කණ්ඩායම් සාකච්ඡා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න. එම අදහස් අනෙක් කණ්ඩායම් අදහස් සමග බෙදා ගැනීමට ද යොමු කරන්න. අවසානයේ ඔබගේ ප්‍රතිචාරය ද ළමුන්ට ඉදිරිපත් කරන්න. ඒ අනුව නිර්මාණ සම්බන්ධ ව සිසු අදහස්කීම්, අදහස් ප්‍රකාශ කිරීමට හා අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරු අගය කිරීම මගින් සිසුන් තක්සේරු කිරීමට අවස්ථාව සලසා ගන්න.

## ක්‍රියාකාරකම 04 මුහුණක් සිතුවම් කරමු

| | | |
|---|---|---|
| විෂය අන්තර්ගතය<br>උඩුකය රූප - **Portrait**<br>ඇගයීම - **Appriciation** | කාලය : | කාලච්ඡේද 01යි. |
| | හැඳින්වීම : | මෙම ක්‍රියාකාරකමින් උඩුකය රූප ඇඳීම සඳහා වන මූලික අභ්‍යාස සිදු කරනු ලැබේ. ඒ අනුව මුහුණක අංග හඳුනා ගනිමින් එම අංග එකිනෙකට සන්සන්දනය කරමින් ඒවා ප්‍රමාණ අනුව චිත්‍රණය කිරීමට අවස්ථාව සලසනු ලැබේ. |

**ක්‍රියාකාරකම කිරීමට අවශ්‍ය උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පැන්සල්
- වර්ණ (පැස්ටල්/දිය සායම්/ඇක්‍රිලික් වැනි)

### 1 වන පියවර



- පෙර දැනුම ආවර්ජනය කරමින් පන්ති කාමරයේ සිසුන්ට ඔවුන්ගේ ළඟ සිටින මිතුරු මිතුරියන්ගේ මුහුණුවල් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන්න. නිරීක්ෂණය කළ මුහුණක අංග විමසා බලන්න.
- ඇස්, නාසය, කට හා කන වැනි අංගවල හැඩය විමසා බලන්න. මෙහිදී පළමුවන වාරයේ මූලික හැඩ සමග මෙම අංග සන්සන්දනය කර පෙන්වා දෙන්න.
- මුහුණු ඇඳීම සඳහා සිසුන්ට ආදර්ශ පෙන්වමින් ඒ සඳහා කැමැත්ත උනන්දුව ඇති කරන්න.

### 2 වන පියවර



- මිතුරෙකුගේ මුහුණක් නිරීක්ෂණය කරමින් මුහුණක් ඇඳීමට ළමුන්ට උපදෙස් දෙන්න. මුහුණ ඇඳීමේදී එය කඩදාසිය පුරා විශාල ව ඇඳීමට යොමු කරන්න. කඩදාසිය අනුව අඳින මුහුණේ ඇස්, නාසය, කට යෙදීමට උපදෙස් දෙන්න. දී ඇති රූප ඒ සඳහා ඔබට ආදර්ශයක් කර ගත හැකි ය. මෙහිදී ඇඳ පෙන්වීම සිදු නොකළ යුතු අතර ළමුන්ට ඔවුන්ට රිසි ලෙස තමන්ගේ හැකියා වර්ධනය කිරීමට අවස්ථාව සලසා දෙන්න.

2 වන පියවර



- ඇඳීමෙන් පසු මුහුණ වර්ණ කිරීමට යොමු කරන්න. පළමුවන හා දෙවන වාරයේ සිදු කරන වර්ණවල අභ්‍යාස නැවත මෙහිදි අවධාරණය කරන්න.
- මුහුණ සමග පසුබිම ලෙස ඉතිරිවන කොටස් ද සුදුසු ලෙස වර්ණ කිරීමට යොමු කරන්න. කඩදාසියේ සුදු නොපෙනෙන ලෙස ඉතා හොඳින් වර්ණ ආලේප කිරීම උපදෙස් ලබා දෙන්න.
- පළමුවන වාරයේ ඉගෙන ගත් රේඛා අභ්‍යාස අවධාරණය කරමින් ඒවා ද තම සිතුවම මතු කිරීම සඳහා භාවිත කිරීමට උපදෙස් ලබා දෙන්න.
- මෙම උපදෙස් ලබා දීම වාචික උපදෙස් මත පමණක් සිදු කිරීමෙන් ළමුන්ට තම හැකියා ස්වයං සංවර්ධනයට අවස්ථාව සලසා දෙන්න.

4 වන පියවර

- නිම කරන අභ්‍යාස පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. එම නිර්මාණ සම්බන්ධ ව සිසු අද්දැකීම්, අදහස් ප්‍රකාශ කිරීමට හා අනෙක් නිර්මාණ ගැන අදහස් දැක්වීමට මෙන් ම ගුරු අගය කිරීම මගින් සිසුන් තක්සේරු කිරිමට අවස්ථාව සලසා ගන්න.

# සංගීතය

## ක්‍රියාකාරකම් 01

ගීතයක් ගැයීමේ හැකියාව සංවර්ධනය කිරීම සඳහා ශුද්ධ ස්වර 2ක් පමණක් භාවිතවන ගීතයක් ගායනා කිරීම

- සිසුන් වෙත මේ ගීතයේ අදහස සරල බසින් පැහැදිලි කරන්න.
- ගීතය පද එකින් එක ගායනා කරමින් අදාළ සංගීත භාණ්ඩය/හඬ පටය වාදනය කරමින් ගීතය රසවිඳීමට හුරු කරන්න
- සිසුන්ට ගීතය කටපාඩම් වනතුරු ගායනා කර කණ්ඩායම් වශයෙන් අංග චලන සමග ගීතය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

ගී ගයන මේ කුරුලු යාලුවන් හා
මේ අහසෙ පාවෙන්න බෑ අපට බෑ
කෝ එවන් පියාපත් නෑ අපට නෑ
යාලුවනේ පියාඹන්න ආදරය දී

## ක්‍රියාකාරකම 02
## තාල රටා නිර්මාණය

**පියවර 01**

- තාලයට අත්පොඩි තැලීම - මාත්‍රා 2,3,4
- One, Two යන රිද්මයට අත්පුඩි තැලීමට දරුවන්ට උපදෙස් දෙන්න.
- අත බොකුටු කරමින් ශබ්දය උපදවන්න දරුවන්ට මග පෙන්වන්න.
- වේගයෙන් සහ සෙමින් වෙනස පැහැදිලි කරමින් අත්පුඩි තැලීමට උපදෙස් දෙන්න.





**පියවර 02**

- අපේ ශරීරයේ දෙඅත් සහ දෙපා භාවිතයෙන් අපට කළ හැකි වෙනත් ශබ්ද මොනවා ද? යන්න සිසුන්ගෙන් විමසන්න
- අත්පුඩි ගසමින්, දෙපා භාවිතයෙන් පොළව මත පාදය පතිත කිරීමෙන් නිකුත්වන විවිධ හඬ සමග තාල රටා නිර්මාණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න.

**පියවර 03**

- කට හඬ සහ ශරීර අංග එකතු කර ගනිමින් තාල රටා නිර්මාණය සිදු කිරීම සඳහා පහත දැක්වෙන උදාහරණ භාවිත කරන්න

උදාහරණ

| | | | |
|---|---|---|---|
| 01 |  |  |  |
| 02 |  |  |  |
| 03 |  |  |  |

- තව දුරටත් ලබා දී ඇති වීඩියෝ පට සහ හඬ පට සමග සිසුන්ට මෙම තාල රටා පුහුණු වීමටත්, නිර්මාණශීලී ලෙස කට හඬ සහ ශරීර අංග භාවිතයෙන් සිසුන් කණ්ඩායම් සකස් කර නිර්මාණයන් කිරීමටත් ඉඩ ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 03**

- සිසුන් තුළ සහකම්පනය, නොපසුබට උත්සාහය, වගකීම් සහගත බව, සහයෝගීතාවය, රැකබලා ගැනීම සහ පෝෂණය කිරීම සහ චිත්තවේගීය ප්‍රකාශනය වැනි මූලික සමාජ කුසලතා ඉස්මතුවන ආකාරයෙන් 'අයන්න කියන්න' ගීතය අදහස පැහැදිලි කරමින් සිසුන් සමග අංග චලන භාවිත කරමින් ගායනය කරන්න.

අයන්න කියන්න ලොවට ම ඇහෙන්න - එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න - එන්න මගේ නංගී

අයන්න කියන්න ලොවට ම ඇහෙන්න - එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න - එන්න මගේ නංගී

පාසල නම් රන් දෙවොලේ - දෙවියන් වන් ගුරු කැළගේ
සිත දිනමින් පා හෙවණේ - ශිල්ප ලබා මතු දවසේ
ලෝකය දකින්න එහි සැරිසරන්න
එන්න මගේ මල්ලී - එන්න මගේ නංගී

අයන්න කියන්න ලොවට ම ඇහෙන්න - එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න - එන්න මගේ නංගී

කාසි පනම් හිටි හැටියේ - සතුරෝ ගෙන යති රහසේ
පොතින් පතින් ලද දැණුමේ - ධනය සදාකල් සුරැකේ
ඥානය වඩන්න කාලය ගෙවන්න
එන්න මගේ මල්ලී - එන්න මගේ නංගී

අයන්න කියන්න ලොවට ම ඇහෙන්න - එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න - එන්න මගේ නංගී //

**ගායනය** : විශාරද නන්දා මාලනී
**සංගීතය** : මර්වින් පෙරේරා
**පදරචනය** : සුනිල් ආරියරත්න

**නාට්‍ය හා නර්තනය**
**ක්‍රියාකාරකම 01**
**තාල තැබීම**

- තාලයක රටාව ඒකාකාරී වේ.
- තාලය තබීම සඳහා තාලම්පට භාවිත වේ.
- තාලම්පටේ හඬ දෙකකි.
- තලම්පටේ පියන් දෙක වසා වාදනය කිරීමේදී සහ පියන් දෙක අඩක් වසා වාදනය කිරීමේදී එහි වෙනස හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. (තාලම්පටයක් මේ සඳහා භාවිත කරන්න)
- ඉන් පසු අත්පුඩි (හඬ) ඇසුරෙන් තාලය තැබීමට යොමු කරන්න.
- අත්පුඩි දෙකක් අතර ගතවන කාලය ඒකාකාරිවන නිසා එක හා සමාන දුරින් අත්පුඩි ගසන බව පෙන්වා දෙන්න
- මේ අත්පුඩි දෙකක් අතර ගතවන කාලය 'මාත්‍රා' ලෙස හඳුන්වන බව අතේ ඇඟිලි ඇසුරෙන් පෙන්වා දෙන්න.
- මාත්‍රා දෙකේ තාලයට අනුව 'උඩපල ගත්තත් වට්ටක්කා' රබන් පදය අත්පුඩි සහිත ව ඉදිරිපත් කරන්න.
- එම අත්පුඩි දෙකක් අතර ගතවන කාලය 1 - 2 ලෙස ඇඟිලි ඇසුරෙන් පෙන්වා දෙන්න.
  1 - අත්පුඩිය
  2 - ඇඟිල්ල
- තාලය ඒකාකාරී වන බව පෙන්වා ඉහත ආකාරයට ප්‍රායෝගික ව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 02**
**ජන ගී ගායනය (කෙළි ගී)**

- ක්‍රීඩා කරන අවස්ථාවන්හිදී සාමූහික ව ගායනා කළ ගීත 'කෙළි ගීත' ලෙස හැඳින්වේ.
- ලී කෙළි කණ්ඩායමක 06 දෙනෙක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකතු වී සැහැල්ලු ලී පොලු දෙක බැගින් කපා ගෙන ඒමට සිසුන්ට පවසන්න.
- කවිය හොඳින් පුහුණු වී ගයමින් නර්තනයේ යෙදෙන්න සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

එක පඳුරෙන් ලී සයක්      කපාගෙන
එක උස ඇති සදෙනෙක්      තෝරාගෙන
ගුරුන් අතට දී ලී      බෙදවාගෙන
අපිත් කෙළිමු ලී දෙපිළ      සැදීගෙන

පියවර 01

- ගීතය හොඳින් පුහුණු වූ පසු එක තැන රැදෙමින් ලී කෙළි රංගනයේ යෙදෙන්න.
- ගීතය ගයමින් කණ්ඩායම අනුගමනය කරමින් රංගනයේ යෙදීමට උපදෙස් දෙන්න.

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

# Activity Based Oral English

## Greeting – Good Morning to you – Song

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.1 Greets and responds to greetings | Good morning to you //<br>Good morning, dear children.<br>Good morning to you //<br><br>Good morning to you //<br>Good morning, dear teacher.<br>Good morning to you //<br><br>Structure:<br>Good morning, children!<br>Good morning, teacher! | Greets appropriately<br><br>Greets politely<br><br>Greets using a song appropriately. |

**ඉගෙනුම් සම්පත් :** ABOE ක්‍රියාකාරකම් පොත, හඬ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- එකිනෙකාට ආචාර කිරීමේ දී දෑත් තබා ගත යුතු ආකාරය සිසුන්ට කියා දෙන්නී
- Good morning යැයි පැවසීමේ දී අත් දෙකෙහි අත්ල දෙක එකිනෙක මත ස්පර්ශ වන සේ සිරස් ව නිකට ට පහතින් ළය මත තබා ගෙන "Good morning" කියා පැවසීමට කියා දෙන්න.
- ගීතයේ පළමු කොටස ඔබ ගැයූ පසු ගීතයේ දෙවන කොටස එනම් 4, 5, 6 පේළි සිසුන් ලවා ගැයීමට උපකාර වන්න.
- මෙලෙස දිනපතා ඉංග්‍රීසි පාඩම ආරම්භයේ දී මේ ගීතය ගයා ආරම්භ කරන්න.

| Classroom Language | |
|---|---|
| **Teacher:** | Children, Stand up. Good morning, children!. |
| **Students:** | Good morning, teacher!. |
| **Teacher:** | Now we are going to sing a song. First, let's listen. Are you ready? Students: Yes, teacher. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Greets** | |
| **Greets using a song** | |

**Activity 01 - Listen, Show, Say and Act**

| **Learning Outcomes** | **Subject Content** | **Performance Standards** |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | Listen, Show, Say and Act<br><br>Ship, aero plane, tractor, car, train, bus<br><br>I am a car..<br>I am a ship..<br>I am a tractor..<br>I am a bus..<br>I am a train..<br>I am an aeroplane.. | Identifies the vehicles appropriately. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත￼ අදාළ වාහනවල පින්තූර පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සෑම ළමයෙකුටම එක වාහනයක පින්තූර පතක් ලබා දෙන්න
- ගීතයට සවන් දීමට පවසා පින්තූර පත් පෙන්වමින් එම ගීතය ගැයීමට ළමුන්ට උපකාර වන්න
- උදාහරණයක් ලෙස කාර්යක පින්තූර පතක් ලබා දුන්නා නම් එම කොටස තාලයට ගායනා කරමින් වාහනයක් පදවන ආකාරයෙන් චලනය වීමට පවසන්න
  I am a car // bru..m /// peep //
- මේ ආකාරයට අනෙක් වාහන වලද පින්තූර පත් ලබා දෙමින් පළමුව ගුරුතුමා/ගුරුතුමිය අදාල ගීත කාණ්ඩය පවසමින් වාහනය පදවන ආකාරය විනෝදජනක ලෙස රඟපා ඔවුනට ඒ ආකාරයෙන් ම කිරීමට පවසන්නී

| | |
|---|---|
| **Teacher:** | We are going to do a game. Do you like it? |
| **Students:** | Yes, teacher. |
| **Teacher:** | Good. Children, I will give you picture cards of vehicles. Now, listen and do as I do. |

**Assessment:**

| **Criteria** | **Yes** |
|---|---|
| **Actively participate in the game.** | |

**Activity 02 - Listen, Colour and Say**

| **Learning Outcomes** | **Subject Content** | **Performance Standards** |
|---|---|---|
| 1.1Follows simple instructions (2-3 word) related to real life and learning areas | Vocabulary:<br>car, aeroplane, bus, tractor, ship, train | Listens and Colours the vehicles<br>correctly. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත ල වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

මෙහි සඳහන් කර ඇති පරිදි මව්බස සහ ඉංග්‍රීසි බස යන භාෂා දෙකෙන්ම ඔවුනට උපදෙස් දෙන්න
අද අපි පින්තූර පාට කරන්නයි යන්නේ

Children, today we are going to colour the objects in the classroom.

- සිසුන්ට පාට පැන්සල් සහ ක්‍රියාකාරකම් පොත ගෙන සූදානම් වෙන ලෙස පවසන්න.
  ‘Now, get ready with your colour pencils and the ABOE Activity Book.’

- පාට කිරීමට පැවසීමට පෙර ඔවුන්ට වචන මතක දැයි බැලීමට “What can you see in this picture?” යැයි විමසන්න.
- ඔබට හොඳින් ඇහුම්කන් දී ඔබ පවසන වචනයට අදාළ පින්තූරය පමණක් ම පාට කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් පාට කරන අතරතුරේ දී පන්තිකාමරය තුළ ඇවිදිමින් ඔවුන්ව නිරීක්ෂණය කරන්න.
- පාට කිරීම සඳහා කාලය ගතවන බැවින් **දිනකට පින්තූර දෙකක් හෝ තුනක් නිදහසේ පාට කිරීමට අවස්ථාව ලබා දෙන්න. (ඔබ පැවසූ පින්තූර පමණි)** මෙම ක්‍රියාකාරකම තුළින් දරුවන්ගේ සවන් දීමේ කුසලතාවය දියුණු කිරීමත් වචන නැවත නැවතත් අසන්නට ලැබීමෙන් මතකයේ රැඳීමට උපකාර වීමත් බලාපොරොත්තු වේ.
- වැරදියට පාට කර ඇත්නම් වැරදි ලකුණ නොදමන්න. නිවැරදි රූපය පාට කිරීමට උදව් වෙන්න.
- හැකි සෑම විට ම ඉංග්‍රීසි භාෂාවෙන් උපදෙස් දෙන්නී
- “Colour the car” **යනුවෙන් පවසා, එය මව්බසින් නොපවසන්න ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ම උපදෙස් දෙන්න**
- (හරි සළකුණ යොදන අතර ගුරුතුමිය විසින් ‘What is this object?’/‘Show me the car’ යන්න සිසුන්ගෙන් විමසන්න.)
- සිසුන් සියලුදෙනාම රූප නිවැරදිව හඳුනා ගත් පසුව පහත ගීතය ඔවුන් සමඟ ගායනා කරන්න.

**Teacher:** Children, today we are going to colour some pictures. These are pictures of vehicles.
Now get ready with your coloured pencils.
Children, are you ready?
**Students:** Yes, teacher.

**Teacher:** Children, today we are going to colour some pictures. These are pictures of vehicles.
Now get ready with your coloured pencils.
Children, are you ready?
**Students:** Yes, teacher.
**Teacher:** Colour the car. (Teacher goes around the classroom observing whether they are colouring the correct picture.)
**Teacher:** Colour the aeroplane.
Colour the bus.
Colour the tractor.
Colour the ship.
Colour the train.
**Teacher:** OK children. Now bring your books. Stand in a line, one behind the other.
(While marking the book, teacher asks, ‘What is this?/ Show me the car’)

**Assessment:**

| **Criteria** | Yes |
|---|---|
| **Listens and colours the objects** | |

**Activity 03 - Song: I see a car ...**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song:<br>I see a car<br>You see a car<br>Peep, Peep, Peep<br>We see a car.<br>I see a bus<br>You see a bus<br>Bru…m Bru…m Bru…m<br>We see a bus | Sings an action rhyme on vehicles with appropriate rhythm and actions, meaningfully |

**ඉගෙනුම් සම්පත්:** ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොතල අදාළ වාහනවල පින්තූර පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.
- වාහනය ඉදිරියට ගමන් කරන ආකාරය ශබ්ද නගමින් ගීතය ගැයීමට උපදෙස් දෙන්න.

**Teacher:** Children, today we are going to sing a song with actions.
Are you ready?
First, let's listen to the song.
(Teacher sings/plays the audio).
Eg- Shows the car when she sings the word 'car'.

**Teacher:** Now, let's sing the song with actions. You can make a song like this for other vehicles too.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Sings with actions.** | |

**Activity 04 - Game: Spot the Difference**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | Structures:<br>Picture 1 has... but picture 2 has...<br>How many cats are there in picture 1?<br>One / one cat<br>How many cats are there in picture 2?<br>two /two cats | Identifies the object/ animal and number correctly. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- මෙහිදී ඇති පරිදි ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් පළමු පින්තූරය සහ දෙවැනි පින්තූරයේ දක්නට ලැබෙන දේවල් සිසුන්ගෙන් විමසන්න.
- මෙම පින්තූර දෙකෙහි ඇති වෙනස්කම් සංඛ්‍යාව අනුව රූපය අනුව වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සරල ව විස්තර කිරීමට උපකාර කරන්න.

| Picture 1 |
|---|
| **Teacher:** What can you see in this picture? |
| **Students:** Cat, pot, cap, bat |
| **Teacher:** Very good children. How many cats are there in picture 1? |
| **Students:** One / one cat/ there's one cat. |

| Picture 2 |
|---|
| **Teacher:** What about picture 2? How many cats are there in picture 2? |
| **Students:** Two / two cats / there are two cats in picture 2. |
| **Teacher:** Very good, children. Picture 1 has one cat, but picture 2 has two cats. |

- Help the children to do this game. In groups students can ask questions and answer like given above.
- සිසුන් කණ්ඩායම් කර මෙහි දක්වා ඇති පරිදි ප්‍රශ්න ඇසීමටත් පිළිතුරු දීමටත් පවසමින් ක්‍රීඩාව කිරීමට උපකාර කරන්නී
- How many cats are there in picture 1? One / one cat
- How many cats are there in picture 2? two /two cats යනාදී වශයෙන්.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Do the game actively.** | |

**Activity 05 - How we get information – Song: Newspapers ….**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song- How We Get Information Newspapers letters | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත, අදාළ පින්තූර පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- පෙර ක්‍රියාකාරකම පරිදි පින්තූර පත් පෙන්වමින් ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to sing a song with actions.<br>Are you ready?<br>First, let's listen to the song.<br>(Teacher sings/plays the audio).<br>Eg. Shows the 'newspaper' when she sings the word 'newspaper'. |
| **Teacher:** | Now, let's sing the song with actions. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Sings with actions.** | |

Activity 06 - Song: Where is my pencil? eraser, bag, book

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Where's my pencil? //<br>Where is it? //<br>It's on the table//<br>Over there.<br>(Are you sleeping tune)<br>Eraser, book, bag, bottle, ruler | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත අදාළ පින්තූර පත්
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- කලින් ආකාරයෙන් පින්තූරුපත් පෙන්වමින් ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings with actions. | |

Activity 07 - Game: Spot the Difference

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 2.5 Introduces things, places, persons and actions related to real life | Picture 1 has ….<br>but picture 2 has …..<br>How many cows are there in picture 1?<br>One / one<br>How many cows are there in picture 2?<br>two /two cows | Identifies the object/ animal and number correctly. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- මෙහි දක්වා ඇති පරිදි ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් පළමු පින්තූරය සහ දෙවැනි පින්තූරයේ දක්නට ලැබෙන දේවල් සිසුන්ගෙන් විමසන්න.
- මෙම පින්තූර දෙකෙහි ඇති වෙනස්කම් සංඛ්‍යාව අනුව, රූපය අනුව වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සරල ව විස්තර කිරීමට සිසුන්ට උපකාර කරන්න.

**Teacher:** What can you see in this picture?
**Students:** dogs, parrots, butterflies, pigs, cow, zebra, peacock
**Teacher:** Very good children.
How many cows are there in picture 1?
**Students:** one / one cow/ there's one cow.
**Teacher:** Very good children. Picture 1 has one cow.

**Teacher:** What about picture 2? How many cows are there in picture 2?
**Students:** two / two cows / there are two cows in picture 2.
**Teacher:** Very good children. Picture 1 has one cow, but picture 2 has two cows.

- Help the children to do this game. In groups, students can ask questions and answer as given above.
- සිසුන් කණ්ඩායම් කර මෙහි දක්වා ඇති පරිදි ප්‍රශ්න ඇසීමටත් පිළිතුරු දීමටත් පවසමින් ක්‍රීඩාව කිරීමට උදව් කරන්න
- How many cows are there in picture 1? One / one cow
- How many cows are there in picture 2? two /two cows යනාදී වශයෙන් විමසන්න

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Do the game actively.** | |

**Activity 08 - Song: Big and Small**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song: Big and Small<br>Big and small///<br>A red ball //<br>A big red ball<br>A green ball//<br>A small green ball<br>A red ball -green ball<br>Big and small<br>(Gingle Bells) | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූර පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- පෙර ක්‍රියාකාරකම පරිදි පින්තූර පත් පෙන්වමින් ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.

**Teacher:** Children, today we are going to sing a song with actions.
Are you ready?
First, let's listen to the song.
(Teacher sings/plays the audio).
Eg. Shows the red ball when she sings the word 'red ball'.

Now, let's sing the song with actions.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Sings with actions.** | |

**Activity 09 - Listen, Draw, Colour and Say**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1Follows simple instructions (2-3 word) related to real life and learning areas | Listen, Draw, Colour and Say | Listens, draws and colours the<br>correctly |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- ඔබට සවන් දී අදාළ රූපය ඇඳීමට පවසන්න
- උපදෙස් ඉංග්‍රීසි බසින් පවසන්න

**Teacher:** Today we are going to draw. Do you like to draw?
**Students:** Yes, teacher.
**Teacher:** Now listen to me, and draw.
**Teacher:** Now, draw a big cat.
Now, colour the cat yellow. Have you finished?
Now, draw a small cat.
Now, colour the cat black.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Listens, draws, colours and says** | |

**Activity 10 Song: Long and Short**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song:<br>Long and short///<br>Long /// short///<br>Long and short.<br>(Gingle Bells)<br><br>A long tail//<br>I have a long tail.<br>A short tail//<br>I have a short tail. | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත, පින්තූරපත්
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**
- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- පෙර ක්‍රියාකාරකම පරිදි පින්තූර පත් පෙන්වමින් ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to sing a song with actions.<br>Are you ready?<br>First, let's listen to the song.<br>(Teacher sings/plays the audio).<br>Eg. Shows the long tail when she sings the word 'long tail.<br><br>Now, let's sing the song with actions. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Sings with actions.** | |

**Activity 11 - Song: What is it made of? - Wood**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song - What is it made of?<br><br>What is it made of//<br>My dear friend//<br><br>It's made of wood//<br>La la la//<br><br>(I hear thunder tune)<br>Show the picture of a thing made of wood and sing<br>Eg: chair, table, bed, pencil etc. | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත, අදාළ පින්තූර පත්**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- ඔබ සමග ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.
- සියලුම සිසුන්ට මේ ආකාරයෙන් ගීතය ගයමින් රඟපෑමට උදව් කරන්න.
- ගීතයේ පළමු පේළි දෙක සිසුන් එක් කණ්ඩායමකුත් තුන හතර පේළි දෙක අනෙක් කණ්ඩායමටත් ගායනා කිරීමට උදව් කරන්න.

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to sing a song with actions. Are you ready?<br>First, let's listen to the song. |
| **Teacher:** | Now, let's sing the song with actions show your picture card. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Sings with actions.** | |

**Activity 12 – Song: What is it made of? - Clay**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song - What is it made of?<br><br>What is it made of//<br>My dear friend//<br>It's made of wood//<br>La la la//<br><br>(I hear thunder tune)<br>Show the picture of a thing made of clay and sing<br>Eg: pot, oil lamp, pan, vase, etc. | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත, අදාළ පින්තූර
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.
- සියලුම සිසුන්ට මේ ආකාරයෙන් ගීතය ගැයීමට උදව් කරන්න.

**Teacher:** Children, today we are going to sing a song with actions. Are you ready? First, let's listen to the song.
**Teacher:** Now, let's sing the song with actions show your picture card.

**Teacher:** Children, what can you see in this picture?
**Students:** teapot, pot, cup, saucer
**Teacher:** They are made of clay.
The pot is made of clay.
The teapot is made of clay.
The cup and saucer is made of clay.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| Sings with actions. | |

**Activity 13 - Listen, Draw, Colour and Say**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1Follows simple instructions (2-3 word) related to real life and learning areas | Listen, draw, Colour and Say | Listens, Draws and Colours the pictures/objects correctly. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත, වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ඔබට සවන් දී අදාළ රූපය ඇඳීමට පවසන්න
- උපදෙස් ඉංග්‍රීසි බසින් පවසන්න

| | |
|---|---|
| **Teacher:** | Today we are going to draw. Do you like to draw? |
| **Students:** | Yes, teacher. |
| **Teacher:** | Now listen to me, and draw. |
| **Teacher:** | Now, draw two things made of clay<br>Have you finished?<br>Now, draw two things made of wood.<br>Now, colour the pictures. |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Listens, draws and colours the objects** | |

**Activity 14 - Song: My Shadow and Mirror**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Song – My Shadow<br>Song – Mirror | Sings an action rhyme with appropriate rhythm and actions meaningfully. |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- සිසුන්ට ඇසෙන ලෙස ගීතය ගැයීම හෝ හඬ පටය වාදනය සිදු කරන්න.
- ඔබ සමඟ ගීතය ගැයීමට සිසුන්ට පවසන්න.
- සියලුම සිසුන්ට මේ ආකාරයෙන් ගීතය ගයමින්

| | |
|---|---|
| **Teacher:** | Children, today we are going to sing a song with actions. Are you ready?<br>First, let's listen to the song. |
| **Teacher:** | Now, let's sing the song with actions |

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Sings with actions.** | |

**Activity 15 - Listen and Colour**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 1.1Follows simple instructions (2-3 word) related to real life and learning areas | Listen and Colour and Say | Listens and Colours the picture correctly. |

**ඉගෙනුම් සම්පත්:** ABOE ක්‍රියාකාරකම් පොත ල වර්ණ ගැන්වීමට අවශ්‍ය ද්‍රව්‍ය
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- ඔබට සවන් දී අදාළ රූපය ඇඳීමට පවසන්න
- උපදෙස් ඉංග්‍රීසි බසින් පවසන්න

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Listens and colours the pictures.** | |

**Activity 16, 17, 18, 19, 20, 21 - Story telling: Sugar Plum Fairy - 1, 2, 3, 5, 6**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Story- Sugar Plum Fairy - 1 | Responds verbally and non-verbally to stories individually or collaboratively |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- පළමු වාරයේ කතන්දර කියා දුන් ආකාරයෙන්ම මෙම කතාව පින්තූර පෙන්වමින් ප්‍රශ්න අසමින් චරිත රඟපාමින් රසවත් ලෙස ඔබගේ නිර්මාණශීලී බව භාවිත කරමින් සිදු කරන්න.
- ඔබගේ පන්තියේ සිසුන්ගේ ස්වභාවය අනුව දිනකට පිටුවක් හෝ පිටු කිහිපයක් කියා දීමට උත්සහ කරන්.
- කතාව කියා දෙන අවස්ථාවේ දී පින්තූර පෙන්වමින් සිසුන්ගෙන් ඒ පිළිබඳ ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Listens and responds and enjoys the story** | |

**Activity 22, 23, 24, 25, 26, 27 - Story telling: The Grasshopper and the Ant – 1, 2, 3, 5, 6**

| Learning Outcomes | Subject Content | Performance Standards |
|---|---|---|
| 5.1 Responds verbally and non-verbally to simple chants, rhymes, action songs and stories individually or collaboratively | Story- Sugar Plum Fairy - 1 | Responds verbally and non-verbally to stories individually or collaboratively |

**ඉගෙනුම් සම්පත්:** ABOE - ක්‍රියාකාරකම්පාදක වාචික ඉංග්‍රීසි ක්‍රියාකාරකම් පොත
**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය:**

- පළමු වාරයේ කතන්දර කියා දුන් ආකාරයෙන්ම මෙම කතාව පින්තූර පෙන්වමින් ප්‍රශ්න අසමින් චරිත රඟපාමින් රසවත් ලෙස ඔබගේ නිර්මාණශීලී බව භාවිත කරමින් සිදු කරන්න.
- ඔබගේ පන්තියේ සිසුන්ගේ ස්වභාවය අනුව දිනකට පිටුවක් හෝ පිටු කිහිපයක් කියා දීමට උත්සහ කරන්න.
- කතාව කියා දෙන අවස්ථාවේ දී පින්තූර පෙන්වමින් සිසුන්ගෙන් ඒ පිළිබඳ ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.

**Assessment:**

| Criteria | Yes |
|---|---|
| **Listens and responds and enjoys the story** | |

# දෙවන ජාතික භාෂාව (දෙමළ)

# 06 ඉගෙනුම් පලය

## වර්ණ සඳහා යෙදෙන වචන හඳුනා ගෙන ඒවා නිවැරදි ව භාවිත කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| நீல நிறம்<br>(නීල නිරම්) නිල් පාට<br>பச்சை நிறம்<br>(පච්චෛ නිරම් - කොළ පාට)<br>மஞ்சள் நிறம்<br>(මඤ්ජල් නිරම් - කහ පාට)<br>வெள்ளை நிறம்<br>(වෙල්ලෛ නිරම්- සුදු පාට)<br>கறுப்பு நிறம்<br>(කරුප්පු නිරම් - කළු පාට)<br>சிவப்பு நிறம்<br>(සිවප්පු නිරම් - රතු පාට) | 6.1 නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සඳහා යෙදෙන වචන නිවැරදි ව උච්චාරණය කරයි<br><br>6.2 නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ නිවැරදි ව නම් කරයි. | 6.1.1 නිවැරදි උච්චාරණය<br><br>6.2.1 නිවැරදි ප්‍රකාශ |

**යෝජිත කාලය - පැය 02 මි.30**

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

**ක්‍රියාකාරකම 1**

**ඉගෙනුම් සම්පත්**

**නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සහිත වර්ණ පුවරු හයක් කාඩ්පත් දැමීමට සුදුසු ප්‍රමාණයේ පෙට්ටි**

- සිසුන් තුන් දෙනෙකුට වර්ණ පුවරුව බැගින් ලබා දෙන්න.
- ඉන් පසු ගුරුවරයා යම්කිසි වර්ණයක් නම් කළ විට එම වර්ණය අයත් පුවරුව හිමි සිසුවාට ඉදිරියට පැමිණ වර්ණය දෙමළ බසින් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

  උදා:

  ගුරුවරයා "**நீல நிறம்**" (නීල නිරම්) කී විට අදාළ සිසුවා පැමිණ වර්ණ පුවරුව පෙන්වා (නීල නිරම්) ලෙස කිව යුතු ය.
- ඉන් පසු සිසුන් සියලු දෙනා ම අදාළ වචනය ප්‍රකාශ කළ යුතු ය.
- සැම සිසුවකුට ම අවස්ථාව ලැබෙන පරිදි මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.
- මේ ආකාරයට අනෙක් වර්ණ තුන ද වෙනත් දිනයක දී හඳුන්වා දෙන්න.

## ක්‍රියාකාරකම 2

**ඉගෙනුම් සම්පත්**

**නිල්, කොළ, කහ, සුදු, කළු, රතු යන වර්ණයෙන් වර්ණ කළ පුවරු හයක්**

- සිසුන් එළිමහනකට කැඳවා ගෙන යන්න. ක්‍රියාකාරකම 01 සඳහා යොදා ගත් වර්ණ පුවරු සුදුසු තැන්වල සිටුවන්න.
- ගුරුවරයා වර්ණයක් පැවසූ විට සිසුන් එම වර්ණය සහිත පුවරුව වෙත ගුරුවරයා විසින් දෙනු ලබන සංඥවකට අනුව එම වර්ණය හඬ නගා පවසමින් ඒ දෙසට දිව යා යුතු ය.
- වැරදි වර්ණය අසලට ගිය සිසුන් වෙතොත් නිවැරදි ස්ථානය වෙත යොමු කරන්න.
- මෙම වර්ණවලට අයත් නම් හොඳින් අවබෝධ කර ගන්නා තුරු ම සිසුන් මෙම ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- මෙම ක්‍රියාකාරකම කුඩා කණ්ඩායම් වශයෙන් සිදු කිරීම යෝග්‍ය ය.

## ක්‍රියාකාරකම 3

**ඉගෙනුම් සම්පත්**

**නිල්, කොළ, කහ, සුදු, කළු, රතු යන වර්ණවලින් යුතු මල් පෙති**

- නිල්, කහ, කොළ, සුදු, කළු, රතු යන වර්ණ සහිත වාර්නිෂ් හෝ වෙනත් කඩදාසි වර්ගයක් හෝ බ්‍රිස්ටල් බෝඩ් මත අලවා ගන්න.
- පසු ව එම වර්ණ හයෙන් එක ම හැඩයක් සහිත මල් පෙති, එක් වර්ණයකින් සිසු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් වන සේ කපා ගන්න.
- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න. එම ස්ථානයේ මීටර් 20ක පමණ ප්‍රදේශයක් ආවරණය වන සේ සෑම වර්ණයකට ම අදාළ මල් පෙති විසුරුවන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- එක් කණ්ඩායමක් ඉදිරියට කැඳවා ගුරුවරයා විසින් දෙමළ බසින් ප්‍රකාශ කරන වර්ණය සහිත මල් පෙති රැගෙන ආ යුතු බව පවසන්න.
- මේ ආකාරයට කණ්ඩායම් මාරු කරමින් සිසුන්ට වර්ණ පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම සිදු කරන්න.


සැ.යු. එක් කණ්ඩායමක සිසුන් මල් පෙති රැගෙන ආ පසු ඊළඟ කණ්ඩායම ක්‍රියාකාරකමෙහි යෙදීමට පෙර, ගෙන ආ මල් පෙති නැවත මල් පෙති තිබූ ස්ථානයේ ම විසුරුවන්න.

## ක්‍රියාකාරකම 3

**ඉගෙනුම් සම්පත්**

**නිල්, කොළ, කහ, සුදු, කළු, රතු යන වර්ණයෙන් වර්ණ කර සකසා ගත් වාසනා චක්‍රයක්**

- වර්ණ යොදා ගනිමින් "වාසනා චක්‍රය" ක්‍රීඩාවෙහි සිසුන් සමඟ නිරත වන්න.
- චක්‍රය කරකැවූ පසු කුමන පැහැය ඊතලය ළඟ නවතී දැයි අනුමාන කරන මෙන් සිසුන්ට පවසන්න.
- ඉන් පසු රෝදය කරකවා ඊතලය ළඟ නවතින වර්ණය හඬ නගා දෙමළ බසින් පැවසීමට උපදෙස් දෙන්න.
- සිසුන්ට වර්ණවලට අදාළ නම් හොඳින් හුරු වන තෙක් ක්‍රියාකාරකමේ යොදවන්න.



මෙම ක්‍රියාකාරකම ලකුණු ප්‍රදානය කරමින් තරගයක් ලෙස ද පැවැත්විය හැකි ය.

## තක්සේරු නිර්ණායක

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායකය | ප්‍රවීණතාවට පැමිණ ඇත | | ප්‍රවීණතාවට පැමිණ නැත | |
|---|---|---|---|---|---|
| | | 4 මට්ටම | 3 මට්ටම | 2 මට්ටම | 1 මට්ටම |
| 6.1 නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සඳහා යෙදෙන වචන නිවැරදි ව උච්චාරණය කරයි | 6.1.1 නිවැරදි උච්චාරණය | නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සඳහා යෙදෙන වචන නිවැරදි ව උච්චාරණය කරයි. | නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සඳහා යෙදෙන වචන අතරින් වචන හතරක් උච්චාරණය කරයි. | නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සඳහා යෙදෙන වචන අතරින් වචන තුනක් උච්චාරණය කරයි. | කිසිදු උච්චාරණයක් සිදු නොකරයි. |
| 6.2 නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ නිවැරදි ව නම් කරයි. | 6.2.1 නිවැරදි නම් කිරීම | නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ සියල්ල නිවැරදි ව නම් කරයි. | නිල්, කහ, රතු, කළු, සුදු, කොළ යන වර්ණ අතරින් හතරක් නිවැරදි ව නම් කරයි. | නිල්, කහ, රතු, කළු, කොළ යන වර්ණ අතරින් තුනක් නිවැරදි ව නම් කරයි. | කිසිදු ප්‍රතිචාරයක් නො දක්වයි. |

# 07 ඉගෙනුම් පලය

# පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව හඳුනාගෙන එදිනෙදා කතාබහේ දී භාවිත කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| அம்மா - (අම්මා) අම්මා<br>அப்பா - (අප්පා) තාත්තා<br>அக்கா - (අක්කා) අක්කා<br>அண்ணா - (අණ්ණා) අයියා<br>தங்கை - (තංගෛ) නංගි<br>தம்பி - (තම්බි) මල්ලි<br>நான் - (නාන්) මම | 7.1 පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව නිවැරදි ව පවසයි. | 7.1.1 නිවැරදි ව හඳුනා ගැනීම |
| | 7.2 පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව නිවැරදි ව උච්චාරණය කරයි. | 7.2.1 නිවැරදි උච්චාරණය |

**යෝජිත කාලය - පැය 03**

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

**ඉගෙනුම් සම්පත්**

**අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි යන අය පැහැදිලි ව පෙන්නුම් කරන ආකාරයෙන් වෙන් වෙන් ව සකසා ගත් දඬු රූකඩ හයක්**

- අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි යන අය පැහැදිලි ව පෙන්නුම් කරන ආකාරයේ දඬු රූකඩ හයක් සකසා ගන්න.
- තම නිවසේ සිටින සාමාජිකයෝ කවුරු දැයි සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න. උදා: අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි
- ගුරුවරයා විසින් 'අම්මා' ලෙස සකස් කර ගන්නා ලද දඬු රූකඩය ඉදිරිපත් කරන්න.
- 'මේ අපේ අම්මා.' අම්මාට දෙමළ බසින් **அம்மா** (අම්මා) යන්න ම භාවිත කරන බව පැහැදිලි කරන්න.
- **அம்மா** (අම්මා) යන්න සිසුන් සමඟ කිහිප වරක් උච්චාරණය කරන්න.
- දෙවනු ව 'තාත්තා' ලෙස සකස් කරගත් දඬු රූකඩය ඉදිරිපත් කර 'මේ තාත්තා.' 'තාත්තා'ට දෙමළ භාෂාවේ **அப்பா** (අප්පා) යනුවෙන් භාවිත කරන බව පවසා සිසුන් සමඟ එම වචනය ද උච්චාරණය කරන්න.
- මේ ආකාරයට ම අක්කාට **அக்கா** (අක්කා) ලෙස ම භාවිත කරන බව ද අයියාට **அண்ணா** (අණ්ණා) ලෙස යෙදෙන බව ද, නංගිට **தங்கை** (තංගෛ) ලෙස යෙදෙන බව ද, මල්ලිට **தம்பி** (තම්බි) ලෙස යෙදෙන බව ද පැහැදිලි කරන්න.
- ගුරුවරයා විසින් භාවිත කරන ලද දඬු රූකඩ සියල්ල රැගෙන එක් එක් රූපය ඉදිරිපත් කරමින් පන්තියේ සිසුන්හට ඒ අය කවුරු දැයි දෙමළ බසින් හඳුන්වන ලෙස පවසන්න. සිසු අවබෝධය පිරික්සා බැලීම සඳහා අහඹු ලෙස නම් කරනු ලබන සිසුන්ගෙන් ද පිළිතුරු ලබා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- එළිමහනේ සුදුසු ස්ථානයකට සිසුන් කැඳවා ගෙන යන්න.
- පහත දැක්වෙන ගීතය පේළියෙන් පේළිය ගුරුවරයා විසින් ගායනා කරන්න.

| | |
|---|---|
| லல்லா லலலலா | ලල්ලා ලලලලා...// |
| அம்மா எங்கள் அம்மா | අම්මා එංගල් අම්මා |
| அப்பா எங்கள் அப்பா | අප්පා එංගල් අප්පා |
| அண்ணா எங்கள் அண்ணா | අණ්ණා එංගල් අණ්ණා |
| அக்கா எங்கள் அக்கா | අක්කා එංගල් අක්කා |
| தம்பி எங்கள் தம்பி | තම්බි එංගල් තම්බි |
| தங்கை எங்கள் தங்கை | තංගෛ එංගල් තංගෛ |
| லல்லா லலலலா | ලල්ල ලලලලා...// |

- මෙම ගීතයේ **எங்கள்** (එංගළ්) යනුවෙන් අදහස් වන්නේ 'අපේ' යන්න යි.
- පසු ව ගීතය පෙළින් පෙළ සිසුන් සමඟ ද ගායනා කරන්න.

**ක්‍රියාකාරකම 3**

**ඉගෙනුම් සම්පත්**

**අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි යන අය පැහැදිලි ව පෙන්නුම් කරන ආකාරයෙන් වෙන් වෙන් ව සකසා ගත් දඬු රූකඩ හයක්**

- පන්තියේ සිසුන් එළිමහනේ සුදුසු ස්ථානයකට රැගෙන ගොස් රවුමක් ආකාරයට ස්ථානගත කරන්න.
- ක්‍රියාකාරකම 1 සඳහා යොදා ගත් පවුලේ සාමාජිකයන් පෙන්නුම් කරන ආකාරයේ දඬු රූකඩ හය සිසුන් අතර බෙදා දෙන්න.
- ගීතයක් වාදනය වීමට සලස්වා දඬු රූකඩ අතින් අත මාරු කර ගන්නා ලෙස පවසන්න. ගීතය නතර කරන අවස්ථාවේ දී දඬු රූකඩ අතැති සිසුන් තම තමා කවුරු දැයි හඳුන්වා දිය යුතු ය.

උදා : මවගේ රූපය සහිත දඬු රූකඩය අතැති සිසුවා - **நான் அம்மா** (නාන් අම්මා)
අයියාගේ රූපය සහිත දඬු රූකඩය අතැති සිසුවා - **நான் அண்ணா** (නාන් අණ්ණා)

- මේ ආකාරයට දඬු රූකඩ අතැති ව සිටින සිසුන් සය දෙනාගෙන් ම ප්‍රකාශ ලබා ගන්න. නැවත ගීතය වාදනය වීමට සලස්වා පෙර පරිදි ම ක්‍රියාකාරකම සිදු කරන්න. සිසුන්ට වචන පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 4**


- පන්තියේ සිසුන් 6 දෙනා බැගින් වන සේ කණ්ඩායම් කරන්න.
- සෑම සිසු කණ්ඩායමකට ම අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි යන චරිත සඳහා සුදුසු වෙස් ගැන්වීම් සිදු කරන්න.
- සිසුන්ට තනි තනි ව පන්තිය ඉදිරියට පැමිණ තමා හඳුන්වා දීමට අවස්ථාව ලබා දෙන්න. උදා: **வணக்கம், நான் தங்கை** (වණක්කම්, නාන් තංගෛ)
- පසු ව චරිත අනුකරණයට යොදා ගත් ද්‍රව්‍ය සිසුන් අතර හුවමාරු කරමින් එම චරිත හඳුන්වා දීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.


## ක්‍රියාකාරකම 5

### ඉගෙනුම් සම්පත්

**එක් කාඩ් පතක පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙකු නියෝජනය වන ආකාරයට සකසා ගත් කාඩ් පත්**

- එක් කාඩ් පතක පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙකු නියෝජනය වන ආකාරයට පන්තියේ සිටින සිසු සංඛ්‍යාවට ප්‍රමාණවත් වන සේ රූප කාඩ් පත් සකසා ගන්න.
- මේ ආකාරයට සකසා ගත් කාඩ් පත් එක් සිසුවකුට එක බැගින් වන සේ බෙදා දෙන්න.
- සෑම කාඩ් පතක ම දැක්වෙන්නේ පවුලක සාමාජිකයන් බව පවසන්න.
- පසු ව එක් එක් සිසුවා තමා සතු ව ඇති කාඩ් පතේ දැක්වෙන පවුලේ සිටින සාමාජිකයෝ කවුරු ද යන වග දෙමළ භාෂාවෙන් පැවසීමට යොමු කරන්න.
- සිසුන් අතර කාඩ් පත් හුවමාරු කරමින් දරුවන් තුළ පවුලේ සාමාජිකයන් පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.





## ක්‍රියාකාරකම 6

- ගුරුවරයා විසින් එක් සිසුවකු පන්තිය ඉදිරියට කැඳවන්න.
- එම සිසුවා ලවා තම පවුලේ සිටින කුමන හෝ සාමාජිකයන් දෙදෙනෙකු පිළිබඳ ව පහත දැක්වෙන ආකාරයට ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- උදා: **எனது அம்மா காந்தி** - (එනදු අම්මා කාන්ති)

  **எனது அண்ணா ரவி** - (එනදු අණ්ණා රවී)
- මේ ආකාරයට අහඹු ලෙස සිසුන් තෝරා ගෙන ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

## තක්සේරු නිර්ණායක

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත | | ප්‍රවීණතාවට පැමිණ නැත | |
|---|---|---|---|---|---|
| | | 4 මට්ටම | 3 මට්ටම | 2 මට්ටම | 1 මට්ටම |
| 7.1 පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව නිවැරදි ව පවසයි. | 7.1.1 නිවැරදි ව හනා ගැනීම | அம்மா, அப்பா, அக்கா, அண்ணா, தங்கை, தம்பி, நான் යන පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව නිවැරදි ව පවසයි. | அம்மா, அப்பா, அக்கா, அண்ணா, தங்கை, தம்பி, நான் යන පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව අතරින් හතරක් නිවැරදි ව පවසයි. | அம்மா, அப்பா, அக்கா, அண்ணா, தங்கை, தம்பி, நான் යන පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව අතරින් තුනක් නිවැරදි ව පවසයි. | කිසිදු ප්‍රකාශයක් සිදු නොකරයි. |
| 7.2 පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්ව නිවැරදි ව උච්චාරණය කරයි. | 7.2.1 නිවැරදි උච්චාරණය | නිවැරදි ව උච්චාරණය කරයි. | | නිවැරදි ව උච්චාරණය සිදු නොකරයි. | |

# 08 ඉගෙනුම් පලය

## සරල ළමා ගී ගායනා කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

| අන්තර්ගතය | කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක |
|---|---|---|
| පේළි හතරකින් යුත් සරල ළමා ගී දෙකක් | 8.1 දෙන ලද පේළි හතරකින් යුත් ළමා ගීයක් ගායනා කරයි. | 8.1.1 ගායනය |
| | 8.2 ළමා ගී ගායනා කරමින් රිද්මානුකූල චලන ඉදිරිපත් කරයි. | 8.2.1 රිද්මානුකූල චලන |

**යෝජිත කාලය - පැය 03**

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය**

පහත සඳහන් ගීතය සිසුන් සමග ගායනා කරන්න.
පසුව එම ගීතය කණ්ඩායම් වශයෙන් ද තනි තනිව ද ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ගීතයේ අර්ථය සරල ව පැහැදිලි කර දී ගීතය ගායනා කරමින් රංගනයේ යෙදීමට ද සිසුන් යොමු කරන්න.

ගීතය 1

| | | |
|---|---|---|
| அப்பம் அப்பம் அப்பம் | අප්පම් අප්පම් අප්පම් | ආප්ප ආප්ප ආප්ප |
| அம்மா சுட்ட அப்பம் | අම්මා සුට්ට අප්පම් | අම්මා පිච්චූ ආප්ප |
| வட்ட வட்ட அப்பம் | වට්ට වට්ට අප්පම් | රවුම් රවුම් ආප්ප |
| வடிவான அப்பம் | වඩිවාන අප්පම් | ලස්සන ආප්ප |

ගීතය 2

| | | |
|---|---|---|
| பந்தடிப்போம் பந்தடிப்போம் | පන්දඩිපෝම් පන්දඩිපෝම් | බෝල ගසමු // |
| பாலா ஓடி வா | පාලා ඕඩි වා | පාලා දුවලා එන්න |
| பாடிப் பாடி பந்தடிப்போம் | පාඩිප්පාඩි පන්දඩිපෝම් | ගී ගයමින් බෝල ගසමු |
| பாலா ஓடி வா | පාලා ඕඩි වා | පාලා දුවලා එන්න |

## තක්සේරු නිර්ණායක

| කාර්ය සාධන ප්‍රමිතිය | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත | ප්‍රවීණතාවට පැමිණ නැත | |
|---|---|---|---|---|
| | | | 2 මට්ටමට | 1 මට්ටමට |
| 8.1 දෙන ලද පේළි හතරකින් යුත් ළමා ගීයක් ගායනා කරයි. | 8.1.1 ගායනය | දෙන ලද පේළි හතරකින් යුත් ළමා ගීයක් තනි ව ගායනා කරයි. | දෙන ලද පේළි හතරකින් යුත් ළමා ගීයක් තවත් සිසුවකු සමඟ ගායනා කරයි. | කිසිදු ප්‍රතිචාරයක් නොදක්වයි. |
| 8.2 ළමා ගී ගායනා කරමින් රිද්මානුකූල චලන ඉදිරිපත් කරයි. | 8.2.1 රිද්මානුකූල චලන | ළමා ගීයක් තනි ව ගායනා කරමින් රිද්මානුකූල චලන ඉදිරිපත් කරයි. | ළමා ගීයක් තවත් සිසුවකු සමඟ ගායනා කරමින් රිද්මානුකූල චලන ඉදිරිපත් කරයි. | කිසිදු ප්‍රතිචාරයක් නොදක්වයි. |

මූලික විද්‍යාව හා
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගුරු මාර්ගෝපදේශය (සි)